# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016**දෙසැම්බර් **09** වන සිකුරාදා
2016 மார்கழி 09 வெள்ளிக் கிழமை
Friday 09th December 2016

බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.00ට පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.00 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.00 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [Sunil Wijerathne] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දිනට නියමිත න්‍යාය පත්‍රය අනුව අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තෝරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය සම්බන්ධ වැය ශීර්ෂයන් පිළිබඳ විවාදයෙන් අනතුරුව සභාවේ එකඟතාවය මත ඡන්ද විමසීම ප.ව. 3.00 ට සිදු කිරීමට නියමිතව තිබෙන බැවින්, ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මම ආරාධනා කරනවා, ඒ අවස්ථාවට සහභාගී වෙන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2017 වාර්ෂික මුදල් ප්‍රකාශයේ ප්‍රධානයන් පිළිබඳව සලකා බැලීම සඳහා මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself intoa Committee of the whole Council.*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2017
# පූර්ණ කාරක සභාව
ANNUAL FINANCIAL STATMENT - 2017
COMMITTEE OF THE WHOLE COUNCIL

**ශීර්ෂ අංක 108 - අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය**

**ශීර්ෂ අංක 126 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

Head No 108 - Ministry of Education, Cultural and Arts Affairs, Sports and Yout Affairs and Information Technologe.

Head No 126 - Department of Educaiton

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, *"අංක 108 හා 126 යන වැය ශීර්ෂවලින් රු. 10/- ක සංකේත කපා හැරීමට යෝජනා කරනවා."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංක 108 හා 126 ට අදාළ වැය ශීර්ෂ පිළිබඳ විවාදය ආරම්භ කිරීම සඳහා සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට විනාඩි 12 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.05]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි මම නියෝජනය කරන උපදේශක කාරක සභාවේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය ආරම්භ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම රංජිත් සෝමවංශ අමාත්‍යවරයා මේ අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ, මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු කර ගෙන යන්නට එතුමාට මම හිතන්නේ, මගෙන් පූර්ණ සහයෝගය ලැබුණා. එතුමාත් ඒ වාගේම තමයි. ඉතාමත්ම සාධාරණව මේ සියලුම මන්ත්‍රීවරුන්ට

[ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ]

සමානව සලකලා, මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ කටයුතු කර ගෙන යන්න අවස්ථාව උදා කරලා දීලා තිබෙනවා. හැබැයි, මම දකින විධියට මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කළාට පස්සේ, ආරම්භකම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා වූ සුසිල් මුණසිංහ ප්‍රධාන අමාත්‍යවරයාට අධ්‍යාපන විෂය ලැබුණේ නැහැ. ඒ වෙලාවේ සුරනිමල රාජපක්ෂ මැතිතුමා තමයි අධ්‍යාපන ඇමතිවරයා හැටියට කටයුතු කළේ. මගේ මතකය නිවැරදි නම්, ඉන් පස්සේ සෑම අවස්ථාවකදීම ප්‍රධාන අමාත්‍යවරයා තමයි අධ්‍යාපන විෂය භාර ගත්තේ. අපි දැක්කා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය, සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා, රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා, ප්‍රසන්න රණතුංග මැතිතුමා මේ ආදී විධියට ප්‍රධාන අමාත්‍යවරයා යටතේ තමයි අධ්‍යාපන විෂය පැවරුණේ. මේ වතාවේ සුවිශේෂ වෙනසක් වෙලා ප්‍රධාන අමාත්‍යවරයාගෙන් බැහැරව, රංජිත් සෝමවංශ ඇමතිවරයාට අධ්‍යාපන විෂය පැවරිලා තිබෙනවා. මේ නිසාම යම් යම් කලබැගෑනිත් සිද්ධ වුණා. අපි දන්නවා. පසුගිය කාලයේ එවැනි ප්‍රශ්නවලටත් මුහුණ දෙන්න සිදු වුණා. නමුත් ඒ කණ්ඩායම තුළත් මොන ප්‍රශ්න හරි විසඳාගෙන, එතුමා මේ කටයුත්ත බොහොම උපේක්ෂාශීලීව, කලබල වෙන්නේ නැතිව පවත්වාගෙන යන්න උත්සාහ කරනවා.

ගරු සභාපතිතුමනි, මම විශ්වාස කරන දෙයක් තමයි පළාත් සභාවේ තිබෙන මේ අමාත්‍යාංශවලට හුදෙකලාව ගමන් කරන්න බැහැ. එහෙම කරන්න අමාරුයි. මොකද, මේ පළාත් සභාවේ අපි දන්නවා, මේ තිබෙන පාසල් සංඛ්‍යාව දිහා බැලුවාම තනිව ගොඩ නැගෙන්න අමාරුයි. පළාත් සභාවට වෙන් වන මුදල් ප්‍රමාණයත් එක්ක, මේ පළාත් සභාවේ තිබෙන පාසල් තනියම ගොඩ නගා ගන්න බැහැ. මධ්‍යම රජයේ ආධාර උපකාර නැතිව, ඒ තිබෙන සම්පත් උපයෝගී කර ගන්නේ නැතිව, ශ්‍රී ලංකාවේ කොයි පැත්තේ පළාත් සභාවක් වුණත් එහෙම තනිවම ගොඩ නගා ගන්න බැහැ. ඒ නිසා තමයි මධ්‍යම රජයෙන්, හැම වෙලාවකම තිබුණු සෑම රජයක්ම උදව් උපකාර කරන්නේ. දැන් අපි දැක්කා. පසුගිය රජය කාලයේත් අධ්‍යාප අමාත්‍යාංශය හරහා, රේඛීය අමාත්‍යාංශය හරහා පළාත් සභාවලට යම් යම් උපකාර කළා. පසුගිය කාලයේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ඒ හිටපු ජනාධිපතිතුමාගේ නම දාලා මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර කියලා හැදුවා. කාගේ නම් දාලා හැදුවත් ඒවා හොඳ ලක්ෂණයක්. දැන් සමහර ඒවාට ඒ අවශ්‍ය කරන බඩු මුට්ටු ටික දීලා, විවෘත කර ගන්න බැරිව ඉන්නවා. දැන් අපේ පළාතේ වත්තල අධ්‍යාපන කොට්ඨාශයේ, කැලණිය කලාපයේ හීන්කෙන්ද මහා විද්‍යාලයේ තිබෙන මහින්දෝදය විද්‍යාගාරය තවම එහෙම්මම තිබෙනවා. අවුරුදු දෙකක් තිස්සේ තවම බඩු ටික දී ගන්න බැරි වෙලා තිබෙනවා.

ඒ නිසා දැන් වර්තමාන අධ්‍යාපන ඇමතිවරයා කිසිම අධ්‍යාපන ඇමතිවරයෙකුට නොදෙවෙනි ආකාරයට අතිවිශාල මුදල් ප්‍රමාණයක්, මේ බස්නාහිර පළාත් සභාවට දීලා තිබෙනවා. ඒ ගැන තර්කයක් නැහැ. ඒක කවුරු මොන විධියට අර්ථ දක්වන්න උත්සාහ කළත්, පුදුමාකාර විධියට මුදල් දීලා තිබෙනවා. තවමත් දී ගෙන යනවා. අපි දැක්කා, අපේ කොට්ඨාශවල එක කොට්ඨාශයකට පාසල් දෙකක් තෝරා ගෙන ඉතාමත්ම සාධනීය මට්ටමෙන් මුදල් වෙන් කර ගෙන යනවා. ඒ මුදල් වෙන් කරන්නේ, අවුරුදු තුනකට. හතරකට. ඒ විද්‍යාල නගා සිටුවන්න. ඒක හොඳ ක්‍රමයක්. මොකද, එක විද්‍යාලයක විද්‍යාල දෙක තුනක් සාර්ථක විද්‍යාලයක් විධියට ඒ සම්පත් උපරිම මට්ටමෙන් යොදවලා, ඒ විද්‍යාලය ගොඩ නැගුවාම මේ තිබෙන තරඟකාරී ස්වරූපය නැති වෙනවා. අද අපේ පළාත්වල, විශේෂයෙන්ම විද්‍යාල දෙක තුනකට තමයි මේ තරඟය තිබෙන්නේ. ඒ තිබෙන තරඟය නිසා තමයි අද මේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ, පාසල්වලට ළමයින් ඇතුළත් කිරීමේ ප්‍රශ්නයේදී. විද්‍යාල දෙක තුනක විතරයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. පසුගිය කාලේ විද්‍යාල කීයක් වැහුණාද කියලා බලන්න. ඒ නිසා අපි ඉල්ලීමක් කරන්නේ, මේ හැම විද්‍යාලයක්ම සම්පත්වලින් පෝෂණය කරන්න ඕනෑ. දැන් පසුගිය කාලයේ අපි දැක්කා, හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ පළාත් සභාවේ සල්ලි, මහා ආණ්ඩුවේ සල්ලි අරගෙන මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමන්ලා එහෙම ඉදිරිපත් වෙලා ඒ පාසල්වලට තීන්ත ගාන්න, ජල නල දෙන්න, වතුර දෙන්න කටයුතු කළා. ඒවා තනිකරම ඒගොල්ලන්ගේ ව්‍යාපෘති විධියට කෙරුවා. ඒක ඇත්ත. හොඳයි. ඒ වැඩ සටහන් කර ගෙන ගියා. අභ්‍යන්තර පාරවල් හැදුවා. ඒවා කරන්න ඕනෑ. (බාධා කිරීමක්) ඒවා කළේ තනි මතයට. අනික් අයව සහභාගී කර ගත්තේ නැහැ. හොඳයි. මම කියන්නේ, කොහොම හරි ඒවා කරන්න ඕනෑ. ඒ නිසා මම මෙතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේ වැඩ සටහන් කරන කොට - එතුමා සාමාන්‍යයෙන් නම්‍යශීලී ඇමතිවරයෙක්.

ඒ නිසා මධ්‍යම රජයේ ඇමතිවරයාත් එක්ක සහසම්බන්ධතාවය ඇති කර ගෙන වැඩ කටයුතු කරන්න. හැබැයි, එතුමාව හමු වුණු දවසක පහුගිය සෙනසුරාදා අපිව ගෙන්වලා, එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම ගෙන්වලා සාකච්ඡා කළා. චෝදනාවක් එල්ල කළා. මම මේවා ප්‍රසිද්ධියේ කියන්න ඕනෑ. මොකද, තුන්වන ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ගේ පත්වීම් ටික ලැබිලා, ඒ විදුහල්පතිවරුන්ව විද්‍යාලවලට අනුයුක්ත කළාම, ඒ විද්‍යාලවලට තවමත් විදුහල්පති ශ්‍රේණිය ලැබුණු විදුහල්පතිවරුන්ව අනුයුක්ත කළේ නැහැ. ඒගොල්ලෝ පාසල්වලට ඉන්නවා. තවමත් විද්‍යාලවල වැඩ බලන විදුහල්පතිවරු ඉන්නවා. තාක්ෂණික හේතුව මොකක්ද කියලා මම දන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම වත්තල, ජා-ඇළ, මීගමුව කොට්ඨාශවල ඉන්නවා. මම අනික් කොට්ඨාශ ගැන කියන්නේ නැහැ. මම දන්න ඒවා ටික කියන්නම්. ඔබතුමා ඒ ප්‍රශ්නය මතු කළ වෙලාවේ කිව්වා, සාධාරණ හේතු තිබෙනවා. ඒ කාලේ මේ විද්‍යාල භාර ගන්න හිටියේ නැහැ. එහෙම තිබෙන්න ඇති දුෂ්කර පළාත්වල. නමුත් අපේ පළාත්වල එහෙම තිබුණේ නැහැ.දේශපාලන හේතූන් මත තමයි ඒ වැඩ බලන විදුහල්පතිවරුන්ව පත් කළේ. ජා-ඇළ වාගේ තැනකට යන්න අකමැති කවුද? වත්තල වාගේ තැනකට යන්න අකමැති කවුද? ඒවාට යන්න අකමැති නැහැ. දැනුත් දැම්මොත් පැනලා යන්නේ. නමුත් එහෙම තැන් තිබෙනවා. ඒ නිසා කරුණාකර, ඒ විදුහල්පති ශ්‍රේණි ලැබූ විදුහල්පතිවරුන්ව කරුණාකර ස්ථානගත කරන්න. එහෙම නැතිව ගියොත් ඒ චෝදනාව තමුන්නාන්සේට එනවා. ඒ නිසා නැති ප්‍රශ්න ඇති කර ගන්න එපා. (බාධා කිරීමක්) එහෙම තීන්දුවක් ගන්න. අවුරුදු හත අට වැඩ බලපු විදුහල්පතිවරු ඉන්නවා. ඒගොල්ලන්ටත් පරිපාලන ක්ෂේත්‍රය ගැන දැනීමක් තිබෙනවා. ඒ ගැන පරිපාලනමය තීන්දුවක් ගන්න. ඒක වෙනම කතන්දරයක්. ඒක කථා කරලා සාකච්ඡා මාර්ගයෙන් විසඳගන්න.

ඊළඟට අපි දන්නවා. දැන් මේ දිගට හරහාට පුළුවන් තරම් ගුරු පත්වීම්වලට තිබෙන අඩුපාඩු සපුරාගෙන යනවා. මම ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ ගුරු පුරප්පාඩු පිරෙව්වාට අපි දන්නවා, විද්‍යාලයට ගියාම උගන්වන්න ගුරුවරු නැහැ. මොකක්ද හේතුව? කාන්තාවන්ට ගුරු පත්වීම් ලබා දුන්නාම - ඇත්තටම මේක මානුෂික ප්‍රශ්නයක්. විවාහ වන වයස. ගර්භනී තත්ත්වයට පත් වෙනවා. එතකොට ඒ නිවාඩු ලබා දෙන්න ඕනෑ. එතකොට පන්තියේ ගුරුවරයා නැහැ. ඒ නිසා අඩුම තරමින් ගුරු පත්වීම් ලබා දෙන කොට 50% ක් 60% ක් පිරිමි ගුරුවරුන්ව දෙන්න. උපාධිධාරී ගුරු පත්වීම් දෙන කොට මේක සමහර විට වෙනස් වෙන්න පුළුවන්. ඒ නිසා මේ තත්ත්වය පොඩ්ඩක් අඩු කරලා, උසස් පෙළ සමත් පිරිමි අයටවත් මේ ගුරු පත්වීම් ලබා දෙන්න. එතකොට මේ තත්ත්වය සමනය වෙන්න පුළුවන්. අද විද්‍යාලවලට ගිහිල්ලා බලන්න. හුඟක් කලාපවලට ගිහිල්ලා බලන්න. ඉස්කෝලයක 80% ක් විතර ඉන්නේ කාන්තා ගුරුවරු. පිරිමි අය එන්නේ නැති හේතුවක් තිබෙනවා. එකක් උපාධිධාරී ගුරුවරුන්ව බඳවා ගන්න කොට ඒ උපාධිධාරී පිරිමි අය යනවා වෙන වෙන රස්සාවල්වලට. ඉහළ වැටුප්වලට. ඒක තමයි ඇත්ත කතන්දරය. නමුත් මේකේ තාක්ෂණික ගැටළුත් විසඳන්න පුළුවන්. උපාධිධාරී මට්ටමෙන් අඩු, උසස් පෙළ සමත් පිරිමි අයව ගත්තොත් මේ තත්ත්වය වෙනස් වෙන්න පුළුවන්. ඒ නිසා ඒ පිළිබඳව මේ පළාත් සභාවේ අපට තීරණයක් ගන්න පුළුවන් නම් හොඳයි.

ඊළඟට මම ගුරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. අපේ කලාපයේ ද්‍රවිඩ පාසලක් ආරම්භ කරන්නය කියලා තිබෙනවා. මේක දැන් අවුරුදු ගණනාවක් තිස්සේ එන ප්‍රශ්නයක්. කරුණාසේන කොඩිතුවක්කු මැතිතුමා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටි කාලයේත් ඇවිල්ලා මුල් ගලක් තිබ්බා. ද්‍රවිඩ කියන වචනයෙන් මේ පාසල විවෘත කරනවාට මම විරුද්ධයි. මේවාට විශාල ප්‍රශ්න එනවා. ඔලියාමුල්ලේ වත්තල මේ පාසල මහා විද්‍යාලයක් කියලා අරින්න. එතකොට මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න පුළුවන්.මම හිතන්නේ, දැන් මේ ගැටළු නිරාකරණය වෙලා තිබෙන්නේ. කරුණාකරලා මේ ප්‍රශ්නය විසඳන්න. මේක දැන් හිඟන්නාගේ තුවාලය වාගේ. හැමදාම එක කණ්ඩායමක් මේවාවලට උඩගෙඩි දෙමින් යනවා. පසුගිය දවසක මේකේ මුල් ගල තියන්න ඇවිල්ලාජානක සූරියබණ්ඩාර මැතිතුමාගේ වාහනයටත් ගල් ගැහුවා. මේ නැති ප්‍රශ්න ඇති කරන්නේ. (බාධා කිරීම්) ඇත්ත තමයි. එදා මම ගියා නම් මටත් ගහනවා. එදා මට යන්න බැරිව ගියා. එදා තමයි මගේ නෝනා අසනීප වුණේ. මට යන්න බැරිව ගියා. නැත්නම් මම යනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

නෝනා බේරගත්තා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම ඒකයි මේ කියන්නේ. ඒ නිසා කරුණාකරලා මේක ආරම්භ කරන්න. මොකද, අද වත්තල තිබෙනවා, ද්‍රවිඩ කතෝලික විද්‍යාලයක් කියලා එකක්. මේ ඉන්න කිසිම මන්ත්‍රීවරයෙකුව ගණන් ගන්නේ නැහැ. මේක ප්‍රසිද්ධියේ කියන්න ඕනෑ. කරුණාකර මේ ගැන පරීක්ෂණයක් කරන්න. තමන්ට ඕනෑ විධියට තමයි ඒ විදුහල්පතිවරයා වැඩ කරන්නේ. කොහේ අයවද මේ විද්‍යාලයට ගන්නේ කියලා. මම ඇත්ත වශයෙන්ම මේක ප්‍රසිද්ධියේ කියන්නත් අකමැතියි. ඉතාම අක්‍රමික විධියට කටයුතු කරන්නේ. මුදල් ගන්නවා. ඊයේ මේ චෝදනාව තමුන්නාන්සේට කළා. ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමාත් කළා. ඒ නිසා මේ විද්‍යාලය ආරම්භ කරන්න. මොකද, අපේ පළාතේ සීඝ්‍රයෙන් ද්‍රවිඩ ජනතාව පදිංචි වෙනවා. කොළඹින් එන අය. ඒ ළමයින්ට ඉගෙන ගන්න තැනක් තිබෙන්න ඕනෑ. කෝවිල් හැදෙනවා. පල්ලි හැදෙනවා. ඒ නිසා ඉගෙන ගන්න තැනක් තිබෙන්න ඕනෑ. සිංහල මිනිස්සු ඉඩම් විකුණලා යනවා නම්, ඒ දරුවන්ට ඉගෙන ගන්න තැනක් තිබෙන්න ඕනෑ. ඒ නිසා මේ විද්‍යාලය ආරම්භ කරන්නය කියන ඉල්ලීම මම කරනවා. ඒවාගේම ඇලපිටිවල චන්ද්‍රවංශ විද්‍යාලය. මම ඇමතිතුමාගෙන් 2017 අවුරුද්දට ඉල්ලන්නේ, එක ඉල්ලීමයි. මේ විද්‍යාලය අපට ගොඩ නගන්න ඕනෑ. මොකද, බෞද්ධ පාසලක් විධියට කරුණාරත්න බෞද්ධ විද්‍යාලය ගොඩ නැඟෙන කොට ඒ අවට අනික් දරුවන්ටත් යන්න තැනක් තිබෙන්න ඕනෑ. ඒ නිසා මේ විද්‍යාලය හදන්න. මගේ සිහිනය සැබෑ කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වාගේම වත්තල ශාන්ත ආනා විද්‍යාලයේ පැරැණි ගොඩනැගිල්ල බිමට සමතලා කළා. දැන් ඒ දරුවෝ ඉන්නේ කූඩාරම් යට. කූඩාරම් යට තමයි ඉගෙන ගන්නේ. මම හිතන්නේ, මේකට දැන් මුදල් වෙන් කරන්න තීරණය කරලා තිබෙනවා. මේ විද්‍යාල දෙකට තමුන්නාන්සේ විශේෂයක් දක්වලා ඒ මුදල ලබා දෙන්න. මොන තීන්දු ආවත්, මොන විධියේ බලපෑම් ආවත්, තමුන්නාන්සේ පිළිබඳව තීරණ ගන්න කියලා.මගේ හෘද සාක්ෂිය තමුන්නාන්සේට විරුද්ධව අත උස්සන්නේ නැහැයි කියන -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

උදේ කිව්වේ එහෙම නොවෙයි නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

උදේ තමුන්නාන්සේ එක්ක හොරෙන් කිව්වාට, මේ සභාවේ ප්‍රසිද්ධියේ කියන කාරණාව විශ්වාස කරන්න. තමුන්නාන්සේත් එක්ක ඒක හොරෙන් කිව්වාට, හැන්සාඩ් ගත කරන්න,මේ ප්‍රසිද්ධියේ කියන්නේ මගේ හෘද සාක්ෂිය රංජිත් සෝමවංශට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන්නේ නැහැයි කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 09.17]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික, කලා කටයුතු, ක්‍රීඩා හා තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. 2016 දී එතුමාගේ අමාත්‍යාංශයේ වෙන් වුණු මුදල්වලට - ඒ වාගේම මේ අවුරුද්දේ කරපු වැඩ කටයුතුවලදී, ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී අපි දැකපු දෙයක් තමයි පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හැටියට රුපියල් මිලියන 1120 ක් වෙන් කරලා තිබුණා. ඒ වාගේම පළාත් සංවර්ධන රුපියල් මිලියන 300 ක් වෙන් කරලා තිබුණා. ඒ වාගේම ලෝක බැංකු ආධාර යටතේ රුපියල් මිලියන 464 ක් වෙන් කරලා තිබුණා. නමුත් කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. දහවැනි මාසේ පළමුවැනිදා වන කොට රුපියල් මිලියන 1120 න් වියදම් කරලා තිබුණේ,රුපියල් මිලියන 200 යි. ඒ කියන්නේ ප්‍රතිශතයක් හැටියට ගත්තොත් 17.92% යි. ඒ වාගේම පළාත් සංවර්ධන මුදල් රුපියල් මිලියන 300 න්,රුපියල් මිලියන 38 යි වියදම් කරලා තිබුණේ. ප්‍රතිශතයක් හැටියට ගත්තොත් 12.09% යි තිබෙන්නේ. එතකොට ලෝක බැංකු ආධාර නම් අපි දන්නවා, මුදල් කොහොමත් ලැබෙනවා. ඒ නිසා වැඩ කටයුතු ක්‍රියාත්මක කරනවා. සමහර විට අමාත්‍යතුමා කියයි, අනුමත වෙලා තිබුණේ. වැඩ කරන්න - නමුත් එහෙම නොවෙයි. අපි දකින දේ තමයි අමාත්‍යාංශයක් හැටියට වැඩ කටයුතු කිරීමේදී, මුල් මාස හය මේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනවා නම්, මීට වඩා ප්‍රගතිය ඇති කරගෙන, අපි ගෙනියන්න බලාපොරොත්තු වන අරමුණ කරා අපට මේ අමාත්‍යාංශය ගෙනියන්න පුළුවන් වෙනවා කියන එක තමයි මන්ත්‍රීවරු හැටියට අපි විශ්වාස කරන්නේ.

ඒ නිසාම තමයි මේ අවුරුද්දේ 2017 වසරේ එතුමා විශාල උත්සාහයක් අරගෙන තිබෙනවා. මධ්‍යම ආණ්ඩුවට කාරණා හයක් ඉදිරිපත් කරලා, මේ කාරණා හය තුළ රුපියල් මිලියන 1995 ක් ඉල්ලලා තිබෙනවා. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හැටියට. නමුත් ලැබිලා තිබෙන්නේ,රුපියල් මිලියන 180 යි. ඒ වාගේම 2016 දී ලැබුණු මුදල් අනුව මේ අවුරුද්දේ ලැබුණු මුදලත් එක්ක බලන කොට රුපියල් මිලියන 940 ක අඩුවක්තිබෙනවා. එක පැත්තකින් ලක්ෂ 94,000ක්ලැබෙන්නේ නැහැයි කියන එක අද ඔප්පු වෙලාතිබෙනවා.

ඒ වාගේම තමයි මේ සභාවේ පොදු සාකච්ඡාවේදී කිව්වා, රුපියල් මිලියන 7057 ක පරිපූරක ඇස්තමේන්තුවක් දාලා අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කළා කියලා. ඒ වාගේම රුපියල් මිලියන 7057 න් අද වන කොට රුපියල් මිලියන 3000 කට වැඩි ප්‍රමාණයකට ගිවිසුම් ගත වෙලා තිබෙනවා, බස්නාහිර පළාතේ පාසල්වලට. පාසල් බැලුවොත්, අපි දන්නවා. ඒකේ වෙන් වෙන් වශයෙන් වෙන් කරලා තිබෙනවා, A B C D කියලා. හොඳම පාසල ළඟම පාසල හැටියට. ඒ වාගේම 1 AB, 1 AC පාසල් හැටියට වෙනමම වෙන් කරලා තිබෙනවා. ප්‍රාථමික පාසල් වෙනමම වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පාසල් 758 ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම එක් එක් වර්ගීකරණය කරලා. ඒ වාගේම තවත් පාසල් 500 කට ආසන්න සංඛ්‍යාවක් තිබෙනවා, 1280 යටතේ. හැබැයි, මේ වන කොට රුපියල් මිලියන 3000 කට ගිවිසුම්ගත වෙලා, අද වැඩ පටන් ගන්නවා. හැබැයි, ඒකේ බලාපොරොත්තු වෙනවා, 2017 වසරේ අග වන කොට මේ වැඩ සටහන් ටික ඉවර වෙයි කියලා. නමුත් මේකේ තිබෙනවා, 2016 – 2020 අතර අවුරුදු පහක වැඩ සටහනකට තමයි රුපියල් මිලියන 7000 ක් ගෙවන්නේ කියලා එය මේ එතුමා දුන්න පොතේම සඳහන් කරලා තිබෙනවා. හිටපු ප්‍රධාන ලේකම්තුමිය අවබෝධතා ගිවිසුමක් අත්සන් කරලා තිබෙනවා. නමුත් අද වන කොට පළාත් සභාවට ලැබිලා තිබෙන්නේ රුපියල් මිලියන 333 යි. දැන් අපි විශ්වාස කරනවා, පළාත් සභාවට මේ මුදල් ලැබුණේ නැත්නම් පළාත් සභා මුදල් තමයි ලබන 2017 වන කොට මේකට වියදම් කරන්න වෙන්නේ. මොකද, රුපියල් මිලියන 3000 කට ආසන්න ගිවිසුම් ගත වෙලා වැඩ භාර ගත් ව්‍යාපෘතිවලට මුදල් ගෙවීමට අවශ්‍ය වනවා. ඒ වැඩ සටහන් කරලා මුදල් ගෙවීමේදී මධ්‍යම ආණ්ඩුවෙන් මුදල් පරක්කු වුණොත්, අපට මුදල් ගෙවීමක් කරන්න වෙනවා. මොකද, ගිවිසුම් ගත වෙලා තිබෙන නිසා. ඒ නිසා මේ ගැන විශේෂයෙන් ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ ගැනත් අවධානය යොමු කරන්න. මොකද, නැත්නම් මුදල් නොලැබුණොත්, අපේ පළාත් සභාවේ මුදල් තමයි මේකට ගෙවන්න වෙන්නේ.

ඒ වාගේම තමයි ගරු ඇමතිතුමා ප්‍රාථමික හා ද්විතියික ගුණාත්මක සංවර්ධනය කියලා පැහැදිලිවම මේ පොතේ දාලා තිබෙනවා. විශේෂයෙන්ම අපිත් කලාප කාර්යාලවල සහ කලාප රැස්වීම්වලට ගියාම මේ ප්‍රගතිය බලන නිසා එතුමා එක පැත්තකින් පෙන්වලා තිබෙනවා, මේකේ ශිෂ්‍යත්ව ප්‍රතිශතය, සාමාන්‍ය පෙළ ප්‍රතිශතය, උසස් පෙළ ප්‍රතිශතය යම්කිසි දශම ගණනක් වැඩි කරලා තිබෙනවාය කියලා. ඒ වාගේම තවත් පැත්තකින් එතුමාට පැහැදිලි කරන්න ඕනෑ. මම හිතන්නේ, පොතේ 11 වන පිටුවේ තිබෙනවා. ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය කියලා. මේකේ අපි දකිනවා, ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් විෂයයන් වෙනුවෙන් වෙන් කරලා මේ අවුරුද්ද පුරා මිලියන 121 ක් ආයෝජනය කරලා තිබෙනවා. එතකොට අපි දැකපු දේ තමයි හර විෂයන්වලට - මේ හර විෂයයන් සඳහා විශේෂයෙන්ම සාමාන්‍ය පෙළ, උසස් පෙළ දරුවන් සඳහා වෙන් වන විෂයයන්වලට වැඩ සටහන් ක්‍රියාත්මක කරලා, පුහුණු ධාරිතා වැඩ සටහන් කරන කොට සිසුන් සහ ගුරවරුන් අඩුවෙන් තමයි සහභාගී වෙලා තිබෙන්නේ.

ඒ වාගේම අනික් පැත්තෙන් හර විෂයයන් නොවන විෂයයන්වලට. විශේෂයෙන්ම සෞන්දර්ය, ක්‍රීඩා විෂයයන්වලට. හර විෂයයන්වලට වඩා පස් ගුණයකින් දරුවන්ගේ සහ ගුරුවරුන්ගේ සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. එතකොට අපි අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම මේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී හර විෂයයන්වලට සිසුන්ව වැඩි අවධානය යොමු කරලා සහභාගී කරවා ගන්න ඕනෑ. මොකද, හර විෂයයන්වල මේ පුහුණු ධාරිතා වැඩ සටහන් අඩු වන නිසා තමයි සාමාන්‍යපෙළ සහ උසස් පෙළ දරුවන්ගේ ප්‍රතිශතයේ අඩු වීමක් වෙන්නේ. මොකද, අපි හැම අවුරුද්දේම මුදල් වියදම් කරනවා. හැම අවුරුද්දේම වැඩ සටහන් ක්‍රියාත්මක කරනවා. සිසු පාදක, පාසල් පාදක, ගුරු පාදක කියලා වැඩ

[ගරු මෙරිල් පෙරේරා ]

සටහන් ක්‍රියාත්මක කරනවා. නමුත් ප්‍රතිශතයක් හැටියට ගත්තොත්, දශම ගණනක් විතරයි අපට ප්‍රතිශතයක් හැටියට ලබන්න පුළුවන් වෙන්නේ. ලොකු ප්‍රමාණයක් ලබන්න බැහැ. නමුත් මුදල් ප්‍රමාණය වියදම් වන නිසා මේ ගැන අවධානය යොමු කරන්නය කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. උදාහරණයක් වශයෙන් කියන්න පුළුවන්, මේ අවුරුද්දේ වෙන් කරපු පුහුණු ධාරිතා වැඩ සටහන්වලින් මාස 10 ක් වන කොට මිලියන ගණනම ඉතිරියි. වියදම් කරලා නැහැ. දැන් උදාහරණයක් විධියට, හෝමාගම අධ්‍යාපන කොට්ඨාශයේ පුහුණු ධාරිතා වැඩ සටහන්වලට - මේ කාලේ ආරංචියක් තිබෙනවා. මේ කාලේ තමයි වැඩ සටහන් යොදා ගන්නේ. යොදා ගෙන ගම්පහ පැත්තේ පුහුණු ධාරිතා වැඩ සටහනකට ගිහිල්ලා, ගුරු විදුහල්පතිවරු ප්‍රශ්නයක් ඇති වෙලා, ඒ ප්‍රශ්නයේදී පුහුණු ධාරිතා වැඩ සටහන්වලට ගිය අයට ධාරිතා වැඩ සටහන් නොවෙයි කරලා තිබෙන්නේ. විනෝද චාරිකා විධියට. අන්න ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්නය කියලා අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, මාස 10 ක් වන තුරු මේ වැඩ සටහන කරන්නේ නැහැ. අන්තිම මාස දෙකේ තමයි වැඩිපුරම වැඩ සටහන්වලට මුදල් වෙන් කරලා, මේ වැඩ සටහන් ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා මාස දහයක්ම මුදල් වියදම් කරන්න බැරි වෙලා තිබෙනවා. මේ ගැන අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, අපි මීට ඉහතත් කථා කළා, මේ සුපසන් ගුරු පවුර ජීවිත රක්ෂණාවරණය පිළිබඳව. මේක 2014 – 2015 පටන් ගත්තේ. මේ වැඩ සටහන හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා අධ්‍යාපන ඇමතිවරයා හැටියට රක්ෂණ සංස්ථාවත් එක්ක සාකච්ඡා කරලා මේ නිලධාරීන්ට, ගුරුවරුන්ට සහ විදුහල්පතිවරුන්ට සියලු දෙනාට මේකට එකතු වෙලා, මේ රක්ෂණාවරණය ලබා ගන්න කියලා ඉල්ලීමක් කරලා පළමුවැනි අවුරුද්දේම 7122 ක් මේ රක්ෂණ ආවරණය ලබා ගත්තා. මේ රක්ෂණ ආවරණය ලබා ගෙන රු. 900 ක් තමයි අවුරුද්දට වෙන් කළේ. එයින් රු. 450/- ක් පළාත් සභාවෙන් දැරුවා. අනික් රු. 450/- ක දායකත්වය ලබා දුන්නේ, රක්ෂණාවරණය කරන පුද්ගලයා. ඒ වන කොට රුපියල් මිලියන 6.4 ක් වෙන් කරලා මේ මුදල සම්පූර්ණයෙන්ම ගෙවලා තිබෙනවා. ඒකට නැවත ප්‍රතිලාභ හැටියට 2014 වසරේ මරණ 05 ක් හා අසාධ්‍ය රෝග හැටියට රුපියල් මිලියන 6.25 ක් ලැබිලා තිබෙනවා. ඒ වාගේම 2015 දී නැවත 9440 දෙනෙකු රක්ෂණාවරණය ලබා ගන්න කොට 2015 වසරේ මරණ 04 ක්, අසාධ්‍ය රෝග 15 ක් සහ හදිසි අනතුරු හැටියට 21 දෙනෙකුට රුපියල් මිලියන 10.15 ක්ලබා දීලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ප්‍රධාන අමාත්‍යතුමාගෙනුත්, අධ්‍යාපන ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කළා, 2016 වසරේත් මේ වැඩ සටහන ක්‍රියාත්මක කරන්න කියලා. මොකද, අත්‍යවශ්‍යම කරුණක් නිසා.

ගරු සභාපතිතුමනි, මේ 2016 වසරට රක්ෂණ සංස්ථාවෙන් මුදල වැඩි කළා, රු. 1022 ක්. ඒ කියන්නේ රු. 122 ක් වැඩි කළේ. රු. 37.50 ක් මාසයට වෙන් වන මුදල රු. 42.50 යි. පොඩි ගණනක් වෙන් වෙන්නේ. නමුත් 2016 වසරේ මේක ක්‍රියාත්මක කළේ නැහැ. නමුත් ගුරුවරුන් නොවන විදුහල්පතිවරුන් නොවන පළාත් රාජ්‍ය සේවයේ ඉන්න නිලධාරීන්, 572 අතින් ගෙවලා මේ රක්ෂණාවරණය ලබා ගත්තා. නමුත් ගුරුවරුන්ට විදුහල්පතිවරුන්ට මේ රක්ෂණාවරණය ලබා දෙන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ නිසා මම අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේකෙන් ප්‍රතිලාභ ලැබුණු අය, හදිසි අනතුරු වුණු අය, ඒ වාගේම මරණ වුණු අය, අසාධ්‍ය රෝග ඇති වූ අය මේකේ වටිනාකම දැක්කා. ඒ නිසා තමයි වසරින් වසර මේ ඉන්න රක්ෂණලාභීන් ප්‍රමාණය වැඩි වුණේ. අන්න ඒ නිසා මේ රු. 122 දිහා බලන්නේ නැතිව - අනික මේ මොහොතේ ඉල්ලීමක් කරලා තිබෙනවා, ඒ අය ඉතිරි මුදල දරන්නම් කියලා. ඒ අය දරනවා නම්, මේක 2017 වසරේ ලබා දීමට කටයුතු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. මොකද, මේක අත්‍යවශ්‍යම කරුණක් නිසා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපි අවුරුදු ගණනාවක් 'සුපසන් නිම්තෙර' වැඩ සටහන යටතේ පාසල් වර්ණ ආලේප කිරීමට චෙක්පත් ලබා දෙන වැඩ සටහන ක්‍රියාත්මක කළා. මෙතුමා ගිය අවුරුද්දේ කිව්වා, මට ලැබුණු කාල සීමාව මදී. මට ලැබුණු කාර්ය මණ්ඩලය මදී. මේ අවුරුද්දේ කරන්න බැහැ. ලබන අවුරුද්දේ මේ වැඩ සටහන අපි ක්‍රියාත්මක කරනවාය කියලා. අපි ඒ වැඩ සටහන මුළු බස්නාහිර පළාතේම පාසල් තෝරා ගෙන, පාසල් සිසු අනුපාතය අනුව චෙක්පත් ලබා දුන්නා. ශිෂ්‍යත්ව සහතික ලබා දුන්නා. පාසලට ගිහිල්ලා, පාසලේ ප්‍රතිඵල සංවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ ප්‍රතිඵල බලලා,

යම්කිසි වැඩ පිළිවෙළක් බස්නාහිර පළාතේම ක්‍රියාත්මක කර ගෙන ගියා. නමුත් ගිය අවුරුද්දේ වුණේ නැති වුණාට කමක් නැහැ. මේ අවුරුද්දෙත් ඒ වැඩ සටහන ක්‍රියාත්මක වුණේ නැහැ. එතුමාට 2017 වසරේ මේ බස්නාහිර පළාතේ ඒ වැඩ සටහන අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරන්නය කියලා ඉල්ලා සිටිනවා. එය අත්‍යවශ්‍ය කරුණක් කියලා මතක් කරමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාටම බොහොම ස්තුතියි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මම මේ පළාත් සභාවේ සැසිය ආරම්භයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙක්. මම මාසයකට වැඩි කාලයක් අසනීප වෙලා හිටියා. නිවාඩු යෝජනාවක් අනුව. මම සුමිත් ලාල් මැන්දිස් සභා කටයුතු අමාත්‍යතුමාටත්, ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත් කිව්වා මෙය නිවැරදි කරන්නය කියලා. ඊට පස්සේ මාව මේ උපදේශක කාරක සභාවෙන් ඉවත් කරලා තිබෙනවා. මම කිව්වා, මම වැඩ කොටසක් පටන් අරගෙන තිබෙනවා. මේ සැසිවාරය ආරම්භයේ මම හිටියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ. ඒ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු හැටියට ප්‍රසන්න රණතුංග හිටපු ගරු ඇමතිතුමා මාව පත් කරලා තිබෙනවා. ඒ නිසා කරුණාකර මම කර ගෙන ආපු වැඩ කොටස ඉස්සරහාට කර ගෙන යන්න ඕනෑ. මට ඒ අවස්ථාව දෙන්නය කියලා. මම ඊයේ තමයි දන්නේ, මම අධ්‍යාපන උපදේශක කාරක සභාවේ නැහැයි කියලා. ඊයේ දවසේ දන්නේ. අපි මේ සභාවේ ඉන්න ධුරධාරීන්ව විශ්වාස කරනවා. ඔවුන් වචනයක් කිව්වාම, ඒ වචනයේ බරක් තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. ඔවුන් සාමාන්‍යයෙන් ආවාට ගියාට වාචාලයෝ වාගේ කථා කරන්නේ නැහැයි කියන එක අපි විශ්වාස කරනවා. ඒ නිසා ඒ තත්ත්වය නිවැරදි කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, මේ උපදේශක කාරක සභා අමාත්‍යාංශවලින් පත් කළාට, ඔබතුමාගේ වගකීම යටතේ තමයි පවතින්නේ. ඒ නිසා කරුණාකරලා මේක නිවැරදි කරන්න. අපේ ආත්ම ගරුත්වය මේ විධියට හෑල්ලු කරන්න මේ සභාවේ කටයුතුවලදී තිබෙන ඉඩකඩ මෙපමණට විවර කරන්න එපාය කියලා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේක නිවැරදි කරන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමා, ඉන්නවා. ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරන්න. මොකද, එතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. හිටපු සභාපතිවරයෙක්.එතුමා ඉල්ලීමක් කළා කියලා ප්‍රකාශ කළානේ? ඔබතුමා ඉල්ලීමක් කළාද?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඔව්. මම ඉල්ලීමක් කළා. සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමා මේ ස්ථානයට ආවාම ඒක පොඩ්ඩක් - මම ඊයෙත් විමසුවා. මේක ආරංචි වුණු වෙලාවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අවස්ථාවේත් මම උපදෙස් දුන්නා, අධ්‍යාපන අමාත්‍යාංශයේ පත් කරන උපදේශ කාරක සභාවට විශේෂයෙන්ම ජ්‍යෙෂ්ටත්වය සලකා බලන්නය කියලා. මම හිටපු සංවිධායකතුමාටත් ඒක මතක් කළා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, අපි ඒ ප්‍රදේශවල ගිහිල්ලා අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරු හැටියට පෙනී සිටිමින් වැඩ කරනවා. ඊට පස්සේ එයා එහෙම කෙනෙක් නොවෙයි කිව්වාම - ලොකු නින්දාවක්, අපහාසයක් වෙනවා. අපව අපහසුතාවයට පත් වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා එතුමාට ඒ අවස්ථාව ලබා දෙන්න කියලා. මමත් ඒ ගැන සොයා බලන්නම්.

[පූ.භා. 09.30]

**கௌரவ எஸ்.குஹவரதன்**
**ගරු එස්. කුහවර්දන්**

மதிப்பிற்குரிய தவிசாளர் அவர்களே, பிரதித் தவிசாளர் அவர்களே, கௌரவ முதலமைச்சர் அவர்களே, இச் சபையிலே வீற்றிருக்கின்ற சிரேஷ்ட அமைச்சர்களே, ஏனைய சிரேஷ்ட மாகாண சபை உறுப்பினர்களே, உங்கள் அனைவருக்கும் எனது காலை வணக்கம்.

[கௌரவ எஸ்.குஹவரதன்]

இன்றைய இந் நிகழ்வின் காதாநாயகனானமேல் மாகாண சபையின் கல்வி அமைச்சர் கௌரவ ரஞ்சித் சோமவன்ச அவர்களின் அமைச்சின் கீழ் இவ் உரையை ஆற்றுவதற்கு எனக்கு சந்தர்ப்பமளித்தமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன். எல்லா மாகாண சபை உறுப்பினர்களுக்கும், அமைச்சர்களுக்கும் நான் நன்றியைத் தெரிவித்தது ஏனென்றால்,2011 ஆம் ஆண்டு கொழும்பு மாநகர சபைக்கு ஐந்தாயிரம் வாக்குகளுடன், எனது தலைவர் கௌரவ மனோ கணேஷன் அவர்களின் மூலம் அரசியலுக்குள் பிரவேசித்த நான், 2014 ஆம் ஆண்டு இருபதுனாயிரம் வாக்குகளுடன் மேல் மாகாண சபைக்கு முதல் முறையாக தெரிவு செய்யப்பட்டு, கடந்த பாராளுமன்றத் தேர்தலிலே நாட்பதாயிரம் வாக்குகளைப் பெற்றுப் பாராளுமன்றத்திற்கு செல்ல முடியாவிட்டாலும், மக்களின் ஆதரவைப் பெற்றதன் காரணம்,இந் நாட்டில் இன்று மொழி ரீதியான மற்றும் கல்வி ரீதியான பிரச்சினைதான் புரிந்துணர்வு இல்லாமைக்கான முக்கிய காரணமாகும். அப் புரிந்துணர்வு இருந்திருந்தால் முப்பது வருட கால அந்த யுத்தம் எப்பொழுதோ முடிவிற்குவந்திருக்கும்.

மேல் மாகாணத்தில் வாழுகின்ற மக்களுக்கு குறிப்பாக கொழும்பு, களுத்துறை, கம்பஹாமாவட்டமாகாண சபைக்கு உட்படுத்தப்பட்ட பாடசாலை மாணவர்களுக்கு தமிழ் கல்வி,கடந்த 2014 ஆம் ஆண்டுக்கு முன்னர் இருந்த ஆட்சியாளர்களினால் திட்டமிட்டு புறக்கணிக்கப்பட்டிருந்தது.

2015 ஆம் ஆண்டு ஜனவரி மாதம் 08 ஆந் திகதி இந் நாட்டிலே ஒரு நல்லாட்சி உதயமானது. அதற்குப் பின்னர் 2015 ஆம் ஆண்டு ஆகஸ்ட் மாதம் நடைபெற்ற பாராளுமன்றத் தேர்தலின் பின்னர் ஏற்படுத்தப்பட்ட "යහපාලන"என்று சொல்லப்படுகின்ற நல்லாட்சியின் மூலம் வரவழைக்கப்பட்ட எமது மாகாண அமைச்சர் கௌரவ ரஞ்சித் சோமவன்ச அவர்கள் தமிழ் பாடசாலைகள் மீது கொண்டிருக்கின்ற அக்கறை மற்றும் நன்மதிப்பு அப் பாடசாலைகளின் முறைபாடுகளை, ஆசிரியப் பற்றாக் குறைகளை மற்றும் வளப் பற்றாக் குறைகளை நிவர்த்தி செய்து அப் பாடசாலைகளை முன் கொண்டு வந்தார் என்றால் அது பாராட்டத்தக்க விடயமும், மிகவும் வரவேற்கத் தக்க விடயமும் ஆகும்.

அவ்வாறான அமைச்சர் அவர்களின் வழிநடத்தலின்கீழ் மேல் மாகாண பாடசாலைகளில் இருந்த குறைபாடுகள் படிப்படியாக முன்னோக்கி எடுத்துச் செல்லப்படுகின்ற வேளையில்,களுத்துறை போன்ற பெருந்தோட்டப் பகுதியைச் சேர்ந்த தோட்டப் புற பாடசாலைகளிலே ஆரம்பப் பாடசாலைகளுக்கான ஆசிரியர் பற்றாக்குறை நீண்ட காலமாக இருந்து வந்தது. உங்களுக்குத் தெரியும் தவிசாளர் அவர்களே, களுத்துறை போன்ற பகுதிகளிலேமிகவும் வருமைக் கோட்டின் கீழே வாழுகின்ற தோட்டப் புற பாடசாலை மாணவர்களுக்கு ஆரம்பக் கல்வி என்பது எட்டாக் கணியாகவே இருந்து வந்தது. அதற்கு கௌரவ கல்வி அமைச்சர் அவர்கள் 231 பயிற்றப்பட்ட ஆசிரியர்களை தயார் செய்து சமீபத்தில் அவர்களுக்கான அனுமதி வழங்கப்பட்டிருந்தது. 2017 ஆம் ஆண்டுமேல் மாகாணகொழும்பு,களுத்துறைகம்பஹா மாவட்டத்திலே ஒட்டுமொத்த தமிழ் பாடசாலைகளுக்கான ஆசிரிய பற்றாக்குறையை ஜனாதிபதியினதும், பிரதமரினதும் மற்றும் ஆளுநரினதும் பணிப்புரையின் பெயரில் அமைச்சர் அவர்கள் அடுத்த வருடம் பாடசாலை ஆரம்பிப்பதற்கு முன்னதாகவே நிவர்த்தி செய்து தருவதாக கூறியிருக்கின்றார்.

கௌரவ தவிசாளர் அவர்களே, உண்மையிலேயே இந் நாட்டிலே புரிந்துணர்வு இல்லாமைக்கு காரணமான மொழி ரீதியான பிரச்சினையை அடிமட்ட மக்களுக்கு எடுத்துச் செல்லக் கூடிய ஒரு ஊடகமாக கல்வி இருக்கின்றது.எனவேதமிழ் மாணவர்கள் சிங்களத்தையும், சிங்கள மாணவர்கள் தமிழையும் கற்பதன் மூலம் நிச்சயமாக எதிர்காலத்தில் இந் நாட்டில் வெகு விரைவாக ஒரு இனவாதம், மத வாதம், மொழி வாதம் இல்லாத ஒரு சிறந்த அரசாங்கத்தை உருவாக்குவதற்கு கல்வி ஒரு முக்கிய காரணமாக அமைகின்றது. எனவே அந்தக் கல்விக்கு முக்கியத்துவம் கொடுத்து மேல் மாகாணத்தை சிறந்த உதாரணமாக வழிநடாத்திச் செல்கின்ற ரஞ்சித் சோமவன்ச கௌரவ அமைச்சர் அவர்களை நான் பாராட்டுகின்றேன். அவரை நான் வரவேற்கின்றேன். எனவே இவ்வாறான அடிப்படைப் பிரச்சினைகளை மேல் மாகாணத்திலே தொடர்ச்சியாக கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுத்துச் சென்று தீர்க்க வேண்டும்.

கௌரவ தவிசாளர் அவர்களே, தெஹிவளை தமிழ் வித்தியாலயத்திற்கு அருகிலே உள்ள 40 பர்ச் காணியைபத்து வருட காலங்களுக்கு மேலாக ஒருவரால் பலாத்காரமாக

பிடித்து வைக்கப்பட்டிருக்கின்றது. அக் காணியை விடுவிப்பதன் மூலம் தெஹிவளை பிரதேசத்திலே ஒரு சிறந்த தேசிய பாடசாலையையோ, மாகாண பாடசாலையையோ உருவாக்க முடியும்.அதேபோல் நுகேகொட தமிழ் மஹா வித்தியாலயத்திற்கு மாணவர்கள் செல்லும் பாதை மிகவும் ஒரு இக்கட்டான நிலையிலே இருக்கின்றது. அதை ஒரு தேவாலயத்திற்கு சொந்தமாக கைப்பற்றப்பார்க்கின்றார்கள். எனவே அதையும் அமைச்சர் அவர்களின் கவனத்திற்கு கொண்டு வருகின்றேன். மோதரை இந்து வித்தியாலயத்திற்கு பின் பகுதியில் இருக்கின்ற 1984 ஆம் ஆண்டு அப் பாடசாலையில் இருந்து பிரிக்கப்பட்ட காணி அவர்களுக்குக் கொடுக்கப்படல் வேண்டும். அதேபோல தொண்டர் வித்தியாலயத்திலே பாடசாலை மாணவர்களின் வரவு குறைவாக இருக்கின்றது. ஆனால் அங்கே வளம் அதிகமாக இருக்கின்றன எனவே அப் பாடசாலையை மாவட்ட மாணவர்கள் தங்கியிருந்து படிப்பதற்கான விடுதி வசதியை செய்து கொடுப்பதன் மூலம் அப் பாடசாலையையும் அபிவிருத்தி செய்யலாம் என்று கூறிக் கொண்டு,

எமது தமிழ் பாடசாலைகள் தொடர்பாக நாம் எதைச் சொன்னாலும் அது தொடர்பாக உடனடியாக அதற்கான சகல நடவடிக்கைகளையும் மேற்கொள்ளும் மேல் மாகாண கல்வி அமைச்சரின் ஊழியர்கள் மற்றும் திரு. விஜயபந்து உட்பட அவரது சகல ஊழியர்களுக்கும் எமது நன்றியைத் தெரிவித்துக் கொள்வதுடன்,

மேல் மாகாண சபையின் திரு. ஹேமந்த சமரகோன் தலைமையிலான அனைத்து ஊழியர்களுக்கும் எனது நன்றியைத் தெரிவித்துக் கொண்டு,

கௌரவ தவிசாளர் அவர்களே, எமக்கு ஏராளமான வரப்பிரசாத பிரச்சினைகள் இருக்கின்றன இருந்தாலும், ஒரு இறுதி வேண்டுகோள் இவ்வாறான புத்தகங்கள் ஆண்டாண்டு காலமாக அச்சிட்டு எமக்கு வந்துகொண்டு இருக்கின்றன இவ்வாறு புத்தகங்களை அச்சிடாமல் ஒவ்வொரு மாகாண சபை உறுப்பினருக்கும் நவீன முறைப்படியான IPAD வசதியை அழிப்பதன் மூலமும்,Email செய்வதன் மூலமும் செலவுகளைக் குறைத்துக் கொள்ளலாம் என்று கூறி அவ்வாறான வரப்பிரசாதத்தை 2017 ஆம் ஆண்டு பெற்றுக்கொடுப்பீர்கள் என்ற நம்பிக்கையுடன், எதிர்வரும் 2017 ஆம் ஆண்டு பிறக்கின்ற புதுவருடம் எல்லோருக்கும் இனிமை நிறைந்த சக்தி நிறைந்த, அனைவரும் இலங்கையர் என்று சொல்லக் கூடிய ஒரு புது வருடமாக பிறக்க வேண்டும் என்று கூறி விடைபெருகின்றேன் நன்றி வணக்கம்.

[පූ.භා. 09.38]

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා, යෞවන කටයුතු හා තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කිරීමට මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු ඔබතුමාටත්, රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමාටත් මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වාගේම 2010 වසරේ කාලය තුළ පළාත් පාසල් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම නිසා ගුරු හිඟය පියවීමට කටයුතු කිරීම ගැන පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ප්‍රශංසා කරනවා. නමුත් දැනටත් ගුරු හිඟයක් පවතින නිසා විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු කොළඹ, මැද කොළඹ ප්‍රදේශයේ ප්‍රාථමික, ඉංග්‍රීසි, තොරතුරු තාක්ෂණ සහ චිත්‍ර වැනි විෂයයන් සඳහා පුරප්පාඩු පවතින දෙමළ මාධ්‍ය පාසල්වල දැනටමත් ගුරුවරු 600 ක පමණ ඌණතාවයක් පවතින බව වාර්තා වෙනවා. ඒ වාගේම එම අවස්ථාවලදී මෙය පියවා ගැනීම සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කිරීම ගැන ගරු ඇමතිතුමා ඇතුළු සියලු දෙනාට ප්‍රශංසා කරනවා. නමුත් මෙම පත්වීම් ලබා දීමේදී පිටස්තර ප්‍රදේශවල පදිංචි අය පත් නොකර, මෙම ප්‍රදේශයේ අය පත් කිරීමට කටයුතු කළ යුතුයි. පසුගිය කාලය තුළ බඳවා ගන්නා ලද උපාධිධාරීන් ස්ථාන මාරු වීම් සහ සේවය අතහැර තමන්ගේ පදිංචි ප්‍රදේශවලට පත්වීම් ලබා ගෙන ඇති බව මේ අවස්ථාවේදී දන්වා සිටිනවා. පළාත් පාසල්වල අධීක්ෂණ කටයුතු සඳහා විධිමත්ව කටයුතු කළ යුතුයි. විශේෂයෙන්ම දෙමළ මාධ්‍ය සඳහානිලධාරී හිඟය බාධා වී තිබෙනවා. කොළඹ, කළුතර, මීගමුව, හොරණ, හෝමාගම කලාපවල සුදුසු නිලධාරීන් නැහැ. බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දෙමළ මාධ්‍ය නිලධාරීන්ගේ අවශ්‍යතාවයක් පවතිනවා. එය සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුයි. දැනට සිටින එම නිලධාරීන්ගෙන් පළාතේ කාර්යයන් ඉටු කිරීමට නොහැකි බව මම ගරු ඇමතිතුමාට දන්වා සිටින්න කැමැතියි. ගුරු පුහුණු අධීක්ෂණ, විනය සම්බන්ධ ගැටළු සඳහා අවශ්‍ය

[ගරු මොහොමඩ් ෆායිස්]

නිලධාරීන් සිටිය යුතු අතර, ඔවුන් පළපුරුදු අයගෙන් සමන්විත විය යුතුයි. දෙවන බස සිංහල, දෙමළ බස නිවැරදිව ඉගැන්වීමට ගුරුවරුන් පත් කර ඔවුන්ට පුහුණුවක් ලබා දිය යුතුයි. තවද, අනෙකුත් විෂයයන් නගා සිටුවීමේදී ආදර්ශ පොත් ලබා දීමට කටයුතු කළ යුතුයි. විද්‍යාව, ගණිත විෂයයන් සඳහා එවැනි පොත් ලබා දීම අගය කරනවා.

කොළඹ කලාපයේ විශාල ගුරු අතිරික්තයක් පවතින හෙයින් තුලනය කිරීමට කටයුතු කළ යුතුයි. විශේෂයෙන් විද්‍යාව, ගණිතය අධික ගුරුවරුන් තුලනය කරන්න අවශ්‍යයි. ගුරුවරුන් තුලනය කරනවා කියන්නේ පාසලට ගිහිල්ලා - මම මේ ගැන පසුගිය උපදේශක කාරක සභාවල, එහෙම නැත්නම් ලේකම්තුමාත් එක්ක ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කළාම, නිලධාරීන් ගිහිල්ලා තුලනය කරලා තිබෙන්නේ කොහොමද? ළමයි 49 ක් එක පන්තියට අරගෙන එහෙම තුලනය කරන්න ගියොත් සමහර වෙලාවට ඒ දරුවන්ට නිසි ලෙස අධ්‍යාපනය ලබා ගැනීමට අපහසු වෙනවා. ඒ නිසා මට මතකයි. පසුගිය වසරවලදී අපි තීරණයක් ගත්තා, දරුවන් 20 කට එක ගුරුවරයෙක් ලබා දිය යුතුයි කියලා. මම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නෝනිස් මහත්මයාගෙන්, ඒ වාගේම ලේකම්තුමාගෙන්, ඒ වාගේම විජේතුංග මහත්මයා ඇතුළු ඒ සියළුම නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර එම දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් සරිලන ගුරු තුලනයක් කරන්නට ඇමතිතුමා උපදෙස් ලබා දෙයි කියලා.

ඒ වාගේම පාසලකට අවශ්‍ය භෞතික සම්පත් ලබා දීමට කටයුතු කළ යුතුයි. ඒ සඳහා පාසල්වලින් විස්තර ලබා ගෙන ඇති බව සඳහන් කරනවා. ආගමික ගුරුවරුන් පාසලට පත් කිරීමට කටයුතු කළ යුතුයි. ප්‍රාථමික පන්තිවලට ළමයින් නිසි පරිදි ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුයි. තවද, මේ පාසල්වල ඉඩකඩ පහසුකම් ඇතත් එවැනි පාසල්වල පරිසරය නිසි පරිදි කළමනාකරණය කොට, අධ්‍යාපනයේ ආකල්ප මනා වෙනසක් ඇති කර, එම පාසල් දියුණු කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වාගේම ආගමික නිදහස තහවුරු කිරීමට මෙම සභාව බැඳී සිටින අවස්ථාවකදී මෑතකදී සිදු වූ සිදුවීමක් සඳහන් කරන්න කැමැතියි. පළාත් පාසල්වල වන්දනා සඳහා විදේශ නිවාඩු අනුමත කිරීම ආණ්ඩුකාරතුමා විසින් සිදු කළ යුතුව තිබෙනවා. 2016 වර්ෂයේදී ශුද්ධ වූ හජ්ජි වන්දනාව සඳහා විධිමත්ව ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ ගම්පහ අල් හසාර් විදුහලේ සහ දාරුසලාම් විදුහලේ ගුරුවරුන් දෙදෙනෙකුගේ ඉල්ලුම්පත්‍ර ආණ්ඩුකාරතුමා විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් වැඩ තහනම් කිරීමට කලාප කාර්යාලය පියවර ගැනීම කනගාටුදායක සිදුවීමක්. වන්දනාවෙන් පසු නැවත සේවයේ පිහිටුවා ගැනීම සඳහා කටයුතු කර ඇතත්, එය ලබා දී ඇත්තේ නොයෙකුත් කොන්දේසි මත. ඒ වාගේම බේරුවල කොට්ඨාශයේ නිවාඩු සඳහා ඉල්ලුම් කළ තිදෙනෙකුට අවසර ලබා දී ඇතත්, ඔවුන් ඉල්ලුම්පත්‍ර අවසන් මොහොතේදී ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන තිබෙනවා. ඒ නිසා කලින් අනුමැතිය සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ අයගේ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීම කනගාටුවට කරුණක්. ඒ නිසා මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා ඉදිරියේදී මෙවැනි සිදුවීම් ඇති නොවීමට කටයුතු කරන්නය කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම විශේෂයෙන්ම උතුරු කොළඹ පාසල්වල තිබෙන්නා වූ ඌණතාවයන් ගැන, ඒ වාගේම ගුරු පුරප්පාඩු ගැන, කියන්න ඕනෑ. ඒ වාගේම පාසල්වලට භෞතික සම්පත් ලබා දීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය විශේෂයෙන්ම යොමු වෙන්න ඕනෑ. ඒ වාගේම පළාත් ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරීන්ගේ අවධානය යොමු වෙන්න ඕනෑ. මම ඉල්ලා සිටිනවා, කොටහේන කුමාර විද්‍යාලය, මට්ටක්කුලිය ශාන්ත ජෝන් විද්‍යාලය, මහවත්ත ශාන්ත අන්තෝනි විද්‍යාලය, මට්ටක්කුලිය සර් රාසික් ෆරීඩ් විද්‍යාලය, මෝදර හම්සා විද්‍යාලය, මහවත්ත ශාන්ත අන්තෝනි විද්‍යාලය, කොළඹ 13 ශාන්ත අන්තෝනි පිරිමි විද්‍යාලය වැනි පාසල්වල ගොඩනැගිලි ඉදි කිරීම සඳහා හිටපු ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින් විශාල මුදල් පරිත්‍යාගයක් කොළඹ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් අපට ලබා දුන්නා. නමුත් එම පාසල්වල එම අමාත්‍යාංශය හරහා එතුමා ඒ ලබා දුන්, භෞතික සම්පත් පිරවීම තුළින් විශාල වශයෙන් එතුමා ඒ වෙනසක් ඇති කරන්නට කල්පනා කළා. ඒ සඳහා ඒ පාසල්වලට භෞතික සම්පත් ලබා දෙන්නට, ඒ ගොඩනැගිලි ලබා දෙන්නට පියවර ගත්තා. නමුත් ඒවා අඩක් නිම වූ ගොඩනැගිලි වශයෙන් දැනට

පවතිනවා. සමහර පාසල්වල මම ගිය වසරේ සිටම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීම් කළත්, ඒ ඉල්ලීම්වලට මම හිතන විධියට අමාත්‍යාංශයේ මුදල් නැති වීම හේතුවෙන් ඒවා කර ගන්නට බැරි වුණා. ඒ නිසා මම හිතන විධියට ලබන අවුරුද්දේ එතුමාට මුදල් සමහර වෙලාවට අඩු වෙන්න පුළුවන්. වැඩි වෙන්න පුළුවන්. නමුත් විශේෂ අවධානයක් යොමු කරලා මේ පාසල්වල තිබෙන්නා වූ ප්‍රශ්න ටික විසඳන්නට අපට සාර්ථක විසඳුමක් දෙයි කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම අපට උපදේශක කාරක සභාවලමේවා කථා කරලා තීන්දු තීරණ ගන්න පුළුවන්. මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. ලබන වසරේදී කොටහේන රෝමාණු කතෝලික විද්‍යාලයට ගොඩනැගිල්ලක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ වාගේම සංඝමිත්තා විද්‍යාලයට ගොඩනැගිල්ලක් අවශ්‍ය වෙලා තිබෙනවා. සංඝබෝධි විද්‍යාලයට ගොඩනැගිල්ලක් අවශ්‍ය වෙලා තිබෙනවා. අල් හිදායා විද්‍යාලයට අලුතෙන් ගොඩනැගිල්ලක් අවශ්‍ය වෙලා තිබෙනවා. ශාන්ත ආනා බාලිකා විද්‍යාලයට ගොඩනැගිල්ලක් අවශ්‍ය වෙලා තිබෙනවා. හම්සා විද්‍යාලයට ගොඩනැගිල්ලක් අවශ්‍ය වෙලා තිබෙනවා. ප්‍රෙස්බිටීරියන් විද්‍යාලයට ගොඩනැගිල්ලක් අවශ්‍ය වෙලා තිබෙනවා. අල් හික්මා විදුහලට ගොඩනැගිල්ලක් අවශ්‍ය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මම කලෙයි මගල් විද්‍යාලය ගැන කියන්නට ඕනෑ. කොළඹ කොට්ඨාශ කාර්යාලය වෙනත් තැනක තිබුණේ. රාජසිංහ විද්‍යාලය. අපි ඒක කලෙයි මගල් විද්‍යාලයට ගත්තා. කලෙයි මගල් විද්‍යාලයේ ගොඩනැගිල්ලක තමයි දැන් කොට්ඨාශ කාර්යාලය පිහිටා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා තවත් කාලය දෙන්න අපහසුයි.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඒ කාලයේදී අපි එතුමන්ලාට පොරොන්දු වුණා,ඉක්මණට ගොඩනැගිල්ලක් දෙන්නම් කියලා. ඒ නිසා 2017 වර්ෂයේදී ඒ සඳහා ගොඩනැගිල්ලක් දීමට අධ්‍යාපන ඇමතිතුමා තීන්දු තීරණ ගන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම මම හිතන්නේ නැහැ, මේ ඔක්කොම එකවර කර ගන්න මුදල් තිබෙයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මේ අවුරුද්දට ඇති.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

නමුත් 2017 වර්ෂයේදී ලබා දීමටත් බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2017 ට වැඩියි කියපු ඒවා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඒ වාගේම ගරු අමාත්‍යතුමා, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය, හේමචන්ද්‍ර මහතා, විජේතුංග මහතා ඇතුළු සියලුම නිලධාරීන්ගේ සහයෝගය අපට විටින් විට ලැබෙනවා. අපි ගිහිල්ලා කථා කරනවා. හැමදාම වාගේ මම එතුමාගේ අමාත්‍යාංශයට යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මමත් දකිනවා. ඔබතුමා හැමදාම එහේ ඉන්නවා. දැන් කථාව අවසන් කරන්න.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඒ නිසා ඒ සියලුම නිලධාරීන්ටත්, ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ලබන වසරේදී මේ සියල්ලටම යම් කිසි පිළිතුරක් ලබා දෙයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ගුරුවරුන් බඳවා ගැනීමත් ඉක්මන් කරලා, 2017 වර්ෂයට ලබා දීමට හැකි වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, ලබන වසර සුභ වසරක් වේවායි කියලා ප්‍රාර්ථනා කරමින්, අධ්‍යාපන අමාත්‍යාංශයට වැඩි සැලකිල්ලක් ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 09.50]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මා විශ්වාස කරන්නේ, පළාත් සභාවක විෂය පථය තුළ ඉතාමත්ම වැදගත් අමාත්‍යාංශය වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය. අධ්‍යාපන අමාත්‍යාංශයට සහසම්බන්ධව සංස්කෘතික හා කලා කටයුතු, ඒ වාගේම ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යාංශයක් අනුබද්ධ වෙලා තිබෙනවා. මම හිතන්නේ, මේ සභා ගර්භයේ වැඩියෙන්ම කථා වෙනවා ඇත්තේ, අධ්‍යාපනය පිළිබඳවයි. මම අධ්‍යාපනය ගැනම කථා කරන්න යන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මගේ කථාව වෙනතක යන්න ඉස්සෙල්ලා ලොකු අවධානයක් යොමු කරන්න කල්පනා කරනවා. මොකද, මමත් ඔය මූලාසනයේ ඉන්න කොට හැම වෙලාවේම කියන්න වෙනවා, ගරු මන්ත්‍රීතුමා තව විනාඩියයි තිබෙන්නේ කියලා. ඒ මොකද, ඔබතුමාට මේ ඔරලෝසුව පේනවා. නමුත් කථා කරන හැම මන්ත්‍රීවරයෙකුම ඔබතුමා දිහා බලාගෙනයි කථා කරන්නේ. එතකොට ඔරලෝසුව ඇහැ ගැහෙන්නේ නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා, මේ ඉස්සරහා හොඳ ඔරලෝසුවක් සවි කරන්නය කියලා. එතකොට අපි ඔරලෝසුව දකිනවා. ඔබතුමාට කියන්න ඕනෑ නැහැ. එතකොට අපේ කථාව කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තූතියි. ඒ ගැන ඉක්මණින් ක්‍රියා කරනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒ ගැනත් සඳහන් කරමින් අද ෆායිස් මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී ස්තුති කළා. ලේකම්තුමාගේ, අරගොල්ලන්ගේ මේගොල්ලන්ගේ නම් සඳහන් කළා. මගේ කථාවේ එහෙම සඳහන් කර ගන්න බැරි වුණොත් මට සමාවෙන්න ඕනෑ. මොකද, ඔවුන්ට කරන වැරැද්දක් නොවෙයි. එහෙම කර ගන්න බැරිව යනවා. මම අධ්‍යාපනය ගැන කථා කරන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු අධ්‍යාපන ඇමතිවරයාට එක දෙයක් කියන්න ඕනෑ. අපේ තිබෙන ලොකුම මැසිවිල්ල තමයි, පාසලට ගුරුවරු නැහැයි කියන එක. පන්ති කාරමයේ ගුරුවරයා නැහැ. එතකොට මෙතැනදී එනවා, වචන. ගුරුවරු වැඩියි. මේවා තුලනය කරන්න ඕනෑ කියලා. මේ සියලුම සාකච්ඡා ආවත් පන්ති කාමරයේ ගුරුවරු මදි. ඒ නිසා ගරු ඔබතුමා මාර්ගයෙන් මම ගරු අධ්‍යාපන ඇමතිතුමාට යෝජනා කරන ප්‍රධාන යෝජනාව තමයි, 2017 වන කොට විශ්‍රාම යන ගුරුවරුන්ට, ඒ කියන්නේ ඉල්ලුමට සරිලන සැපයුමක් සඳහා ගුරුවරු අපි සම්පාදනය කරලා, ඒ ගුරුවරු බැංකුගත කරලා තියෙන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සංචිතයක්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

සංචිතයක්. ඒ කියන්නේවිභාග තිබෙනවා නම්,ඒ විභාග තියලා. සම්මුඛ පරීක්ෂණ තියනවා නම් සම්මුඛ පරීක්ෂණ තියලා. අපි ගුරුවරුන්ව තෝරලා සංචිතයක් ස්ථානගත කරලා තිබෙන්න ඕනෑ. එතකොට කොයි පාසලේද විශ්‍රාම යන්නේ. කොයි පාසලේද කවුරුහරි ගුරුවරයෙකුගේ වැඩ තහනම් කරන්නේ. ඒ එක්කම අපට ගුරුවරයා දෙන්න පුළුවන් වෙනවා. අපේ අධ්‍යාපනය තුළ දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? පන්ති කාමරයේ ගුරුවරයා නැහැ. සති ගණන් යනවා. අවුරුදු ගණන් යනවා. ගුරුවරයා නැහැ. ළමයි ටික ඇට්ටකුණා වෙනවා. රටේ යම්කිසි ආන්දෝලනයක් ඇති වෙනවා. ඒ සියලුම ආන්දෝලන එන්නේ කොහාටද? ආණ්ඩුවට. ජනාධිපතිතුමාට. අධ්‍යාපන අමාත්‍යවරයාට. අපේ පළාත් සභාවේ නම්, අපේ රංජිත් සෝමවංශ අභිංසක මේ අමාත්‍යතුමාට තමයි එන්නේ. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, එදා මම රෙජිනෝල්ඩ් කුරේ හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් සිටින අවස්ථාවේ, මම එවකට අපේ බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යවරයෙක් හැටියට අපට පුළුවන් වුණා, ඒ පිළිබඳව යම්කිසි අවබෝධයක්,අවධානයක් අරගෙන ඒ සඳහා යම්කිසි පිළියමක් කරන්න. ඒ නිසා මම ප්‍රධාන වශයෙන් ඔබතුමා මාර්ගයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ. මේ අධ්‍යාපනයේ තිබෙන වැදගත්ම සාධකය වන පන්ති කාමරයේ දරුවාට ගුරුවරයා අඩු නොවෙන්න, ගුරුවරුන් සැපයීමේ යම්කිසි ක්‍රමවේදයක් හදන්න කියලා.

ඊළඟට මේ බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් මට වැදගත් වන එක්තරා වැදගත් අංශයක් තිබෙනවා. ඒ තමයි සංස්කෘතික හා කලා කටයුතු අංශය. රටක සංස්කෘතිය, සභ්‍යත්වය සහ ශීලාචාරත්වය තුළ තමයි යහපත් සමාජයක් ගොඩ නැගෙන්නේ. ඒ සඳහා අපට සුවිශේෂී වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. දැනට ඒ තත්ත්වය ගොඩ නැගෙමින් තිබෙනවාය කියලා මම විශ්වාස කරනවා. කනගාටුවෙන් වුණත් කියන්න වෙනවා. අපේ පසුගිය වකවානුවේ අපේ බස්නාහිර පළාත තුළ සංස්කෘතියක් ගැන අවබෝධයක් නැති අයව වගකිවයුත්තෝ පත් කරපු නිසා සංස්කෘතිය හා කලාව පිරිහුනා. අන්තයටම ගියා. එදා රෙජිනෝල්ඩ් කුරේ හිටපු ප්‍රධාන අමාත්‍යතුමා, අපි අමාත්‍යාංශ නියෝජනය කරන කොට තමයි සෞන්දර්ය හා කලා නිකේතනය බිහි කළේ. මම මේ අවස්ථාවේදී හිටපු ජනාධිපති චන්ද්‍රකා බණ්ඩාරනායක මැතිනියව ගෞරවයෙන් සිහිපත් කරනවා. එතුමිය එදා රාජිත සේනාරත්න මැතිතුමා ඉඩම් අමාත්‍යවරයා වෙලා ඉන්න අවස්ථාවේදී, රාජ්‍ය ඉඩම් අමාත්‍යවරයාත් එක්ක කථා කරලා අපට ඒ ස්ටැන්ලි විජේසුන්දර මාවතේ ඉඩම අරන් දීලා සෞන්දර්ය නිකේතනය බිහි කිරීමේ පුරෝගාමියා වුණේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය. එදා ඒ කටයුත්ත රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමායි අපියි ඉෂ්ට සිද්ධ කළා. නමුත් පසුගිය කාලය තුළ මේක කුළියට දීලා තිබුණේ. එක්තරා රූපවාහිනී ආයතනයකට කුළියට දීලා, මාසයකට රුපියල් පත් ලක්ෂයක් අර ගත්තා. සමහර මුදල් පළමුවැනි Installmentඑක සාක්කුවේ දා ගෙන මේක සම්පූර්ණයෙන් පෞද්ගලික නාලිකාවකට දුන්නා. මේ වාගේ ගොඩනැගිල්ලක් හදන්න අඩුම ගණනේ කෝටි 10 ක් වත් වියදම් කරන්න ඕනෑ. නමුත් ඒ පෞද්ගලික නාලිකාවත් එක්ක තිබෙන පෞද්ගලික සම්බන්ධකම් උඩ සංස්කෘතික නිකේතනය කුළියට දීලා යම්කිසි කණ්ඩායමක් -

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මගේ කථාව කරන්න සභාව නිශ්ශබ්ද කරලා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක තමයි බැලුවේ. කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම දන්නේ නැහැ තවත් ඇමතිවරයෙක් ඊයේ පෙරෙයිදා පත් කළාය කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා, හිටපු අමාත්‍යතුමාට -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම මගේ කථාව නවත්වනවා. මගේ කථාවට කාලය දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, අපි තව පොඩ්ඩකින් කථා කරලා බලමු. ඇමතිතුමා එක්ක කථා කරලා, මම ඔබතුමාට සාධාරණයක් ඉෂ්ට කරලා දෙන්නම්. ඔබතුමා හිටපු ක්‍රීඩා ඇමතිවරයානේ? සංස්කෘතික ඇමතිවරයා නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

දැන් ඇමති නොවෙයිනේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඇමති නොවෙයි. දැන් මන්ත්‍රී. එතුමා ජනාධිපති උපදේශක. ඔබතුමා කථා කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, අද සෞන්දර්ය නිකේතනය ඉතාමත්ම ප්‍රශංසාත්මක විධියට පාලනය වෙනවා. මට මතකයි. එක්තරා වකවානුවක කලාවට, සෞන්දර්යයට සම්බන්ධ වෙලා හිටපු කෙනෙක්. එදා බෞද්ධාලෝක මාවතේ තිබෙන සුදර්ශියේදී අපි ඔබතුමන්ලා ගස් යට තමයි පුහුණුවීම් කළේ. එවැනි අවස්ථාවක් තිබුණේ නැහැ. අද අපේ සෞන්දර්ය නිකේතනය තුළ අපේ වර්තමාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් එතැනට අධිකාරියක් පත්

[ගරු හෙක්ටර් බෙත්මගේ ]

කරලා අද ඒක නියම සංස්කෘතික නිකේතනයක් හැටියට පවත්වාගෙන යනවා. මේ පිළිබඳව අපට අලුතෙන් කථා කරන්න දෙයක් නැහැ. අපි හරි දේට හරියි කියන්න ඕනෑ. වැරදි දේට වැරදියි කියන්න ඕනෑ. සංස්කෘතික දෙපාර්තමේන්තුව, නැත්නම් අපි සංස්කෘතිය පිළිබඳව කථා කරන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් සුදර්ශි එකත් දෙන්න යන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, අපි අමාත්‍යවරු පත් කරන්නේ - ජනාධිපතිවරයා වෙන්න පුළුවන්. වෙනත් කෙනෙක් වෙන්න පුළුවන්. නිර්මාණශීලී වැඩ පිළිවෙළකට - නැත්නම් ඔහේ නිකම් ගලාගෙන යාවි. අධ්‍යාපන අමාත්‍යවරයා නොසිටියත් ලේකම්තුමා කර ගෙන යාවි. සංස්කෘතික ඇමතිවරයෙක් නොසිටියත් සංස්කෘතිය ඔහේ යාවි. නමුත් නිර්මාණශීලී වැඩ පිළිවෙළකට අපි ප්‍රවිශ්ට වෙන්න ඕනෑ. ඒ නිසා අපි ආඩම්බර වෙනවා. මේ පොත් පිංචේ තිබෙනවා. ශ්‍රී ලංකාවේ හිටවන කවිය පිළිබඳව අලුත් වැඩ පිළිවෙළකට ප්‍රවිශ්ට වෙලා තිබෙනවාය කියන කාරණාව. ඒ පිළිබඳව ගරු අමාත්‍යතුමා ලබන වර්ෂය සඳහා රු. 1,250,000 ක් වෙන් කරලා තිබෙනවා. හැබැයි, ගරු අමාත්‍යතුමනි, මේක කොන්ත්‍රාත්කරුවන්ට දෙන්න එපා. සැබවින්ම හිටවන කවිය පිළිබඳව සාම්ප්‍රදායිකව, ඒ වාගේම ප්‍රාගුන්‍යයක් තිබෙන, අවබෝධයක්, ප්‍රබෝධයක් තිබෙන නියම හිටවන කවිය මේ රටේ ස්ථාපිත කිරීම සඳහා සැබෑ කවියන්ට මේක භාර දෙන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

ඊළඟට මම කථා කරන්න යන්නේ - මේ හුඟක් වෙලාවට අපේ ඇමතිතුමාට අනුන්ගේ පව් තමයි එන්නේ. මම එතුමාට කියනවා, තව එක පව් වැඩක් එන්න තිබෙනවා. ඒක එන්න ඉස්සෙල්ලා, පෙර සූදානම් වෙන්නය කියලා. දැන් මේ අපේ නිල ඇඳුම් වවුචර් බෙදනවා. ගියවර නිල ඇඳුම් වවුචර් බෙදීමේදී රටේ ආන්දෝලනයක් වුණා. දැන් ඒක සමථයකට පත්වෙලා, එහෙම්ම යටපත් වෙලා තිබෙනවා. දැන් මේ නිල ඇඳුම් වවුචර් බෙදාගෙන යන කොට ඇතැම් පාසල්වල නිල ඇඳුම් වවුචර් බෙදීමේදී අක්‍රමිකතාවයක් වෙනවා. ඊයේ පෙරෙයිදා එක්තරා පාසලක ඒ විධියට නිල ඇඳුම් වවුචර් බෙදීමේදී අක්‍රමිකතාවයක් වෙලා, ඔබතුමාත් දන්නවා. අපේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඒ ගැන විනය පියවරක් ගැනීම සඳහා මැදිහත් වෙලා තිබෙනවා. ඒ නිසා අපට එන්න තිබුණු චෝදනාවක් ලේකම්තුමා මග හරවා ගත්තා. ඒ නිසා යම්කිසි කෙනෙක් නිල ඇඳුම් වවුචර් බෙදීමේදී මෙවැනි දේවල් කරනවා නම්, ඒ සඳහා ඔබතුමා මැදිහත් වෙලා රටේ නීතිය හරියටම අකුරටම ක්‍රියාත්මක කරන්න. වංචනිකව කවුරු හරි කරනවා නම්, ඒ ගැන කිසිසේත්ම නිදහස් කිරීමේ අවස්ථාවක් ලබා දෙන්න එපා. නැත්නම් ඒ සියල්ලම එන්නේ ඔබතුමාට.

ඊළඟට තමයි ගරු සභාපතිතුමනි, මේ ලපා හොපා ව්‍යාපෘතිය. දන්නවා නේද ලපා හොපා ව්‍යාපෘතිය?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දන්නවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මමත් මේ ඊයේ පෙරෙයිදා තැනකට ගියාම කිව්වා, තමුන්නාන්සේලාගේ කලාපයට ලපා හොපා ලැබිලා තිබෙනවාද කියලා. මේ ලපා - හො යන්න කියන එකට වෙනත් කෙනෙක්, වෙනත් වචනයක් දීලා තමයි පා යන්නට වෙනත් අකුරක් කියලා කිව්වේ. මාවත් හිනස්සවන්න. මාවත් නිකම් කරකවලා අත ඇරියා වාගේ වුණා. ලපා හොපා කියන්නේ, මේ "ළඟම පාසල හොඳම පාසල" වශයෙන් ලබා දෙනවාය කියලා. හැබැයි, මේකේ හොඳකුත් තිබෙනවා. බොරුවකුත් තිබෙනවා. අදියර කිහිපයකින් තමයි මේක දෙන්නේ. පළමුවැනි අදියර, දෙවැනි අදියර, තුන්වන අදියර, හතර වන අදියර කියලා. අපේ ආයුෂ කාලය ඉවරයි ගරු ඇමතිතුමනි. ඒ නිසා මේ ලපා හොපා ව්‍යාපෘතිය ලබන අවුරුද්දේ දෙනවා නම් කියන්න ඕනෑ, මෙන්න 2017 දී ලපා හොපා මෙපමණයි. මේක 2018 එකත් කියනවා. 2019 එකත් කියනවා. අපේ පැත්තේ එක්තරා දේශපාලඥයෙක් මේ ලපා හොපා ලැයිස්තුවක් හදා ගෙන, මේක කියාගෙන යනවා. කට ඇරගෙන බලාගෙන ඉන්නවා. ඇයි ලපා හොපා දෙනවාය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා මූලාසනයටත් එන්න ඕනෑ නිසා කථාව අවසන් කරමු නේද?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමා මාර්ගයෙන් අවසාන වශයෙන් කියන්නේ, ලපා හොපා ව්‍යාපෘතිය සැබමින්ම අපේ බස්නාහිර පළාතට ලැබිලා තිබෙනවා නම්, දැනට ලැබිලා තිබෙන ප්‍රගතිය, 2017 දී ලැබෙන්න තිබෙන ප්‍රගතිය අපේ මේ සභාවට දෙන්න ඕනෑ. මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. රංජිත් සෝමවංශ මැතිතුමා කියන්නේ, අපේ සමකාලීනයෙක්. විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංගම්වල අරගල කරලා හොඳ අත්දැකීම් තිබෙන කෙනෙක්. ඉතින් මම හිතනවා. එතුමා ඉතාමත්ම ඉවසීමෙන් තමන්ගේ කටයුත්ත කර ගෙන යාවි කියලා. එක්තරා පුංචි දෙයක් කියන්න ඕනෑ. ඔබතුමා ළඟට හොඳ ඔලුවක් තිබෙන, උපායශීලී, දේශපාලනය හීන්සැරේ ගෙනියන්න පුළුවන් හොඳ පුද්ගලික ලේකම්වරයෙක් පත් කර ගන්න ඕනෑ. මම මේක කියන්නේ, මොකද එක්සත් ජාතික පක්ෂයත් ඒගොල්ලන්ගේ දේශපාලන ප්‍රතිපත්තිය තුළ ඔබතුමා සමඟ විරසකව ඉන්නවා. අපිත්, අපේම කට්ටියත් ඔබතුමාට ඇතැම් දේවල්වලට විරසක වෙන්නේ ඔබතුමා ළඟ ඉන්න, ඔබතුමාට හයිය දෙන අයගේ දුර්වලකම නිසයි කියන කාරණාව මම කියනවා. අද හදියමක් හූනියමක් කරන්න කාට හරි තිබුණා නම් මේ සභාව ඇතුළේදී, ඒ සියලු හදි හූනියම් දුරීම්භූත වෙලා යන්නයි මම ඒ වචනය කිව්වේ. අවසාන වශයෙන් රංජිත් සෝමවංශ මැතිතුමාට මේ බස්නාහිර පළාත් සභාව තිබෙන තුරු අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට සේවය කරන්නට ශක්තිය සහ ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව බොහොම හොඳයි. ඒ වාගේම මේ අවස්ථාවේදී මම ඔබතුමාට ආරාධනා කරනවා, මූලාසනයේ අසුන් ගන්නා හැටියට.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman[Mr. Sunil Wijeratne] left the Chair and Hon. Hector Bethmage M.P.C took the Chair.*

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු අධ්‍යාපන ඇමතිතුමා, අසුන් ගන්නවා නම් අසුන් ගන්න. මීළඟට ගරු කේ.ටී. කුරුසාමි මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.05]

**கௌரவ கே.ரீ. குருசாமி**
**ගරු කේ.ටී. කුරුසාමි**

யாரும் Headphone ஐப் போட வேண்டாம். நான் தொடர்ந்தும் சிங்களத்தில் பேசுவேன்.

தற்பொழுது சபைக்கு தலைமைதாங்கும் தலைவர் அவர்களே, என்னுடைய பேச்சை ஆரம்பிப்பதற்கு முன்னதாக எங்களுடைய இந்திய தமிழ் நாட்டின் மாண்புமிகு முதல்வர் செல்வி. ஜயலலிதாஜெயராம்அவர்கள் அண்மையில்காலமானார்கள். அவர்களுக்கு,இலங்கை நாட்டின் மேல் மாகாண சபையின் ஒரு உறுப்பினர் என்ற முறையில் என்னுடைய அனுதாபத்தை தெரிவித்துக் கொள்கின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව මම සිංහලෙන් තමයි පවත්වන්නේ. පසුගිය වසරකට වැඩි කාලයක් මෙම පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මාගේ සේවාව ජනතාවට ඉටු කර දීමට මෙම අමාත්‍යාංශය තුළින් ඉතා හොඳින් මා හට සහයෝගය දුන්නා. අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් මට සහයෝගය දුන් අපේ පළාත් අධ්‍යාපන ඇමති රංජිත් සෝමවංශ මැතිතුමාටද, ඒ වාගේම එම අමාත්‍යාංශයේ ලේකම් විජයබන්දු මහතා, සහකාර ලේකම් විජේතුංග මහතා, ඒ වාගේම සම්බන්ධීකරණ ලේකම්වරු වශයෙන් කටයුතු කරන හේමචන්ද්‍ර සහ ලියනගමගේ යන මහත්වරුන්ට ද එම අමාත්‍යාංශයේ නිලධාරීන්ට ද මම මේ අවස්ථාවේ පළමුවෙන්ම මගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නවක අධ්‍යක්ෂ වශයෙන් පත්වීම් ලැබූ ශ්‍රීලාල් නොනිස් මහතා ඉතා හොඳින් අපට advice කරලා, අපට සේවය කිරීමට හොඳ සහයෝගයක් දෙනවා. ඒ මහතාටත්, ඒ වාගේම කොළඹ කලාපයේ කලාප අධ්‍යක්ෂ ජයන්ත වික්‍රමනායක ඇතුළු අප කොළඹ කලාපයේ නිලධාරී මහත්වරුන්ටද මාගේ ස්තුතිය මේ අවස්ථාවේ පුද කරනවා.

[ගරු කේ.ටී. කුරුසාමි ]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 වසරේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශයේ අයවැය විවාදයේ කථා කරන්නට අවස්ථාවක් ලැබීම ගැන ඔබතුමාටත්, ඒ වාගේම දැනට මහ ඇමතිතුමා මේ සභාවේ නැහැ, එතුමාට ද ඒ වාගේම අපේ කණ්ඩායමේ විරුද්ධ පක්ෂයේ නායකතුමා, ඒ වාගේම අපේ සංවිධායකතුමාටත් මම ස්තූතිවන්ත වෙනවා. මෙම සභාවේ නවක මන්ත්‍රීවරයෙකු ලෙස පසුගිය මාස 15 ක පමණ කාලය තුළ මම ලබා ගත් අත්දැකීම් සේවා ගැන කථා කරන්න අදහස් කරනවා. කොළඹ, කළුතර, ගම්පහ යන දිස්ත්‍රික්කවලට ඇතුළත් මන්ත්‍රීවරුන් 104 ක් සිටින මෙම සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් ද්‍රවිඩ ජනතාව නියෝජනය වන්නේ මනෝ ගනේෂන් මැතිතුමාගේ පක්ෂයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරුන් දෙදෙනෙක් බව සඳහන් කිරීමට කැමැතියි. මගේ අදහස් තමයි මම මේ කියන්නේ. එහි අඩුපාඩු තිබෙනවා නම්, කරුණාකර සමාවෙන්න ඕනෑ. බස්නාහිර පළාත් පාසල්වලින් දෙමළ පාසල් 138 ක් තිබෙනවා. මෙයින් කොළඹ, කළුතර, ගම්පහ දිස්ත්‍රික්කවල පාසල් සඳහා රුපියල් මිලියන ගණනක් වැය කළත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩි ප්‍රගතියක් ලබාගෙන නොමැති බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. සමස්ත ජාතික අධ්‍යාපන ප්‍රතිඵල දිහා බලන කොට බස්නාහිර පළාතට දෙවැනි ස්ථානය ද දකුණු පළාතට පළමුවැනි ස්ථානය ද ලැබී තිබෙනවා. ගරු ඇමතිතුමනි, කරුණාකර මෙම පසුබිමට හේතුව සොයා බලන්න. අපේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් ද මේ අවස්ථාවේ සිටිනවා. මම කියන එක සමහර විට වැරදි වෙන්න පුළුවන්. ඒ නිසා හරි දේ සොයා බලන්න. මෙම පසුබිමට හේතුව දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන සිසුන්ගේ අධ්‍යාපනයේ පසුබෑම බව මට දැන ගන්නට ලැබුණා. ඒ කියන්නේ, කාලයක් පුරාවටම බස්නාහිර පළාත තමයි පළමුවැනි ස්ථානයේ සිටියේ. අද දෙවන ස්ථානයට තල්ලු වී තිබෙනවා.

සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මම කියා සිටිනවා, මෙසේ සඳහන් කිරීම නිසා මාව ජාතිවාදියෙකු ලෙස සිතන්න එපා. මා ශ්‍රී ලාංකිකයෙකු යන හැඟීමෙන් තමයි මෙම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති අඩුපාඩු ගැන සඳහන් කරන්නේ. මම දෙමළ ජනතාවගේ නියෝජිතයෙකු හැටියට පත් වීමට දායක වූ දෙමළ ජනතාවගේ ප්‍රශ්න විසඳීම මාගේ යුතුකමක්. එසේ නොකළොත් මාධ්‍යවලින් හා විරුද්ධ පක්ෂවලින් අපවත් මෙම සභාවත් විවේචනය කරන්න හේතුවක් වෙයි. එම අඩුපාඩු සොයා සහන සැලසීම අපි කාගේත් යුතුකමක්.

මෙම දෙමළ පාසල් අධ්‍යාපනයේ ප්‍රගතියක් ඇති කිරීම සඳහා මා යෝජනා කිහිපයක් මෙම අවස්ථාවේදී ගරු ඇමතිතුමාට සහ අපේ පළාත් අධ්‍යාපන නිලධාරීන්ට සඳහන් කරනවා. එහෙම නම් පළමුවෙන්ම, දෙමළ පාසල්වලට අවශ්‍ය සම්පත් ලබා දිය යුතුයි. දෙවනුව, සෑම කලාපයකටම සුදුසු කාර්යක්ෂම අධ්‍යක්ෂවරු පත් කළ යුතුයි. තුන්වෙනුව, දෙමළ භාෂාවෙන් අධ්‍යාපනය ලබා ගත් අධ්‍යක්ෂවරු පත් කළ යුතුයි. ඒ වාගේම ගුරුවරුන්ගේ හිඟකම පිළිබඳව සොයා බලා අවශ්‍ය ගුරුවරු පත් කළ යුතුයි. විශේෂයෙන්ම රංජිත් සෝමවංශ ගරු ඇමතිතුමාට අපි මේ අවස්ථාවේදී ස්තූතිවන්ත වෙන්න ඕනෑ. මේ පසුගිය මාසය තුළ දෙමළ ගුරුවරු 200 ක් නොවෙයි, 500 ක් වාගේ ලබා දීමට එතුමා කටයුතු කිරීම ගැන අපි අපේ ස්තූතිය මේ අවස්ථාවේදී පුද කරනවා.

ඒ වාගේම බස්නාහිර පළාතේ අධ්‍යාපනය ගැන සොයා බැලීම සඳහා පරීක්ෂණ ඒකකයක් පිහිටුවිය යුතුයි. එහෙම ඒකකයක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. මෙහිදී මම කියන කොට, මම දෙමළ මන්ත්‍රී නියෝජිතයෙකු හැටියට කථා කරන කොට, මේ අඩුපාඩුව බහුතරයක් ජීවත් වන අපේ සිංහල දූ දරුවන්ටත් තිබෙනවා. ඒ වාගේම මුස්ලිම් දූ දරුවන්ටත් තිබෙනවා. මම මේ දෙමළ දරුවන් කියලා කියන කොට අනික් දූ දරුවන් අයින් කරලා කථා කරනවා නොවෙයි. ඒ නිසා එවැනි පරීක්ෂණ ඒකකයක් බස්නාහිර පළාතේ කොළඹ කොහේ හරි පිහිටුවනවා නම්, අපට මේ අඩුපාඩු ගැන සොයා බලන්න පුළුවන්. ඒ වාගේම දෙමළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම හා දෙමළ භාෂාව දන්නා නිලධාරීන් කලාපවලට පත් කිරීම හා දෙමළ පාසල්වල නිලධාරීන්ට යවන ලිපි ලේඛන දෙමළ භාෂාවෙන් එවීමට අවශ්‍ය පියවර ගන්න කියලා ඉල්ලා සිටිනවා. ඇයි මම එහෙම කියන්නේ? අපේ පළාත් අධ්‍යක්ෂවරුන් ද, කලාප අධ්‍යක්ෂවරුන් ද ඇත්තටම දෙමළ පාසල් කියලා වෙනසක් පෙන්වන්නේ නැහැ. එතුමන්ලා හොඳ සේවයක් කරනවා. නමුත් එතැන අඩුපාඩුවක් තිබෙනවා. දෙමළ දන්නේ නැත්නම්. ඒ නිසා කරුණාකර දෙමළ භාෂාවෙන් ලියුම් යවන්න කටයුතු

කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම ගුරුවරුන් හා අනෙකුත් දෙමළ නිලධාරීන් සඳහා පවත්වන සම්මන්ත්‍රණ හා රැස්වීම්වලදී දෙමළ භාෂාවෙන් කිරීමට කටයුතු කරන්න. මුළු දවසේම සම්මන්ත්‍රණ තියන කොට ගරු ඇමතිතුමනි, උදේ ඉඳන් හවස් වන තුරුම සිංහල භාෂාවෙන් තියලා ඉවර වෙලා දෙමළ ගුරුවරුන්ට, දෙමළ අධ්‍යක්ෂවරුන්ට හවස් වෙලා translation එක විතරක් දෙනවා. ඒක හොඳට කරනවා තමයි. නමුත් මීට පසු ඒ ගැනත් අවධානයක් යොමු කරන්න. අවසාන වශයෙන් මම කියන්න කැමැතියි. දෙමළ ජනතාව බහුතරව වාසය කරන ප්‍රදේශයක් තමයි වත්තල ප්‍රදේශය කියන්නේ. ඔබතුමන්ලා දන්නවා, පසුගිය ජනවාරි මාසයේ දෙමළ පාසලක් ඉදි කිරීමට උත්සාහ කළා. අවුරුදු දහයක් පමණ ගත වෙලත් එය අසාර්ථක වෙලා තිබෙනවා. පවතින යහපාලන ආණ්ඩුව විසින් නැවත පාසල ඉදි කිරීමේ කටයුතු පසුගිය ජනවාරි මාසයේ ආරම්භ කළත්, අද වන තුරු එම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන ගියේ නැහැ. මෙය ඉතාම අසාධාරණ ක්‍රියාවක් ලෙස ජනතාව පසුතැවිලි වෙනවා. අවශ්‍ය දෙමළ පාසල්වල ඉඩ නොමැති හෙයින්, තිබෙන පාසල්වල ඉඩ නොමැති වීමෙන් 2017 වසරට පළමු ශ්‍රේණිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන් 500 දෙනෙකුගෙන් සිසුන් 200 කට පමණයි අනුමැතිය ලැබුණේ. ඉතිරි සිසුන් 300 දෙනා අධ්‍යාපනය ලබා ගන්නේ කොහෙන්ද? මෙම දුප්පත් සිසුන්ගේ අනාගතය කෙසේ වෙයිද? ඒ දෙමව්පියන්ගේ මානසික තත්ත්වය කෙසේද කියලත් මදක් සිතා බලන්න.

විශේෂයෙන්ම එම ප්‍රදේශයේ හින්දු සිසුන්ට ඉගෙනුම ලැබීමට පාසලක් නොමැති වීම ඔවුන්ට කරන මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් කියලා මා සිතනවා. විශේෂයෙන්ම මෙම ප්‍රදේශයේ හින්දු ආගමික ළමයින්ට තමන්ගේ ආගම ගැනවත් දැනුමක් ලබා ගැනීමට පාසලක් නැහැ. මෙය එක් ජාතියකට කරන අසාධාරණයක් හා මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් නොවේද? එසේම පවතින යහපාලන ආණ්ඩුව පත් කිරීමට ද්‍රවිඩ ජනයාගෙන් ද ලැබුණු සහයෝගය, දායකත්වය ගැන ද අපි සිතා බැලිය යුතුයි. අනාගතයේ මෙම රටේ සියලුම ජන කොටස් සහෝදරත්වයෙන්, සමඟියෙන්, සාමයෙන් ජීවත් වීමට නම් සියලුම ජනතාවට ජාති, ආගම්, කුල භේදයෙන් තොරව සමානව සැලකිය යුතුයි. අවසාන වශයෙන් රංජිත් සෝමවංශ ගරු ඇමතිතුමාට අපේ සහයෝගය ලබා දෙන බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.14]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිය ප්‍රකාශ කරනවා. අධ්‍යාපන උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු ලෙසත්, ඒ වාගේම දේශපාලන පළි ගැනීමකට ලක් වූ ගුරුවරයෙකු ලෙසත් අද මට මේ විවාදයට සම්බන්ධ වීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව මම යළිත් ස්තුතිය පළ කරනවා. මම හිතන්නේ, අපේ අධ්‍යාපන ඇමතිතුමා, අපේ කළුතර දිස්ත්‍රික්කයේ අපේ පන්තියේ අපිත් එක්ක ඉතා සහයෝගයෙන් කටයුතු කරන අමාත්‍යවරයෙක්. ඒ නිසා මම හිතන්නේ, එතුමා මේ අමාත්‍යාංශය භාර ගත් දවසේ සිට අති විශාල අභියෝග රාශියකට එතුමා මුහුණ දුන්නා. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී පවා සමහර සැක මුසු අවස්ථා එතුමාගේ හිතටත් අපටත් - සමහර අයට දැනුමක් ඇති වෙන්න ඇති. ඒ කෙසේ වුවත් පසුගිය කාලය තුළ ගරු ඇමතිතුමා මේ අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණු කරන්නඅති විශාල වෙහෙසක් දැරුවා. මේ අපේ ගම්පහ, කොළඹ, කළුතර දිස්ත්‍රික් තුනේ අපේ රටේ ජීවනාලිය වන මේ දරුවන් වෙනුවෙන් අති විශාල වැඩ කොටසක් කළා. අපි ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම තවත් විශාල වැඩ කොටසක් කරන්න 2017 වර්ෂයේදී ඔබතුමා සැලසුම් සකස් කරලා තිබෙනවා. නමුත් කියන්න කනගාටුදායක තත්ත්වයක් තිබෙන්නේ. මේ වසරේ වෙන් කරන ලද මුදල් පිළිබඳව මම හිතන්නේ, 2016 වර්ෂයේ අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් මිලියන 27,467 ක් පමණ වෙන් කරලා තිබුණා. නමුත් 2017 වර්ෂයේ රුපියල් මිලියන 4,796 ක් අඩු කරලා රුපියල් මිලියන 22,671 ක වාගේ මුදලක් තමයි මුළු අධ්‍යාපනය වෙනුවෙන්ම මේ වර්ෂයේ පළාත් සභාව තුළින් වෙන් වී තිබෙන්නේ. ඒ නිසා අපි කනගාටු වෙනවා. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දෙන ප්‍රතිපාදන අද පළාත් සභාවට නොලැබෙන තත්ත්වයක අපි ඉන්නේ.

අපට මතකයි. පසුගිය කාලය තුළ දළ ජාතික නිෂ්පාදනයෙන් 6% ක මුදලක් වෙන් කරන බවට මහා පම්පෝරි ගහලා ගණිත විජ්ජාවක් කළා. 2015 වර්ෂයේ මුදල් ඇමතිවරයා මේ වන කොට ගිය වර්ෂයටත් වඩා 41% ක මුදලක් කපා හැරලා, අධ්‍යාපනය වෙනුවෙන්. ඒ තත්ත්වය 2017 වර්ෂයේදී අපේ පළාත් සභාවටත්

[ගරු නිල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු ]

බලපෑමක් ඇති වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ කෙසේ වුණත්, මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව අපට ලැබුණු බලතල අධ්‍යාපන අමාත්‍යාංශයට ලැබුණු බලතල. මම දන්නවා. ඔබතුමා පෞද්ගලිකව මාත් එක්ක කථා කරලා තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක සමහර ප්‍රශ්නවලදී ගැටුම් ඇති කර ගන්නවා. මට කිව්වා, එක අවස්ථාවකදී මේ වැඩ බලන විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නය මත අධ්‍යාපන ඇමතිතුමාත් එක්ක විවාද කරන්න සිද්ධ වුණා. සමහරවිට අධිකරණමය ක්‍රියාමාර්ගයකට යන්න සිද්ධ වෙයිද කියලා ඔබතුමා මාත් එක්ක කිව්වා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ වැඩ බලන විදුහල්පතිවරු සමහර අවස්ථාවලදී අපේ එක මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ, දේශපාලනමය කරුණු මතත් වෙන්න පුළුවන්. ඒ කෙසේ වෙතත් අති දුෂ්කර කාලයේ ඒ පාසල් අපි ඒගොල්ලන්ට භාර දුන්නේ. ශ්‍රේණියක් නැහැ. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඒ පවත්වන ලද විභාගයට අනුව වැඩ බලන විදුහල්පතිවරු දැන් ස්ථානගත කර තිබෙනවා. මම ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා. දැනට ශ්‍රේණිධාරී නොවන වැඩ බලන විදුහල්පතිවරුන්ට ඒ තත්ත්වය එතැන යම්කිසි වැඩ පිළිවෙළක් හදලා හෝ - මොකද, ඔවුන් අති දුෂ්කර කාර්යයක යෙදුණේ. ඒ වාගේම සමහර පාසල් වැටෙන්න ගිය පාසල්. ඒවා කෙසේ හෝ ගොඩ නගා ගත්තා. නමුත් ශ්‍රේණියක් ලබා ගන්න බැරි වුණා. ඔවුන්ටත් යම් අවස්ථාවක් දෙන්න. ඔවුන්ව එකවරම ඉවත් කරන්න එපාය කියලා මම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට යෝජනා කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම උපාධිධාරී ගුරුවරු බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමේදී අපි 2014 වර්ෂයේදී විභාගය පැවැත්වුවා. මම දන්න සංඛ්‍යා ලේඛන අනුව 4000 කට වැඩි ප්‍රමාණයක් සමත් වුණා. ඒකෙන් දැන් ඔබතුමා 1500 කට වැඩි ප්‍රමාණයක් බඳවා ගෙන තිබෙනවා. නමුත් තවත් විශාල පිරිසක් මේ විභාගය සමත් වෙලා, ගුරුවරුන් වශයෙන් පත් වෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ නියමිත ලකුණු මට්ටම පැමිණෙන තෙක් ඔවුන් බලාගෙන සිටිනවා. ඒ නිසා ඒ අයටත් අවස්ථාවක් ලබා දෙන්න. ඒ වාගේම ගරු ඇමතිතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. දෙමළ මාධ්‍ය ගුරු හිඟය සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරන බව මට දැන ගන්නට ලැබුණා. ඒ පිළිබඳවත් ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමේදී - මම මේ අවස්ථාවේදී එක කරුණකට ඔබතුමාගේ අවධානය යොමු කරනවා. උපාධිධාරී ගුරුවරු බඳවා ගැනීමේදී විද්‍යාවේදී හෙද උපාධියට. ඒ උපාධියට ගුරු පත්වීම් ලබා දීම අපේ පළාත් සභාව තුළ සිදු කෙරෙන්නේ නැහැ. නමුත් මේ සඳහා අපේක්ෂකයෝ වශයෙන් මෙතුමන්ලා ඒ ගැසට් නිවේදනය අනුව අයදුම්පත්‍ර ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් ඒ බඳවා ගැනීම් සිද්ධ වෙන්නේ නැහැ. අපේ පළාත් සභාව තුළ පමණයි මෙය තිබෙන්නේ. මධ්‍යම, වයඹ, සබරගමුව, ඌව, දකුණ ආදී පළාත්වල ඒ ගුරුවරු බඳවා ගන්නවා. ඒ වාගේම මම විශේෂයෙන්ම අපේ ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙමින්, ඉදිරි කටයුතු කර ගෙන යන්න ගරු අමාත්‍යතුමාට සහයෝගය ලබා දෙන බව සඳහන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.20]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 අයවැය විවාදයේදී අධ්‍යාපන වැය ශීර්ෂය ගැන කථා කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන ඇත්ත වශයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා. දුප්පත්කම, විරැකියාව විතරක් නොවෙයි ආදායම් පරතරය තුළින් ප්‍රධාන ආයෝජනය වන අධ්‍යාපන ගැන හා එහි අනාගතය ගැන කථා කිරීම අපි හැමෝගේම වගකීමක්. මොකද, අපේ පළාත් සභාව පිහිටුවා 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජාතික පාසල්, හමුදා සාමාජිකයන් සඳහා වූ විශේෂ පාසල් හා නිශ්චිත සංවර්ධන යෝජනා ක්‍රම සඳහා වූ පාසල් හැර පළාතේ ඇති අනෙකුත් සියලුම රජයේ පාසල් සඳහා පහසුකම් සැලසීම, අධීක්ෂණය හා කළමනාකරණය කිරීමේ වගකීම පවරලා තිබෙන්නේ අපේ පළාත් සභාවට. ඒ වාගේම පළාතේ සියලුම පෙර පාසල් අධීක්ෂණය හා කළමනාකරණය කිරීමේ වගකීම පැවරිලා තිබෙන්නේත් අපිට. ඒ විතරක් නොවෙයි අවිධිමත් අධ්‍යාපනය පිළිබඳව වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීමක් පළාත් සභාව වශයෙන් අපි ඉටු කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ රටවල් 43 ක විතරයි නිදහස් අධ්‍යාපනය තිබෙන්නේ. අපිත් ඒ 43 න් එකක් වීමේ සැබෑ ප්‍රතිලාභය, අපේ රටේ දුප්පත් මිනිස්සුන්ට ඇත්තටම ලැබෙනවාද කියන එක ගැන අපට තිබෙන කනගාටුවක්. මොකද, අපේ ප්‍රධාන ඇමතිතුමාගේ මූලික කථාවේදී අපට අහන්න ලැබුණා. ජාතික පාසල්වල

අ.පො.ස. (සා.පෙළ) සමත් වීමේ ප්‍රතිශතය 81.27% ක් වන කොට, කොළඹ කලාපයේ අ.පො.ස. (සා.පෙළ) සමත් වීමේ ප්‍රතිඵලවල ප්‍රතිශතය 38.48% ක් වෙනවා. සාමාන්‍ය පාසල්වල තත්ත්වය තවත් දුර්වලයි. ඇත්ත වශයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අධ්‍යාපන උපදේශක කාරක සභාවේත් ඉන්නවා. අපට කථා කරන්න වෙලාව මදි. අපට අඩුම තරමින් විනාඩි 20 ක් හෝ 30 ක් ලබා දෙන්න ඕනෑ.

ඒ වාගේම අපේ අධියාපන ඇමතිතුමා ගැන කථා කරන කොට බොහෝ දේවල් කථා කරන්න තිබෙනවා. එතුමා දක්ෂ ඇමතිවරයෙක්. අද අපට දෙමළ පාසල්වලට තිබෙන අඩුපාඩු ගැන, ගුරු ප්‍රශ්න ගැන කථා කරන්න තිබෙනවා. දැන් ගිය සතියේ ගරු ආණ්ඩුකාරතුමා සමඟ විශේෂ සාකච්ඡාවක් තියලා, ඒ ගුරුවරුන් බඳවා ගැනීමේ ප්‍රශ්නයකටත් අධ්‍යාපන ඇමතිතුමා මූලිකත්වය ගත්තා. එතැනින් දෙමළ ජනතාවගේ ප්‍රශ්නය ගැනත්, මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්නය විතරක් නොවෙයි බස්නාහිර පළාත් සභාවට කරන්න ඕනෑ සේවය ගැන අධ්‍යාපන ඇමතිතුමා කථා කරපු විධිය මම අහලා හරි සතුටු වුණා. ගරු ඇමතිවරුන්ගේ පොඩි පොඩි වැරදි තිබෙනවා තමයි. ඒවා අපි ගණන් ගත යුතු නැහැ. කරන හොඳ දේවල් අපි කොයි වෙලාවේත් කථා කරන්න ඕනෑ. මේ කාරක සභාවේ මම ඉන්න එක ගැන මම හරිම සන්තෝෂ වෙනවා. අපි ඕනෑම වෙලාවක අමාත්‍යාංශයට ගිහිල්ලා ගරු ඇමතිතුමා හමු වෙලා කථා කරනවා නම්, ඇමතිතුමා අපට වැඩ කරලා දෙන්න ලැහැස්තියි. නිලධාරීන් තමයි පස්සට අදින්නේ. නිලධාරීන් තමයි දේශපාලන වාසි ගන්නේ. නිලධාරීන් තමයි දේශපාලඥයින් පුම්බලා තියන්නේ. එක එක්කෙනා උස්සලා අරගෙන. ඒක වැරදියි. මම ඒක කෙළින්ම ගරු අධ්‍යාපන ඇමතිතුමාට කියන්න ඕනෑ. මේ බස්නාහිර පළාත් සභාවේඒක නැති කරන්න.

මේ 2017 අයවැය විවාදයේ ඡන්දයේදී ගරු මහ ඇමතිතුමාගේ සිට ගරු ඇමතිවරුන් හතර දෙනාටම අපේ විපක්ෂයෙන් - අපේ නායක ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාහැම ඡන්දයකටම අත උස්සා ඡන්දය දෙන්න කියලා. ඡන්දය නොදී ඉන්නත් එපා කිව්වා. අනිවාර්යයෙන්ම ඡන්දවලට යන්න කිව්වා. අපි ඇමතිතුමාට කියන්නේ, ගිය අවුරුද්දේ වාගේ කුඩම්මාගේ සැලකිල්ල මෙවර අපට කරන්න එපා. අපි කාර්යාලයකට ගිහිල්ලා රස්තියාදු වෙන්නේ නැහැ. අත්‍යවශ්‍ය වැඩකට තමයි අපි යන්නේ. මම බස්නාහිර පළාත් සභාවේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. අද කොළඹ කලාපය කිව්වා නම්, තුට්ටුවට බැහැපු කලාපයක්. එක්කෙනෙකුට දෙන්නෙකුට ප්‍රයෝජනයට තමයි කලාපය අද තියෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු ඇමතිතුමාෆායිස් තමයි ඔක්කොම කරන්නේ. මුජිබුර් රහුමාන්ව දාගෙන ෆායිස් කරන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු ඇමතිතුමා, මේ බස්නාහිර පළාත් සභාවේ තුන්වන වරට මම ඉන්නේ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මේ තිබෙන්නේ, 2014 බලය. පළාත් සභාවේ තිබෙන්නේ 2014 පාලන බලය.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මම අවුරුදු 13 ක් ම මන්ත්‍රීවරයෙක් වශයෙන් සිටිනවා. ඔබතුමා යහපාලන ආණ්ඩුවෙන් බිහි වුණු ඇමතිවරයෙක්. 2014 කථාවක් මෙතැන නැහැ. මේකේ තිබෙන්නේ, 2015 ජනවාරි 08 වැනිදාට පස්සේ බිහි වුණු මහ අමැතිතුමායි, අධ්‍යාපන ඇමතිතුමායි. ගරු මහ ඇමතිතුමායි, අධ්‍යාපන ඇමතිතුමායි දැන ගන්න ඕනෑ, මේ ආණ්ඩු පක්ෂයේ හරි විපක්ෂය හරි දෙකම එකට තියා ගන්න. මේක ලොකු ප්‍රශ්නයක්. ඇත්ත වශයෙන්ම රංජිත් සෝමවංශ ගරු අධ්‍යාපන ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපට ලිඛිතව දුන්නා මේක ගිහිල්ලා දෙන්න කියලා. ඔබතුමා තමයිමේකටපත් වෙන්න ඕනෑ, කියලා. ඔබතුමාට තමයි කොළඹ කලාපයේ වැඩ ටික දෙන්න ඕනෑ කියලා කිව්වා. නමුත් එතැනදී මොකදවුණේ? එතැන නිලධාරීන් දේශපාලන වාසි ගන්න කියලා, ඒ ගැන තිබෙන වැඩ ටික කඩාකප්පල් කරන්න ඕනෑය කියලා වෙනස් විධියට කටයුතු කළා. අද මැද කොළඹ ආසනයේ පාසල් ඔක්කොම කඩා වැටිලා තිබෙන්නේ. මම තවත් එකක් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්නේ මොකක්ද? උතුරු කොළඹ, නැගෙනහිර කොළඹ, බොරැල්ල, බටහිර

[ගරු එම්.එස්.එම්. ෆයිරෝස්]

කොළඹ - කොළඹ කලාපයට අයිති ආසන තිබෙනවා. ඒවායේ මන්ත්‍රී කණ්ඩායමක් ඉන්නවා. ඒ පාසල්වල උත්සවයක් තියනවා නම් කෙළින්ම එක්කෙනෙකුට විතරයි අධ්‍යාපන අධ්‍යක්ෂතුමා කියන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක ෆායිස්ට කිව්වේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

එතුමා විතරයි යන්නේ. මින් ඉදිරියට අපට ඒවාට ඉඩ දෙන්න බැහැ. මේක අපේ සභාවක්. අපි මේ සභාවේ සටන් කරන්නේ, මේ පළාතේ දුගී දුප්පත් ජනතාවට සේවය කරන්න. ළමයින්ගේ පාසල් අධ්‍යාපනය දියුණු කරන්නයි මෙතැන ඇවිල්ලා සටන් කරන්නේ. ඒ නිසා facebook වල, රූපවාහිනියේ සෙල්ලම් කරන්න මෙතැන අවශ්‍යතාවයක් නැහැ. ඒ පළාතේ සියලුම මහජන නියෝජිතයෝ කොපමණ දුක් විඳලා ද මේ සභාවට ඇවිල්ලා තිබෙන්නේ. ජනතාවට සේවයක් කරන්න ඇවිල්ලා තිබෙන්නේ. මම අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේ පිළිබඳව හොඳට හිතලා බලන්න. ගිය අවුරුද්දේ වුණු දේවල් අතහැරලා දාන්න. ඒක හීනයක් වාගේ කියලා හිතන්න. අපි මෙවර ඔබතුමා එක්ක, අන්තිම වෙනකල් ඉන්නවා. මේක හරියට කරන්න. එක්කෙනෙකුට දේශපාලන වාසි ගන්න දෙන්න එපා. මෙතැන අපිත් කරන්නේ දේශපාලනයක්. අනික් කෙනාව ගොනාට අන්දවන්නත් ඉඩ තියන්න එපා. ඒ නිසා මේ සභාවේදී කථා කරන්න මම කරුණු ගොඩක් ලියාගෙන ආවා. ඒත් වෙලාව මදි. මම සංස්කෘතිය ගැනත් කථා කරන්න හිටියා. ඒ බව මට කියන්න කාලයක් නැහැ. ඒ නිසා මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවශ්‍ය නම් ඔය ලිපි ගොනුව සභාගත කරන්න පුළුවන්. ඔබතුමාට තව විනාඩියක කාලයකුත් තිබෙනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, කොයි වෙලාවේත් අපි සභාවට ගරු කරනවා. අපට වෙලාව නැහැ. නතර කරන්න කියලා කිව්වාම, තව විනාඩියක් කථා කරන්න ඕනෑ කියලත් මම ඉල්ලන්නේ නැහැ. මට විනාඩි අටයි නම් තිබෙන්නේ, මම හරි වෙලාවට වැඩ කරන මනුස්සයෙක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ඔබතුමා හොඳ විනයක් තිබෙන මන්ත්‍රීවරයෙක්. ගරු අමාත්‍යතුමනි, එතුමා සඳහන් කළ දේවල් පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න. එතුමා හිතේ අමාරුවෙන් කථා කළේ. කොළඹ කලාපය පිළිබඳව එතුමාට අසාධාරණයක් වෙලා තිබෙනවා නම්, ඒක මගහැරවීමට කටයුතු කරන්න. මීළඟට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.29]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අධ්‍යාපන විෂය වාගේ පුළුල් විෂයයක් විනාඩි 10 ක් වැනි පුංචි කාලයකින් කථා කරලා හමාර කරන්න අමාරුයි. නමුත් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ වෙලාව ලබා දීම ගැන. ඒ වාගේම ලොකු කාරණා, ගැඹුරු කාරණා කථා කරන්න බැරි නිසා, අධ්‍යාපන විෂය සම්බන්ධයෙන් ඉතාම සිල්ලර කාරණා ටිකක් කථා කරලා මගේ කථාව හමාර කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන විෂය කියලා කියන්නේ, අද දවසේ රටේ තිබෙන සංවේදීම විෂය. මේ විෂය සම්බන්ධයෙන් රටේ ජනතාව උනන්දු වන ප්‍රමාණය කොයි තරම් ද කියලා ජාතික විභාග තියන වෙලාවලදී දැක ගන්නට පුළුවන්කම තිබෙනවා. ඒ බව පාසල් අවට රැඳෙන දෙමව්පියන්ගේ ප්‍රමාණයෙන් දැන ගන්නට ලැබෙනවා. පාසලට දරුවන් ඇතුළත් කර ගන්න දෙමව්පියෝ දක්වන උනන්දුවේදී ඔවුන් කොයි තරම් සංවේදී ද කියන කාරණය ඉතාම පැහැදිලි වෙනවා. මේ සංවේදී විෂය හසුරුවද්දී මම විශ්වාස කරනවා, පළාත්

සභාවේ ඉන්න හොඳම කෙනාට ඒ ඇමතිකම දීලා තිබෙනවාය කියලා. එතුමා බොහොම දුෂ්කර තත්ත්වයන් යටතේ, දුෂ්කර ප්‍රදේශයකින් ඇවිල්ලා, බොහොම මහන්සියෙන් ඉගෙන ගෙන, විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් ලබලා, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරලා එහෙම ඉස්සරහාට ආපු ඇමතිවරයෙක්. හැබැයි, අද වන කොට අපට කියන්නට තිබෙනවා. මේ අමාත්‍යාංශය කළමනාකරණය කරද්දී, ගරු ඇමතිතුමා දක්වන උනන්දුව නම් මේ විෂයේ ජනතාව දක්වන සංවේදීකමට සාධාරණය ඉෂ්ට කරන්න ප්‍රමාණවත් නැහැයි කියන කාරණය කනගාටුවෙන් වුණත් කියන්නට සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් 1289 ක්, පාසල් ශිෂ්‍යයෝ 727,228 ක්, ගුරු භවතුන් 35,873 ක්. මේ දැවැන්ත ප්‍රමාණය කළමනාකරණය කරද්දී අලසකමින් මේ අමාත්‍යාංශය හසුරුවන්න පුළුවන්කමක් නැහැ. වැඩ කරන අමාත්‍යවරයෙක් වෙන්න ඕනෑ. හැම වෙලාවේම දුරකථනයේ ඉන්න ඕනෑ. කෙනෙකුට හම්බ වෙන්න පුළුවන්කම තිබනේන ඕනෑ. එහෙම හම්බ වෙන කොට රස්තියාදු නොකර මේ සංවේදී කාරණය කථා කරන මනුස්සයාව සතුටු කරලා යවන්න, ඒ මනුස්සයාගේ ප්‍රශ්නය විසඳලා යවන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. ඒ නිසා එවැනි තත්ත්වයට අමාත්‍යාංශය හැසිරෙනවා නම් තමයි මේ පළාතේ ජනතාවට මේ අධ්‍යාපන විෂයේ ප්‍රයෝජනය ලබාගන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒකේ බරපතළම වගකීම, ජාතියක් ගොඩ නැගීමේ වගකීම තමයි මේ ඇමතිතුමාට භාර දීලා තිබෙන්නේ. ඒක සෙල්ලම් කාරණාවක් නොවෙයි. ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා වඩාත් වගකීම් සහගතව හැසිරෙන්න කියන කාරණය ගරු ඇමතිතුමාට, ඔබතුමා මාර්ගයෙන් මේ වෙලාවේ මතක් කරන්නට ඕනෑ.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, අපි කියන්නට ඕනෑ. අපට කථා කරන්න තිබෙන්නේ, රටේ අධ්‍යාපනයේ අහිංසක මිනිස්සුන්ගේ ප්‍රශ්න ටික. අද මේ රටේ අධ්‍යාපනයේ පන්ති පරතරය පුළුල් වෙලා ඉවරයි. මේ රටේ බලය තිබෙන, ධනය තිබෙන මිනිස්සු තමන්ගේ අධ්‍යාපනය තෝරා ගෙන ඉවරයි. ජාත්‍යන්තර පාසල් ජාලයක් හරහා මේ රටේ සල්ලි තිබෙන මිනිස්සු තමන්ගේ දරුවන්ට - මේ රටේ ගුරුවරු විතරක් නොවෙයි, අද විදේශීය රටවල ගුරුවරු ඇවිල්ලා ජාත්‍යන්තර පාසල්වල උගන්වනවා. ඒ නිසා ඒ අයගේ අධ්‍යාපනය, ඒ අය මුදල් එක්ක කරන ගනුදෙනුවෙන් තෝරා ගෙන හමාරයි. අද අහිංසක මිනිස්සුන්ට තමයි අධ්‍යාපනයේ ප්‍රශ්නය මතු වෙන්නේ. ගරු අමාත්‍යතුමා දුෂ්කර පළාතකින් ආවේ. අපි විශ්වාස කරනවා, මේ පෙට්ටිය ඇතුළේ ටයි දාලා ඉන්න නිලධාරීන් සියලු දෙනා කොළඹ නගරයේ සුපිරි පාසල්වල ඉගෙන ගත් අය නොවෙයි. මේ අය ගමෙන් ඇවිල්ලා, දුෂ්කර තත්ත්වයන් යටතේ ඉගෙන ගෙන නිදහස් අධ්‍යාපනයේ පිහිටෙන් තමයි අද මේ පුටුවල වාඩි වෙලා ඉන්නේ. ඒ නිසා මේ අයට වගකීමක් තිබෙනවා. අහිංසක මිනිස්සුන්ගේ අධ්‍යාපනය ආරක්ෂා කරලා දීලා, නිදහස් අධ්‍යාපනයෙන් ඒ මිනිස්සුන්ගේ ජීවිත ගොඩ නගා ගන්න උදව් කරන්න. හැබැයි, එවැනි තැනකට අධ්‍යාපන අමාත්‍යාංශය යනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. අධ්‍යාපනයට අවශ්‍ය කරන්නේ ප්‍රසන්න මිනිස්සු. අධ්‍යාපනයට අවශ්‍ය කරන්නේ ප්‍රබෝධමත් මිනිස්සු. කාගේ හරි ඇඟට කඩා පනිනවා නම්, ගුරුවරයෙක් ආවාට පස්සේ අධ්‍යාපන කාර්යාලයක ගුරුවරයාගේ ඇඟට කඩා පනිනවා නම්, ප්‍රසන්නව පන්ති කාමරයට යන්න පුළුවන් තත්ත්වය ගුරුවරයෙකුට හදන්නේ නැත්නම්, ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා අධ්‍යාපනය සංවර්ධනය වෙන්න නම් මේ ප්‍රසන්නකම හැම තැනම තිබෙන්න ඕනෑ. තමන් අධ්‍යාපනය හැදෑරුවේ නිදහස් අධ්‍යාපනයෙන් බව මතකයේ තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේක ඉස්සරහාට වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අධ්‍යාපනයේ තිබෙන බරපතළම ප්‍රශ්නය තමයි, පන්ති කාමරයේ ගුරුවරු නැති එක. ඉන්න ගුරුවරු ප්‍රසන්නව වැඩ කරන්නේ නැති එක. අද මේ පළාත් සභාවේ ඉන්න දේශපාලඥයෝ, ගරු මන්ත්‍රීවරු ළඟට දෙමව්පියෝ කීදෙනෙකු එනවාද පන්ති කාමරයේ ඉන්න ගුරුවරයාව මාරු කරලා දෙන්නය කියලා. ඒ අයට සුදුසුකම නැහැ. ඒ අයට වැඩ කරන්න අත්දැකීම් නැහැ. දැනුම නැහැ. අලසකම මිසක් ප්‍රබෝධමත්ව පන්ති කාමරයේ නැහැ. මේ අය හරහා ශිෂ්‍යත්ව විභාගයට දරුවෝ ගෙනියන්න බැහැයි කියලා පන්ති කාමරයේ ඉන්න ගුරුවරයා වෙනස් කරලා දෙන්නය කියලා කියනවා. එහෙම ඉල්ලීම් කරන දෙමව්පියෝ රාශියක් ඉන්නවා. මේ ගුරුවරු ඉතාමත් ශක්තිමත්ව පුහුණු කරන්න නම්, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය වඩා ශක්තිමත් වෙන්න ඕනෑ. හැබැයි, මම ඇමතිතුමාට කියන්න ඕනෑ. මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන්

[ගරු මහේෂ් අලේම්දා ]

ගරු අධ්‍යාපන ඇමතිතුමාට දන්වනවා. මේ පළාත් අධ්‍යාපන විෂය සම්බන්ධයෙන් තිබෙන විගණන විමසුම් අරගෙන කියවන්න කියලා. ගරු ආණ්ඩුකාරතුමාත් මේවා කියවනවා. ගරු ආණ්ඩුකාරතුමා පසුගිය දවසක පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ අධ්‍යාපන විෂයය සම්බන්ධයෙන් විගණන විමසුම් ගණනාවක් විමර්ශනය කරලා භාර දෙන්න කියලා දුන්නා. අපි ඒවා විමර්ශනය කරලා භාර දුන්නා. ඒ විගණන විමසුම් හරහා ගරු අමාත්‍යතුමාට අධ්‍යාපන අමාත්‍යාංශය දෙකට කපලා බලන්න පුළුවන් හැකියාව තිබෙනවා. මේකේ අධ්‍යාපන ධාරිතා සංවර්ධනයට මිලියන 121 ක් වෙන් කළා කියලා තිබෙනවා. මීට වඩා වැඩි ගණනක් තමයි වෙන් වෙලා තිබුණේ. මේ පොතේ තිබෙන්නේ, මිලයන 121 යි කියලා. මේ රුපියල් මිලියන 121 ගසා කෑවා කියලා කිව්වොත් මම හිතනවා, ඇමතිතුමා තරහා වෙන්නේ නැහැයි කියලා. මේ මිලියන 121 න් නිසි ප්‍රයෝජනය ගුරුවරුන්ට අරන් දුන්නේ නැහැ. ධාරිතා සංවර්ධනය සිද්ධ වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිණුම් කාරක සභාවේදී මේ පුහුණු වැඩ සටහන් තිබ්බා කියලා, සම්පත්දායකයෝ විධියට සම්බන්ධ වුණා කියලා, ඒවාට සම්බන්ධ වෙන්නේ නැතිව මුදල් ගත් නිලධාරීන්ගේ නම් හෙළිදරව් කරලා තිබුණා. මේ ගිණුම් කාරක සභාවේ මේවා විමර්ශනය කරන වෙලාවේ ඒ මුදල් ගත් නිලධාරීන් කාරක සභාවේ වාඩි වෙලා හිටියා. මේවා ඉතාම ලජ්ජා සහගත කාරණා. මේ පුහුණු වැඩ සටහන් වෙන්නේ නැහැ. මම ඔබතුමා මාර්ගයෙන් දැනුම් දෙනවා. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය වහාම ස්ථාපිත කරන්න කියලා. පුහුණු අධ්‍යක්ෂවරයෙක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පත් කරන්න කියලා. මේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලබන අවුරුද්දේ කරන පුහුණු වැඩ සටහන් ගැන මේ අවුරුද්දේ සැලසුම් කරන්නේ නැහැ. අද ඇහුවොත් දින නම් කරලා, ඒවායේ විෂයන් නම් කරලා පුහුණු වැඩ සටහන් ප්‍රමාණය තිබෙනවාද කියලා ඇහුවොත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ එහෙම එකක් නැහැ. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අවුරුද්දේ අන්තිම මාසයේ තමයි කාවද පුහුණු කරන්නේ කියලා මේ සැලසුම් ටික හදන්නේ. ඒ සේවාස්ථ සැසිලවලට ගුරුවරු සහභාගී වෙන්නේ නැහැ. ගුරුවරු සහභාගී වෙනවා කියලා ලැයිස්තු දාලා මේ මුදල් ටික හොරා කනවා. ඒ නිසා මේක අපරාධයක්. මේ අපරාධය නොවෙන්න නම් ගරු ඇමතිතුමාත්, මේ සම්බන්ධයෙන් වන නිලධාරීනුත් ඉතාම කාර්යක්ෂමව වැඩ කරන්න ඕනෑ. ඒ වාගේම අධ්‍යාපන පුහුණු අංශය ස්ථාපිත කරන්න ඕනෑ. පුහුණු අධ්‍යක්ෂවරයෙක් පත් කරන්න ඕනෑ.

ඊළඟ කාරණය තමයි. මම කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,මම කිව්වා. මේ වෙලාව මදි නිසා සිල්ලර කාරණා තමයි කථා කරන්න වෙන්නේ කියලා. ගුරු මාරු ප්‍රතිපත්තිය නිවැරදිව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මම ඇහුවොත්, අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතුව බස්නාහිර පළාතේ වසර 10 ට වඩා සේවය කරන ගුරුවරුන්ගේ නාම ලේඛනයක් තිබෙනවාද කියලා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ එහෙම එකක් නැහැ. මේ වැඩේ භාර දීලා තිබෙනවා, ගුරු මාරු මණ්ඩලවලට. මම ඊයේත් කිව්වා, දේශපාලන පක්ෂ මේ ගුරු මාරු මණ්ඩල හරහා තමන්ගේ දේශපාලන කටයුතු කරන්න ගුරුවරු පාවිච්චි කරලා. ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වෙන්නේ මේ දේශපාලඥයින්ට ඕනෑ විධියට. දේශපාලන පක්ෂවලට ඕනෑ විධියට. ගුරු මාරු ප්‍රතිපත්තියේදී තමන්ගේ දායකත්වය දීලා දේශපාලන පක්ෂ බරපතළ බලහත්කාරකමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම උදාහරණයක් කියන්න ඕනෑ. පාදුක්ක සිරි පියරතන විද්‍යාලයේ ගුරුවරු මාරු කරලා තිබෙනවා. අවුරුදු 10 ට වැඩි ගුරුවරු දෙන්නෙක් මාරු කළා. එක්කෙනෙක් ක්‍රීඩා විෂය භාරව ඉන්න ගුරුවරයා. අනික් කෙනා විනය භාරව හිටපු ගුරුවරයා. හැබැයි, මේ පාසලේ අවුරුදු 17 ක් වැඩ කරපු ගුරුවරු ගණනාවක් ඉන්නවා. ඒ අය දේශපාලන පක්ෂයක් නියෝජනය කරනවා. ඒ දේශපාලන පක්ෂයේ අය හෝමාගම අධ්‍යාපන කලාපයේ ගුරු මාරු මණ්ඩලයේ පුටුවල වාඩි වෙනවා. ඒ නිසා ඒ අයට මාරුව එන්නේ නැහැ. ඒ අයට පළිගන්න ඕනෑ අයව ගුරු මාරු ප්‍රතිපත්තිය යටතේමාරු කරලා දානවා. මේක බරපතළ අසාධාරණයක්. මේක අධ්‍යාපනයට කරන බරපතළ වැරැද්දක්. අද මාරු කරපු ක්‍රීඩා ගුරුවරිය නිසා, ක්‍රීඩා පාසලක් විධියට, බස්නාහිර පළාතේ ක්‍රීඩාවේ ලොකුම ප්‍රතිඵල ගන්න පාසලක් විධියට, සිරි පියරතන විද්‍යාලයට මේ ක්‍රීඩා ජයග්‍රහණ දිනාගන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ. ක්‍රීඩාවට අවශ්‍ය දක්ෂ ක්‍රීඩකයෝ බිහි කර ගන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. ඒ පාසලේ විනය කටයුතු ඉස්සරහාට කර ගෙන යන්න

ලැබෙන්නේ නැහැ. ඒ නිසා ගරු ඔබතුමාගේ මාර්ගයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමාට කියනවාමේ ගැන අවධානය යොමු කරන්නය කියලා. ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරද්දී, යම් නිශ්චිත තොරතුරු යටතේ මේ කාරණය කරන්නය කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් කියන්න ඕනෑ. බස්නාහිර පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පර්යේෂණ අංශයක් ස්ථාපිත කිරීම ඉතාම වැදගත්. පර්යේෂණ අංශයක් නැහැ. අද මේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කිසිම විෂය කාරණාවක් පිළිබඳ පර්යේෂණ සිද්ධ කරන්නේ නැහැ. අද අලුත් මුදල් ඇවිල්ලා තිබෙනවා. මේ මුදල් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මේ අවුරුද්දේ දෙසැම්බර් 31 ට රුපියල් මිලියන 7500 ක් එව්වා කියලා කියනවා. ඇත්තටම භෞතිකව එහෙම මුදලක් හම්බ වෙලා නැහැ. අද පළාතේ නියෝජ්‍ය ලේකම් ඉංජිනේරු ළඟ රුපියල් මිලියන 2000 ක වවුචර් තිබෙනවා, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන්න. රුපියල් මිලියන 258 යි ලැබිලා තිබෙන්නේ. මුදල් ලැබිලා නැහැ. සංඛ්‍යාවක් කියනවා, එහෙම ලැබුණා කියලා. හැබැයි, මේ මුදල්වලින් එක එක විද්‍යාලවල, එක එක ඉදි කිරීම් කරන්න කටයුතු කරලා තිබෙනවා. නමුත් පර්යේෂණාත්මකව මේ කරන්නේ මොනවාද කියන අධ්‍යයනය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය හමාරයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කාලය හමාරයිද? විනාඩියයිද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හමාරයි. මම ඒ විනාඩිය ගැන කියන්නෙත් නැතිව දුන්නේ ඒකයි. හමාර කරන්න පුළුවන් නම් වඩාත් හොඳයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මගේ කාලය අවසන් නිසා අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, එතුමාගේ කථාව සුවිශේෂී කථාවක්. ඒ නිසා මම එතුමාට පොඩ්ඩක්වත් බාධා කළේත් නැහැ. ඒ වාගේම ධාරිතා වැඩ සටහන් සම්බන්ධව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමායි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමායි මතු කරපු කාරණා සැලකිල්ලට ගන්නවා නම්, මම මූලාසනයේ සිට පොඩි යෝජනාවක් කරනවා. මේ ධාරිතා වැඩ සටහන් පිළිබඳව අපේ ව්‍යුහ කමිටුව තිබෙනවා. ව්‍යුහ කමිටුවට පෙර වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා ඉල්ලනවා. එතකොට අධීක්ෂණයක් වෙනවා. මීළඟට විපක්ෂය වෙනුවෙන් නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 10 ක් තිබෙනවා.

[පූ.භා. 10.39]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද එන කොට ගුවන් විදුලියේ ගීතයක් ඇහෙනවා,

*මා ඉතින් යන්න යනවා*
*මට යන්න අවසරයි*
*මට අරන් යන්න ඇත්තේ*
*ඒ මතකය විතරයි*

කියලා. තව පොඩ්ඩක් ගැස්සුනා නම් අධ්‍යාපන ඇමතිතුමාට වෙන්නේ ඒක තමයි.

*මා ඉතින් යන්න යනවා*
*මට යන්න අවසරයි*
*මට අරන් යන්න ඇත්තේ*
*ඒ මතකය විතරයි*

දශක දෙකහමාරක මතකය විතරයි. දශක දෙකහමාරක් විතර මේක ඇතුළේ ඉන්නවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට එහෙමයි. දැන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කියපු දේවල් ඇත්ත. එතුමා පසුගිය කාලයේ හිටියේ පුදුම මානසික ආතතියකින්. මැතිවරණ කොමසාරිස්තුමා හිටියා වාගේ. හිටපු මැතිවරණ කොමසාරිස්තුමා හිටියා වාගේ තමයි මෙතුමාත් හිටියේ.

[ගරු නිරෝෂන් පාදුක්ක ]

ගැමුණු කුමාරයාට වුණු දේ. එහෙන් මහ මුහුද. මෙහෙන් අර කවුද කිව්වා. ඒ වාගේ තමයි එතුමාත් හිටියේ. එතුමාටත් කප්පරක් ප්‍රශ්න තිබුණා. ඒ නිසා එතුමාගේ නොපසුබට උත්සාහය නැතිව ගියා. උට්ඨාන වීර්යය අභිමි වුණා. ආත්ම ශක්තිය හීන වුණා. ප්‍රඥාව ගලාගෙන ගියා. ඒ නිසා එතුමා පසුගිය කාලයේ අර මැරිලා ගන්ධබ්බ අවදියේ ඉන්නේ දවස් හතක්. ඒ වාගේ තමයි හිටියේ. පා වී පා වී වායු ගෝලයේ හිටියේ. දැන් අපට පුළුවන් වුණා එතුමාව අරගෙන ආයිත් පුටුවේ වාඩි කරවන්න. සියලු පාර්ශවවල එකඟතාවයකින්. කැමැත්තකින්.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගෙත් දශක දෙකකට ආසන්න වන පළාත් සභා ජීවිතයේ අධ්‍යාපන උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරයෙකු විධියට වගකීමෙන් කියනවා,මේ පසුගිය වසර තුළ මේ අධ්‍යාපන උපදේශක කාරක සභාවේ ආපු එලදායීත්වය පිළිබඳව අපට ගැටළු තිබෙනවා. අපි ඒකේ බොහෝ තීන්දු ගත්තාට වැඩිය වුණේ, බොහෝ කාලයක් කථාකරපු එක විතරයි. එහෙම වෙන්න බැහැ. තීන්දු ගන්න ඕනෑ. මේ ලංකාවේ පාර්ලිමේන්තුවේ හෝ වේවා, පළාත් සභාවේ හෝ වේවා, රටක අමාත්‍යධුරයක් තිබෙනවාද? ජනප්‍රිය නොවන අමාත්‍යධුරයක් තිබෙනවාද? ඒක ඉතිහාසය පුරා ජනප්‍රිය නොවුණු තනතුර තමයි අධ්‍යාපන ඇමතිකම. ඒ නිසා තමයි නිදහස් අධ්‍යාපනයේ පියා සී.ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාට 1947 දී ව්‍යාපාරිකයෙකුට පැරදිලා ගෙදර යන්න වුණේ? එදා එතුමා මේ රටේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය හදන්න, මේ රටේ රාජ්‍ය නායකවරු නැව්ගත වෙනකල් හැංගිලා හිටියා. පනත ගේනවා. ගෙනියනවා. දාන්නේ නැහැ. මොකද, කණ්ඩායමක් ඉන්න නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පළාතේ අධ්‍යාපන ඇමති ජනප්‍රිය චරිතයක් වෙන්නේ නැහැ. හැබැයි, අධ්‍යාපන ඇමතිවරයකු ගන්නා තීන්දු, තීරණ ඒ පළාතේ ජනතාවට වැඩදායි වෙනවාද නැද්ද කියලා තේරෙන්නේ යමක් ක්‍රියාත්මක කරලා අවුරුදු හතරක් පහක් ගියාට පස්සේ.

දැන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් විධයට ගන්න. කොළඹ රාජකීය විද්‍යාලය. එක පන්තියකවත් පන්ති කාමර 15 ක් නැහැ. බස්නාහිර පළාතේ කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ මේ අවුරුද්දේ පන්ති කාමර 15 ක් 6 ශ්‍රේණියට යනවා. මේවා කාගේ තීන්දුද? කාගේ ඉතිහාස කථාද? ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියන්නේ, තමුන්නාන්සේට මේකයි වෙලා තිබෙන්නේ. දැන් කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ මීට කාලයකට ඉස්සෙල්ලා ප්‍රසන්න රණතුංග මැතිතුමා මේකේ මහ ඇමති කාලයේ එක්කෙනෙක් කොට්ටාව හන්දියේ ගහක් උඩ. අද මොකක්ද වෙලා තිබෙන්නේ? පාසල් තුනක ළමයි ගෙනැල්ලා වාසුමතී ඉස්කෝලෙට දාලා, වාසුමතී පාසලෙන් කොට්ටාව ධර්මපාලයට එවනවා. දැන් උසස් පෙළ දක්වා අනිවාර්යය කරලා. ඒකේ ගොඩනැගිලි හදන්න ඉඩක් නැහැ. ඇයි? පන්ති කාමර 15 ක්. මේවා ඉතිහාසයේ වැරදි තීන්දු. ඒ නිසා මේවා කරන්න බැහැ. මම තවදුරටත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හරහා ප්‍රකාශ කරන්නේ. අධ්‍යාපන ඇමති ජනප්‍රිය ක්‍රීඩකයෙක් නොවෙයි. එයා හොඳම ක්‍රීඩකයා විය යුතුයි. ඒ නිසා මීට වඩා ඒ තනතුර වර්ණවත් වෙන්න -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කොට්ටාවට Swimming pool එකක් හදලා දුන්නා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර මූලාසනය අමතන්න. නැත්නම් කාලය මදියි කියලා අන්තිමට චෝදනා කරන්න එපා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒක තමයි. මේ ෆ්‍රී ස්ටයිල් ඉන්න කොට හරිම අමාරුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ හරහා මම ඉල්ලා සිටින්නේ. මේ පළාතේ අපට කථා කරන්න බොහෝ දේවල් තිබෙනවා. අද ලංකාවේ ජාත්‍යන්තර පාසල් තිබෙනවා. ඊට පස්සේ ජාතික පාසල් තිබෙනවා. ඊට පස්සේ ශාන්තුවරුන්ගේ පාසල් තිබෙනවා. මේ හැම එකකම නැත්තේ, විදුලි ආදාහනාගාරයක් විතරයි. අනික් ඔක්කොම තිබෙනවා. හැබැයි, ඊට පස්සේ හොර සහතික හදන්න බැරි වුණු මිනිස්සුන්ගේ ළමයි තමයි අපේ පළාත් සභා පාසල්වලට එන්නේ. ඒකෙත් A Grade පාසල් පද්ධතියක් තිබෙනවා. දැන් කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ ළමයින් 5000 ක් ඉගෙන ගන්නවා. ජාතික පාසලක ස්වභාවය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

මේවා බේදවාචක. මේ තීන්දු වෙනස් කරන්න ගියාම අධ්‍යාපන ඇමතිතුමා ජනප්‍රිය ක්‍රීඩකයෙක් වෙන්නේ නැහැ. හැබැයි, ඒ උපදේශක කාරක සභාවත් එක්ක කථා කරලා ඒකමතික තීන්දුවක් ගන්නවා නම්, ඒවා අනාගත පරම්පරාව රංජිත් සෝමවංශ මහත්තයා අර මතුගම සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහත්තයා පැරදිලා ගෙදර ගිහින් ඉන්න කොට වාගේ මෙතුමාත් කවදා හරි ගමේ වෙල් යායේ ඇවිදින කොට කියයි, අරකා තමයි අධ්‍යාපන පනත හදපු එකා. ඕකා හොඳ එකා කියලා. ඒ නිසා හෘද සාක්ෂියට එකඟව අපි වැඩ කරමු.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමා මගින් ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. අමාත්‍යාංශයේ කප්පරක් වැරදි තිබෙනවා. ඒවා මේ අවුරුද්ද තුළ ඔබතුමාට ඒවා නිවැරදි කරන්න වෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයට අලුත් සංසායනාවක් ඕනෑ. ඒ සංසායනාව තුළ ජනප්‍රිය ක්‍රීඩකයෝ අයින් කරලා, හොඳ ක්‍රීඩකයෝ තෝරා ගන්න ඕනෑ. ගරු ඇමතිතුමා මේ ක්‍රීඩාව හරියටම කරන්න ඕනෑ. ඒ නිසා ගුරු උපදේශකවරු - අපට විසඳුමක් නැහැ. පසුගිය රජය අල්ලසක් දීලා ගුරු උපදේශකවරු කියලා පත් කරන්න. මේ එක ගුරුවරයෙක් පන්ති කාමරයකට යන්නේ නැහැ. 35,000 ක් ගුරුවරුන්ගෙන් කණ්ඩායමක් sick. කණ්ඩායමක් maternity leave. පන්ති කාමර කීයක ගුරුවරු නැද්ද? අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගුරු උපදේශකයා පන්තියට යන්නේ නැහැ. ගුරුවරු නැහැ. මේක තමයි යථාර්ථය. මේක තමයි තිත්ත වුණත් ඇත්ත. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හරහා මම ඉල්ලා සිටිනවා. මේ ක්‍රියාකලාපය තුළ මේ අර්බුද කළමනාකරණය කිරීමේ සම්පූර්ණ වගකීම කලාප අධ්‍යක්ෂවරු හරහා කොට්ඨාශ අධ්‍යක්ෂවරු හරහා මම විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම තමයි ගුරුදා විග්‍රහය අධ්‍යාපන අමාත්‍යාංශයට එතරම් සුන්දර නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයට යන්න කාට හරි කැමට පෙර බෙහෙත් බොන්න තිබෙනවා නම්, එයාට බෙහෙත් බොන්න වෙන්නේ නැහැ. ඇයි? අධ්‍යාපන අමාත්‍යාංශයට ගියාමwaiting list එකක් තිබෙනවා. ඉස්සෙල්ලා දවසේ ගිහිල්ලා ඉන්න වෙනවා. හොරිවිල වෙද මහත්තයා හම්බ වෙන්න යනවා වාගේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔය කියන්නේ ඉසුරුපාය ගැනද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ. ගරු ඇමතිතුමාගේ අලුත් නවාතැන.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අධ්‍යාපන අමාත්‍යාංශය කිව්වාම දෙකක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

රන්මඟ පාය. මේක රන් මඟක් නොවෙයි. ඒක පුදුම දුෂ්කර මගක්. එතැනට එන ජනතාවට ගැස්ට්‍රික්. ඒ නිසා එතැනට එන ජනතාවට අලුත් ක්‍රමවේද, කළමනාකරණ සංකල්ප ඕනෑ. ජනතාවට ප්‍රශ්න විසඳලා පල්ලෙහා පුටුවලින් විසඳන්න පුළුවන් ඒවා තිබෙනවා. ඊළඟ පුටුවලින් විසඳන්න පුළුවන් ඒවා තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසන් කරනවා නම් යෙහෙකි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

තව ටිකක් කාලය දෙන්න කෝ. කරුණු ගණනාවක් කියන්න තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඊළඟට එනවා ක්‍රීඩාව. අපේ උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා දිවි හිමියෙන් ආරක්ෂා කරපු පොල්වත්ත. එතකොට කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ පොල්වත්තට තිබුණේ පුදුමාකාර ආදරයක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමාගේ කාලයෙන් විනාඩියක් දුන්නා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතුමා එහා පැත්තේ ඉඩම්නුත් ගන්න බැලුවා. ඒ වාගේ සුන්දර ස්ථානයකට අද ලක්ෂ දෙකහමාරද කොහේද පොල්වත්තේ එකටයි, ගම්පහ එකටයි දීලා තිබෙන්නේ. ලක්ෂ 25 න් පුළුවන්ද? කථා කරන්නේ ඔලිම්පික් දුවන්න.

[ගරු නිරෝෂන් පාදුක්ක ]

ඔලිම්පික් දුවන්න තියා කුඹුරේ දුවන්නත් බැහැ මේ මුදලින්. ජාත්‍යන්තර තරගවලට යවන්න. ජාත්‍යන්තර නොවෙයි මතුගමින් මෙහාට කොල්ලෙක් ගේන්න වෙන්නේ නැහැ, මෙහෙම දුවලා. මේවා හරියන්නේ නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයට ක්‍රීඩා අමාත්‍යාංශය එකතු කරලා තිබෙන්නේ, වසර ගණනාවකට පස්සේ. ඒකෙන් අපි උත්සාහ කරලා බලනවා. අද ලංකාවේ පාසල් ක්‍රීඩා පද්ධතියම කඩාගෙන වැටිලා. ඉස්සර අර්ජුන රණතුංගලා, අරවින්ද ද සිල්වලා අවුරුදු 11 දී ක්‍රිකට් ගහනවා. අපේ රටේ හිටපු අධ්‍යාපන ඇමතිතුමා මොකක්ද කළේ? වයස 13 න් පහළ ක්‍රීඩා තරගාවලි නැවැත්තුවා. ඉතිහාසයේ. මොකක්ද කිව්වේ? තරගකාරීත්වය හොඳ නැහැයි කියලා. ශිෂ්‍යත්වයට මරා ගන්නවා, අම්මයි පුතායි ගිහිල්ලා තරගයට. ශිෂ්‍යත්වයෙන් පස්සේ එන හයේ හතේ පන්තිවල පොඩි එකාට ක්‍රිකට් වුනමන්ට් ගහන්න හොඳ නැහැ. රගර් ගහන්න හොඳ නැහැ. එල්ලේ tournament හොඳ නැහැ. මෙහෙම රටක්. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හරහා මම ඉල්ලා සිටිනවා. මධ්‍යම ආණ්ඩුව කරන්නේ නැත්නම් මේ බස්නාහිර පළාතේ පාසල් අතර නැවතත් ක්‍රීඩා තරගාවලි ආරම්භ කරන්න ඕනෑ. මම හැමදාම කියපු එකක් තමයි පළමුවැනි ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකරලා, උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමයි, ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමයි ඔය සංවාදය එළියට ගිහින් කර ගන්න. මේ වැදගත් කථාවක්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෙජිනෝල්ඩ් කුරේ අධ්‍යාපන ඇමතිතුමාගේ කාලයේ සිටම මම හැමදාම කියපු එකක් තමයි, බස්නාහිර පළාතට තමන්ටම ආවේණික පළමු වැනි ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛයක් අවශ්‍යයි. තිබුණා. ඉතිහාසයේ වුණේ, මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතියි, පළාත් සභාවේ අධ්‍යාපන ඇමතියි රණ්ඩු වෙලා ඒක විනාශ වුණා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මෙතුමා ගත්ත කාලය පොලීසියෙන් ද දෙන්නේ. ඒක දෙන්නේ නැද්ද.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඇයි? ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමාගෙන් දුන්නා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

දුන්නා. මෙතුමා බාධා කරපු කාලය. එයාගෙන් අඩු කරන්න කෝ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒක තත්පර ගාණයි. ඒක සුළඟේ පා වෙලා ගියා. හරි බොහොම ස්තුතියි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේ ඔරලෝසුව කොහේද හැදුවේ. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට රොජර් සෙනෙවිරත්න -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගණපූරණය පිළිබඳව අවධානය යොමු කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර සීනුව නාද කරන්න.

***පූර්ණ කාරක සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.***

***පසුව ගණපූරණය ඇති නොවූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් පූර්ණ කාරක සභාව තාවකාලිකව අත් සිටුවන ලදින් පූ.භා. 10.56 ට යළිත් රැස් විය.***

*Committee of the whole council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*

*Later, it found no quorum, Hon. Presiding Member suspended the sitting temporarily and it resumed at 10.56 a.m.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පසුගිය දේවල් සියල්ල අමතක කරලා, අපි හා හා පුරා කියලා දැන් සභාව පවත්වාගෙන යනවා. මීළඟට රොජර් සෙනෙවිරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. එතුමා සභාවේ නැති බවයි පෙනී යන්නේ. මීළඟට තිබෙන්නේ නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමාගේ කාලය. එතුමා සභාව අමතන්නේ නැති බව සඳහන් කරලා උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට ඒ කාලය දෙන්න කියලා දන්වා තිබෙනවා. ඒ නිසා උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 10.58]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සතුටු වෙනවා, බලහත්කාරකමින් හරි හිටපු අමාත්‍යවරයා හැටියට විනාඩි 10 ක් ඉල්ලා ගැනීම සම්බන්ධව. ඒකට මට සහාය දුන්න අපේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ගරු මන්ත්‍රීවරුන්ටත්, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ටත් මේ සභාවේ මගේ ස්තුතිය ප්‍රථමයෙන්ම පුද කර සිටිනවා. මම මේ සභාවේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. මම හිටපු අමාත්‍යවරයෙක්. මම කරපු වැඩ කොටසක් මේ සභාවේ ඕනෑම ගමක ගියාම පේන්න තිබෙනවා. මම අද අධ්‍යාපනය ගැන කථා කරන්නේ නැහැ. මොකද, අධ්‍යාපනය ගැන කථා කරනවාට වඩා මේ රටට අවශ්‍ය වෙලා තිබෙන්නේ සංස්කෘතිය, ක්‍රීඩා විෂය. අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන කිව්වා. අද බලන්න සංස්කෘතික විෂය ගත්තාම අපි මේ පළාත් සභාවේ තිබුණු සංස්කෘතික විෂය අරගෙන අපේ හිටපු මහ ඇමති ප්‍රසන්න රණතුංග මැතිතුමා කැබිනට් පත්‍රිකාවක් දාලා, සෑම පන්සලකම දහම් පාසල් දියුණු කිරීම සඳහා අපි රුපියල් ලක්ෂය බැගින් ඒ දහම් පාසල්වලට දුන්නා. මම සංස්කෘතික අමාත්‍යාංශයට ප්‍රඥප්තියක් ගෙනැල්ලා, රුපියල් ලක්ෂ පහක් සීමාව වැඩි කරලා මේ මන්ත්‍රීවරුන්ට දුන්නා. පන්සලක දහම් පාසලක් හදන්න, කතෝලික දේවස්ථානයක ඒ කතෝලික දරුවන්ට උදව් කරන්න, ඒ වාගේම හින්දු දේවස්ථානයක හින්දු දරුවන්ට උදව් කරන්න, ඒ වාගේම මුස්ලිම් අයට ඒගොල්ලන්ගේ අවුරුද්දට රට ඉදි දෙන්න, ඒ අයට ඒ දරුවන්ගේ ඇඳුම් ලබා දෙන්න කටයුතු කළා. අපි මේ වාගේ වෙනසක් කළා. ඒ විතරක් නොවෙයි. බස්නාහිර පළාතේ දහම් පාසල් පන්සල් තුන් දහස් ගණනක් තිනෙවා. මේ මන්ත්‍රීවරුන්ට ඒ තුන් දහස් ගණනටම ඒ දහම් පාසල් දරුවන් ළඟට ගිහිල්ලා තමන්ගේ විමධ්‍යගත අරමුදලින් ලක්ෂ 05 ක් දෙන්න පුළුවන් වුණු නිසා, ඒ මහා සංඝරත්නය, කතෝලික පූජකවරු, හින්දු පූජකවරු සියලු දෙනාම ඒකරාශී කර ගන්න පුළුවන්කමක් ලැබුණා. මේ ඇමතිතුමා, සත පහක්වත් මේ අයවැයෙන් ඒවාට යෝජනා කරලා නැහැ. සල්ලි වෙන් කරලා නැහැ. අපට අයවැය හදන දෙපාර්තමේන්තුවෙන් එහෙම සල්ලි දුන්නේ නැහැ. නමුත් අපේ අමාත්‍යාංශයට ලැබුණු ඒ මූලික කොටසෙන් තමයි අපි සංස්කෘතික විෂයයට ගණනක් වෙන් කර ගත්තේ. ඒ අනුව තමයි අපි ඒවාට බෙදලා දුන්නේ.

ඒ වාගේම මම හිටපු ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට ක්‍රීඩා විෂය පිළිබඳවත් සඳහන් කරන්න ඕනෑ. Swimming pool තුනක් දිස්ත්‍රික්ක තුනට දුන්නා. අපේ හිටපු මහ ඇමති ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ මීනුවන්ගොඩ ආසනයට එක Swimming pool එකක්. කොට්ටාව ධර්මපාල විද්‍යාලයට ස්විමිං පූල් එකක් දුන්නා. ගාමිණී තිලකසිරි ඇමතිතුමාත් ඒ උත්සවයට ආවා. මුල්ගල් තිබ්බා. මේ මන්ත්‍රීවරුන්වත් ඒකරාශී කර ගෙන සභාවේ සල්ලි නැතිව මම 'සමූපකාර මේලා' කියලා සමූපකාර කානිවල් එකක් තියලා, ඒ කානිවල් එකේ ලාභයත් අරගෙන, ඒ පාසල්වල ආදි ශිෂ්‍යයොත් එකතු වෙලා තමයි පිහිනුම් තටාකයක් හදලා දුන්නේ. (බාධා කිරීමක්) හැම මන්ත්‍රීවරයෙක්ම කිව්වා, අධ්‍යාපනයට සල්ලි කපලා තිබෙනවාය කියලා. දැන් ඒ ඉස්කෝලේ කම්කරුවන්ට පඩි ගෙවන්නේ කොහොමද? ලයිට් බිල් ගෙවන්නේ කොහොමද? ඒවායේ සනීපාරක්ෂක කම්කරුවන්ට පඩි ගෙවන්නේ කොහොමද? ඒ ඉස්කෝලෙට පිහිනුම් තටාකයෙන් ලැබෙන ආදායම මාසයකට ලක්ෂ හතරක් විතර වෙනවා. ඒවායෙන් තමයි ඒකේ පඩි ගෙවන්නේ. ලයිට් බිල් ගෙවන්නේ. ආණ්ඩුවේ සල්ලි ඕනෑ නැහැ. ඇමතිවරුන්ගේ මුදල් පාලනය කර ගන්න ඕනෑ. අපි රජයේ මුදල් ගන්නවා කිව්වා, රජයේ මුදල් කිව්වාම මහජනතාවගේ මුදල්. මහජනතාවගේ බදු තමයි මෙකේ තිබෙන්නේ. ඒ නිසා ගරු ඇමතිතුමා කනගාටු වෙන්න ඕනෑ. මොකක්ද හේතුව? ඇමතිතුමාට කණ්ඩායමේ විශාල විරෝධයක් තියෙද්දී, මහ ඇමතිතුමා තමුන්නාන්සේ ගැන පත්තරේ පිටු ගණන් ලියද්දී, අපි කණ්ඩායමක් හැටියට තමුන්නාන්සේ වෙනුවෙන් කථා කරලා, මේ ප්‍රශ්නය බේරුවේ අපි. අපේ මහ ඇමතිතුමාම

[ගරු උපාලි කොඩිකාර ]

කියනවා, නිශාන්ත වර්ණසිංහට වුණු දේ රංජිත් සෝමවංශට කර ගන්න එපාය කියලා. නමුත් අපි කණ්ඩායමක් හැටියට එකඟ වෙලා, මන්ත්‍රීවරු කථා කරලා තමුන්නාන්සේව අපි බේරුවා. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය තමයි සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ අඩුම ප්‍රගතිය තිබෙන අමාත්‍යාංශය. දැන් මේකට සල්ලි හම්බ වුණේ නැහැ. දැන් සල්ලි තිබිලාද අපි වැඩ කළේ. ස්විමිං පූල් හැදුවා. ක්‍රීඩා පිට්ටනි හැදුවා. වොලිබෝල් පිට්ටනි හැදුවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගෙදරින් ගෙනැල්ලා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි මන්ච් ආයතනය, කඳුරට කුඩ ආයතනය අල්ලා ගෙන ආයෝජනය කළා. ආයෝජකයෝ ඇල්ලුවා. මේවා ඉස්කෝලවලට හදලා දුන්නා. මේ පළාත් සභාවේ හැමදාම අයවැය කිව්වාම අපේ ගරු මන්ත්‍රීවරු ටික දින හයක් කථා කරලා, අයවැය ප්‍රකාශයේ දෙන ඉලක්කම් ටික ගැන කථා කරලා යනවා. ඇමතිවරුත් ගෙදර ගිහිල්ලා පහුවෙනිදාට ෆයිල් ටිකත් අරන් අමාත්‍යාංශයට එනවා. අලුත් වැඩක් කරන්න තේරෙන්නේ නැහැ. දැන් අධ්‍යාපන අමාත්‍යාංශයට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් ගෙනාවා "ළඟම පාසල හොඳම පාසල" කරන්න කියලා. දැන් මේකට කොටස් වශයෙන් දුන්නා. මගේ කොට්ඨාශයේ ඉන්නවා නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා. ඒ වාගේම රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා මෙතැන ඉන්නවා. එක මුල් ගලක්වත් තිබ්බාද? මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපති අධ්‍යාපනයේ දැක්ක අනාගතය වෙනුවෙන් මේ කථා කරන අපට, ඇයි මෙපමණ ප්‍රායෝගික ශක්තියක් ආවේ. මම ඉස්කෝලේ යන කාලයේ මගේ ඉස්කෝලේ වඩු වැඩ, ලේත් මැෂින් වැඩ, කොණ්ඩා කැපීම, වැල්ඩින් වැඩ මේවා ඔක්කොම අපි කළා. (බාධා කිරීම්) අපට පොත පතේ ඥානයත් එක්කම දැතේ ඥානයකත් හම්බ වුණා. දැතේ ඥානයෙන් තමයි අපි වැඩක් කරන්න ඉගෙන ගත්තේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් ගරු ඇමතිතුමාට කියනවා. (බාධා කිරීම්) මේ රටේ අනාගතය තිබෙන්නේ, අපේ කොල්ලෝ කෙල්ලෝ අතේ. අපි හදපු දරුවන් අතේ. අපේ අම්මලා මාස නවයක් බඩේ තියාගෙන මේ දරුවාව එළියට ගෙනැල්ලා මේ රටේ අනාගතයට දෙන්නේ, මේ දරු සම්පත. මේ දරු සම්පත ආරක්ෂා කිරීමේ මූලික තැන තමයි අධ්‍යාපනය. තමුන්නාන්සේත් විශ්ව විද්‍යාලයේ ගිහිල්ලා, බත් පැකට් එක කාලා හිටපු කෙනෙක්. තමුන්නාන්සේ වෘත්තීය සමිතිවලට සහභාගී වුණු කෙනෙක්. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය ගලවන්න අයවැය ඕනෑ නැහැ. අපට පුළුවන් විශ්වාසභංගයකින් ගලවන්න. ඒ නිසා විශ්වාස භංගයක් ගේන්න කටයුතු කර ගන්න එපාය කියමින් (බාධා කිරීම්) ඒ නිසා අපේ බස්නාහිර පළාත් සභාවේ ඉන්න, ජනගහනයෙන් තුනෙන් එකක් ජීවත් වන පළාත හැටියට (බාධා කිරීම්) මුස්ලිම්, දෙමළ සහෝදරයෝ 8% ක් ජීවත් වන පළාත හැටියට මේ සියලුම දරුවන්ට සංස්කෘතික අමාත්‍යාංශය හරහා සංහිඳියාව ඇති කරන්න ඕනෑ. දැන් බලන්න. එදා පෘතුගීසී, ලන්දේසි, ඉංග්‍රීසි මේ රටට එන කොටත් මේ රටේ සංහිඳියාව තිබුණා. එදා දුටුගැමුණු - එළාර ගහ ගන්න කොටත් මේ රටේ මුස්ලිම් මනුස්සයා, සිංහල මිනිහා, දෙමළ මිනිහා ජීවත් වුණා. (බාධා කිරීම්) ඒ නිසා සියලුම ජාතීන් ඒකරාශී කර ගෙන තමුන්නාන්සේගේ සංස්කෘතික අමාත්‍යාංශය පණ ගන්වන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට දරුවන්ටත් ක්‍රීඩා අමාත්‍යාංශයට හොඳ නීරෝගී මිනිස්සු හදන කොට අධ්‍යාපන ඥානය දරුවාට නිකම්ම ලැබෙනවා, ඉස්කෝලෙන්. අන්න එහෙම කරන්න කියලා ඉල්ලමින්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***

*[Expunged on the order of the chair]*

මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෛත්‍රීපාල කවුරු කියලාද කිව්වේ. ජනාධිපතිතුමාට එහෙම කියන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු ජනාධිපති සංහිඳියාවේ නායක -

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම ලේකම්තුමාට උපදෙස් දෙනවා කරුණාකර අනවශ්‍ය වචන ඉවත් කරන්න කියලා. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ කථාව හොඳයි. අන්තිම ටික තමයි නා ගත්තේ. මීළඟට ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාට -

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ඒක ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නාඩා එක හැදුවේ එයාද? මම තමයි. පුටුවක වාඩි වෙන්න බැහැ. මම තමයි උපදේශක කාරක සභාවේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර වාඩි වෙන්න. ඔබතුමාගේ කාලය ඉවරයි. මීළඟට ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[සභාවේ ඝෝෂා]

[පූ.භා. 11.09]

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපාලි කොඩිකාර අපේ හිටපු අමාත්‍යතුමා නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමාගේ කාලය අරගෙන මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට දොස් කියලා, බැනලා කථාව අවසන් කළා. කෙසේ වෙතත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෑම මහජන නියෝජිතයෙකුගේම විශේෂයෙන්ම මේ අපේ පළාත් සභාවේ ඉන්න පක්ෂ විපක්ෂ සියලු දෙනාගේම අවධානය යොමු වන විෂය කරුණක් පිළිබඳවයි අපි අද සාකච්ඡා කරන්නේ. ඒ විෂයට අදාළ වැය ශීර්ෂය පිළිබඳව. අපේ රටේ පමණක් නොවෙයි. ලෝකයේත් පැවැත්ම සහ අනාගතය තීන්දු වන විෂය පිළිබඳව අපි අද කථා කරන්නේ. ඒ වාගේම අධ්‍යාපනික දැනුමක් තිබෙන, ඒ වාගේම ක්‍රීඩා කුසලතාවයන් නිසා අනෙකුත් බාහිර ක්‍රියාකාරකම්,හැකියාවන් සහ දක්ෂතාවයන් සහිත, ඒ වාගේම හෙට දවසේ අනාගතයේ අභියෝග ජය ගන්නට පුළුවන් තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම සහිත, ඒ වාගේම කලා කටයුතු, සෞන්දර්ය කටයුතු, සංස්කෘතිය පිළිබඳ සංවේදී උගත්, බුද්ධිමත්, මානව හිතවාදී පුරවැසියෙකු බිහි කරලීමේ වැඩි වගකීම තිබෙන අමාත්‍යාංශයක වැය ශීර්ෂයට තමයි අපි මේ මුහුණ දෙන්නේ. එහෙම නම් ඒකට නායකත්වය දෙන රංජිත් සෝමවංශ ගරු ඇමතිතුමාට, එයට අදාළ අනෙකුත් මහජන නියෝජිතයින්ට, නිලධාරීන්ට තිබෙන වගකීම පිළිබඳව අපි සුළු කොට තැකිය යුතු වෙන්නේ නැහැ.

ඒ වාගේම මේ අමාත්‍යාංශය පිළිබඳව මම හිතන්නේ වැඩිපුරම විවේචන සහ පැමිණිලි පසුගිය කාලයේ පුරාවටම මේ පළාත් සභාව තුළ ඉස්මතු වෙනවා, අපි දැක්කා. අමාත්‍යවරයාට, අනෙකුත් නිලධාරීන්ට දැඩිව විවේචන එල්ල වෙනවා අපි දැක්කා. අපි අදත් දුටුවා. එසේ නම් මම දකින්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය වර්තමාන ගරු අමාත්‍යවරයාගේවත්, වර්තමානයේ සිටින නිලධාරී මණ්ඩලයේවත් වරද නොවෙයි. පසුගිය ඉතිහාසය පුරාවට අරගත්තාම මේ විෂයයට නායකත්වය දුන්නු සියලුම ගරු අමාත්‍යවරුන් ඇතුළු ඒ නිලධාරී කණ්ඩායම ඒ කාලය තුළදී ඒ කාලීන තීන්දු තීරණ, ප්‍රතිපත්ති තීන්දු තීරණ නොගැනීම නිසා තමයි අද මේ තත්ත්වය අධ්‍යාපන විෂයය සම්බන්ධව ඇති වෙලා තිබෙන්නේ. පසුගිය කාලය පුරාවටම අධ්‍යාපන විෂයය ක්ෂේත්‍රය මෙහෙයවපු අය තමන්ගේ පෞද්ගලික අවශ්‍යතාවයන්, පෞද්ගලික ඕනෑ එපාකම් මත තීන්දු තීරණ ගත්තා. අපි කවුරුත් පිළිගන්නවා. අධ්‍යාපන ක්ෂේත්‍රය තරම් සංකල්ප බිහි වන ක්ෂේත්‍රයක් වෙන කොහේවක්වත් නැහැ. දැන් තිබෙන සංකල්පය තමයි, "හොඳම පාසල ළඟම පාසල" කියන එක. ඒක අපේ ආණ්ඩුවේ, අපේ අධ්‍යාපන ඇමැතිවරයා ඉදිරිපත් කරපු එකක්. පසුගිය කාලයේත් නොයෙකුත් සංකල්ප බිහි වුණා. ද්විතියික පාසල් සංකල්පය වෙන්න පුළුවන්. එහෙම නැත්නම් නවෝදයා පාසල කියයි. අතුරු මිතුරු පාසල කියයි. නොයෙකුත් ආකාරයේ සංකල්ප මේ අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා බිහි වෙනවා. හැබැයි, ඒ බොහෝ සංකල්ප

[ගරු ලෙනාඩ් කරුණාරත්න ]

බිහි වන්නේ, තමන්ගේ දේශපාලන චරිතය උලුප්ප ගන්නයි. ඒක තමයි ඇත්ත. මේ රටට අවශ්‍ය කරන, කාලීන අවශ්‍යතාවය මත, හෙට දවසේ අවශ්‍යතාවය වෙනුවෙන් මේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ප්‍රතිපත්ති සැකසෙන්නේ නැහැ. ඒ නිසා තමයි අද මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම අද අපට අභියෝගයක් තිබෙනවා. ජාතික පාසල්වලට ඇතුළත් වන දරුවන් සංඛ්‍යාව අඩු වෙමින් පවතිනවා. මධ්‍යම රජය වෙන්න පුළුවන්. පළාත් පාසල වෙන්න පුළුවන්. ඒ දරුවන් ජාතික පාසලේ විෂයය නිර්දේශය පිළිබඳව තිබෙන විශ්වාසය දෙමව්පියන් තුළ, දරුවන් තුළ අඩු වෙමින් පවතිනවා. ඒ දරුවා අද ගමන් කරන්නේ අපි කැමැති වුණත්, අකැමැති වුණත්, මොන විවේචන එල්ල වුණත් පෞද්ගලික සහ අනිකුත් ජාත්‍යන්තර පාසල්වලටයි. එහෙමනම් අපට තිබෙන වගකීම මොකක්ද? අභියෝගය මොකක්ද? අපි නිදහස් අධ්‍යාපනය ලබා දෙනවා කියලා, පොදුවේ දේශපාලන පක්ෂ තීන්දු තීරණ අරගෙන ඒ වෙනුවෙන් පෙනී සිටියාට, අපේ ගමේ පාසලේ දරුවා, නගරයේ පාසලේ දරුවා, අපේ ජාතික පාසලට ගෙන්වා ගැනීමේ අභියෝගය හෙට දවසේ අපට තිබෙනවා. අද අපි ගෙන්නා ගන්නවා. මොනයම් හේතුමත හරි අපි ඒ දරුවා පාසලට ගෙන්නා ගන්නවා. අද අ.පො.ස (සාමාන්‍ය පෙළ) සහ උසස් පෙළ විභාගයට ඒ පන්ති කාමරවලට ගියාම, ඒ ගෙන්නා ගන්නා දරුවා පන්ති කාමරය තුළ රඳවා ගැනීමේ අභියෝගයක් තිබෙනවා. ගිහිල්ලා බලන්න. මෙතැන ඉන්න ඕනෑම මන්ත්‍රීවරයෙක් ඕනෑම පාසලකට ගිහිල්ලා බලන්න. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ පන්තිවල දරුවන් කී දෙනෙක් පන්ති කාමරවල රැඳෙනවාද කියලා. එහෙමනම් මේකට හේතුව මොකක්ද? ඒ අවශ්‍ය කරන අධ්‍යාපනික දැනුම අද සිටින ගුරුවරයාගෙන් ලැබෙන්නේ නැහැයි කියන එකයි මට දැනෙන්නේ. ඒක ගුරුවරයාගෙන් ලැබෙන්නේ නැහැ. මේ ක්‍රමවේදය තුළින් ඒ දරුවාට අවශ්‍ය කරන අධ්‍යාපනය ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උපකාරක පන්ති කෙරෙහි දරුවන් සහ දෙමව්පියන් දැඩි අවධානය සහ විශ්වාසය තබලා තිබෙනවා. මේ ක්‍රමවේදය වෙනස් කරගන්න අපි මොකක්ද කරන්නේ කියන එක පිළිබඳව තීන්දු කරන්න ඕනෑ. ගුරුවරුන් බඳවා ගැනීම, ඒ වාගේම ඔවුන් වෙනුවෙන් පුහුණු සහ ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩ සටහන් පිළිබඳව අපේ අවධානය යොමු කොට මීට වඩා අපි ඒවා වැඩි කළ යුතුයි. ඒ වෙනුවෙන් අවශ්‍ය මධ්‍යස්ථාන සහ ක්‍රමවේදයන් ඇති කරලා විශේෂයෙන්ම මීට වඩා ගුරු පුහුණු මධ්‍යස්ථාන දිස්ත්‍රික්ක මට්ටමින් ඇති කරලා, අපේ දරුවාට හෙට දවසේ අනාගත අභියෝග ජයගන්න පුළුවන්කම ඇති දරුවෙක් බිහි කරන්න පුළුවන්, නිර්මාණශීලී ගුරුවරයෙක් බිහි කරන්න අපේ අවධානය යොමු විය යුතුයි. පසුගිය කාලය පුරාවටම කළේ රාජ්‍ය සේවයේ පුරප්පාඩුවක් ඇති කරලා, ඒ පුරප්පාඩුව පිරවීම තමයි. රාජ්‍ය සේවයේ ගුරු පුරප්පාඩුවක් ඇති කරනවා. ඒ පුරප්පාඩුව පුරවනවා. හැබැයි, හෙට දවසේ අපේ දරුවාට අවශ්‍ය කරන අධ්‍යාපනය දිය හැකි, ඒ අනාගත අභියෝග ජය ගැනීමට අවශය දැනුම ලබා දිය හැකි නිර්මාණශීලී ගුරුවරයෙක් බිහි කිරීමේ හැකියාව පසුගිය කාලය පුරාවටම තිබුණේ නැහැ. ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුයි කියන එක මා විශ්වාස කරනවා.

ඒ වාගේම පසුගිය කාලය පුරාවටම පළමුවැනි ශ්‍රේණියට සහ අනිකුත් අතරමැදි පන්ති සඳහා දරුවන් ඇතුළත් කර ගැනීමේ පවතින මේ ක්‍රමවේදවල අඩුපාඩු නිසා දරුවන් දහස් ගණනක්, දෙමව්පියන් දහස් ගණනක් දුක් විඳිනවා. ඔවුන්අසාධාරණයට ලක් වෙනවා. අද අපිත් පිළිගන්නවා. අද පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් අපට තිබෙන ලොකුම කටයුත්ත මොකක්ද? අපේ ප්‍රදේශයේ ජනතාව අපෙන් වැඩියෙන්ම බලාපොරොත්තු වන්නේ මොකක්ද? තමන්ගේ දරුවා ඉන්න පාසලෙන් තවත් ජනප්‍රිය පාසලකට මාරු කරගන්න එක. පළමුවැනි ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීම සිදු කෙරෙන සෑම වසරකදීම දෙසැම්බර් මාසයේදී ජනවාරි මාසයේදී අපේ පළාතේ දෙමව්පියන්, ආසනයේ දෙමව්පියන් වැඩියෙන්ම එන්නේ තම දරුවන්ට ජනප්‍රිය පාසලක් ලබා ගන්නටයි. නිසි ක්‍රමවේදයක් නැහැ. පවතින චක්‍රලේඛ යාවත්කාලීන විය යුතුයි. ඒ චක්‍රලේඛ අනුව මම හිතන්නේ, මේ ප්‍රදේශයේ ජනතාවට ඒ නියමිත සාධාරණයකින් යුක්තව ඒ පාසල් ලබා ගැනීමේ හැකියාව ලැබෙන්නේ නැහැ. එහෙමනම් ඒ පිළිබඳව අපි ප්‍රතිපත්ති තීන්දු ගත යුතුයි. නමුත් අපි ඒ ප්‍රතිපත්ති තීන්දු ගන්නේ නැහැ. අපිත් කරන්නේ අවුරුද්ද පුරාවටම ඒ දෙමව්පියන්ගේ ඉල්ලීම් අනුව ඒ දරුවාව තවත් පාසලකට මේ පාසලෙන් අනික් පාසලට, දාන් බෝඩ් එකේ ඉත්තෝ මාරු කරනවා වාගේ මාරු කරන එකයි.

මේ කටයුත්ත නවත්වන්න මම යෝජනා කළා. දේශපාලන මැදිහත්වීම් මේ අධ්‍යාපන ක්ෂේත්‍රයට ලබා දෙන්න, ලබා දෙන්න මේ අධ්‍යාපනයේ ප්‍රමිතිය කඩා වැටෙනවා කියන එක අපි බොහොම පැහැදිලිව කියනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,විශේෂයෙන්ම මම යෝජනා කරනවා. පසුගිය කාලය පුරාවමට මේ පළාත් සභාවේ මන්ත්‍රීතුමන්ලා සහ නිලධාරීන් විදේශ සංචාර යොමු කරවනවා. අද මේ වෙනුවෙන් විශේෂයෙන්ම ලෝකයේ පවතින දියුණුතම සහ සංවර්ධිතම අධ්‍යාපනික ක්‍රමවේදයක් පවතින රටවල් තිබෙන්නෙත් ආසියාවේ. අද ඉදිරියෙන්ම සිටින්නේ දකුණු කොරියාව. ඉන් පසුව ගත්තොත් ජපානය, සිංගප්පූරුව, හොංකොං. ඒ වාගේ රටවල්වලට ගිහිල්ලා එහි තිබෙන වඩාත් සුදුසු, මේ අපේ රටට ගැලපෙන සාධනීය ක්‍රමවේදයන් අපට එකතු කරගන්න පුළුවන් නම් මම හිතන්නේ, අපට මීට වඩා හොඳ පුරවැසියෙක් බිහි කරන්න පුළුවන්ය කියන එක මම විශ්වාස කරනවා. අද ඒ රටවල් අනුගමනය කරන්නේ සාමාන්‍යයෙන් අපේ දෙමව්පියන් වයස අවුරුදු 04, 05 වන කොට දරුවා පාසලට ඇතුළත් කරගන්න උත්සාහ කරනවා. නමුත් ඒ රටවල්වල දරුවන් පාසලට ඇතුළත් කර ගන්නේ වයස අවුරුදු හයෙන්, හතෙන්. එක පන්ති කාමරයක ළමුන් 25 යි, 30 යි සිටින්නේ. හතර වැනි ශ්‍රේණිය දක්වා ඔවුන්ට ලිඛිත විභාගයක් නැහැ. පස්වන ශ්‍රේණිය දක්වා Home Work දෙන්නේ නැහැ. මේක තමයි අලුත් අධ්‍යාපන සංකල්පය. නමුත් අද අපේ රටේ පාසල්වල දරුවන්ට ලබා දෙන්නේ, දැඩි පීඩනයක් තමයි. මේ ක්‍රමවේදය දැන් වෙනස් කරන්න ඕනෑ. එහෙම නැතිව මිලියන ගණනින්, බිලියන ගණනින් මුදල් වෙන් කළාට කවදාවක්වත් මේ අධ්‍යාපනයේ ප්‍රමිතිය නංවන්නට බැහැ. ඒක මම බොහොම පැහැදිලිව කියනවා. පසුගිය කාලයේදී මිලියන ගණන් වෙන් කළාට සාමාන්‍ය පෙළ අසමත් වන දරුවන්ගේ ප්‍රතිශතයට මොකද වුණේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්. බොහොමත්ම ස්තූතියි.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට බොහොමත්ම ස්තූතියි. ගරු අධ්‍යාපන ඇමැතිතුමා ඇතුළු ඒ සියලුම කණ්ඩායම්වලට, ඉදිරියේදී ගරු ඇමැතිතුමා ගන්නා සියලුම උත්සාහයන් වලට එක්සත් ජාතික පක්ෂය වශයෙන් අපගේ සහයෝගය ලබා දෙනවා කියන පණිවුඩයත් ලබා දෙමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 11.19]

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශීර්ෂ අංක 108 හා 126 පිළිබඳව සාකච්ඡා වන වෙලාවේ මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන් මේ අමාත්‍යාංශයේ විෂයයන් රාශියක් තිබෙන අමාත්‍යාංශයක්. විශේෂයෙන්ම බොහෝ මහජන නියෝජිතයින් වැඩි අවධානයක් යොමු කරන අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව මමත් මේ කෙටි කාලය තුළ යමක් සඳහන් කරන්න කැමැතියි. බස්නාහිර පළාත් සභාවේ පාසල් 1289 යේ හත් ලක්ෂ හතලිස් එක් දහස් නවසිය තිස් හතරක් දරුවන් සිටින අපේ පළාත් සභාවේ, විශේෂයෙන් ගුරු භවතුන් 35,432 ක සේවය මේ වන කොට අපට ලැබෙනවා. විශේෂයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහෝ ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කරපු ආකාරයට අදටත් අපට තිබෙන විශාල ගැටලුවක් තියෙනවා. ඒදරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දෙන කොට පන්ති කාමරයේ සැබෑවටම තිබෙන ගුරු පුරප්පාඩුවල ගැටලුවයි. දැන් අපේ අමාත්‍යාංශයේ ඇමැතිතුමාගෙන් හරි ලේකම්තුමාගෙන් හරි ඇහුවාම ගුරු පුරප්පාඩු අවමයි කියලා සඳහන් කරන්න පුළුවන්. මම හිතන්නේ, ඊයේ දවසේත් අපේ ගරු ඇමැතිතුමා කිව්වා, එහෙම ලොකු පුරප්පාඩු ගණනක් නැහැ. අවමයි. ඒ සංඛ්‍යා ලේඛන අනුව නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ගැටලුව තිබෙන්නේ, පන්ති කාමරය තුළ. මේකට ප්‍රධාන හේතුව තමයි දැන් මම නියෝජනය කරන කැලණි කලාපය උදාහරණයක් හැටියට ගත්තොත්. කැලණි කාලපයේ මේ වන කොට මුළු ගුරු පුරප්පාඩු සංඛ්‍යාව චක්‍රලේඛ අනුව නැති වුණත් පන්ති කාමරයට ගුරුවරුන් නැති සංඛ්‍යාව 200 ක් විතර වෙනවා. කැලණි කලාපය තුළ. ඒක සිද්ධ වන්නේ, බොහෝ විට ගුරු භවතුන් ප්‍රසූත නිවාඩු ගිහිල්ලා, ඊට අමතරව අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු ගියාමයි. ඊළඟට මේ ප්‍රසූත නිවාඩු ගන්න කොට, ප්‍රසූත භාවයට ආසන්න වන කොට තමුන් පදිංචියට ආසන්න පාසලක් සොයාගෙන එක්කෝ කලාපයෙන් පිටතට යනවා.

[ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

සැබෑවටම මේ වන කොට කැලණි කලාපයේ ගුරු පුරප්පාඩු තිබෙන්නේ 50 කට විතර ආසන්න සංඛ්‍යාවක්. ඒකෙන් මේ වන කොට චක්‍රලේඛය අනුව ප්‍රාථමික ගුරුවන් 31 ක පුරප්පාඩුවක් තිබෙනවා. හැබැයි ඊට එහා ගිහිල්ලා පන්ති කාමරයට, සැබෑවටම මම අර ඉස්සෙල්ලා කිව්ව හේතුත් එක්ක ගුරු භවතුන් 200 ක පමණ පුරප්පාඩුවක් පන්ති කාමරය තුළ පවතිනවා. මේක ලොකු ගැටලුවක්. ඒ වාගේම අර කිව්ව විධියට ගුරු සේවයේ ඉඳගෙන ගුරු උපදේශක සේවයේ යෙදීම, ඒ වාගේම වෘත්තිය සමිතිවලට නිදහස් වීම, ඒ වාගේම වෙනත් සේවාවන් වලට නිදහස් වීම මත බරපතළ ගැටලුවක් පන්ති කාමරය තුළ අද වන කොට තිබෙනවා. මේකට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ එක අවස්ථාවක සාකච්ඡා කළා. යෝජනා කළා, ගුරු සංචිතයක් පිහිටුවන්න කියන කාරණාව. මේක බැලූ බැල්මට බැරි වුණත් එදත් අපි සාකච්ඡා කළා. මම දන්න විධියට වයඹ පළාත් සභාවේ මේ වන කොට ගුරු සංචිතයක් ආරම්භ කරලා තිබෙනවා. මේකට කියයි, කාඩර් කමිටි එකෙන් අනුමැතිය නැහැ. මහා භාණ්ඩාගාරයේ අනුමැතිය නැහැ. නමුත් වයඹ පළාත් සභාව මේකට යම් ක්‍රමවේදයක් ඇති කරගෙන, මේ වාගේ ගුරු පුරප්පාඩු ඇති වන කොට, ඒ අඩුව දැනෙන්නේ නැති වෙන්න පන්ති කාමරයට ගුරුවරුන් ලබා දීමේ වැඩ පිළිවෙළවක් සඳහා වයඹ පළාත් සභාව ගුරු සංචිතයක් ආරම්භ කරලා තිබෙනවා. ඒ නිසා අපට අයිති ගුරු භවතුන් ප්‍රමාණයට වඩා ගුරු සංචිතයක් ඇති කර ගැනීම තුළ පන්ති කාමරයට අවශ්‍ය ගුරුවරයා ලබා දීමේ වැඩ පිළිවෙළක් වයඹ පළාත් සභාව දියත් කරලා තිබෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා. ගරු ඇමැතිතුමා ප්‍රමුඛව අවධානය යොමු කරලා ගුරු සංචිතයක් අපේ පළාත් සභාව තුළ ආරම්භ කරලා, ගුරු සංචිතයක් පවත්වාගෙන ගිහිල්ලා, මේ පන්ති කාමරය තුළ තිබෙන ගුරු පුරප්පාඩුවලට විසඳුමක් ලබා දෙන වැඩ පිළිවෙළක් යුසුළුව ක්‍රියාත්මක වෙන්නය කියන කාරණාව ඉදිරිපත් කරනවා.

ඊළඟ කාරණාව තමයි අද ප්‍රාථමික පාසල් සඳහා සෞන්දර්යය ගුරුවරුන් අපේ චක්‍රලේඛ හරහා දෙන්නේ නැහැ. මේක බරපතළ ගැටලුවක්. අපි දරුවන්ගේ ගුණාත්මක පැත්ත හිතනවා නම් හොඳ පෞරුෂයක් තිබෙන දරුවෙක් බිහි කරගන්න බලාපොරොත්තු වෙනවා නම්, මේ චක්‍රලේඛවල හිර වෙලා මේ කාරණය කරන්න බැහැ. මේ චක්‍රලේඛවලට වඩා එහා ගිහිල්ලා හොඳ දරුවෙක් අපි නිර්මාණය කර ගන්නවා නම් සෞන්දර්යය සහ ක්‍රීඩාව අනිවාර්යයි. දැන් මෙතුමා ලබා දීපු පොතේ සඳහන් කරලා තිබුණා, පාසල් තුළ ක්‍රීඩාව දියුණු කිරීම සම්බන්ධව. දරුවන් ස්ථූල භාවයෙන් වැඩි වෙලා. බෝවන රෝගවලට ගොදුරු වන ප්‍රමාණය වැඩි වෙලා. ඒ වගේම අද පාසල් අධ්‍යාපනය ලබන දරුවන් 14% ක් මොනවා හරි මත්ද්‍රව්‍යයක් පාවිච්චි කරනවා. එතැන දැරිවියන් 2.5% ක් ඉන්නවා. මේ කාරණාවලට දරුවන් යොමු වන්නේ, සෞන්දර්යයට හරි ඉඩකඩකුත්, ක්‍රීඩාවට හරි ඉඩකඩකුත් නොමැති නිසා. ඒ වාගේම තමයි දරුවෙක් ජාත්‍යන්තරයට හරි මොනවාට හරි දක්ෂතාවයක් පෙන්වන්න කුඩා කල සිටම ඒ පුහුණුව තිබෙන්නට ඕනෑ. නමුත් අවාසනාවකට අපේ රටේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කරලා තිබෙන චක්‍රලේඛ අනුව සෞන්දර්යය ගුරුවරයෙක් සහ ක්‍රීඩා ගුරුවරයෙක් ප්‍රාථමික පාසල්වලට දෙන්නේ නැහැ. හය වසරේ සිට තමයි දෙන්නේ. එතකොට 1 සිට 5 දක්වා දරුවා සංගීතය, නර්තනය, ක්‍රීඩාව හදාරන්න ඕනෑ නැද්ද? පළමුවැනි ශ්‍රේණියේ සිට තමයි දරුවෙක් ක්‍රීඩාවට හරි සෞන්දර්යයට හරි යොමු වන්නේ. ඒ නිසා කරුණාකරලා මෙන්න මේ ප්‍රාථමික ශ්‍රේණිවලට සෞන්දර්යය සහ ක්‍රීඩා ගුරුවරුන් ලබා දෙන වැඩ පිළිවෙළක් අපේ පළාත් සභාවෙන් ඔය චක්‍රලේඛ පොඩ්ඩක් පැත්තකට තියලා ආරම්භ කරන වැඩ පිළිවෙළක්, ආරම්භ කරන්නය කියන යෝජනාව මේ වෙලාවේ කරනවා.

ඒ වාගේම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපන කාර්යයන් සඳහා අපේ දෙන ප්‍රමුඛත්වය යම් ප්‍රමාණයකින් ගිලිහිලා කියලා තමයි මම විශ්වාස කරන්නේ. අවධානය මදී. ඒ දරුවොත් මේ සමාජයේ අපි වාගේම අවශ්‍යතා දකින, යම් විශේෂ අවශ්‍යතාවයක් තිබුණත් සාමාන්‍ය පුරවැසියන් හැටියට ජීවත් වෙන්න ඕනෑ දරුවන්. ඒ නිසා අද අපේ පාසල් මට්ටමේ ඉන්න විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ ඒකක මම හිතන්නේ, බස්නාහිර පළාත් සභාවේ 158 ක් තිබෙනවා. ඒ 158 ට පුහුණුව, ඒ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න පුළුවන් පුහුණු ගුරු භවතුන්ගේ අඩුවක් තිබෙනවා. අඩුවක් නොවෙයි. නමුත් ඉන්නවා. ඒ අය දැන් වෙනත් ක්ෂේත්‍රවල. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා හරහා ගරු ඇමැතිතුමාට මම යෝජනා කරනවා. ඒ පුහුණුව ලබපු විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට උගන්වන්න පුළුවන් ගුරු භවතුන් වහා ඒ අදාළ පන්ති කාමරවලට යවලා, ඒ අයගේ දැනුම යාවත්කාලීන කරන

වැඩ පිළිවෙළකුත් ආරම්භ කරලා, ඒ දරුවන්ගේ පන්ති කාමර සඳහා ලබා දෙන පහසුකම් මීට වඩා වැඩි ප්‍රමාණයකින් ලබා දෙන වැඩ පිළිවෙළකට යන්නය කියන කාරණය මේ වෙලාවේදී මම මතක් කරනවා.

ඒ වාගේම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගුරු මාරු ප්‍රතිපත්තිය මතක් කළා. අපේ පළාතේ සිද්ධ වෙන ගුරු මාරු ප්‍රතිපත්තිය, දැන් අපේ කැලණි කලාපයේ ගත්තත් සැබැවින්ම ඇත්ත. මේ වෘත්තීය සමිති හරහා මැදිහත්වන ඒ මැදිහත්වීම් මත ඒ අය වෙත එන අයගේ අවශ්‍යතාවයන් විතරයි සිද්ධ වෙන්නේ. ඇත්තටම ගත්තොත් බොහෝ සෙයින් මේ ගුරු මාරු මණ්ඩල තුළ සිද්ධ වන්නේ, පෞද්ගලික උවමනාකම්. අර ඇත්තටම සැබෑවටම සාධාරණයක්, සේවයක් ඒ තුළින් සිද්ධ වෙන්න ඕනෑ. අවශ්‍යතාවයක් තිබෙන ගුරුවරයාගේ අවශ්‍යතාවයක් සිද්ධ වන්නේ නැහැ, කා වෙත හරි යන්න බැරිකම මත. ඒ නිසා මේකටත් යම් ක්‍රමවේදයක් හදන්නය කියන කාරණාව මේ වෙලාවේදී මම මතක් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු සංවිධායකතුමා, ගුරු මාරු මණ්ඩලවල අයගේ පෞද්ගලික උවමනා වුණාට, මම විශ්වාස කරනවා ඒක Over rule කරන්න පුළුවන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට. ලේකම්තුමාට. අධ්‍යාපන ඇමැතිතුමා එතැනට යන්න ඕනෑ නේද?

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මම යෝජනා කරන්නේ අන්න ඒ මැදිහත්වීම කරන්නය කියන කාරණාව. ඒක සිද්ධ වෙනවා මදියි කියන කාරණාව තමයි මම මේ මතක් කරන්නේ. ඒ නිසා අන්න ඒ කාරණාවටත් අවධානය යොමු කරන්නය කියන එක මම මේ වේලාවේ මතක් කරනවා. ඒ වාගේම තමයි අද මේ පළාත් සභාවට දිගින් දිගටම සඳහන් කළා, මහ ආණ්ඩුවෙන් ලැබුණු බිලියන 09 ක මුදල් ප්‍රමාණයක් කපා හැරීම පිළිබඳව, විශේෂයෙන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ බස්නාහිර පළාත් සභාවේ අපේ අධ්‍යාපන අමාත්‍යාංශයට මහ ආණ්ඩුවෙන් රුපියල් මිලියන 1091 ක් 2016 වසරේ ලැබෙන කොට කනගාටුවට කාරණය, 2017 රුපියල් මිලියන 180 යි අපට ලැබිලා තිබෙන්නේ. බරපතළ අඩුවක්. රුපියල් මිලියන 911 ක වෙනසක් තිබෙනවා. මම හිතන්නේ මේ තත්ත්වය ලබන වසරේ අපේ පළාත් සභාව හරහා පළාත් සභා පාසල් ඉදි කිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී බරපතළ ගැටලුවකට අපට මුහුණ දෙන්න සිදු වෙනවා. විශේෂයෙන් මම නියෝජනය කරන බියගම අධ්‍යාපන කොට්ඨාශය පිළිබඳව යමක් සඳහන් කිරීමේදී අඩක් නිම කරපු ගොඩනැගිලි ඇති පාසල් හතරක් තිබෙනවා. බියගම මහා විද්‍යාලය. බොල්ලෑගල මහා විද්‍යාලය, හෙයියන්තුඩුව සංඝමිත්තා විද්‍යාලය,යටිහේන විද්‍යාලය.ඒ නිසා මේ අඩක් නිම කරපු ගොඩනැගිලි වලට දැඩි අවධානය ලබන වසරේ යොමු කරන්න ඕනෑය කියන කාරණාව මතක් කරනවා.

විශේෂයෙන් ගුරු මාරු සම්බන්ධයෙන් මම තව එක දෙයක් මතක් කරන්න ඕනෑ. අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලා, පාසල් ගුරු වෘත්තියේ යෙදෙන උත්තරීතර අපේ ස්වාමීන් වහන්සේලා වෘත්තියක් හැටියට ගුරු වෘත්තියේ විතරයි බොහෝවිට යෙදෙන්නේ. මේ ස්වාමීන් වහන්සේලා ස්ථාන මාරු කිරීමේදී අර ගිහියෙක් මාරු කරනවා වාගේ ක්‍රමවේදය අනුගමනය කරන්න එපා. අනිකුත් ආගම්වල පූජකතුමන්ලා ඒ ගුරු සේවයේ ඉන්නවා නම්, විශේෂයෙන්ම අපේ ස්වාමීන් වහන්සේලා සහ පූජක උතුමන්ලා ස්ථාන මාරු කිරීමේදී මේ වසර 10 ප්‍රතිපත්තියේම ඉන්නේ නැතිව ගිහියන් පිළිබඳව සලකන ආකාරයෙන් නොසලකා - මොකද, සමහරවිට උන්වහන්සේලා විහාරාධිපති ස්වාමීන් වහන්සේ කෙනෙක්. ආසන්න පාසලේ සේවයකරන්න පුළුවන්. ඒ නිසා ආගමික වශයෙන් සලකලා ස්වාමීන් වහන්සේලා ස්ථාන මාරු කිරීමේදී වෙනත් පියවරකට, එක පාර ස්ථාන මාරු නොකර උන් වහන්සේලාගේ අදහස් අරගෙන ස්ථාන මාරු කරන ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නය කියන කාරණාව මතක් කරමින්, ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු සාර්ථක වේවායි පතමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 11.28]

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මා නියැළිලා ඉන්න ක්ෂේත්‍ර දෙකක් පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳවමම ඉතාමත් සතුටට පත් වෙනවා. එකක් අධ්‍යාපන ක්ෂේත්‍රය. මගේ ගුරු වෘත්තිය. අනික් වෘත්තිය තමයි කලාව. මේ ක්ෂේත්‍ර දෙකම මට සම්බන්ධ වුණු, ක්‍රීඩාව

[ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්]

කෙසේ වෙතත් මේ ක්ෂේත්‍ර දෙක පිළිබඳව විනාඩි 09 කින් කථා කරන්න උත්සාහ දැරීම මම හිතන්නේ පුංචි විහිළුවක් වගේ. අර මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ සිල්ලර විධියට කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේ සංඛ්‍යාලේඛන අරගෙන කථා කරන්න ගියොත් එහෙම වැඩිය කථා කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඒක නිසා මම දන්නවා, මේ අධ්‍යාපනය පිළිබඳව කථා කරන අවස්ථාවේදී අපි පිළිබඳව, අපේ අධ්‍යාපනික දැනුම පිළිබඳව සොයා බලන හොඳ මිම්මක් තමයි එක්තරා විධියකට මේකේ හැසිරීම. අධ්‍යාපනය පිළිබඳව කථා කරන අවස්ථාවේදී කොහොමද අපි මේ ශාලාව තුළ හැසිරෙන්නේ කියන එකත් එක්තරා මිනුම් දණ්ඩක් තමයි, මේ අවස්ථාව හුවා දක්වන. ගරු අමාත්‍යතුමනි, එක්සත් ජාතික පක්ෂය හැටියට මම ඉතාමත්ම සතුටට පත් වෙනවා. සුප්පුවේ සිට උපාධිය තෙක් අධ්‍යාපනයට විශාල මෙහෙවරක් කරපු පක්ෂයක්. හැම අංශයකින්ම අධ්‍යාපනයේ යම්කිසි ඉදිරි ගමනක් තිබෙනවා නම් ඒ ඉදිරි ගමනේ පෙනී හිටපු, දායකත්වය දුන්නු පක්ෂය තමයි එක්සත් ජාතික පක්ෂය. පොත්පත් ලබා දීම, අධ්‍යාපනය, නිදහස් අධ්‍යාපනයක් බවට පත් කිරීම, ඒ වාගේම තමයි මධ්‍යම පාසල් ඇති කිරීම, ජාතික පාසල් සංකල්පය හඳුන්වා දීම, නිල ඇඳුම් ලබා දීම මේ ආදී වශයෙන් අධ්‍යාපනය වෙනුවෙන් විශාල මෙහෙවරක් කරපු පක්ෂයක සාමාජිකයෙක් හැටියට අද මේ අවස්ථාවේදී කථා කරන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව මම ඉතාමත් සතුටට පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ නම් සංකල්පය වෙන්නේ අපේ ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට දේශපාලනය අධ්‍යාපනයට සම්බන්ධ වෙනවා නම්, එතැන රික්තයක් තිබෙන්නේ. ඇත්තටම සොයා බලන්න ඕනෑ, මැතිවරණ සඳහා වෙනම කොමිසමක් පිහිටුවලා තිබෙනවා නම්, ඒ වාගේම පොලීසිය සඳහා කොමිසමක් පිහිටුවලා තිබෙනවා නම්, ඒ වාගේම මැතිවරණ, පොලිස්, ප්‍රසම්පාදන කටයුතු සඳහා වෙනම කොමිෂන් සභා පිහිටුවලා තිබෙනවා නම් අධ්‍යාපනය සඳහාත් වෙනම කොමිසමක් පිහිටු විය යුතුයි. මේක දේශපාලනයෙන් තොර වුණු අධ්‍යාපනඥයන් පමණක් සම්බන්ධ වුණු කොමිසමක් විය යුතුයි. අර පුංචි කොටස තුළ හිර වෙලා ඉන්න කට්ටිය බොහෝ අවස්ථාවලදී මන්ත්‍රීවරුන්ගේ - මම නිලධාරීන්ගේ පැත්තට කථා කරනවා නොවෙයි. මන්ත්‍රීවරුන්ගේ ගිරයට අහු වෙලා තිබෙන්නේ. හිර වෙලා තිබෙන්නේ. සමහර මන්ත්‍රීවරු විදුහල්පතිවරුන්ට කථා කළේ තමුසේ කියලා. මම මේක දෙවතාවක් විතර මෙතැන කියලා තිබෙනවා. මම එක්තරා උත්සවයකට ගිය වෙලාවේ අමාත්‍යතුමා, ඒ උත්සවයේදී එක මන්ත්‍රීවරයෙක් - මම මන්ත්‍රීවරයාගේ නම කියන්නේ නැහැ. මේ ස්ථානයේ රැඳී සිටිය නිසා. ඒ මන්ත්‍රීවරයා ඒ උපාධිධාරී ගුරුවරයාට කථා කළේ තමුසේ කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මහරගම ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක් වෙන්න ඇති.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මම ඒක දන්නේ නැහැ. කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වෙන්න ඇති. මම නම කියන එක එතුමාට හොඳ නැහැ නේ?එහෙම වුණාම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ප්‍රදේශය කියන්න. නැත්නම් අනික් අයත් අහු වෙනවා නේ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිතන්න කෝ බලන්න, ඒ විදුහල්පතිවරයා කොපමණ අසරණ තත්ත්වයකට පත් වෙනවාද කියලා. ඒ කියන්නේ මේ පුද්ගලයාගේ තිබෙන අධ්‍යාපන අත්දැකීම් සහ ඒ පරිණත භාවය තුළ අර O/L වත් නැති මන්ත්‍රීවරයාට ඒ අවස්ථාවේදී යටත් වුණා. මට හරියට දුක හිතුණා. මම අවුරුදු 30 කට වැඩි කාලයක් ගුරු වෘත්තියේ නියැලුනා. මම වාගේ එක්කෙනෙක් නම් බණිනවා. ඒ මන්ත්‍රීවරයා කිව්වේ, තමුසේ කියලා. තමුසේට අයිසේ ළමයින් ටික පාලනය කරගන්න බැරිද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම කියන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

අනේ මට එහෙම නම කියන්න -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

තමුසේ කියන්නේ, තමුන්නාන්සේ කියන එක.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒක වැරැදියි. ඒක ඇත්තටම වැරැදියි. ඇත්තටම අපටත් ඒක හරි කැතයි. ඉතින් ඒ නිසා මගේ මතය වන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක සම්පූර්ණයෙන්ම අයින් කරලා දැමිය යුතුයි. පාසල දේශපාලනය නොවන ස්ථානයක් බවට පත් විය යුතුයි. ඇමැතිවරු අත දාන්න හොඳ නැහැ. මන්ත්‍රීවරු දැන් පාසල්වල අරක් ගෙන ඉන්නේ. මේක මගේ පාසල. පාසල්වලට ළමයින් ඇතුළත් කර ගැනීමේදී - ගරු අමාත්‍යතුමා අපට නම් ඉස්කෝලයකට ළමයෙක් දා ගන්න එකක්වත් හම්බ වුණේ නැහැ. ඒ කෙසේ වෙතත් මේවා අරක්ගෙන තිබෙන්නේ. මහරගම විද්‍යාකර මහා විද්‍යාලය මගේ පාසල. සමුද්‍ර දේවි විද්‍යාලය මගේ පාසල. ඒවාට වෙන කට්ටියට භාර දෙන්න බැහැ. මේවා මගේ කලාපයේ තිබෙන පාසල්. මේවාට මගේ ළමයින් ටික දාගන්න ඕනෑ. සමහර විට අත් යටින් යන සෙල්ලමක් තිබෙනවා. සමහර විට අමාත්‍යවරයා නැතත්, මන්ත්‍රීවරයා නැතත් බිරිඳ හරි මේක කරනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක දේශපාලනීකරණය වෙන්න, වෙන්න අපි බලාපොරොත්තු වුණු ඒ අරමුණ කරා යන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

මම අවුරුදු ගණනාවක අත්දැකීම් තිබෙන ගුරුවරයෙක්. දේශපාලන ක්ෂේත්‍රයේ නියැලෙන්න ඉස්සෙල්ලා ගුරු වෘත්තියේ නියැලුනේ. කලාකරුවෙක් වෙන්නත් ඉස්සෙල්ලා. මම නම් කියන්නේ එදා සිටම අපි පාසල් යන සමයේදී අපට දේශපාලනයක් තිබුණේ නැහැ. පාසල් පද්ධතියේ මේ වාගේ වෙනස් වීමක් තිබුණේ නැහැ. මධ්‍යම රජයේ පාසල් සහ පළාත් සභා පාසල් කියලා වෙනසක් තිබුණේ නැහැ. සියලු පාසල්වලට සියලු සම්පත් ඒකාකාරී විධියට බෙදිලා ගිය පද්ධතියක් තිබුණේ. අපේ උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට, මම දන්නේ නැහැ.අනික් කට්ටිය විහිළුවට ගත්තාද කියලා. එතුමා ප්‍රකාශ කරපු ආකාරයට මම කොළඹ ලුම්බිණියේ ඉගෙන ගන්න දවස්වල අපේ පාසලේ මැටි කර්මාන්තය සඳහා වෙනම ස්ථානයක් තිබුණා. මැටි කර්මාන්තය උගන්වන ගුරුතුමාට කිව්වේ, මැටි ගුරුතුමා කියලා. යකඩ ගුරුතුමාට යකඩයා කියලා කිව්වේ. ඒ වාගේ වෙනම අංශ තිබුණා. ඒ කියන්නේ මේ අධ්‍යාපන ගමනේ යන්න බැරි නම් වෘත්තීය සුදුසුකම්වලින් වෙනත් අංශ සඳහා යන්න තිබුණා. නමුත් අද ඒ පිළිබඳව කොහෙත්ම සොයා බලන්නේ නැහැ. අද ව්‍යූහ කමිටුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් ඒ ව්‍යූහ කමිටුවේ ඉන්න මන්ත්‍රීවරුන් පාලනය කරන පාසල් පමණයි පාවිච්චි කරන්නේ. මන්ත්‍රීවරයෙක් යන්නේ නැති පාසලක් අඩුම තරමින් ඒකේ සංවර්ධනය පිළිබඳවත්, ඒකේ ගුරුවරු පිළිබඳවත්, ඒකේ අධ්‍යාපන කටයුතු වෙන්නේ මොන ආකාරයෙන්දවත් කියලා සොයා බැලීමක් කරන්නේ නැහැ. ඒ නිසා ඇත්තටම මේ තත්ත්වයෙන් ඈත් වෙන්න ඕනෑ.

ගරු අමාත්‍යතුමනි, අපි හිතුවට වඩා, වැඩි වශයෙන් ජාත්‍යන්තර පාසල් දියුණු වේගෙන එනවා. දෙපානම ධර්මපාල විද්‍යාලය වැහීගෙන යනවා. අද හොඳම පාසල ළඟම පාසල බවට පත් කරගෙන තිබෙනවා.අපි අකිල විරාජ් කාරියවසම් ගරු ඇමැතිතුමාට කියලා හදා ගත්තු නිසා. එහෙම නොවුණා නම්, එහා පැත්තේ තිබෙන ලූවස් විද්‍යාලය විශාල පාසලක් බවට පත් වෙනවා. ඊර්ෂ්‍යා කිරීමක් කරන්නේ නැහැ. ජාත්‍යන්තර පාසල් දන්නේ නැතිව මේ කටයුත්ත සඳහා සම්මාදන් වෙනවා. මම නම් ඇත්තටම සතුටට පත් වෙනවා. උපකාරක පන්ති ක්ෂේත්‍රය නියෝජනය කරන ගුරුවරයෙක් හැටියට, විශේෂයෙන් අපි නැත්නම් මේ අධ්‍යාපනය අද ලංකාවේ නැහැ. අද කවුරු මොනවා කිව්වත්, ටියුෂන්කාරයෝ නැත්නම් - ටියුෂන්කාරයන්ට තමයි ඉස්සෙල්ලාම මල් තියලා වඳින්න ඕනෑ. ඒ නිසා තමයි ගිය සැරේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අධ්‍යාපන ඇමැතිකම බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමාටත්, ශ්‍රේරු අමාත්‍යතුමාටත් දුන්නේ. මොකද, මේක හරියාකාරව පවත්වාගෙන යන්න පුළුවන්කමක් තිබෙන්නේ, ඒ පිළිබඳව දක්ෂතාවයක් තිබෙන්නේ ඔවුන්ටයි. ඔවුන්ට තමයි මේ පිළිබඳව දැක්මක් තිබෙන්නේ. හැබැයි අද තිබෙන ටියුෂන් පිළිබඳව සොයා බැලීමක් කළේ නැත්නම් ඉදිරි කාලයේදී මහා වින්නැහියක් වෙනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම ඒවාත් පාලනය කිරීමක් කරන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩි යයි. ඔබතුමා කලාකාරයෙක් හැටියට කලා කටයුතු කියැවුණේ නැහැ. විනාඩිය තුළ මොනවා හරි කියන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ නිසා ඒක පාලනය කිරීමක් කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් කථා කරන්න තිබෙනවා, සංස්කෘතිය හා කලා කටයුතු පිළිබඳව. අපේ ගරු අමාත්‍යතුමා පිළිබඳව ඉතාමත් සතුටට පත් වෙනවා. එතුමා හරියට අර කැළේ පිපුණු මලක් වාගේ තමයි. අනික් කට්ටියගේ හඬ මීස වැඩ නැත වාගේ නේ. මෙතුමාගේ බොහෝදුරට තිබෙන්නේ, වැඩ. ඒවා එළියට එන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නිහඬයි.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

නිහඬ සේවාවක් කරන්නේ. මේ නාඩා ආයතනය හරහා, සංස්කෘතික අංශය හරහා මම ගොඩක් දුරට සම්බන්ධ වෙනවා. මෙතුමාත් සම්බන්ධ වෙනවා. කලාකරුවන් හැටියට, කලාව නියෝජනය කරන මන්ත්‍රීවරු විශාල පිරිසක් මෙතැන ඉන්නවා. මම ආසියාවේම සහ ලෝකයේම දීර්ඝතම ටෙලි නාට්‍යය වන කෝපි කඩේට සම්බන්ධ වෙලා හිටපු කලාකරුවෙක් හැටියට මම දන්නවා, මේ සංස්කෘතික ආයතනය හරහා විශාල මෙහෙවරක් කරනවා. නමුත් ඒක එළි දැක්වීමක් වෙලා නැහැ. ඉතින් ඒ නිසා ඒ නාඩා ආයතනය හරහා අපි වැඩ කටයුතු ගොඩක් කළා. මේ සැරේ විශේෂයෙන්ම රංගන ශිල්පීන් සඳහා පුහුණුවීම් කටයුතු පවත්වාගෙන යනවා. වෙනම කෙටි නාට්‍ය උළෙලක් පවත්වලා තිබෙනවා. ඒ වාගේම තමයි පුහුණුවීම් සඳහා නාට්‍ය ශාලා වෙනම වෙන් කිරීම් කරලා තිබෙනවා. විශේෂයෙන්ම නාට්‍යකරුවන්ට බොහෝ අවස්ථාවලදී නාට්‍යයක් ඉවර වුණාට පස්සේ අපේ ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමනි, මට ඉස්සර මතකයි නාට්‍යයක් ඉවර වුණාට පස්සේ, ත්‍රිකුණාමලයේ නම් ෂෝ එක තිබුණේ අපිව බොහෝදුරට ගිහින් දාන්නේ ටවුන් හෝල් එකට. ඔබතුමා දන්නවා ඇති. අපට රෑට යන්න නැතිව අපි ටවුන් හෝල් එකේ බස් එකක් එනතුරු එළිවෙනකන් ඉන්නවා. අද නාඩා ආයතනයේ ඒකට අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. කලාකරුවන් සඳහා රාත්‍රියේදී නේවාසිකාගාර පහසුකම් ලබා දීලා තිබෙනවා. ඇත්තටම ඒක විශාල සේවාවක් වෙනවා. ඒ නිසා අපි ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කළා. වයඹ පළාත් සභාවෙන් වයඹ තරංගා කියලා එකක් තිබුණා. මට මතකයි, ඔබතුමාත් සංගීත සංදර්ශනවලට සහභාගි වෙලා ඇති. විශාල ආදායමක් ගෙනාපු සංගීත කණ්ඩායමක් තමයි වයඹ තරංගා කියලා කියන්නේ. ජිප්සීස්ලා වාගේ. විශාල වශයෙන් මුදල් හම්බ කරපු එකක්. ඉතින් ඒ නිසා ඔබතුමා මේ සැරේ එය අවස්ථාවක් කරගෙන බස්නාහිර පළාතේ වෙනම නර්තන කණ්ඩායමක් ඇති කරගෙන තිබෙනවා. අපි මෙතුමාගෙන්ම ඉල්ලීමක් කළා. අපට නාට්‍ය කණ්ඩායමකුත් පිහිටුවන්න කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ වාගේම සංගීත කණ්ඩායමක් පිහිටුවන්නය කියලා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න. මම පොඩි ඉල්ලීමක් කරනවා. නාට්‍යකරුවන් සහ කලාකරුවන් වෙනුවෙන් සැබෑ අසරණ වුණු කලාකරුවන් වෙත යම් මූල්‍යමය පරිත්‍යාගයක් ලබා දෙන්න පුළුවන් නම් ඒ දේ ලබා දෙන්න. ඔබතුමන්ලා දන්නවා, කෝපි කඩේ වාගේ නාට්‍යවල ශිල්පීන් අද අසරණ වෙලා ඉන්නවා. ලංකාවේ සූරාකෑමට ලක් වෙලා තිබෙන ප්‍රධානම ආසියාවේ දිගම ටෙලි නාට්‍යය. දේශපාලනය වෙනුවෙන් මම හිතන්නේ පාරට බැහැපු යුද්ධය වෙනුවෙන් පාරට බැහැපු ප්‍රධානම කලාකරුවන් තමයි, කෝපි කඩේ කලාකරුවන්. සතියකට රුපියල් 3000/- යි ලැබෙන්නේ. අද චිත්‍රා වාකිෂ්ඨ වාගේ අය පිළිකා හැදිලා ගෙදරට වෙලා අසරණ වෙලා ඉන්නවා. ඒ නිසා අපි ඇත්තටම හැරිලා බැලුවොත් එහෙම ඔවුන්ට අවස්ථාවක් නැහැ. කෝපි කඩේ හිටපු, අර අබිලිං මාමාට ඇටි කළේ. එතුමා මිය ගියා. එතුමාගේ මළ මිනියේදී අඩුම තරමින් - ආසියාවේ දිගම ටෙලි නාට්‍යය. එතුමාගේ මිනිය තියාගන්න තැනක් නැහැ. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.39]

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

විනාඩි පහයි. විනාඩි පහට හැරෙන්නවත් බැහැ නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නැඟිටලා, හැරිලා විනාඩි පහෙන් කථා කරන්න කෝ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මට අපේ ගරු ඇමැතිතුමාගෙන් තව විනාඩි පහක් ලැබෙනවා.මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මිනිත්තු පහට තව මිනිත්තු පහක් එකතුවීම පිළිබඳව තවත් සන්තෝෂ වෙනවා. මිනිත්තු 10 ත් මදි. අපේ රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා බොහොම නිවුණු ගති ගුණ තිබෙන, වැඩි කලබල වෙන්නේ නැති අමාත්‍යවරයෙක්. අපට ප්‍රශ්නයක් ඇති වුණු හුඟක් වෙලාවට එතුමා - මම ඇත්තටම මේක මතක් කරන්න ඕනෑ. පළාත් සභා මන්ත්‍රීවරු වශයෙන් අපට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුත් එක්ක වැඩ කරන කොට හුඟක් වෙලාවට අපේ ආසනවල ප්‍රශ්න ඇති වෙනවා. එතුමා අපේ අධ්‍යාපන ඇමැතිවරයා වශයෙන් පළාත් සභාවේ අපේ ගෞරවය ආරක්ෂා කරමින් අපට කටයුතු කරලා තිබෙනවා. මමත්, රවී විජේසේකර ගරු මන්ත්‍රීතුමාත් ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

අපේ පාසල්වලට සහ අපේ මන්ත්‍රීකමට වටිනාකමක් එතුමා ලබා දීලා තිබෙනවා. පසුගිය දවස්වල බස්නාහිර පළාත් සභාවේ තීරණයක් අරගෙන, අර මුල්ගල් තැබීම නතර කරපු අවස්ථාවේ, අපේ පළාතේ ඉන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විදුහල්පතිවරුත් නැතිව ගිහිල්ලා මුල් ගල තිබ්බා. (බාධා කිරීම්) අනේ කරුණාකරලා අද මට කථා කරන්න ඉඩ දෙනවාද? මොකද, මේක විහිළුවක් නොවෙයි නේ?දොම්පේ ආසනයේ පාසල් 49 ක් තිබෙනවා. ජාතික පාසල් 01 යි තිබෙන්නේ. ඒ පාසල්වල අපි දැඩි උත්සාහයක් අර ගත්තා ඇමැතිතුමා සහයෝගය දුන්නා. ඇමැතිතුමාගේ ලේකම්තුමා, නිලධාරීන් සහයෝගයක් දුන්නා. රවී විජේසේකර ගරු මන්ත්‍රීතුමාත් ලොකු සහයෝගයක් ලබා දුන්නා. පන්තිවල සීමාව ආරක්ෂා කරන්න කටයුතු කරන්න. කොහේ කළත් දොම්පේ ආසනයේ 40, 42 සීමාව අපි ආරක්ෂා කරමින් කටයුතු කළා. පාසල්වල පන්තිවල වටිනාකම. ඒනිසා මම ගරු ඇමැතිතුමාටත්, අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරුන්ටත් සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. පාසල් පද්ධතිය ආරක්ෂා කර, වටිනාකම ආරක්ෂා කිරීම පිළිබඳව. දැන් ළඟම පාසල හොඳම පාසල වැඩ සටහන තිබෙනවා නේ?ඒකේදී අපි පාසල් පහකට මුල් ගල් තිබ්බා. ඒවායේ මුල්ගල් තියන කොට විදුහල්පතිවරු සිටියෙත් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රවීට වැලි, ඔබතුමාට පස්

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

කවුද ඒ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වට පිට බලන්නේ නැතිව ඔබතුමා මූලාසනයට කථා කරන්න කෝ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

කිඹුලා කන එක කමක් නැහැ. කොහිල කටු ඇණෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දොම්පේ ආසනයේ පාසල් පහක කවුරුවක් නැතිව මුල් ගල් තැබුවා. ඒ නිසා ඉදිරියේදී මුල්ගල් තබන අවස්ථාවකදී ගරු ඇමැතිතුමා ඇවිල්ලා ඒවාට නායකත්වය ලබා දෙයි කියලා මම ඉල්ලා සිටිනවා. එම අවස්ථාවලදී ගරු ඇමැතිතුමාගේ නායකත්වයෙන් මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කළොත්, ගොඩක් හොඳයි කියලා අපි හිතනවා. මම විශේෂයෙන්ම මේ අධ්‍යාපන නිලධාරීන්ගෙන් ඉල්ලීමක් කරන්නේ, ඉංග්‍රීසි අධ්‍යාපනය ගැන. දැන් ආණ්ඩුව, සියලු දෙනාම ඉංග්‍රීසි අධ්‍යාපනය ගැන දැඩි ලෙස මේ දවස්වල කථා කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගමේ අරක්කු බෙදන එක කැතයි නේද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

බාධා කරන්න එපා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

අනිවාර්යයෙන් පොහොට්ටුවක්. පිපෙන්නේ නැති පොහොට්ටුවක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගමේ අරක්කු බෙදන ගමන් අධ්‍යාපනයට කථා කරන එක හරිද?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ඉංග්‍රීසි අධ්‍යාපනය දැන් ඉතාම වැදගත් වෙලා තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා, ඔහොම බාධා කරන්න දෙන්න එපා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

කරුණාකර මගේ දොම්පේ ආසනයේ දරුවන් වෙනුවෙන් ඉල්ලා සිටිනවා. කරුණාකර මටබාධා කරන්න එපා කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අරක්කු බෙදන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ටයි. උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමාගේ ගුණ කථනයට තමුන්නාන්සේලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම කියන්න එපා.

**ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මොකක්ද? ගුණ කථනය. මළගෙයක් යැ ගුණ කථනය.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

දොම්පේ ආසනයේ දරුවන් වෙනුවෙන් මම කථා කරන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා කථා කරන්න.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මේ ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දෙන්න අපි දැඩි උත්සාහයක් දරනවා. ඒ මොකද, විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දෙන්න අපි ගුරුවරුන් පුහුණු කරන්න ඕනෑ. හුහක් වෙලාවට ඉංග්‍රීසි ගුරුවරුන්ට ඔක්කෝටම ඉස්සෙල්ලා ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දෙන්න ඕනෑ. හොඳ ගුරුවරු ඉන්නවා. අපි ඉංග්‍රීසි වැඩ සටහන් කරන කොට හුහක් වෙලාවට ගුරුවරුන්ගේ මදි පාඩුවක් දැනෙනවා. මොකද, හැම වර්ෂයකදීම අවුරුදු ගණනාවක් තිස්සේ ඉංග්‍රීසි නාට්‍ය තරග පවත්වනවා. ඉංග්‍රීසි ක්‍රියාකාරකම් තරග පවත්වනවා. එතැනදී මට ගුරුවරුන්ගේ ගොඩක් දුර්වලතාවයන් දැකලා තිබෙනවා. විශේෂයෙන් මම ඒවා කියන්න යන්නේ නැහැ. නාට්‍ය තරගවලදී මට පේනවා, ඒ ගුරුවරුන්ට ඉංග්‍රීසි ගොඩක් බැහැයි කියලා. ඉස්කෝලවල මම ඉංග්‍රීසි දින පවත්නවා. ඒ ඉංග්‍රීසි දිනවලට ගියාම ළමයින් එනවුන්ඩ්ස් කරනවා ගොඩක් වැරැදියි. මම බලනවා. මේ ඉංග්‍රීසි ගුරුවරයා තමයි ලියලා දීලා තිබෙන්නේ. පැමිණිලි කරපුවාම හුහක් වෙලාවට ඒ ගුරුවරයා මාරු කරන්න තැනක් නැහැ. දැන් මේ ISA ලා කියලා ඉන්නවා. International adviser ලාටත් හුහක් වෙලාවට ඉංග්‍රීසි බැහැ. මම සොයලා බැලුවාම මේ International adviser ලා ගන්නෙත් සිංහල විභාගයක් තියලා. ඉතින් ඒක නිසා ඉංග්‍රීසි විෂයය අද රටේ දියුණු කරන්න නම් එකක් තිබෙනවා, මේ වටිනාකම් හඳුනා ගන්න ඕනෑ. පළාත් සභාවට ආපුවාම පළාත් සභාවේ වටිනාකම හඳුනා ගන්න ඕනෑ. කරුණාකර පිස්සෝ වාගේ හැසිරෙන්නේ නැතිව ඉන්න ඕනෑ. තමුන්නාන්සේලාට ඡන්දය දීපු අයව ලැජ්ජා කරන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පස් කපන එක හොඳයිද?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

එතකොට මහ විද්‍යාලයේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ කාර්මික අංශයට විශේෂ උපදේශයක්. මේ අනවශ්‍ය මයික්‍රෝෆෝන් සියල්ලම -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා නම් කරලා කියන්න කෝ නවත්වන්න කියලා. කාර්මික අංශයට කියන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කාර්මික අංශයට කිව්වේ,මේ මයික්‍රෆෝන් අනවශ්‍ය විධියට -

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මගේ වෙලාව අඩු කරන්න එපා. ඒක එකතු කරලා දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

වෙලාවට පස් කපන්න ඕනෑ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා මට කථා කරන්න ඉඩ දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මම වැදගත් දෙයක් කථා කරනකොට කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ නේ?මොකද, අපි ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දෙන්න උත්සාහ කරනවා. ඉංග්‍රීසි ගුරුවරුන්ට විශේෂයෙන්ම පුහුණු පාඨමාලාවක් පවත්වන්න ඕනෑ. එහෙම නැති වුණොත් මේ වැඩේ අපට කරන්න අමාරු වෙනවා. ඒ වාගේම ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මේ ගුරු පුරප්පාඩු ගැන කථා කළා. දොම්පේ ආසනයේත් ගුරු පුරප්පාඩු 100 ක් විතර තිබෙනවා. 1 සිට 5 වසර, O/L, A/L. හුහක් වෙලාවට ප්‍රසූත නිවාඩු ගත්තාම ගුරුවරුන් නැති නිසා ගුරුවරු සංචිතයක් ඉන්නවා නම් හොඳයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මම විනාඩි දෙකක කාලයක් වැඩිපුර දුන්නා. විශේෂ කථාවක් නිසා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මට මෙතුමාත් විනාඩි 05 ක් දුන්නා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කථා කරන්න හම්බ වුණේ නැහැ නේ?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මට කථා කරන්න දුන්නේ නැහැ නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වෙනත් විෂයයකදී කථා කරන්න. දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න. ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තූතියි.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

පොඩ්ඩක් ඉන්න. මට අවසාන වශයෙන් තව එකක් කියන්න තිබෙනවා. මොකද, මේ පොහොට්ටු කථා කරන්න දෙන්නේ නැහැ නේ? පොහොට්ටුවලට මම කවියක් කියලා නතර කරන්නම්. මතක තියා ගන්න ඕනෑ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති, රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති. මේක 2020 වනතුරු නතර කරන්න බැහැ. මේ පොහොට්ටු පිපෙන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි. ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මේ කුංකුනාවේ හාමුදුරුවෝ මෙන්න මෙහෙම කවියක්කියලා තිබුණා.

අනේ කුඹිය නේ
තොපිටත් රජෙක් ඉන් නේ
අපට නම් නැත්තේ
ඒ නිසාමයි අපි තැවෙන් නේ.

මම ඒකට කියන්නම්.

අනේ පොහොට්ටුව නේ
තොපට රජෙක් නැත්තේ
රජා මේ පැත්තේ
ඇවිත් හිටගන් මේ පැත්තේ.

ඒ නිසා මෛත්‍රී - රනිල් විශ්වාසය 2020 වනතුරු තිබෙනවා. ඒ නිසා පොහොට්ටුකාරයන්ට තිබෙන්නේ, තැවෙන්නේ නැතිව රජෙක් ඉන්න පැත්තට ඇවිල්ලා හිට ගන්න එකයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා බොහොම ස්තුතියි. අපි අද තමයි දන්නේ එතුමා හිටවන කවි කියන මන්ත්‍රීවරයෙක් හැටියට. විපක්ෂය වෙනුවෙන් ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය විනාඩි 09 යි.

[පූ.භා. 11.49]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පළමුවැනි වතාවට මේ අයවැයේ කථාවක් කරන්නේ. මම මේ උපදේශක කාරක සභාවේ ඉන්න නිසා කථා කරන්න සිදු වෙලා තිබෙනවා. නැත්නම් හෘද සාක්ෂියට එකඟව අද කථා කරන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ඇමැතිතුමා මේ යහපාලන රජය පටන් ගත්තු දවසේ සිට, මේ අමාත්‍යාංශයට ආපු දවසේ සිට ගිරේට අහු වුණු පුවක් ගෙඩිය වාගේ. එක කොට්ඨාශයක් ආපු දවසේ සිට එතුමාට ප්‍රශ්න දැම්මා. මම හිතන්නේ, මේ අපේ ගරු අධ්‍යාපන ඇමැතිතුමාට විතරක් නොවෙයි. හැම ඇමැතිවරයෙක්ටම. පුළුවන්තරම් බැලුවා, මේ ඇමැතිවරුන්ව අපහසුතාවයට පත් කරලා එතුමන්ලාව පරාජය කරන්න තමයි සැලැස්ම තිබුණේ. නමුත් අද යහපාලන රජය වශයෙන් අපටත් උපදෙස් ලැබුණේ මේ පළාත් සභාවේ අයවැයට පක්ෂව ඡන්දය දෙන්නය කියලා. ඒක නිසාදෝ මම හිතන්නේ පොහොට්ටුව මේ වන කොට පරවෙලා ගිහිල්ලා තිබෙනවා. නැත්නම් අද වන කොට මේ පොහොට්ටුවේ අය බලාගෙන සිටියේ, මේ අයවැය පරද්දන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම එකක් තිබෙනවා. එහෙම එකක් තිබුණා. අපටත් කියලා තිබුණේ. මට දැනගන්න ලැබුණු කාරණා අනුව ඒක අද උදේ ඉතාමත්ම පැහැදිලිව පෙනිලා තිබෙනවා. ඉතින් ඒක නිසා මේක හංගන්න දෙයක් නැහැ. අද පළාත් සභාවේත් පොහොට්ටුව පරාද වුණා. මහ ලොකුවට කියන් හිටියේ අපට කට්ටිය ඉන්නවාය කියලා. පොහොට්ටුවට මේ බස්නාහිර පළාත් සභාවේ බලය නැහැයි කියන එකත් අද ඉතාමත්ම පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. ඒක ගරු මහ ඇමැතිතුමාත් ඉතාමත්ම පැහැදිලිව ප්‍රකාශ කළා.

ඒ පොහොට්ටුව කොපමණ අසරණ වෙලාද කිව්වොත්, අර ලැබෙන මුදල්වලට අද ඔවුන්ට මේ අයවැයට පක්ෂව ඡන්දය දෙන්න වෙලා තිබෙනවා. අද ජනතා විමුක්ති පෙරමුණට වුණු වැඩේම තමයි අද පොහොට්ටුවට වෙලා තිබෙන්නේ. ඉතින් ඒක නිසා අද කවුරු මොනවා කිව්වත්, පොහොට්ටුවේ අය කියන්න ඇති මිලියන අට සියය ගණනක් කපලා කියලා. කපලාතිබුණත්, ඒ කපලා තිබෙන්නේ අමාත්‍යාංශයෙන් වුණාට, බස්නාහිර පළාත් සභාවට මම හිතන්නේ අද බිලියන 04 ක විතර ප්‍රමාණයක් වෙනම අපේ මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ලැබිලා තිබෙනවා. මෙතෙක් කල් මේ අධ්‍යාපන ක්ෂේත්‍රය අතට අරගෙන අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ තමන්ගේ බුදලයක් හැටියට පාවිච්චි කළේ මේ පොහොට්ටුවේ අය. අපි දන්නවා" අපේ පාසල්වල ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ ප්‍රසන්න රණතුංග මහ ඇමැතිතුමාගේ කාලයේ මේගොල්ලන්ගේ බුදලයක් වාගේ තමයි මේක පාවිච්චි කරගෙන තිබුණේ. අර කිව්වා වාගේ විදුහල්පතිවරුන්ට කථා කරපු විධිය. අන්න එවැනි තත්ත්වයක් තිබුණා. මම මීට පෙරත් අපේ ගරු ඇමැතිතුමාට කිව්වා. තමුන්නාසේට ලැබිලා තිබෙන අමාත්‍යාංශය ඇමැතිවරයෙක් හැටියට කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන්නය කියලා. අපි බලාපොරොත්තු වෙනවා, 2017 වසරේ එතුමා එහෙම ක්‍රියා කරයි කියලා. පාසල්වලට ළමයින් දාන්න ලැයිස්තු හැදුවේ කවුද කියලා අපි දැක්කා. එතුමාගේ කාමරයේම ඉඳගෙන. සමහර මන්ත්‍රීවරු ලොකු ෆයිල් තියාගෙන ළමයින් 40, 45 දැම්මේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි අපි දැක්කා, මේ අමාත්‍යාංශය පාලනය කළේ කීපදෙනෙක්. ඇත්තටම මේ අමාත්‍යාංශය පාලනය කළේ ඇමැතිවරු නොවෙයි. ඇමැතිවරුන්ව භය ගන්නවලා, පීඩනයට පත් කරලා තමයි මේ අය මේ අමාත්‍යාංශය පාලනය කරන් සිටියේ. හැබැයි, ලබන වසරේ මේ තත්ත්වය වෙනස් වෙන්න ඕනෑ. මේ තත්ත්වය වෙනස් වුණේ නැත්නම් මම හිතන්නේ, මේ බස්නාහිර පළාත් සභාව ඉතාමත් අර්බුදයකට යන්න වෙනවයි කියන එකත් අපි මතක් කරලා දෙන්න ඕනෑ. එදා වගේ නොවෙයි. එදා අපි දන්නවා. අපේ ප්‍රදේශවල මෙරිල් ගරු මන්ත්‍රීතුමා ගිහිල්ලා ලක්ෂ 05 බෙදුවෙත් උත්සව තියලා. අද පාසල්වලට මිලියන ගණන් හම්බ වෙන්නේ. අද බිල්ඩින් හදද්දී තනි තට්ටුවේ බිල්ඩින්වලට සල්ලි ලැබෙන්නේ නැහැ. අපේ ගරු ඇමැතිතුමා කියයි. අද තට්ටු දෙකේ තුනේ බිල්ඩින් සෑම පාසලකටම වාගේ ලැබිලා තිබෙනවා. අද නඩත්තු කටයුතු කරන්න කියලා වෙනම මිලියන 02 ක ගණනේ, ලක්ෂ 15 ගණනේ ඒ පාසලේ ළමුන් සංඛ්‍යාව අනුව විශාල මුදල් ප්‍රමාණයක් අද ලැබිලා තිබෙනවා. කවදාවක්වත් ලැබුණේ නැති මුදල් ප්‍රමාණයක් අද පළාත් සභාවල්වලට ලැබිලා තිබෙනවා. ඒක මෙරිල් ගරු මන්ත්‍රීතුමාට පාලනය කරගන්න බැරි වෙලා තිබෙන එක තමයි ප්‍රශ්නය. අද ඒ අය බලාපොරොත්තු වන්නේ, බස්නාහිර පළාත් සභාවේ ඇමැතිතුමාට මුදල් ටික දීලා, ඒ අය මේකත් අතට ගන්න. ඒක කරන එක අපි කොහොම හරි නවත්තලා තිබෙනවා. ලබන වසරේ සිට මේ සියලුම මුදල්, බිලියන 04 ක වාගේ ප්‍රමාණයක් මේ බස්නාහිර පළාත් සභාවට ලැබෙනවා. ඒ ලැබෙන්නේ හැබැයි, පොහොට්ටුවේ අයට ඕනෑ ඕනෑ විධියට වියදම් කරන්න නොවෙයි කියන එකත් අපි මතක් කරලා දෙනවා. ඒක නිසා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා අධ්‍යාපනය ගැන නොවෙයි පොහොට්ටුව ගැන කථා කරන නිසා විශේෂයෙන්ම ගණපූර්ණය ගැන අවධානය යොමු කරනවා. මෙතුමා පොහොට්ටුව නේ පෙන්වන්න යන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගණපූරණය අඳින්න බැහැ නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පුළුවන්. පුළුවන්. ඇයි බැරි?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වැඩක් කරගන්න බැරිව ගියාම නවත්වනවා. පොහොට්ටුවට වෙලා තිබෙන්නේ ඕක තමයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර සීනුව නාද කරන්න. ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සභාව විනාඩි 05 කට කල් තබනවා.

***පූර්ණ කාරක සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.***

***පසුව ගණපූරණය ඇති නොවූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් පූර්ණ කාරක සභාව තාවකාලිකව අත් සිටුවන ලදින් අ.භා. 12.01 ට යළිත් රැස් විය.***

*Committee of the whole council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*

*Later, it found no quorum, Hon. Presiding Member suspended the sitting temporarily and it resumed at 12.01 p.m.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම විශේෂ නිවේදනයක් මේ අවස්ථාවේදී කරන්න බලාපොරොත්තු වෙනවා. මේ බස්නාහිර පළාත් සභාව කියන්නේ, ශ්‍රී ලංකාවේ තිබෙන පළාත් සභා අතුරින් සුවිශේෂී ගෞරවණීය, මුළු මහත් රටේ ජනතාවගේ අවධානය යොමු වන පළාත් සභාවක්. මේ පළාත් සභාවේ වැය ශීර්ෂයන් පිළිබඳව කථා කරන කොට ඉතාමත් වැදගත් වැය ශීර්ෂයක් තමයි මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය. ඒ නිසා අනවශ්‍ය කථා තුළින් තම තමන්ගේ දේශපාලන උවමනාවන් පිරිමහ ගන්න යෑමෙන් සභාව තුළ ඇති වන්නේ නොසන්සුන්කාරී තත්ත්වයක්. මම හිතන්නේ අපි රටට වැරැදි ආදර්ශයක් දෙන්නේ. ඒ නිසා මම සියලු දෙනාගෙන්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ වැය ශීර්ෂය පිළිබඳ සාකච්ඡාවේදී ඉතාමත්ම සංවේදීව හිතලා බලලා, මේ රටේ ශිෂ්‍ය පරම්පරාව ගැන හිතලා, අනවශ්‍ය ප්‍රශ්න ඇති නොවෙන්න විෂය පථයට අදාළව ඉතාම සංවේදීව කථා කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කථා කරමින් සිටියේ. ඔබතුමාගේ කථාව කරගෙන යන්න. ඔබතුමාට දැන් විනාඩි 03 යි ඉතුරු වෙලා තිබෙන්නේ. හරියට කාල කළමනාකරණය කරලා, සභාව නොසන්සුන් නොවෙන්න කථා කරන්න කියලා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ වෙලාව වෙන කොට මම විනාඩි තුනයි කථා කරලා තිබුණේ. තව හයක් තිබෙන්න ඕනෑ. විනාඩි 06 ක් තිබෙන්න ඕනෑ. මම විනාඩි තුනයි කථා කළේ. ඉතිරි තුන පොහොට්ටුව ගිල ගත්තාද දන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

තව විනාඩි දෙකක් එක්ක ඔක්කොම විනාඩි පහක් දෙන්නම්.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ආණ්ඩු පක්ෂයේ ඉන්න සියලුම ගරු මන්ත්‍රීවරු එක්සත් ජනතා නිදහස් සන්ධානයේ. කිසිම කෙනෙක් පොහොට්ටුවකට ගිහිල්ලා නැහැ. ඒ නිසා ඒ වචනය කථා නොකර, කථා කරන්න කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙමනම් ඉතින් කවුරුත් කළබල වෙන්න ඕනෑ නැහැ. එහෙමනම් ඇයි කළබල වෙන්නේ? කළබල වෙන්නේ මොකටද? අපි කිව්වයැ කළබල වෙන්න කියලා. ඔබතුමා එහෙම කිව්වාට අර ආනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා මෙතැනම කට ඇරලා කිව්වා, මම පොහොට්ටුවේ කියලා. ඒ නිසා ඔබතුමාට කියන්න බැහැ, ඔක්කොම සන්ධානයේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අනාගතයේ පොහොට්ටුවේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ බස්නාහිර පළාතේ අධ්‍යාපනය වෙලා තිබෙන දේ ගැන.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අන්න හොඳයි. කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක පාලනය කරන් ගියේ කවුද කියන එකයි මම කියාගෙන ගියේ. දැන් ඒ අය පොහොට්ටුවේ පැත්ත ඉන්න එක වෙනම කථාවක්. නමුත් සන්ධානයේ ඉඳගෙන කළෙත් ඔය ටිකම තමයි. සන්ධානයේ ඉඳගෙන කළෙත් - ඇමැතිතුමාට මෙච්චර කල් ඇමැතිකම කරන්න දුන්නේ නැහැ. ඇමැතිතුමාගේ අත්දෙක බැඳලා, කට බැඳලා, ඇස් බැඳලා තමන්ට ඕනෑ ඕනෑ දේ ඒ අය කර ගත්තා. ඒක තමයි අපි මේ නවත්වනවා කිව්වේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හැබැයි, ලිපිය දාලා නිමල මරියට ළමයින්ට දා ගත්තා, ජෝර්ජ් විපක්ෂයේ සංවිධායකතුමාට කියලා. අර කාමරයට ලියුම එවලා ළමයින් දා ගත්තා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිමල මරියා එකේ කතන්දරෙත් මම කියන්නම්. තුඩැල්ලේ නිමල මරියා එකට වුණු වැඩේ. මම ගරු ඇමැතිතුමාට කියලා රුපියල් ලක්ෂ 20 ක් ඉල්ලා ගත්තා. උසස් පෙළ පන්ති කාමර හතරක ළමයින් අව්වට වේලි වේලි, වැස්සට තෙමී තෙමී එළියේ ඉගෙන ගන්නේ. ඒකේ පන්ති කාමර ටික හදා ගන්න මම ගරු ඇමැතිතුමාගෙන් ලක්ෂ 20 ක් ඉල්ලගෙන අනුමත කර ගත්තාම, ඒකත් අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගිහිල්ලා නැවැත්තුවා. ඇයි නැවැත්තුවේ? එතුමාගේ මාර්ගයෙන් ආවේ නැහැයි කියලා ඒක නැවැත්තුවා. එතුමාට ආරාධනය කළා, තුඩැල්ල නිමල මරියා විද්‍යාලයේ sportmeet එකට. Sportmeet එකට එන එකත් එතුමාව බලහත්කාරයෙන් නැවැත්තුවා. එතුමාගේ නියෝජිතයෙක් ආවා. ඒ නියෝජිතයා සභාව ඉස්සරහා, ඔක්කොම ඉස්සරහා තර්ජනය කළා. තර්ජනය කරලා කිව්වේ මොකක්ද? අපට කියන්නේ නැතිව මෙතැනට කාවවත් ගෙන්නන්න දෙන්නෙත් නැහැ. ඔය ඉස්කෝලෙට සල්ලි දෙන්න දෙන්නෙත් නැහැයි කියලා මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මගේ ඉස්සරහාම කිව්වා. පුළුවන් නම් ඔබතුමා කිව්වේ නැහැයි කියලා කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 36(1)යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතුමා චෝදනාවක් කරන්නේ. මේ අධ්‍යාපන ඇමැතිතුමා ඉන්නවා. අතන එතුමාගේ පෞද්ගලික ලේකම් හේමචන්ද්‍ර මහත්මයා ඉන්නවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වරප්‍රසාදය අහිමි වෙලා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා කියනවා නේ? මම නිලධාරියාට තර්ජනය කළා කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නම කිව්වාද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇයි නම කිව්වේ, මෙරිල් පෙරේරා මන්ත්‍රීතුමා කියලා. එතුමා කියනවා නම් අර නිලධාරියා අතන ඇවිල්ලා ඉන්නවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඉස්සරහා කිව්වේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා ඉන්නවා නම්, එතුමා ඉස්සරහා පිට නේ කියන්න ඕනෑ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇමැතිතුමා හයද කොහෙද? නිලධාරියාව මෙතුමන්ලා හය කරගෙන ඉන්නේ. අපි දන්නවා නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා ඉන්න. දැන් වරප්‍රසාද ප්‍රශ්නයක් නේ? ඔබතුමා ඉඳගන්න දැන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් වරප්‍රසාද ප්‍රශ්නය ඉවරයි නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වරප්‍රසාද ප්‍රශ්නය ඔබතුමාට නොවෙයි, මෙතුමාට නේ කියන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පැහැදිලි කරන්න දෙන්න බැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා කියනවා නම්, මම නිලධාරියාට තර්ජනය කළා කියලා, මෙතුමාව නැවැත්තුවා නම්, සල්ලි කැපුවා කියනවා නම්, මෙතුමා උත්තරයක් දේනන ඕනෑ, කවුද කථා කරලා කිව්වේ නිලධාරියාට මට එන්න බැහැ. ගිහිල්ලා මේක විදුහල්පතිතුමියට කියන්න කියලා කවුද කිව්වේ කියලා. මම තර්ජනය කරලා නැහැ. අනික මෙතුමාට කියන්න ඕනෑ. එතුමා ලක්ෂ 20 ක් පාස් කර ගත්තා නම් මම ඒක නැවැත්තුවා නම් මෙතුමා නැඟිටලා කියන්න ඕනෑ, මම ඒක නැවැත්තුවා කියලා. බොරු චෝදනාවක් නේ?මම කියලා සල්ලි නැවැත්තුවා නම් මෙතුමා නැඟිටලා උත්තරයක් දෙන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා මෙහෙම කරමු.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක වරප්‍රසාද කඩ කිරීමක් නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වරප්‍රසාද කමිටුවට ආලා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දැන් මෙතුමා ඉන්නවා නේ? උත්තරයක් දෙන්න පුළුවන් නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දැන් උත්තරයක් දෙන්න ගියොත් එහෙම -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා චෝදනාවක් නේ කළේ. ලක්ෂ 20 ක් දීලා මට කපන්න පුළුවන් නම් මෙතුමා කියන්න ඕනෑ. මෙතුමා කියන්න එපැයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එහෙම කියන්නේ නැහැ. හයයි නේ,

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හය කරගෙන ඉන්නේ. කියන්නේ නැහැ නේ,

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එතුමාගේ කථාවේදී ප්‍රකාශ කරයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමාගේ නිලධාරියාගෙන් අහලා කවුද තර්ජන කළේ, කවුද කිව්වේ කියලා කියන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුරු කථාවේදී මේ පිළිබඳව සඳහන් කරන්න. එතුමාගේ වරප්‍රසාද කඩවීම සම්බන්ධව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියනවා. මගේ ඉස්සරහා කිව්වේ. සභාව ඉස්සරහා ප්‍රකාශ කළේ. මෙතුමා ඒක කිව්වා. මෙතුමා තර්ජනය කළා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙතුමාගේ තාත්තා පැරදිලා දැන් මෙතුමාව ජා-ඇළ ගණන් ගන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසානයි.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කථා කරන්න හම්බ වුණේ නැහැ. එතුමා නේ කථා කළේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එතුමාගේ කාලය දෙන්න. නැත්නම් අසාධාරණයි.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම විනාඩි 04 යි කථා කරලා තිබෙන්නේ. තව විනාඩි පහක් තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

විවේචන අහගෙන ඉන්න ශක්තිය තිබෙන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තාත්තා පාර්ලිමේන්තුවේ පැරදුණා නේ? ඉවසගන්න එපැයි. දැන් ඉවසීම නැහැ. දැන් කාවින්ද මන්ත්‍රීතුමා තමයි නායකයා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඕනෑ නම් ඒ පාසලේ ගුරුවරුන්ගෙන් ලිඛිතව අරන් දෙන්නම්, මෙතුමා එහෙම තර්ජනයක් කළේ නැද්ද කියලා. ඒ අය සාක්ෂි දෙනවා. ඕනෑ නම් මම ගරු ඇමැතිතුමාට කියනවා, ඒ ගුරුවරුන්ව ගෙන්නලා දෙන්නම්,අහන්න කියලාකිව්වේ නැද්ද කියලා. අද ඔන්න ඔය විධියට තමයි ඇමැතිතුමාව තර්ජනය කරගෙන, පහත් කරගෙන, මේ කට්ටිය කකුළෙන් පාගෙන ඉන්නේ. ඒක තමයි මම කිව්වේ, පොහොට්ටුවේ ඕනෑ විධියට ලබන අවුරුද්දේ මේ අමාත්‍යාංශය කරන්න අපි ඉඩ දෙන්නේ නැහැයි කියලා. අපි ඉතාමත් පැහැදිලිව අපේ රජය, ජනාධිපතිතුමාත් අගමැතිතුමාත් අපට පොරොන්දුවක් දීලා තිබෙනවා. 2017 දී මේ මුදල් බෙදන්නේ එතුමන්ලාත් එක්ක ඉන්න අයට විතරයි කියලා. ඒක නිසා තමුන්නාන්සේලාට ප්‍රතිපාදන ඕනෑ නම් යහපාලනයට එන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

හිඟා කෑවත් යහපාලනයට එන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එක කකුළක් පොහොට්ටුවේ තියාගෙන - ඔබතුමාට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජනවාරියේදී බලමු. තනතුරු එකක් දෙකක් ගැලෙව්වාම අමාරුව හොඳ වෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කඩේ ගියාට කරගන්නේමෙරිල් පෙරේරා විතරයි. තමුනාන්සේලාට අද වනතුරු ශත පහක් වත් හම්බ වෙලා තිබෙනවාද? අද කෝටි ගණනක් වැඩ කරලා තිබෙන්නේ මෙරිල් පෙරේරා විතර නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තව විනාඩි දෙකක් දෙන්න. ඔබතුමාත් පොහොට්ටුවට භය වෙලා නේ?ඒක නේ වැඩේ වෙලා තිබෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරි. හරි. කථා කරන්න. විපක්ෂ නායකතුමාගේ කාලයෙන් විනාඩියයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ලබන වසරේ මේ ලැයිස්තුවෙන් නම් දාන එක නවත්වන්න කියලා. මන්ත්‍රීවරුන්ට නම් දාලා තමන්ට ඕනෑ අයව දාගන්න, ඒ අවසරේ දෙන්න එපාය කියන එක අපි තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇයි ඔබතුමා ලැයිස්තුවෙන් දා ගත්තේ නැද්ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. දා ගත්තේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා දා ගත්තා කියලා ඔප්පු කෙරුවොත්? ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පුළුවන් නම් ඔප්පු කරලා පෙන්වන්න. මම දාගත්තේ නැහැ. පුළුවන් නම් ඔප්පු කරලා පෙන්වන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නිමල මරියා එකට ළමයින් දැම්මා. ලැජ්ජයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ ලියුම් දෙක මම ඉරලා විසික් කළා. මට ඕනෑ වෙලා තිබුණේ, ලැයිස්තුවෙන් දානවා කියලා ඔප්පු කරන්න. ඔබතුමා තමයි ලැයිස්තු හැදුවේ. ඇමැතිතුමා නොවෙයි ලැයිස්තු හැදුවේ. මම දැක්කා. ඇමැතිතුමාගේ මේසේ ඉඳගෙන, මන්ත්‍රීවරුන්ට කථා කර කර 104 දෙනාටම බෙදලා දුන්නේ ඔබතුමා. ඒක නිසයි මම කියන්නේ. මේ අමාත්‍යාංශය පොහොට්ටුවට කරගෙන යන්න ලබන අවුරුද්දේ අපි ඉඩ දෙන්නේ නැහැයි කියන එක මතක් කරනවා. අපේ ඇමැති කෙනෙක් පත් කරගෙන තිබෙන්නේ. අපේ ඇමැතිතුමා ලබන අවුරුද්දේ කොන්ද කෙළින් තියාගෙන වැඩ කරනවයි කියන එක අපට විශ්වාසයි. ඒක නිසා අපි භය නැතිව කියනවා. ලබන වසරේ මේ පොහොට්ටුවට ඕනෑ ඕනෑ විධියට සෙල්ලම් කරන්න අපි ඉඩ දෙන්නේ නැහැයි කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අර්ෂාඩ් නිසාම්ඩීන් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 යි. එහි උපරිමයෙන් ප්‍රයෝජන ගන්න.

[අ.භා. 12.10]

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මගේ සතුට ප්‍රකාශ කරනවා. ඒ වාගේම අපට හොඳ අධ්‍යාපන අමාත්‍යවරයෙක් ඉන්නවා. එතුමාගේ ඒ ඉන්න නිලධාරීන් ගැන කියන කොට ලේකම්තුමා, නියෝජ්‍ය ලේකම්තුමා, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා කලාප අධ්‍යක්ෂවරුන්ගේ උත්සාහයෙන් අපේ ගරු ඇමැතිතුමාගේ විශ්වාසවන්ත වැඩ පිළිවෙළ අනුව අද අධ්‍යාපනය හොඳ මට්ටමකින් ගෙනි යනවා. ඒ අනුව 2016 දී විදුහල්පති ශ්‍රේණිධාරීන් සංඛ්‍යාව 1732 ක් තිබියදී ඒ වර්ෂයේදීම 2411 ක් බවට පරිවර්තනය කරලා තිබෙනවා. ඒ කියන්නේ 679 ක් බඳවා ගෙන තිබෙනවා. ඉතාම

විශිෂ්ටයි. අපි ඒකට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම 2016 වර්ෂයේදී ගුරුවරුන් බඳවාගෙන තිබෙනවා. අපි මෑතකදී ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු 2016 වර්ෂයේ දී දෙමළ මාධ්‍ය සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට එතුමාට අවකාශයක් ලබා ගන්න පුළුවන් වුණා. ඒ වාගේම 2016 වර්ෂයේ අවසානය වන විට වැඩ බලන විදුහල්පතිවරු වශයෙන් 448 ක් සිටියදී, ඊට පස්සේ මධ්‍යම රජයෙන් තුන්වැනි ශ්‍රේණියේ විදුහල්පති සේවය සඳහා බඳවා ගැනීමේදී ඒ විභාගය සමත් වූ විදුහල්පතිවරුන් 801 ක් බස්නාහිර පළාතට ලබා දීමෙන්, ඒ 801 ම බස්නාහිර පළාතට බෙදා දී සම්පූර්ණ කරලා තිබෙනවා. කිසිම පළාතක ඒ වාගේ සම්පූර්ණකිරීමක් අද වනතුරු වෙලා නැති බව තමයි මට හැඟෙන්නේ. ඒ වාගේම විදුහල්පතිවරු පුහුණු, ගුරු පුහුණු, ඒ වාගේම ශිෂ්‍යත්ව ළමයින් සඳහා සම්මන්ත්‍රණ ලබා දීලා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා එතුමා විශේෂ කාර්ය භාරයක් ඉටු කරලා තිබෙනවා. 2016 වර්ෂයේදී ගුරු සංඛ්‍යාව 34,374 ක් තිබියදී 2016 වර්ෂයේදී ඒක 35,148 කට වැඩි කරලා 773 ක් ගුරුවරුන් වැඩිපුර බඳවාගෙන තිබෙනවා. මෙවන් ආකාරයට අධ්‍යාපනයට මූලිකත්වය ලබා දීලා අපේ බස්නාහිර පළාත තුළ අධ්‍යාපනය සඳහා එතුමාගේ කාර්ය මණ්ඩලය මේ කරන්නා වූ සේවාවන් අපි අගය කොට සලකනවා.

ඒ වාගේම එතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන් කොළඹ මුස්ලිම් ජනතාව 80% ක්ම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරන්නේ. නමුත් මුස්ලිම් පාසල්වල අද සිංහල මාධ්‍යයේ ගුරුවරුන් විශාල ප්‍රමාණයක් අඩු වෙමින් තිබෙනවා. ප්‍රාථමික අංශයේ, උදාහරණයකට ටී.බී. ජයා මාවතේ සහිරා විදුහල. කහිරියා විදුහල. ෆාතිමා විදුහල. බදූදීර්න් මොහොමඩ් විදුහල. ඒ පාසල් ගත්තාම ප්‍රාථමික අංශයෙන් ගුරුවරුන් තුනයි, හතරයි, පහයි. එවැනි ගුරුවරුන්ගේ විශාල වශයෙන් අඩුපාඩුවක් තිබෙනවා. ඒ පාසල්වලටත් ගුරුවරුන් ලබා දීලා අපේ කොළඹ තිබෙන අධ්‍යාපනය නඟා සිටුවීමට හැකි වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම අද කොළඹ තිබෙන පළාත් සභා පාසල් මට්ටමෙන් හොඳ මට්ටමේ තිබෙන්නේ, අසෝක විද්‍යාලය සහ සංඝමිත්තා වැනි පාසල්. අද අසෝක විදුහල ගැන කථා කරනවා නම් අසෝක විදුහලේ දැනට සිටින විදුහල්පතිවරයා හොඳ ආකාරයයට අධ්‍යාපනය ඉහළ මට්ටමට පත් කරලා හොඳ විශිෂ්ට ප්‍රතිඵල අසෝක විදුහලට ලබා දීලා තිබෙනවා. නමුත් අසෝක විදුහලේ දැනට අඩු වශයෙන් තිබෙන්නේ ඒ ඉඩ ප්‍රමාණය. ඒ විදුහලට ඒ ඉඩ ප්‍රමාණය මදී. මම අපේ ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා. ඒ විදුහලට බද්ධ කිරීම සඳහා තවත් විදුහලක් ලබා දීලා ඒ ප්‍රාථමික අංශය ඒ විදුහලට බඳවා ගෙන මේ අසෝක විදුහලට තව දියුණු කිරීමට අපට හැකියාව ලැබෙයි කියලා. ඒ වාගේම මම ඉල්ලා සිටින්නේ අපේ ගරු ඇමැතිතුමාගෙන් මේ -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

හොඳ විදුහල්පතිවරයෙක්.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

දක්ෂ විදුහල්පතිවරයෙක්. ඉතා හොඳ විදුහල්පතිරවරයෙක්. අපි දන්නා තරමට ඉතා හොඳ දක්ෂ විදුහල්පතිවරයෙක්. ජේ.වී.පී. එකේ ගරු මන්ත්‍රීවරුන් ඒක පිළිගන්නවා. ජේ.වී.පී. ගරු මන්ත්‍රීතුමාගේ කටින්ම ඒක කිව්වා. ඒකත් පුදුමයි. ඔබතුමා ගැන සන්තෝෂයි. ඒ වාගේම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්. තව තත්ත්පර තිහක් ගන්න කෝ.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ඒ වගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය පවතින අවස්ථාවේදී ඊයේ ඩිලාසාල් විදුහලේ සිදුවීමක් වෙලා තිබෙනවා. ඒ කියන්නේ ගැහැණු ළමයින්, පිරිමි ළමයින් එකට තියලා අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය කරන කොට පිරිමි ළමයින් ඒ ගැහැණු ළමයින්ට අනවශ්‍ය වචනවලින් කථා කරලා එතැන පොඩි ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටින්නේ ගැහුණු ළමයින්, පිරිමි ළමයින් වෙන් කරලා විභාගය පවත්වන්නය කියලා. ඒ වාගේම කොළොන්නාව ජනතාව වෙනුවෙන් පොඩි ඉල්ලීමක් කරනවා. කොළොන්නාව ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව වැඩි වශයෙන් ගැවසෙන නිසා එම ප්‍රදේශයටත් අපට හොඳ පාසලක් ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. ගරු මන්ත්‍රීවරයෙක් කථා කරන කොට අනික් මන්ත්‍රීවරු සාවධානව ඇහුම්කන් දෙන්න. ඇහුම්කන් දෙන්න බැරි නම්, තමන් නිශ්ශබ්ද වෙලා ඉන්න. දැන් මේ හැම කථාවක්ම කරන කොට, කථා කරපු අයත් ඒකට සහයෝගය දෙන්නේ නැහැ. ඒ නිසා විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. මීළඟට විපක්ෂය වෙනුවෙන් මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 09 ක කාලයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ වෙලාව කපන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපේ විනාඩි 10 දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මට ලේකම්තුමාගෙන් දැනගන්න ලැබුණේ, කථික ලැයිස්තුවේ වැඩියෙන් වෙලාව සඳහන් කරලා තිබෙනවා. දැන් විනාඩි 09 යි දෙන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වවුලාගේ මඟුල් ගෙදර ආවාම අපටත් වවුල්ලු වාගේ ඉන්න වෙලා තිබෙනවා තමයි. හැබැයි, අපි ගොඩක් ඔය වවුල් වැඩවලට සම්බන්ධ නැහැ. ඒ නිසා අපට අයිතිය, පක්ෂයක් හැටියට විපක්ෂයේ කථා කිරීමේ අයිතිය අපට දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරි. විනාඩි 10 ක් දෙනවා.

[අ.භා. 12.17]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම 2017 අයවැය අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශවල වැය ශීර්ෂයට එක් වෙමින් මේ අවස්ථාවේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම හිතනවා, අධ්‍යාපනය ගැන කථා කරද්දී, බස්නාහිර අපට වෙන් කරලා කථා කරන්න බැහැ. බස්නාහිර විතරක් අධ්‍යාපනයේ මුදල් ප්‍රතිපාදන හෝ අධ්‍යාපනයේ වෙනස්කම් ගැන කථා කිරීම පළක් නැහැයි කියලා තමයි මම විශ්වාස කරන්නේ. මොකද, අද වන විට රටේම අධ්‍යාපන ප්‍රතිපත්තිය ගමන් කරමින් තිබෙන්නේ කොහේටද කියන කාරණයත් එක්ක, බස්නාහිරත් ඒ දඬුවේම තමයි හිරවෙලා ඉන්නේ කියන එකයි අපි විශ්වාස කරන්නේ.

විශේෂයෙන්ම අධ්‍යාපනය ඇතුළු අනිකුත් අමාත්‍යාංශ සම්බන්ධයෙන් මේ වන කොට පාර්ලිමේන්තුවේ අයවැය විවාදය යමින් තිබෙනවා. පසුගිය 22 අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ලක් වුණා. සිදු වෙලා තිබෙන්නේ කුමක්ද? එකක් තමයි 2016 ට වඩා අධ්‍යාපනයට වෙන් කරපු ප්‍රතිපාදන බරපතළ විධියට කප්පාදු කරලා තිබෙනවා. හැබැයි, මේ වර්තමාන හවුල් ආණ්ඩුව බලයට එන්න කලින්, ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශවල, ඔවුන්ගේ වැඩ පිළිවෙළ තුළ ඉදිරිපත් කළේ මොකක්ද? ලෝකයේ යුනෙස්කෝ පිළිගත්ත සම්මතය වුණු 6% ක් අධ්‍යාපනයට වෙන් කරනවා කියලා. හැබැයි, ගිය වතාවේ මොකද වුණේ? මුදල් ඇමතිවරයා කන්නන්ගර මහත්මයාගේ කාලයේ සිට හදපු ගොඩනැගිලිවල එකතුව බිලියන 121 ක් අයවැයට එකතු කරලා, 5.7% ක් වෙන් කළයි කියලා කිව්වා. පට්ටපල් බොරුවක් කළා. ඊට පස්සේ ඒ බොරුව අපි පාර්ලිමේන්තුවේත් රටේත් හෙළිදරව් කළා. ඇත්තටම වෙන් කළේ, 2.72% යි. අද වන කොට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? මේ වන කොට බිලියන 129 යි. ඒක බිලියන 44 කින් කප්පාදු කරලා තිබෙනවා. අධ්‍යාපනය සඳහා බිලියන 96 යි වෙන් කරලා තිබෙන්නේ. 25% කින් කප්පාදු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. උසස් අධ්‍යාපනය සඳහා බිලියන 4 කින් කප්පාදු කරලා තිබෙනවා. වෘත්තීය පුහුණුව සඳහා බිලියන 10.5 කින් කප්පාදු කරලා තිබෙනවා. 25% ක්, 9% ක්, 22% ක් වශයෙන් ක්‍රමානුකූලව අධ්‍යාපනය සඳහා

වෙන් කරන ප්‍රතිපාදන කප්පාදු කරපු අයවැයක් තිබෙන්නේ. ඒකේ අතුරු ප්‍රතිඵලවලට බස්නාහිරටත් මුහුණ දෙන්න සිදුවන එක ගැන අපට අහන්න දෙයක් නැහැ. ඒ විතරක් නොවෙයි. මේ වන විට රට පුරාම අධ්‍යාපන පද්ධතිය තුළ සිදු වෙමින් තිබෙන්නේ කුමක්ද? කල්පනා කරලා බලන්න. එක පැත්තකින් රාජ්‍ය අධ්‍යාපනය කප්පාදු කරනවා. කෝටි 1350 ක් උසස් අධ්‍යාපනය සඳහා කප්පාදු කරලා තිබෙනවා. මේ විධියට කොහොමද රටේ අධ්‍යාපනය නඟා සිටුවන්නේ? මේ අය අහනකොට කිව්වේ කොහොමද? මේ හවුල් ආණ්ඩුවේ, යහපාලන ආණ්ඩුවේ මහත්වරු කොහොමද කිව්වේ? අපි ක්‍රමානුකූලව 6% දක්වා වැඩි කරනවා කියලා. එහෙම නේ කිව්වේ. ක්‍රමානුකූලව. එකවර 6% ක් දෙන්න බැහැ, ක්‍රමානුකූලව. හැබැයි, ගිය අවුරුද්දෙත් 2.72%, මේ අවුරුද්දේ 2.2% ට දාලා තිබෙනවා. දළ ජාතික නිෂ්පාදනයෙන් අධ්‍යාපනය සඳහා වෙන් කරන ප්‍රතිපාදන දශම හතකින් කප්පාදු කරලා තිබෙනවා. එහෙම අධ්‍යාපන නඟා සිටුවන්නේ කොහොමද?

ඊළඟට පාසල් පද්ධතිය තුළ කුමක්ද සිදු වෙමින් තිබෙන්නේ? පාසල් පද්ධතිය තුළ අද ගුරුවරයාට උගන්වන්න වෙලාවක් නැහැ. මේ වැය ශීර්ෂය අවස්ථාවට සහභාගි වෙමින් කලාප අධ්‍යක්ෂවරු සහ අනිකුත් නිලධාරින්ඉන්නවා. ඔවුන්ගෙන් විමසලා බලන්න. අද පන්ති කාමරය තුළ ගුරුවරයාට උගන්වන්න නිදහස නැහැ. ගුරුවරුන්ට සිදු වෙලා තිබෙන්නේ, වෙනත් වැඩ කරන්න. සෞඛ්‍ය සේවයට අත්පත් වෙලා තිබෙන ඉරණම අද ඔබ කවුරුත් දන්නවා. අද සෞඛ්‍ය සේවයේ වෛද්‍යවරයා ඉන්නවා. රෝහලේ ඇඳ තිබෙනවා. අනිකුත් සියලු සේවාවන්, සියලුම බෙහෙත් ද්‍රව්‍ය, ඒ වාගේම සියලුම පරීක්ෂණ මේ සියල්ලම පිටින් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. වර්තමාන ආණ්ඩුවේ අයවැය මොකක්ද යෝජනා කරන්නේ? රෝහල් ඇතුළට පෞද්ගලික සේවාවන් ගෙනෙන්න, ගෙවන වාට්ටු ගේන්න. අර රසායනාගාර සේවාවන් රෝහල් ඇතුළට ගෙනෙන්න මේ අයවැයෙන් යෝජනා කරනවා. අධ්‍යාපනයටත් තව නොබෝ දිනකින් සිදු වන්නේ ඒක. පන්ති කාමරයේ ගුරුවරයා ඉඳියි. ඩෙස් බංකුව, පුටුව තියෙයි. එච්චරයි. සියලු සේවාවන් පිටතින් ගන්න සිදුවන තැනට පත් කරමින් තිබෙන්නේ. ඒක තමයි ඔවුන්ගේ දැක්ම. මේ තමයි 1977 සිට මේ රටේ ක්‍රියාත්මක වන නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තියේ පියවර. ඒක තමයි මේ තවදුරටත් ඉදිරියට යමින් තිබෙන්නේ. අන් කිසිවක් නොවෙයි. මේක ඇතුළේ අර්බුද ගණනාවක් නිර්මාණය කරලා තිබෙනවා. ඔවුන් සම්පූර්ණයෙන්ම අධ්‍යාපන පද්ධතිය විනාශ කරමින් තිබෙනවා. වනසා දමමින් තිබෙනවා. මේ ඩෝසර් කරන්න යන්නේ කාගෙවත් අධ්‍යාපනයක් නොවෙයි. මේ රටේ සාමාන්‍ය දරුවන් වුණු, ලක්ෂ 40 ක් දරුවන්ගේ අධ්‍යාපනය. ගරු ඇමැතිතුමනි, බස්නාහිරත් ඒකේ ගොදුරක් බවට පත් වෙනවා. ඔබතුමාටත් ඒකේ ගොදුරක් බවට පත් වෙන්න සිදු වෙනවා.

මේ පසුගිය දවස්වල අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා, මේ ආණ්ඩුවේ ජාවාරම පාසල් තුළට ගෙනියපු විධිය. 2016.09.26 අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එස්.එස්.එස්. හෙට්ටිආරච්චි මහත්මයා ගහපු චක්‍රලේඛය. සියලුම පළාත් අධ්‍යක්ෂවරු, සියලුම කලාප අධ්‍යක්ෂවරු, සියලුම විදුහල්පතිවරු. දුෂ්කර, අතිදුෂ්කර හා හුදකලා පාසල් සිසුන් සඳහා නිල ඇඳුම් රෙදි සැපයීම. නිල ඇඳුම් රෙදි සපයන්න සළුසල කියන ආයතනයට භාර දෙනවා. රජයේ ආයතනයක් වන ලංකා සළුසල ආයතනය මඟින් එම ප්‍රදේශවලටම ගිහින් නිල ඇඳුම් භාර දෙනවා කියලා ලියුමක් ගහනවා. ඒ ලියුම පදනම් කරගෙන සළුසල ආයතනයෙන් ඉස්කෝලවලට ලියුමක් ගහනවා. මේ ලියුම ගහනවා. දුෂ්කර, අතිදුෂ්කර, හුදකලා නොවෙයි. හැම පාසලකටම. බස්නාහිර පළාතේ නම් සියලුම පාසල්වලට ගහනවා, ගරු ඇමැතිතුමා. මා සතුව එම ලිපිය තිබෙනවා. මේ ලිපිය සළුසලෙන් ගහනවා. මේ ලිපියත් code කරලා තමයි මේ ලිපිය ගහන්නේ. මේ ලිපිය ගහලා ඉස්කෝලවලට යවනවා. මේක බස්නාහිරට විතරක් නොවෙයි. රට පුරාම සිද්ධ වුණු දෙයක්. මහනුවර ප්‍රදේශයේ විදුහල්පතිවරයෙකුගේ වැඩ තහනම් කරලා තිබෙනවා. මේ වන කොට කොළඹ විදුහල්පතිවරයෙක්ගේ වැඩ තහනම් කරලා තිබෙනවා. දැන් මේ ලිපියට අනුව ක්‍රියාත්මක වුණු විදුහල්පතිවරු දංගෙඩියට යවමින් තිබෙනවා. මේ ලිපිය ගහන්නේ කවුද? අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්. අකිල විරාජ් කාරියවසම් අධ්‍යාපන ඇමැතිතුමාගේ ලේකම්. ලේකම් ලියුම ගහන්නේ, කාගේ උවමනාවටද කියලා තව ටික දවසකින් රටට හෙළිදරව් වෙයි. තමන්ගේ යාළුවාට ඉස්කෝලවලට ගිහිල්ලා බිස්නස් එක කරන්න, මේ වවුචර් එක හඳුන්වලා දුන්නෙත් ඒකට තමයි. වවුචර් ගෙනාවේ දරුවන්ට ආදරේට නොවෙයි. වවුචර් එක ගෙනාවේ. අධිකරණයේ නඩුවක් තිබුණා. නඩුවෙන් තමන් පරදින බව දැන ගත්තා. ඒ නිසා තමයි

[ගරු මහින්ද ජයසිංහ]

වවුචර් එක ගෙනාවේ. වවුචර් එක ගෙනැල්ලා, වවුචර් එක දාලා අධිකරණයට කිව්වා,අපි නිල ඇඳුම් රෙදි බෙදන්නේ නැහැ. අපි මෙතැනින් එහාට වවුචර් එක බෙදනවා. එහෙම කියලා තමන්ගේ හිතවතාට ගෙනාපු රෙදි ටික බෙදලා දෙන්න ඕනෑ කරන පරිසරය තමයි මේ ලිපි දෙකෙන් හදලා තිබෙන්නේ, වෙන කිසිවක් නොවෙයි.

ඒ විතරක් නොවෙයි. ඔබතුමා කල්පනා කරලා බලන්න. මම ඊයේ මාධ්‍ය සාකච්ඡාවක් තියලා මේ කරුණ රටට හෙළිදරව් කළා. භූගෝලය පෙළ පොත මිලියන 22.6 කට මුද්‍රණය කරන්න, ටෙන්ඩර් එක ලබා දීලා තිබුණා. ඒ ටෙන්ඩර් එක අවලංගු කරලා මේ ආණ්ඩුව - මේකට වගකියන්න ඕනෑ, ජනාධිපතිවරයා, අගමැතිවරයා ප්‍රමුඛ සමස්ත ආණ්ඩුව. මේ ආණ්ඩුව අලුත් ටෙන්ඩර් එකක් දුන්නා. ලබන අවුරුද්දේ සිට සින්තටික් පේපර් එකේ භූගෝලය පෙළ පොත මුද්‍රණය කරන්න දුන්නා. සින්තටික් පේපර් එකේ. මම මේ වේලාවේදී අභියෝග කරනවා. මේ පළාත් සභාවේ ඇතුලේ ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නවා නේ? එක්කෙනෙක් නැඟිටලා පුළුවන් නම් මට ලෝකයේ එක රටක් කියන්න, සින්තටික් පේපර් එකේ පෙළ පොත් ගහන රටක්. ලෝකයේ කොහෙවත් නැහැ. සින්තටික් පේපර් එකේ පෙළ පොත් ගහන ලෝකයේ එක රටක්වත් නැහැ. ඇයි? රහස මොකක්ද? මම රහස කියන්නම්. Mr. Dirty බවට පත් වෙලා ඉන්න, Mr. Cleanගේ Brotherගේ Sonට ටෙන්ඩර් එක දෙන්න තමයි මේක කළේ. මිලියන 154.7 යි. මිලියන 22.6 යි ටෙන්ඩර් එක, දුන්නා මිලියන 154.7 කට. සින්තටික් පේපර් එක ආනයනය කරන්නේ කවුද? Mr. Dirtyගේ Younger brotherගේ Son.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තේරෙන්න කියන්න කෝ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තේරෙන්නේ නැත්නම් Mr. Dirty කියන කොට දන්නවා නේ? බැඳුම්කර වංචාවට සම්බන්ධ වුණු Mr. Dirty කවුද කියලා දන්නවා. එයාගේ බාල සහෝදරයාගේ පුතා. පුතා තමයි සින්තටික් පේපර් එක ගෙන්වන්නේ. එයාට දෙනවා, සින්තටික් පේපර් ගෙන්වන ටෙන්ඩර් එක. මේක මොන විද්‍යාවට ද අයිති. මම අක්ෂි වෛද්‍යවරුන්ට කථා කළා. අක්ෂි වෛද්‍යවරුනුත් මේක ප්‍රතික්ෂේප කරනවා. ඇයි? ගරු ඇමැතිතුමනි, මේක දරුවන්ගේ ඇස්වලට හොඳ නැහැ. ඔබතුමාටත් මේකේ ගොඩුරක් බවට ලබන අවුරුද්දේ පත් වෙන්න සිද්ධ වෙනවා. ලබන අවුරුද්දේ භූගෝලය. ඊට පස්සේ අනිකුත් විෂයයන්වලටත් මේක අයිති වෙනවා. ඒක තමයි රටේ අධ්‍යාපනයට සිදු වෙමින් තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. කල්පනා කරලා බලන්න. දැන් පසුගිය කාලයේ විදුහල්පති විභාගයක් තියලා විදුහල්පතිවරු 3958 ක් බඳවා ගත්තා. 4000 කට ආසන්න විදුහල්පතිවරු ප්‍රමාණයක් බඳවා ගත්තා. ඒකෙන් බස්නාහිර පළාතට විදුහල්පතිවරු 769 ක් වෙන් කළා. නමුත් අද සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? මේ බස්නාහිර පළාතේ විතරක් නොවෙයි. රටේම තිබෙන ප්‍රශ්නය. සාධාරණ ලෙස, විභාගයකට මුහුණ දීලා, විභාගයෙන් සමත් වෙලා, ඊට පස්සේ සති තුනක පුහුණුවක් තියලා, ඒ පුහුණුව නිම කරලා, ඒ පුහුණුවෙන් පස්සේ විභාගයකුත් තියලා ඒ විභාගයත් අවසන් වුණාට පස්සේ සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? දැන් මේ ශ්‍රේණිධාරී විදුහල්පතිවරු ඉස්කෝලවලට යවනවා. විභාග ෆේල් වුණු සමහර විදුහල්පතිවරු යටතේ නියෝජ්‍ය විදුහල්පතිවරු ලෙස. මේ විහිළුව මොකක්ද? අධ්‍යාපනය ගොඩනගන්නේ මෙහෙමද? බස්නාහිරත් මේක මේ විධියට සිදු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. රටේ විදුහල්පති ව්‍යවස්ථාවක් තිබෙනවා. 01/2016 චක්‍රලේඛයක් තිබෙනවා. ඒ චක්‍රලේඛය උල්ලංඝනය කරමින් තමයි විදුහල්පතිවරු පත් කරගෙන තිබෙන්නේ. සහකාර විදුහල්පතිවරු ලෙස යවනවා. දැන් උදාහරණයක් විධියට හෝමාගම මධ්‍ය මහ විද්‍යාලයට අලුත් විදුහල්පතිවරු තුන්දෙනෙක් යවනවා. සිද්ධ වෙන්නේ මොකක්ද? ඒ තුන් දෙනාට ඉඩ නැහැයි කියලා ආපසු හරවලා යවනවා. හැබැයි, ඉස්කෝලේ නියෝජ්‍ය විදුහල්පතිවරු හැටියට ඉන්නේ කවුද? සාමාන්‍ය ගුරුවරු. ඊට පස්සේ ඒ තුන්දෙනා යනවා, පුරප්පාඩු නැති කොට්ටාව ධර්මපාල විද්‍යාලයට. කොට්ටාව ධර්මපාලේ පුරප්පාඩු නැහැ. මේ විහිළුව මොකක්ද? උසස් විභාගයක් තියලා ඒකෙන් සමත් වුණු විදුහල්පතිවරු ටික එහේ මෙහේ හතර ගාතේ රස්තියාදු කරමින් තිබෙනවා. අධ්‍යාපනය හදන්නේ මෙහෙමද? ඒ විතරක් නොවෙයි. බස්නාහිර

පළාත ගත්තොත් එහෙම තවත් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය නම් හමාරයි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජාතික දේශපාලනය සහ පළාත් දේශපාලනය අපි දෙන්නා බෙදාගෙන කථා කරන්න හිටියේ. නමුත් එතුමාගේ කථාව මගේ කථාවට වඩා වැදගත් නිසා මගේ සම්පූර්ණ කාලය එතුමාට ලබා දෙන්න සූදානම්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාගේ සම්පූර්ණ කාලය ඔබතුමාට ලැබෙනවා. එතකොට තව විනාඩි 05 ක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තූතියි. ඒ කාලෙත් කන්න එපා. ඒ නිසා මේ විදුහල්පතිවරු පත් කිරීම බරපතළ ගැටලුවක් තිබෙනවා. ඒ නිසා මේ අයවැය විවාදයට එක් වෙමින් මම අවධාරණය කරනවා, කරුණාකරලා ලබන වසරේ සිටවත් මේ විදුහල්පතිවරු නිවැරදිව ස්ථානගත කරමින්, ඔවුන් පත් කිරීමේ පූර්වාදර්ශයක් දෙන්න. බස්නාහිර පළාත රටේ අනික් පළාත්වලට පූර්වාදර්ශයක් දෙන්න. ගරු ඇමැතිතුමා, අනික් පළාත්වලත් මේකම තමයි සිදු වෙමින් තිබෙන්නේ. තමන්ගේ හිතවතුන් ටික අයින් කරන්නේ නැතිව, ඒ තැන්වල තියාගෙන ඉන්නවා. ගුරු සංගමයක් ලෙස අපි වැඩබලන විදුහල්පතිවරු සම්බන්ධයෙන් වෙනම ස්ථාවරයක් අපට තිබෙනවා. අපි ඒ ස්ථාවරය අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ඔවුන් සම්බන්ධයෙන් කියලා තිබෙනවා, ඔවුන්ගේ වයස් සීමාව නොසලකා නැවත විදුහල්පති විභාගයක් තියන්න. වයස නොසළකා හරින්න. සමහරුන්ට වයස නිසා විදුහල්පති විභාගයට මුහුණ දෙන්න නොහැකි වෙලා තිබෙනවා. ඒ නිසා වයස නොසළකා හැර විභාගයක් තියන්න. ඒ විභාගයෙන් යම් ලකුණක් ගන්න කියන්න. ඊට පස්සේ වැඩ බලපු කාලයට ලකුණක් දෙන්න. මේක අපි යෝජනා කරලා තිබෙනවා. මීට කලින් 2009 දී විදුහල්පති විභාගය තියද්දී, අපි මේක මේ විධියටම යෝජනා කළා. ඒ වේලාවේදී අධ්‍යාපන අමාත්‍යාංශය ඒ යෝජනාව පිළිඅරගෙන ඒ විධියට කටයුතු කළා. දැනුත් අපි ඉල්ලනවා, ඒ විධියට කටයුතු කරන්න. එහෙම නැතිව වැඩ බලන විදුහල්පතිවරු හත් අට ගමනක් ෆේල් වෙලා, ඔවුන් පාසල්වල තියලා ඔවුන් යටතේ මේ ශ්‍රේණිධාරී විදුහල්පතිවරු තියන්න එපා. ඒක බරපතළ කාරණයක්. ඒ නිසා එහෙම කරන්නය එපාය කියලා අපි ඉල්ලනවා.

ඒ විතරක් නොවෙයි. දැන් පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේදී, මම දිගින් දිගටම මේ සභාවට යෝජනාවක් ඉදිරිපත් කරමින් මේ සභාවේ අවධානයට යොමු කළා. පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේ විධිමත් වැඩ පිළිවෙළක් නැහැ. මම ගිය වතාවේ ප්‍රශ්නයක් ඇහුවාට පස්සේ ගරු ඇමැතිතුමා අලුත් පන්ති ආරම්භ කරන පාසල්වල ලේඛනයක් ඉදිරිපත් කළා. පාසල් 26 ක ලේඛනයක් ඉදිරිපත් කළා. මට මේ පාසල් 26 ගැනම සොයා බලන්න කාලයක් තිබුණේ නැහැ. නමුත් මේ පාසල් කිහිපයක්ගැන සොයා බැලුවා. මම ගරු ඇමැතිතුමාගෙන් ඇහුවා, මේ පාසල් 26 ට ළමුන් ඇතුළත් කරන ක්‍රමවේදය පුළුවන් නම් ඉදිරිපත් කරන්න. නමුත් ක්‍රමවේදය ඉදිරිපත් කළේ නැහැ. ක්‍රමවේදයක් නැහැ. ක්‍රමවේදය මොකක්ද? මන්ත්‍රීවරුන්ගේ ලිපි. ඒක අසාධාරණයි. මන්ත්‍රීවරුන්ගේ ලිපිවලට යනවා නම් ඒක ආසධාරණයි. මොකද, මේ පාසල්වලට ළමුන් ඇතුළත් කරනවා නම්, පොරොත්තු ලේඛනයේ ඊළඟට ඉන්න ළමයින්ට අවස්ථාව දෙන්න ඕනෑ. අලුත් පන්ති හදනවා නම් පොරොත්තු ලේඛනයේ, ඊළඟට ඉන්න ළමයින්ට ඒ අවස්ථාව දෙන්න ඕනෑ. දැන් මේ පාසල් 26 පන්ති ගරු ඇමැතිතුමා ආරම්භ කරනවා. හැබැයි, මීගහතැන්න ප්‍රාථමිකයේ තිබුණු පන්ති හතර අඩු කරනවා. එතැන වෙනම අර්බුදයක් ඇති වෙනවා. එතකොට සමහර ඇමැතිවරු ගිහිල්ලා බෙල්ලේ වැළ දා ගන්නවා. ඒ පාසල්වලට ගිහිල්ලා බොරු රංගන කරනවා. තිබෙන පාසල්වල පන්ති වහලා තව පාසල්වල පන්ති අරිනවා. දේශපාලන උවමනාවක් ඇතිව තමයි මේ පන්ති අරිමින් තිබෙන්නේ කියන එක ඉතාම පැහැදිලියි. අප සතුව තොරතුරු තිබෙනවා. පිළියන්දල ශාන්ත ජෝෂප් බාලිකා විදුහලට ඒ ආකාරයට තමයි ළමුන් ඇතුළත් කළේ. ඒ වාගේම තව දුරටත් පිළියන්දල කලාපයේ පාසල් ගණනාවකට ඒ අකාරයට තමයි ළමුන් ඇතුළත් කර

[ගරු මහින්ද ජයසිංහ]

තිබෙන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් මේ සභාවේ දැඩි අවධානය යොමු කරනවා. කරුණාකරලා මේ පාසල් 26 ට ළමුන් ඇතුළත් කරන්න විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුයි.

ඒ විතරක් නොවෙයි. දැන් පාසලේ ගුරුවරු විදුහල්පතිවරු සංවර්ධනය කරන්න විවිධ සංවර්ධන වැඩ සටහන් දියත් කරමින් තිබෙනවා. පසුගිය දිනවල ඒ වාගේ සංවර්ධන වැඩ සටහන් ගණනාවක් දියත් කළා. විශේෂයෙන්ම පසුගිය දිනවල විදුහල්පති ධාරිතා සංවර්ධන ව්‍යාපෘතියකට කියලා විදුහල්පතිවරුන්ව බලන්ගොඩට අරගෙන ගියා. මම ගෙන ගිය විදුහල්පතිවරුන්ගෙන් ඇහුවා, මොකක්ද වුණු සංවර්ධනය කියලා. බඩ ටිකක් සංවර්ධනය වෙලා තිබෙනවා. ඒකත් හරියට වෙලා නැහැ. කෑම ටිකවත් හරියට ලැබිලා නැහැ. හැබැයි, අනික් පැත්තෙන් නම් සංවර්ධනය වෙලා තිබෙනවා කියලා තමයි අපට ආරංචි. ඒ නිසා මේක කිසිදු ඵලදායි නොමැති ධාරිතා සංවර්ධනයක් බවට පත් වෙලා තිබෙනවා. ඉතාම පැහැදිලිව රට පුරාම ගුරුවරු පුහුණු කිරීම කියලා ගුරු සේවා වැඩමුළු තියන්නේ, වර්ෂයේ අවසානයට. මට මතකයි. මම උදේ සිටිද්දී, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් කථා කළා. වර්ෂය අවසානයට ගුරු පුහුණු වැඩ සටහන් තියනවා. මේකේ අරමුණ මොකක්ද? පසුගිය දෙවැනිදා කැලණිය කලාපයේ ගුරු පුහුණු වැඩසටහනක් තිබුණා. එක පාසලකින් ගුරුවරුන් දෙදෙනා ගණනේ එවන්න කියලා කැලණිය කලාපයේ ගුරු පුහුණු වැඩ සටහනක් තිබුණා. හැබැයි පාසලකින් ගුරුවරු දෙදෙනා යවන්න බැරි වුණාට පස්සේ ගුරුවරු පහක් එවන්නය කියලා දැනුම් දීලා තිබුණා. පාසලේ අවසාන දවස. විශේෂයෙන්ම ඔබ කවුරුත් දන්නවා, තුන්වන වාරයේ පාසලේ අවසාන දවස කියලා කියන්නේ, ගුරුවරුන්ට අතිශය කාර්යබහුල දවසක්. එක පැත්තකින් දරුවන්ගේ වාර්තා දෙන එක. දරුවන්ගේ පෙළ පොත් දෙන එක. මේ ආදී විවිධ කරුණුවලින් ඔවුන්ට වැඩ අධික දවසක්. එවැනි දවසක සේවා සැසි තිබෙනවා නම්, ඒක තරම් අමනෝඥ වැඩක් තවත් නැහැ. ඒ නිසා රටේම සේවාස්ථ තිබෙන්නේ, අවුරුද්ද අන්තිමට මුදල් ටික වියදම් කරන්න මිසක්, වෙන මොකකටවත් නොවෙයි. ගරු ඇමැතිතුමා, බස්නාහිර පළාතෙත් මේ සේවාස්ථ පවත්වන එක හුදු මුදල් වියදම් කිරීමේ පරමාර්ථයෙන් කරනවා මිසක ගුරුවරු හෝ විදුහල්පතිවරු ගුණාත්මකව සංවර්ධනය කිරීමේ අරමුණකින් පවත්වන එකක් නොවෙයි කියලා තමයි අපට පෙනී යන්නේ. ඒ නිසා අපි මේ විවාදයට එක් වෙමින් අවධාරණය කරනවා. ලබන වසරේ සිටවත් විධිමත් වැඩ පිළිවෙළක් හදන්න. අවුරුද්දේ අන්තිම වනතුරු ඉන්නේ නැතිව, නොවැම්බර් දෙසැම්බර් මාස වනතුරු ඉන්නේ නැතිව ගුරුවරු පුහුණු කරන්න ඕනෑ වැඩ පිළිවෙළක් හදන්න. ඒ විතරක් නොවෙයි. තවදුරටත් බස්නාහිර පළාතේ පාසල්වල, මුළු රටේම වාගේම දරුවන්ගෙන් බරපතළ ලෙස මුදල් එකතු කරමින් තිබෙනවා. මුදල් ඇමැතිවරයාත්, අධ්‍යාපන ඇමැතිවරයාත්, මේ ආණ්ඩුවේ ලොක්කොත් අධ්‍යාපන ප්‍රතිපාදන කප්පාදු කරන කොට ඒකේ ප්‍රතිඵල අපටත් එනවා. ආන්න ඒකේ ප්‍රතිඵලයක් විධියට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය නිම වෙමින් පවතින්නේ. තව තත්ත්පර 30 ක් විතර තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විනාඩියක් දෙන්න. ඒ නිසා කරුණාකර පාසල්වල මුදල් එකතු කරන එක නතර කරන්න කටයුතු කරන්න. චක්‍රලේඛ ගැහුවාට වැඩක් නැහැ. චක්‍රලේඛ ගහලා අරහෙන් මුදල් ප්‍රතිපාදන කප්පාදු කරන කොට මෙහෙන් විදුහල්පතිවරයාට මුදල් එකතු කරන්න සිද්ධ වෙනවා. ඒක තමයි ඇත්ත යථාර්ථය. ඒ නිසා එය කරුණාකරලා නතර කරන්නය කියලා අපි ඉතාමත් ඕනෑකමින් යුතුව ඉල්ලනවා.

ඒ වාගේම බස්නාහිර පළාතේ කලාප අධ්‍යක්ෂවරුන්ගේ බරපතළ ගැටලු ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම දැන් මතුගම අධ්‍යක්ෂවරයෙක් නැහැ. අපි දන්නේ නැහැ, ඒ අධ්‍යක්ෂතුමිය මතුගම කලාපයෙන් ගියේ ඇයි කියලා. හේතුව මොකක්ද කියලා අපි දන්නේ නැහැ. නමුත් අද වන විට මතුගම වැඩ බලන්නේ කළුතර අධ්‍යක්ෂවරිය. ඒ නිසා ඒ වාගේ පළාත පුරාම විවිධගැටලු තිබෙනවා. ඒවා සම්බන්ධයෙනුත් අවධානය යොමු කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තව තත්ත්පර 30 ක් දෙන්න. මම ඉවර කරනවා. බස්නාහිර පළාතේ ගුරුවරුන්ගේ ආපදා ණය ලක්ෂ 2 ½ ට සීමා කරලා තිබෙනවා. ඒක බරපතළ ලෙස වැරැදියි. ස්ථාන මාරු වීම් සම්බන්ධයෙන් බරපතළ ගැටලු තිබෙනවා. දේශපාලන මැදිහත්වීම් හරහා තමයි ස්ථාන මාරු වීම් සිදු කරමින් තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. විශ්‍රාම වැටුප්, මෙවර පත්වීම් දීපු ගුරුවරුන්ගේ පත්වීම් ලිපියේ විශ්‍රාම වැටුප ගැන කිසිඳු සඳහනක් නැහැ. අපි දන්නවා, පරණ විශ්‍රාම වැටුප නැහැ. දැන් තිබෙන්නේ දායක විශ්‍රාම වැටපක්. නමුත් දායක විශ්‍රාම වැටුපක් දෙනවා කියලා සඳහන් කරලා නැහැ. මොකක්වත් සඳහන් කරලා නැහැ. ඒ වාගේ ගැටලු ගණනාවක් තිබෙනවා. ඒ නිසා මේ සියල්ල සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. ඒ වාගේම බස්නාහිර පළාතේ පාසල්වල ඉඩම් සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්නය කියලා ගරු ඇමැතිතුමාට මම කියනවා. සමහර ඉඩම් විවිධ අය පාවිච්චි කරමින් තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නය කියලා ඉල්ලීමක් කරමින්, ඒ වාගේම මම අර ප්‍රශ්නයක් අහමින් මේ පළාතේ ඉන්න දූෂිත නිලධාරීන් ගණනාවක් ගැන කරුණු මතු කළා. නමුත් මේ වනතුරු, මම මේ විවාදයට එක් වෙමින් අවධානයට යොමු කරනවා. ඒ නිලධාරීන් කිසිම කෙනෙක් ගැන කිසිඳු පියවරක් අරගෙන නැහැ. තවදුරටත් ඔවුන් සේවය කරමින් සිටින බව කියන කාරණයත් අවධාරණය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. මීළඟට ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [හෙක්ටර් බෙත්මගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Hector Bethmage M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා වෙලාවටම කථාව අවසන් කරන්න. දැන් ඔබතුමා කාලය ගන්නවා වැඩියි. ඒකයි.

[අ.භා. 12.36]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, මගේම ගම් ප්‍රදේශය නියෝජනය කරන රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමාගේ අධ්‍යාපන විෂයය සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම පිළිබඳවඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. අපි විශ්වාස කරනවා, අපේ පළාත් සභාව තුළ ඉතාම වැදගත්ම විෂයයහැටියට තමයි අපි අධ්‍යාපනය පිළිබඳ කාරණාව සලකන්නේ. ඒ වෙනුවෙන් ගරු ඇමැතිතුමා අත්දැකීම් තිබෙන ඇමැතිවරයෙක් හැටියට, විශේෂයෙන්ම පාසල් පිළිබඳව නිරන්තරයෙන් සොයා බලමින් කටයුතු කරපු ඇමැතිවරයෙක් හැටියට, පසුගිය කාලය තුළ අපි එතුමා එක්ක එකට වැඩ කරපු කෙනෙක් හැටියට ඉදිරි අවුරුද්ද තුළදී එතුමා අධ්‍යාපනය වඩාත් ගුණාත්මක තැනකට ගෙන එන්න කටයුතු කරයි කියලා අපේ විශ්වාසය වෙනවා.

අද අධ්‍යාපනය පිළිබඳව සාකච්ඡා කරන කොට විශේෂයෙන්ම විවේචනාත්මක අදහස් තමයි වැඩිපුර ඉදිරිපත් වුණේ. මම විශ්වාස කරනවා, ඒ විවචෙනයන් ඇමැතිතුමාගේ පෞද්ගලික හේතූන් හැටියට නොවෙයි. ඇමතිතුමාගෙන් අපි බලාපොරොත්තු වෙනවා. එතුමාගේ කටයුතු වඩාත් හොඳින් කළමනාකාරීත්වයක් කර ගත්තොත්, වෙලාව කළමනාකාරීත්වයක් කර ගත්තොත් මේ කටයුතු වඩාත් හොඳින් ඉෂ්ට කරන්න අවස්ථාව ලැබෙයි කියලා. ඒ වාගේම මේ පළාත් සභාව තුළ සිටින සියලුම මන්ත්‍රීවරුන් අධ්‍යාපන විෂයය පිළිබඳව විශාල උනන්දුවක් දක්වන නිසා, මේ අධ්‍යාපන වැඩ පිළිවෙළ පළාත තුළ ඉදිරියට ගෙනි යන්න සියලුදෙනාගේ දායකත්වය ලබා ගන්න වැඩ පිළිවෙළක් ඇති කරනවා නම්, ඒක වඩාත් ඵලදායි විධියට ඉදිරියට ගෙනි යන්න හේතු වේවි කියන එක අපි විශ්වාස කරනවා. මොකද, අපි අද ජීවත්වන අවස්ථාවේ ලෝකයේ ඇති වන වෙනස්කම් එක්ක තමයි අපි අධ්‍යාපනය දිහා බලන්න සිද්ධ වෙන්නේ. අපි කුඩා කාලයේ අධ්‍යාපනය ලබන කොට ටෙලිවිෂන් එකක්වත්, කොම්පියුටර් එකක්වත් අපි දැක්කේ නැහැ. අපට දකින්න ඉඩක් තිබුණේ නැහැ. නමුත් අද දරුවන් ඒ සියල්ල දකිමින් තමයි කටයුතු කරන්නේ. නමුත් අද පාසලට ඇතුළත් වන දරුවා වැඩ ලෝකයට ඇතුල් වන පුද්ගලයෙක් වෙන කොට, අවුරුදු 25 ක් විතර යන කොට,

[ගරු කීර්ති කාරියවසම්]

මේ ලෝකය කොපමණ ඉදිරියට යන ලෝකයක් වනවාද කියන එක කල්පනාවට ගනිමින් අධ්‍යාපන ප්‍රතිපත්තීන් සකස් වෙන්න ඕනෑය කියන එක තමයි අපි විශේෂයෙන් විශ්වාස කරන්නේ.

බස්නාහිර පළාත් සභාව හැටියට අපට පළාත් සභාවට අධ්‍යාපනය පිළිබඳව ප්‍රාදේශීය වශයෙන් තිබෙන වැදගත්කම තේරුම් අරගෙන, උවමනාවන් තේරුම් අරගෙන කටයුතු කරන්න අපට පුළුවන් වෙන්න ඕනෑය කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඒක නිසා සමගාමී විෂයයක් හැටියට අධ්‍යාපනය පැවතුණත්, මේ අධ්‍යාපනය ක්‍රියාවට නන්වන කොටස බවට අපි පළාත් සභාව පත් වෙලා තිබෙන නිසා පළාත් සභාවට අධ්‍යාපනය පිළිබඳව ක්‍රියා කරන්න තිබෙන වැඩි ඉඩකඩක් ව්‍යවස්ථාව තුළ සැකසෙමින් අධ්‍යාපනය ඉදිරියට යන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා. අද ලෝකයේ දියුණු වුණු රටවල් අධ්‍යාපනය පිළිබඳව අපි දකින කෝණයෙන් නොවෙයි දකින්නේ කියන එකයි අපි හිතන්නේ. මම දැක්කා. ලෝකයේ දියුණු අධ්‍යාපනයක් පවතින පින්ලන්තය වාගේ රටවල් ප්‍රකාශ කරලා තිබෙන්නේ, ඒ අය මූලික අධ්‍යාපනයේදී සියලු විෂයයන්වලට උගන්වන්න කටයුතු කරනවා වාගේම උසස් අධ්‍යාපනයට යන කොට ඒ දරුවන් එක විෂයයකට දෙකකට පමණක් සීමා කරලා ඒ අයගේ දක්ෂකම් තුළින් ඉදිරියට යන්න වෙන අලුත් අධ්‍යාපන ප්‍රතිපත්තීන් කරා ලෝකය ගමන් කරමින් ඉන්නවා. එවැනි අත්දැකීම් අරගෙන එවැනි දේ තේරුම් අරගෙන අපේ අධ්‍යාපන ක්‍රමයත් සකස් කරන්න, අපේ ගරු ඇමැතිතුමා මේ පළාත් සභාව තුළ කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා.

විශේෂයෙන්ම අද විශ්ව විද්‍යාල අධ්‍යාපනයට තිබෙන ඉඩකඩ වඩාත් පුළුල් වෙලා තිබෙනවා. පසුගිය අවුරුද්දට වැඩිය සාපේක්ෂව ගත්තාම මුදල් කැපුවයි කිව්වත්, මොන දේ හේතු වුණත් 2015 ට වැඩිය 2016 5000 කට කිට්ටු ප්‍රමාණයකට විශ්ව විද්‍යාලයට යන්න ඉඩකඩ ලැබිලා තිබෙනවා. 2020 වන කොට මෙය 50,000 දක්වා වැඩි කරන්න පුළුවන් වෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සංඛ්‍යා ලේඛන පෙන්වන්න පුළුවන්ද?

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පෙන්වනවාද?

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

දැන් මම ගෙනැල්ලා නැහැ. නමුත් මට ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන ප්‍රමාණය පැහැදිලිවම වැඩි වෙලා තිබෙනවා. මේක ඉලක්කගත කරලා තිබෙනවා, 2020 වන කොට අපේ විශ්ව විද්‍යාලවල තිබෙන ඉඩකඩ වඩාත් පුළුල් කරන්න ඕනෑය කියලා. ඒ විතරක් නොවෙයි. අද මධ්‍යම ආණ්ඩුවේ අයවැය ලේඛනය තුළ ඉඩකඩක් ඇති කරලා තිබෙනවා. විශ්ව විද්‍යාල අධ්‍යාපනයට සුදුසුකම් ලබන, එහෙත් විශ්ව විද්‍යාලයට ඇතුළත් වෙන්න බැරි වන දරුවන්ට රුපියල් අට ලක්ෂයක් දක්වා ණය මුදලක් ලබා දීලා වෙනත් ආකාරයකින් උසස් අධ්‍යාපනයක් ලබන්න පුළුවන් - විශ්ව විද්‍යාලවල ඉඩකඩ නැති නිසා ඒකට එවැනි පහසුකමක් සලසන්න පවා කටයුතු කරන්න සූදානමක් තිබෙනවා කියන එක පවසනවා. මොකද, ළමයින්ට ඉගෙනගැනීමට තිබෙන ඉඩකඩට කාටවත් බාධා කරන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒක සල්ලි තිබෙනවාද? සල්ලි නැද්ද කියන එක වෙන කාරණාවක් වෙනවා. නමුත් ඉගෙන ගැනීමේ තිබෙන අයිතිය මූලික අයිතියක් වෙනවා. මූලික අයිතිය ඒ අයට පාවිච්චි කරන්න රජයට ඒ ඉඩකඩ දෙන්න බැරි නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවන්න කාලය අවසන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විකුණනවා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

නැහැ, විකිණීමක් නොවෙයි. අධ්‍යාපනයට තිබෙන ඉඩකඩ පළල් වීමක්. ඒකට ඉඩකඩ තිබෙන්න ඕනෑය කියන තැන අපි ඉන්නවා. එහෙම හිටියේ නැත්නම් රටක් හැටියට ඉදිරියට යන්න පුළුවන්කමක් අපට නැහැයි කියන එක විශේෂයෙන් සඳහන් කරනවා.

[අ.භා. 12.44]

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි. මම දකින විධියට නම් පළාත් සභාවේ විතරක් නොවෙයි, මුළු රටේම වැදගත් ආයතනය වන්නේ, විශේෂයෙන්ම තුන් වැනි ලෝකයේ රටක් වන ස්වභාවික සම්පත අඩු, එහෙම නැත්නම් නැත්තටම නැහැයි කියන්න පුළුවන් රටක් වන අපේ රටේ වටිනාම අයවැය හැටියට අපට ගන්න පුළුවන් වන්නේ අධ්‍යාපනයේ අයවැයි. ගරුසභාපතිතුමනි, රටක් හැටියට බස්නාහිර පළාත විතරක් නොවෙයි. මම විශ්වාස කරනවා, මුළු ලංකාවම මේ අධ්‍යාපනය කියන එක හරියට තේරුම් අරගෙන නැහැයි කියලා. මොකද, මේ පොත පතේ අපි කරන අධ්‍යාපනය පිළිබඳව අපි විශේෂ බරක් දානවා. අපි දැක්කා, පසුගිය වකවානුවල සාමාන්‍ය පෙළ විභාගය කරපු ළමයින්ටත් එතැනින් එහාට උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා දීමේ වැඩ පිළිවෙළක් පටන් අරගෙන තිබෙනවා කියලා. නමුත් ගරු සභාපතිතුමනි, මේක මම අපේ ගරු අධ්‍යාපන ඇමැතිතුමාගේ දැන ගැනීම පිණිස කියන්නේ. අපි අධ්‍යාපනය ගැන මීට වැඩිය වෙනස් විධියකට දකින්න පටන් ගන්න ඕනෑ. මොකද අද ලෝකයේ දියුණු රටවල් අධ්‍යාපනය ගැන දකින්නේ මේ අද අපි දකින විධියට නොවෙයි. අද අපි තවම සුද්දාගේ ඒ ක්‍රමය බදාගෙන යනවා මිසක්, අද ලෝකයකට හරියන අධ්‍යාපන ක්‍රමයකට අපි ඇවිල්ලා නැහැ, ගරු සභාපතිතුමනි. මොකද මම විශ්වාස කරනවා, ඔව්. සාමාන්‍ය පෙළ දක්වා දරුවන් අධ්‍යාපනය ලැබිය යුතුයි. නමුත් සාමාන්‍ය පෙළින් පස්සේ දරුවන් යන්නේ කොහේද? මේ රටේ ශ්‍රම බලකාය අපි ගෙනි යන්නේ කොහාටද කියන එක ගැන අපි අධ්‍යාපනය හරහා මීට වැඩිය උනන්දුවක් දක්වන්න ඕනෑය කියන එක මම විශ්වාස කරනවා. මොකද ගරු සභාපතිතුමනි, අපි සමහර වෙලාවට පන්තිවලදී ඉගෙන ගන්න ඒවා අපට වැඩිහිටියන් වුණාම අවශ්‍ය වන්නේ නැහැ. මොකද මම දන්නවා. මෙතැන මන්ත්‍රීවරු ඉන්නවා ඉංජිනේරුවන් නොවුණු කට්ටිය අද කෝණයක් පාවිච්චි කරන එක, එහෙම නැත්නම් විශ්කම්භය හොයන එක අපට කවදාවක්වත් ඕනෑ වෙලා නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, අද අපේ රට දිහා බලන්න. උගතුන් ඉන්නවා. ඒක මම පිළිගන්නවා. නමුත් පාරකට බැහැලා හරි අපේ ඔය උගතුන් කියන පුද්ගලයන්ගේ හැසිරීම හරි, ඒ අයගේ ආකල්ප බලන කොට හරි අපට අද තේරෙනවා, මේ රටේ උගතුන් පිරිලා හිටියත් බුද්ධිමතුන් නැහැයි කියන එක. There is a huge deference between education and Intelligent. ඒක අපි තේරුම් ගන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. උගතුන් හිටියාට, උපාධිධාරීන් හිටියාට අද රැකියාවල් නැහැ. එතැන මොකක්ද වෙලා තිබෙන්නේ? අපි අධ්‍යාපනය හරියට කළමනාකරණය කරගෙන නැහැ. අපි ජනතාව හරියට දැනුවත් කරලා නැහැ. මොකද, අද රැකියාවල්වලට අවශ්‍ය කරන පුහුණුව අපේ ජනතාව අතර නැහැ. උපාධි තිබෙනවා. නමුත් අවශ්‍ය කරන වැඩ කටයුතු ටික කරගන්න, ඉස්පිරිතාලෙකට ගියොත් නර්ස්ලාගේ හිඟයක් තිබෙනවා. ඔබතුමන්ලා අද බලන්න. අද ලෝකයේ වැඩිම පිළිගැනීමක් තිබෙන්නේ දොස්තරවරුන්ට, ඉංජිනේරුවන්ට, නීතිඥ මහත්වරුන්ට නොවෙයි. අද අවශ්‍යතාවය තිබෙන්නේ රැකියාවල්වල පුහුණු ශ්‍රමිකයන්ට. ඒ කියන්නේ, ලෝකයේ ඕනෑම රටකට යන්න වුණත් - අද ඕස්ට්‍රේලියාව වාගේ රටකට වීසා ලබා දෙන්න, Permanent residencies ලබා දෙන්න ඉස්සෙල්ලාම බලන්නේ, මේ පුද්ගලයාට අතේ පයේ වැඩක් පුළුවන්ද කියලා. ලකුණු මට්ටම වැඩියෙන්ම ලබා දෙන්නේ මොනවාටද? ඒසි සවි කරන්න පුළුවන් පුද්ගලයාට. නිරූපණ ශිල්පියන්ට. හෙදියන්ට. වෘත්තීමය පුහුණුවක් අපේ අධ්‍යාපනය හරහා කරලා නැහැ.

ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. අද රටේ පුහුණු ශ්‍රමිකයන්ගේ විශාල අඩුවක් තිබෙනවා. ඔබතුමා පොඩ්ඩක් හිතලා බලන්න. අද අපේ රටේ කොම්පැණි වැසීගෙන යන තත්ත්වයක් තිබෙනවා. මොකද, ඒවාට හරියන ශ්‍රමියක් නැතිකම අපේ රටේ විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. පඩිවල අඩුවක් නැහැ. රස්සාවල්වල අඩුවක්

[ගරු අනුරාධ විමලරත්න]

නැහැ. නමුත් අපේ තිබෙන ශ්‍රම බලකායේ විශාල දුර්වලතාවයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපි සිංහලකම ගැන, සිංහ ලේ ගැන, බෞද්ධකම ගැන ලොකුවට කථා කරනවා. අපේ රටේ තිබෙන සුන්දරත්වය ගැන ලොකුවට කථා කරනවා. නමුත් කියන්න ලැජ්ජයි ගරු සභාපතිතුමනි. අපේ රටේ විශාලම අපනයනය වන්නේ, අරාබිකරයට අම්මලා, අක්කලා, නංගිලා යවන එක තමයි අපේ විශාලම අපනයනය වෙලා තිබෙන්නේ. ඇත්තටම ලැජ්ජයි ගරු සභාපතිතුමනි. පිටරටට ශ්‍රමිකයන් අපි යවන්න ඕනෑ. නමුත් ඒ ශ්‍රමිකයන්ව යවන්න ඕනෑ පාරවල් සුද්ධ කරන්නවත්, එහෙම නැත්නම් සුද්දන්ගේ කක්කුස්සි සුද්ධ කරන්නවත් නොවෙයි. අපි යවන්න ඕනෑ, රැකියාවන්වලට සුද්දන්ව පාලනය කරන, සුද්දොත් ඒ පුද්ගලයන්ගේ වැසිකිළි සුද්ධ කරන ඒ job වලට අපට යවන්න පුළුවන් වන්න ඕනෑ. නමුත් අපට ඒක කරගන්න බැරි වෙලා තිබෙනවා. මේක පුංචි රටක් කියලා හිතන්න එපා. අපට ආදායම නැතිවා නොවෙයි.

ගරු සභාපතිතුමනි, අපේ කළමනාකරණයේ විශාල දුර්වලතාවයක් තිබෙනවා. මොකද, ඊශ්‍රාලය ගන්න. භූමි ප්‍රමාණය ගත්තොත් අපේ රටෙන් 1/3 යි. ජනගහනය ගත්තොත් අපේ රටෙන් භාගෙකට වැඩිය අඩුයි. නමුත් ඒ අයගේ දැනුම අධ්‍යාපනය කළමනාකරණය කිරීම හරහා උගතුන් විතරක් නොවෙයි, හැම ක්ෂේත්‍රයකම දක්ෂයන් ඒ අයගේ ඉන්නවා. ලෝකයේ තුන්වැනියාට වැඩිම ආදායමක් ලබන රට, ඒක පුද්ගල ආදායම වැඩියෙන්ම ලබන රට ඊශ්‍රාලය. ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. පොඩ්ඩක් හිතලා බලන්න. මේ ලෝකයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක විතර කාලයක් තිබෙන්නේ.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ගරු සභාපතිතුමනි, විනාඩි දෙකක් දෙන්න. මට ඉවර කරන්න. නමුත් වැඩිම පේටන්ට්බලපත්‍ර ප්‍රමාණයක් අද තිබෙන්නේ ඊශ්‍රාලයට. ඒ විතරක් නොවෙයි. නොබෙල් ත්‍යාග වැඩිම ප්‍රමාණයක් ලබා ගන්නේ ඊශ්‍රාලය. ඇයි එහෙම වෙලා තිබෙන්නේ. අධ්‍යාපනය හරියට කළමනාකරණය කරලා තිබෙනවා. ඒ අර Research facilities අවශ්‍ය කරන ඒ දේවල් අධ්‍යාපනය හරහා ලබා දීලා තිබෙනවා.

ඉතින් ගරු සභාපතිතුමනි, මම ඔබතුමා හරහා ගරු අධ්‍යාපන ඇමැතිතුමාට කියනවා. අපි අඩුම ගණනේ බස්නාහිර පළාතෙවත් අපේ අධ්‍යාපනය අපි හරියට කළමනාකරණය කර ගනිමු. අපේ පළාත් පාසල්වලට ඔන්න ඔය ක්‍රමය අපි ගේමු. සාමාන්‍ය පෙළින් පස්සේ දරුවන් වැඩිපුර වෘත්තිය පුහුණු වැඩ සටහන්වලට යොමු කරන ක්‍රමයකට අපි යමු. ඒ විතරක් නොවයි, ගරු අධ්‍යාපන ඇමැතිතුමනි. අපි ඉංග්‍රීසි සිලබස් එක අපේ පළාත් පාසල්වල අපි වැඩි කරමු. මොකද, අපි හොඳටම දන්නවා. උපාධියක් තිබෙන පුද්ගලයෙකුට වැඩිය අද ලෙහෙසියි සාමාන්‍ය පෙළ, උසස් පෙළ පාස් නැති වුණත්, රුපියල් හැට හැත්තෑ දහසක, ලක්ෂයක ජොබ් එකක්, ඉංග්‍රීසි පොඩ්ඩක් කථා කරන්න පුළුවන් නම් ලැබෙනවා. ඉතින් අපි මෙන්න මේවා දියුණු කරමු. ගරු අධ්‍යාපන ඇමැතිතුමනි, අපි ඔන්න ඔය ටික කරමු. ඒකයි මම කියන්නේ.

ගරු අධ්‍යාපන ඇමැතිතුමනි, මම කථාව අවසන් කරන්න ඉස්සෙල්ලා මෙන්න මේ ටික ඔබතුමාට කියන්න ඕනෑ. ඔබතුමා ඉතාම නිහතමානියි. ඔබතුමා උගත්, බුද්ධිමත් නිවුණු පුද්ගලයෙක්. නමුත් ගරු අධ්‍යාපන ඇමැතිතුමනි, මට හිතනවා ඔබතුමාගේ නිවුණු ගතිය පොඩ්ඩක් වැඩියි කියලා. මට ඒක හිතෙනවා. මොකද, මේ අධ්‍යාපන අමාත්‍යාංශය හැම තිස්සේම මහ ඇමැතිතුමා යටතේ තිබුණු එකක් හින්දදෝ මට තේරෙන්නේ නැහැ. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ කටයුතු කරනවා අද දුර්වලයි කියන එක මට කියන්න වෙනවා. ඔබතුමාට ආදරෙයි. පෞද්ගලික තරහක් නැහැ, ගරු ඇමැතිතුමනි. නමුත් මීට වැඩිය අධ්‍යාපන අමාත්‍යාංශය කාර්යක්ෂම වෙන්න ඕනෑ. මොකද, මේ බස්නාහිර පළාතේ අපේ ශක්තිය, අපේ අනාගතයට පවතින වෙනසක් කරන්න පුළුවන් වැදගත්ම අමාත්‍යාංශය ඕක. පාරවල් හැදුවාට වැඩක් නැහැ. ඒ සංවර්ධනයෙන් වැඩක් නැහැ. අපි ජනතාව දැනුවත් කරන්න ඕනෑ. ජනතාවගේ බුද්ධිය අපි ශක්තිමත් කරන්න ඕනෑ. ඔයිට වැඩිය අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාකාරී වෙන්න ඕනෑ. මොකද ඔබතුමා දන්නවා, මම ඔබතුමාට අප්‍රේල් මාසයේ දීපු ලියුම ඒ ගැන තීරණයක් ගන්න අගෝස්තු වුණා. ඔබතුමා කැඳවලා, ඒ කරපු රැස්වීමේ ලියුම අද වනතුරු ඇවිල්ලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මෙහෙම මම කිව්වාට සමාවෙන්න. කාලය ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

හරි. මම නවත්වනවා. ඉතින් ගරු අධ්‍යාපන ඇමැතිතුමනි මේවා ගැන ඔබතුමා ශක්තිමත් වෙන්නඕනෑ. ඔබතුමාගේ අයවැයට අපි ඡන්දය දෙනවා. නමුත් ඡන්දය දෙන්නේ ඔබතුමා මතක තියා ගන්න පක්ෂයේ තීරණයක් නිසාවත් රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ තීරණයක් හින්දාවත් නොවෙයි. මම කවදාවක්වත් එහෙම හිටියේ නැහැ. මම හැමදාම හෘද සාක්ෂියට එකඟව ඡන්දය ප්‍රකාශ කළා. මම කථා කළා. ගරු අධ්‍යාපන ඇමැතිතුමනි, ඔබතුමාට මේ සැරේ සහයෝගය දක්වන්නේ ඔබතුමා ගැන විශාල බලාපොරොත්තුවක් තියාගෙන. ඒ විතරක් නොවෙයි. මෙතැන අපේ ගරු මහ ඇමැතිතුමාත් සිටියා නම් හොඳයි කියලා මට හිතෙනවා. එතුමාත් මීට වැඩිය අධ්‍යාපනය ගැන උනන්දුවක් අරගෙන ඔබතුමාට මීටත් වැඩිය ශක්තියක් දීලා, අධීක්ෂණයක් කරලා එතුමාත් මේ වගකීම භාර අරගෙන ඉදිරි අවුරුද්දේ මීට වැඩිය විශාල වෙනසක් අපට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කරන්න ලැබෙයි කියන බලාපොරොත්තුව උඩ මම ඔබතුමාට සහාය දක්වනවා. ඔබතුමා මෙච්චර ඉවසීමෙන් අහගෙන සිටියාට බොහොම ස්තුතියි. මාගේ ආදරණීය මන්ත්‍රීවරුනි, බොහොම ස්තුතියි.

[අ.භා. 12.52]

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

ගරු සභාපතිතුමනි, මේ කථික තරගයේ තත්පරයත් වටින නිසා වැඩි විස්තර කථා කරන්න වෙන්නේ නැහැ. මම හිතන්නේ මෑත කාලයේ වැඩිම විවේචනයට ලක් වුණු ඇමැතිවරයා තමයි අධ්‍යාපන ඇමැතිවරයා. ඒක සභාව තුළත්, මහජනතාව තුළත් ඒ ආකාරයෙන්ම තිබුණා. අධ්‍යාපන ඇමැතිතුමා පිළිබඳව මම දන්න තරමට අද දවසේ හොඳම ප්‍රකාශය කළේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා. එතුමා කිව්වා, ඔබතුමා වැඩ කරනවා. නමුත් ඒ වැඩ හරියට එළියට පෙනෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත. මම හිතන්නේ නිලධාරී මණ්ඩලයට ඒ පිළිබඳව වගකීමක් ගන්න වෙයි. ඒ නිසා 2017 වර්ෂය ඔබතුමාට මේ සියලු දොස් දුරුවෙලා ඉතාමත්ම ආකර්ෂණීය අමාත්‍යාංශය බවට, හැම දෙනාගේම ප්‍රසාදයට පත් වුණු අමාත්‍යාංශය බවට අධ්‍යාපන අමාත්‍යාංශය පත් කරගන්න ශක්තිය ලැබෙන්නය කියලා පළමු කොටම ප්‍රාර්ථනා කරනවා.

ඉතින් ඊළඟට කවුරුවත් කථා නොකරපු, මට අදාළ විෂයය පිළිබඳව කථා කරන්න ඕනෑ. මේ ප්‍රකාශන පත්‍රයේ අපේ ගරු ඇමැතිතුමා පිරිවෙන් අධ්‍යාපනය ගැන සඳහන් කරලා තිබෙන නිසා. පිරිවෙන් අධ්‍යාපනය 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව මධ්‍යම රජයට අයිති විෂයයක්. නමුත් පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයට යම් දෙයක් කරන්න පුළුවන්කම තිබෙනවා. මේ වතාවේ මේ ප්‍රකාශනයේ අපේ ගරු අධ්‍යාපන ඇමැතිතුමා මේ පිළිබඳව 2017 දැක්මට ඇතුළත් කර තිබීම පිළිබඳව මම සන්තෝෂයට පත් වෙනවා. ගරු සභාපතිතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ පිරිවෙන් 44 ක්, ගම්පහ 59 ක්, කළුතර 46 ක් වශයෙන් පිරිවෙන් 149 ක් අපේ බස්නාහිර පළාත තුළ තිබෙනවා. ඒ නිසා ඍජු ලෙසම මැදිහත් වෙන්න පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට බැරි වුණත් මම හිතන්නේ, මෙතුමා ඇතුළත් කරලා තිබෙනවා, පරිවේනාධිපතිවරු, නියෝජ්‍ය පරිවේනාධිපතිවරු, පරිවේනාචාර්යවරු පුහුණු කිරීම සඳහා, විශේෂයෙන්ම කළමනාකරණය පිළිබඳව පුහුණුව ලබා දීම සඳහා අවශ්‍ය කරන වැඩ සටහන් 2017 වර්ෂයේදී කරන්න බලාපොරොත්තු වන බව සඳහන් කරලා තිබෙනවා. ඒ ගැන අතිශයින් සන්තෝෂයට පත් වෙනවා. ඒක ඒ ආකාරයෙන්ම ක්‍රියාවට නඟන්න කියන එක මතක් කරනවා.

තවත් විශේෂ කාරණා දෙකක් මතක් කරන්නට ඕනෑ. ගරු මන්ත්‍රීවරු දෙදෙනෙක් ඒ පිළිබඳව සඳහන් කරපු නිසා මට පහසුවක්. අපේ ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සඳහන් කළා, පාසල්වල උගන්වන අපේ හාමුදුරුවන් වහන්සේලාට මාරුවීම් ලබා දීමේදී මේ වසර 10 කියන කාරණයම සලකන්නේ නැතිව, විශේෂයෙන්ම උන් වහන්සේලාගේ අවශ්‍යතා, පන්සලක අධිපති හාමුදුරුනමක් නම් උන්වහන්සේගේ ඒ අවශ්‍යතාවය සැලකිල්ලට අරගෙන ඒ මාරු වීම් කිරීමට සැලකිලිමත් වෙන්නය කියන කාරණය මමත් ඉස්මතු කරනවා.

ඒවාගේම අපේ ද්‍රවිඩ ජාතික ගරු මන්ත්‍රීතුමා මතක් කළා. මගේ කොට්ඨාශය දොඩම්ගොඩ. වතු පාසල් හයක්

[ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි]

තිබෙනවා. මම මේ පාසල්වලට නිරන්තරයෙන් යනවා. ඒ පාසල්වලට ගියාම විදුහල්පතිවරු මට කියපු කාරණයක් තමයි, පළාත් සභාවෙන් චක්‍රලේඛ එනවා. විවිධ ප්‍රකාශන එනවා. ඒ එන්නේ සිංහල භාෂාවෙන්. ඒ අයට කටයුතු කරන්න ගියාම විශාල අපහසුවක් තිබෙනවා කියන එක. ඒක අපේ ගරු මන්ත්‍රීතුමා මතු කළා. මමත් ඒ කාරණය මතු කරනවා. දෙමළ සහ සිංහල භාෂා දෙකෙන්ම ඒ ප්‍රකාශන ඒ ස්ථානවලට යවන්න කටයුතු කරන්නය කියන කාරණය මතක් කරනවා.

සංස්කෘතික අමාත්‍යාංශය යටතේ වචනයක් සිහිපත් කරන්නට ඕනෑ. මම දන්න තරමට අපේ රටේ ජාතික වීර දිනයක් නැහැ. ඉස්සර ජනවාරි 01 වැනිදා ජාතික වීර දිනය තිබුණා. ඊට පස්සේ බණ්ඩාරනායක මැතිනියගේ 1972 ව්‍යවස්ථාවත් එක්ක ඇති වුණු තත්ත්වය තුළ මැයි 22 - 1978 ව්‍යවස්ථාවට ආවාට පස්සේ මැයි 22 නැවැත ජාතික වීර දිනය බවට පත් වුණා. අද අපේ දින දර්ශනයේ ජාතික වීර දිනයක් නැහැ. ලෝකයේ බොහෝ රටවල්වල එහෙම තිබෙනවා කියලා අපි දන්නවා. National Hero Day එකක් තිබෙනවා. මම දන්න තරමට අපේ රටේ එහෙම එකක් නැහැ. ඒ නිසා ඉදිරි වර්ෂයේ පළාත් සභාවේදී පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනාවක් හැටියට මම ඉදිරිපත් කරන්නබලාපොරොත්තු වෙනවා. ජාතික වීර දිනයක් හැටියට විශේෂයෙන්ම සැප්තැම්බර් 17 වැනිදා මෑත යුගයේ සැබෑම ජාතික වීරවරයා වන ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ අනුස්මරණ දිනය මේ රටේ ජාතික වීර දිනයක් බවට පත් කරන්න. ඒක නිවාඩු දිනයක් වීම නොවෙයි අපේ බලාපොරොත්තු වන්නේ. ජාතික වීර දිනය හැටියට ප්‍රකාශයට පත් කරන්න බස්නාහිර පළාත් සභාව හරහා මධ්‍යම රජයට කරුණු ඉදිරිපත් කරලා ඒ කටයුතු ඉෂ්ට කරගන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම දහම් පාසල් ගුරුවරුන් පිළිබඳව සිහිපත් කරන්න ඕනෑ. මේ කාරණය සඳහන් කරලා තිබෙනවා. දහම් පාසල් ගුරුවරයා නිරන්තරයෙන් පුහුණුවට ලක් විය යුතු කෙනෙක්. වැටුපක් ලබන කෙනෙක් නොවෙයි. රැකියාවක් ලැබුණාම එයා දහම් පාසල් ගුරු සේවයෙන් ඉවත් වෙනවා. සමහරවිට විවාහ ජීවිතයට පත් වුණාම දහම් පාසල් ගුරු සේවයෙන් ඉවත් වෙනවා. අලුත් ගුරුවරු තමයි නිතරම ගන්නේ. ඒ නිසා නිරන්තරයෙන් දහම් පාසල් ගුරු සේවයට පුහුණුව අත්‍යවශ්‍යමයි. ඉතින් ඒ නිසා දහම් පාසල් ගුරු පුහුණුව ලබා දීම කියන කාරණය කෙරෙහි විශේෂ අවධානයක් මේ ප්‍රකාශනයේ යොමු කරලා තිබෙනවා. ඒක වඩාත් හොඳින් ව්‍යාප්තව ලබන වර්ෂයේදී කරන්න අපේ ගරු ඇමැතිතුමා මැදිහත් වෙයි කියන කාරණය අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම විශේෂයෙන් ක්‍රීඩාව පිළිබඳව සඳහන් කරන්න ඕනෑ. ක්‍රීඩාව අපේ ජාතිය සකස් කරන්නේ විනය හදන්න. ශක්තිමත් සෞඛ්‍ය සම්පන්න නිරෝගී පරපුරක් බිහි කරන්න අවශ්‍ය කරන ප්‍රධානම කාරණය. නමුත් ඇත්ත වශයෙන්ම ක්‍රීඩාව පිළිබඳව ඉතාම දුර්වල පැති තිබෙනවා. ඒ නිසා පළාත් මට්ටමින් පාසල් ක්‍රීඩාව, ඒ වාගේම ක්‍රීඩා සමාජ මීට වඩා සවිබල ගන්වලා ක්‍රීඩාව අනාගතයේ සවිමත් ජාතියක්, නිරෝගිමත් ජාතියක් බිහි කරන්න අවශ්‍ය කරන ප්‍රධානම ක්ෂේත්‍රයක් හැටියට කල්පනා කරලා, ඒ කෙරෙහිත් විශේෂ අවධානය යොමු කරලා ගම්බද ක්‍රීඩාව දියුණු කිරීම සඳහා විශේෂ අවධානය යොමු කරන්නය කියන කාරණය කෙරෙහිත් අපේ ගරු ඇමැතිතුමාගේ විශේෂ අවධානය අපි යොමු කරනවා. මීට වැඩිය මම කාලය ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. හැම දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 12.58]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, කාලය ලබා දීම ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම අපේ ගරු රංජිත් සෝමවංශ ඇමැතිතුමාගේ අමාත්‍යාංශය ගැන කථා කරන කොට අපට අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය ගැන කථා කරනවාට වඩා මම හිතනවා ගරු ඇමැතිතුමනි, මේ අධ්‍යාපනය දේශපාලනීකරණය වීම ගැන කථා කරන්න බලාපොරොත්තු වෙනවා. පළාත් සභාවේ අධ්‍යාපන විෂයය සම්බන්ධයෙන් කථා කරන කොට අවාසනාවන්ත තත්ත්වයන් කිහිපයක් පසුගිය කාලයේ අපට දකින්න සිද්ධ වෙනවා. විශේෂයෙන් රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමාට විරුද්ධව විශාල විරෝධතා තිබුණා. මේ අයවැයේදී අදාළ වැය ශීර්ෂ පරාජය කරනවා කිව්වා. ඒවා මාධ්‍ය හරහා කිව්වා. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මැතිතුමාට වුණු දේ වෙයි කියලා කිව්වා. ඉතින් ඒ නිසා

ඒ සියලු තත්ත්වයන් එක්ක මම විශ්වාස කරනවා, ඔබතුමා හොඳ තැනකට ඇවිල්ලා තිබෙනවා කියලා. මම කැමැතියි, ඔබතුමාට පුංචි දෙයක් මතක් කරන්න. මේ හැමදෙනාටම පාඩමක් වෙයි. අර අප්‍රිකානු මාසායිමාරා ගෝත්‍රිකයින් අතර යම් කියමනක් තිබෙනවා. ඒ කියමන තමයි, ඔබ වසරකට සැලසුම් කරනවා නම්, ධාන්‍ය වපුරන්න. ඔබ දස වසරකට සැලසුම් කරනවා නම්, ගස් සිටුවන්න. ඔබ ජීවිත කාලයටම සැලසුම් කරනවා නම්, ජනතාවට අධ්‍යාපනය දෙන්නය කියලා. ගරු ඇමැතිතුමනි, එක එක්කෙනා එක එක දේවල් කියන්න පුළුවන්. ඔබතුමා උගත් ඇමැතිවරයෙක් විධියට කවර බාධා ආවත් ඔබතුමා සැලසුම් කරන්න ජීවිත කාලයටම. ඔබතුමා ගැන හැමෝම, හැමදාම කථා කරයි. දැනුම ආකල්ප හා කුසලතාවන්ගෙන් සමස්ත එකතුවකුයි අධ්‍යාපනය කියන්නේ. ඔබතුමා ඒ සියල්ල හොඳින් හඳුනන කෙනෙක්. ඔබතුමා ගුරු වෘත්තිය හා සම්බන්ධ කෙනෙක්. ඒ නිසා දේශපාලන නියෝජිතයින්, බලධාරීන්, නිලධාරීන් බුරුතු පිටින් හිටියත් ගරු ඇමැතිතුමනි, ඇත්ත දේ කියන්න ඕනෑ. බස්නාහිර පළාතේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරන කොට ගුණාත්මක සංවර්ධනයේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මෙහි නියම ඵල නෙළා ගන්න නම් ඔබතුමාට මීට වඩා දෙයක් කරන්න සිද්ධ වෙනවාය කියන එක, ඔබතුමාට මතක් කරන්න කැමැතියි. පසුගිය කාලය පුරාම ඔබතුමාට විශාල, අසීමිත පීඩනයක් තිබුණා. මේ විෂයය සම්බන්ධයෙන්අසීමිත තෙරපුමක් තිබුණා. ඒකට හේතුව අපි හැමෝම දන්නවා. ඒක අමුතුවෙන් කියන්න දෙයක් නැහැ.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මෙතුමා පසුගිය මැයි මාසයෙන් පස්සේ භාර ගත්තා, "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය. ඔබතුමාගේ සියලුම මානව සම්පත ඒකට යොදන්න වුණා. අපි ඒක දන්නවා. එහෙම තිබෙද්දිත් අද ඔබතුමාගේ නිලධාරීන් කියනවා, ඉතා හොඳ මූල්‍ය වර්ධනයක් මෙන්ම භෞතික වර්ධනයක් ළඟා කරගෙන තිබෙනවා කියලා. මූල්‍ය ප්‍රගතිය 60% කුත්, භෞතික ප්‍රගතිය 80% කුත් කියලා වාර්තා කරලා තිබෙනවා. ඉතා හොඳ තත්ත්වයක්. නමුත් එහෙම තත්ත්වයක් තිබෙද්දී මම මතු කරලා පෙන්වන්න කැමැතියි. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඔහුගේ කථාවේදී එක තැනක පොඩි තර්ජනයක් යොමු කරනවා. ඒ තර්ජනය මොකක්ද? මේ සල්ලි ටික හරියට වියදම් කරන්න. මම දැඩි අවධානයක් යොමු කරනවා කියලා මේකේදි කියනවා. සල්ලි වියදම් කළේ නැත්නම් කියලා. දැන් මේකෙන් තේරෙනවා, මේ අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් තිබෙන දේශපාලන පීඩනය. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලනවා කියලා, මේ ගැන සොයා බලන්නය කියලා. මේක සොයා බලන්න දෙයක් නැහැ. මෙතුමාට හොඳට මේ වැඩේ තේරෙනවා. මේක සොයලා බැලුවොත් මොකක්ද දන්නවාද වෙන්නේ? මේකට අනවශ්‍ය දේශපාලන පීඩනය වැඩි වෙලා, එතුමාට එතුමාගේ වැඩේ කරන්න බැරි වෙනවා. ඒ නිසා මේකට අනවශ්‍ය දේශපාලන අතපෙවීම් කරන්න එපා කියන එකයි අපේ ඉල්ලීම, ගරු සභාපතිතුමනි.

මීට අමතරව ගරු ඇමැතිතුමා හොඳ පියවර කිහිපයක් ගත්තා. විශේෂයෙන් විදුහල්පතිවරුන්ගේ බඳවා ගැනීම. ඒ වාගේම විදුහල්පතිවරුන් ස්ථානගත කිරීම. ඒ වාගේම ගුරුවරුන් බඳවා ගැනීම. ගුරු හිඟය. ඒකෙන් ඉවර වෙලා කියලා අපි කියන්නේ නැහැ. බරපතළ ගුරු හිඟයක් තිබෙනවා. විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමා මතු කළා වාගේ දෙමළ ගුරුවරුන්ගේ හිඟයක් තිබෙනවා. ඉංග්‍රීසි ගුරුවරුන්ගේ හිඟයක් තිබෙනවා. ජාතික උසස් ඩිප්ලෝමාව සමත් වුණු ඉංග්‍රීසි විෂයය හදාරපු ඒ අයට ගුරු පුහුණුවක් දීලා තිබෙනවා. ඒ අය කරුණාකරලා බඳවා ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. ඒ ඉල්ලීමට ඔබතුමා යම් ප්‍රතිචාරයක් දක්වලා, මම දන්නවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් එක්ක කථා කළා. ඒ නිසා මේ වාගේ තත්ත්වයන් ධනාත්මකව තිබුණත් දරුවන් ඇතුළත් කිරීමේදී අනවශ්‍ය දේශපාලන පීඩනයකට ඔබතුමා ආයේ සැරයක් යට වුණා. අපි දන්නවා, සමහරු තොග පිටින් දරුවන් දැම්මා. අපේ සමහර නිලධාරීන් කිව්වා, එක් අපේ බලධාරියෙක් තුන්සිය දෙනෙක් ළමයින් දාලා කියලා. ඒ නිසා මේකෙන් මොකක්ද වෙන්නේ? මේකෙන් වෙන්නේ කුඩා පාසල් ටික වැසී යනවා, ගරු සභාපතිතුමනි. 2014 දී ළමයින් 50 ට අඩු පාසල් 63 ක් තිබුණු එක මේ වසර වන විට 74 ට වැඩි වෙලා තිබෙනවා. මේ වෙන්නේ මොකක්ද? ඒ නිසා මේ දේශපාලන අතපෙවීම් වහාම මේකෙන් අයින් කරන්න ඕනෑය කියලා ගරු සභාපතිතුමනි කියනවා. ඒ නිසා මෙවැනි කටයුතු නිසා සිද්ධ වෙන්නේ, මේ අධ්‍යාපනය කඩා වැටෙන එකයි.

ඒක නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාට කියන්න ඕනෑ ඉතාම වැදගත් කාරණා කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම මේ "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය. දැන් ළඟම

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

පාසල හොඳම පාසල ව්‍යාපෘතිය අපට පේන්නේ නැහැ. හැබැයි මේක ඇතුළේ දේශපාලනය තිබෙනවා. මේක තෝරා ගැනීමේ ප්‍රශ්න තිබෙනවා. මේකේ වර්ණීය ප්‍රශ්න තිබෙනවා. සමහර තැන්වල ඉතාම අනවශ්‍ය විධියට - මම මෙතුමාව ගම්පහ පාසලකට එක්කගෙන ගියා. ඒ පාසලේ තිබෙන බරපතළ ගොඩනැගිලි අර්බුදය මෙතුමා දැක්කා. ඒ අර්බුදය දැකලා එතුමා කිව්වා, ඇත්ත නේන්නම් මේ පාසල තෝරා නොගැනීම ප්‍රශ්නයක් කියලා. එවලේම නිලධාරීන්ට උපදෙස් දුන්නා. මේක මගේ ප්‍රදේශයේ නොවෙයි. ගම්පහ. හැබැයි, එහෙම තෝරා ගැනීමේ ප්‍රශ්න තිබෙනවා. ඒ ළමයින්ට ගොඩනැගිලි ප්‍රශ්න තිබෙනවා. සමහර පාසල්වල කැෆටේරියා හතක් හදනවා. ඔබතුමා මේවා දන්නවා. ඒ පාසල්වලට කැෆටේරියා අවශ්‍ය නැහැ. ඔබතුමාට දේශපාලන පීඩනයක් තිබෙනවා. සමහරවිට අයවැය වෙලාවේදී කියයි හිටපුජනාධිපතිතුමියයි කිව්වේ, මේ පාසලට මේක දෙන්නයි කියලා. නැත්නම් ජනාධිපතිතුමයි කිව්වේ මේ පාසලට මේක දෙන්නය කියලා. එහෙම කියලා හරි යන්නේ නැහැ. මේවා වර්ණයේදීහැම පාසලකටම සාධාරණය සිද්ධ වෙන්න ඕනෑ කියලා මම ඔබතුමාට මතක් කරනවා.

ඒ නිසා ගරු ප්‍රශ්නය විසඳන්න. මේ පාසල්වලට දරුවන් ඇතුළත් කිරීම පිළිබඳ නියම ක්‍රමවේදයක් හදලා මුළු රටටම ආදර්ශයක් දෙන විධියට කටයුතු කරන්න. ගුණාත්මක සංවර්ධනය සඳහා කටයුතු කරන්නය කියලා ඔබතුමාගෙන් මම ඉල්ලනවා. ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් අපි ඊයේ, මේ පළාත් සභාවේදී වැය ශීර්ෂ දෙකකට කොන්දේසි විරහිතව සහාය දැක් වූවා. විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ අපි සියලු දෙනා අත ඉස්සුවා. ඒක සදාචාරයේ පාඩමක්ද? එහෙම නැත්නම් ඒක යහපාලනයද? එහෙම නැත්නම් ඒක සම්මුතිවාදයද? මම දන්නේ නැහැ. හැබැයි, අපි විශ්වාස කරනවා. මේ වෙලාවේදී ඔබතුමාට කවර පීඩනයක් එල්ල වුණත්, ඔබතුමා සම්බන්ධයෙන් කථා කරන කොට මේ වෙලාවේ අපි එකම එක සන්නායකයක් විධියට ක්‍රියා කරමින් ඔබතුමාව ආරක්ෂා කරන්න එකතු වෙනවායි කියන එක කියන ගමන්, අවසාන වශයෙන් මම එක වාක්‍යයක් මතක් කරනවා. සුප්‍රසිද්ධ ප්‍රජාතන්ත්‍රවාදී වීරවරිය අවුන්සාන් සූකී කියපු එකක්. අවුන්සාන් සූකී කියන්නේ මොකක්ද? You should never let your pears prevent you from doing what know is right ගරු ඇමැතිතුමනි, ඔබ නිවැරැදියි කියලා හිතන දේ කිරීමෙන් ඔබව වළක්වන්න ඔබතුමා තුළ තිබෙන භයට ඉඩ දෙන්න එපාය කියලා. ඔබතුමා තුළ අනවශ්‍ය භයක් තිබෙනවා. ඒ භයට ඉඩ දෙන්න එපාය කියලා මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි. කාලය පිළිබඳ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මම ඉතාමත් ගෞරවයෙන් අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටයි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටයි දිවා ආහාර වෙලාව තුළ දී මගේ නිල කාමරයට ඇවිල්ලා පොඩ්ඩක් මාව මුණගැහෙන්න. මේක පොඩ්ඩක් හදා ගන්න ඕනෑ. නැත්නම් අන්තිමට වෙන්නේ ගරු ඇමැතිතුමාට අසාධාරණයක් වෙනවා. ඊයෙත් ඒ වැඩේ වුණා. මහ ඇමැතිතුමාට විනාඩි 40 ක් තිබුණා. එතුමාට විනාඩි 24 යි ලැබුණේ. ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාට විනාඩි 30 යි. එතුමා ලැබුණේ විනාඩි 14 යි. මෙතුමාටත් ඒ දේ වුණොත් ඒක අපි කරන අපරාධයක්. ඒ නිසා කරුණාකරලා මගේ නිල කාමරයේදී මුණ ගැසෙන්න.

මේ අවස්ථාවේදී දිවා ආහාර විවේකය සඳහා ප.ව. 02.00 දක්වා සභාව කල් තබනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 02.00 ට යළිත් රැස් විය.***

*Accordingly the Whole Council Suspended and. it resumed at 2.30 p.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම විශේෂයෙන්ම ගරු මන්ත්‍රීවරුන්ට මතක් කරනවා. සභාපතිතුමා හෝ වැඩ බලන සභාපතිතුමා හෝ මූලාසනාරූඪ සභාපතිවරයෙක් හෝ සභා ගර්භයට එන කොට මන්ත්‍රීවරු නිශ්ශබ්ද වන්න. සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, මූලාසනයේ ඉන්න මන්ත්‍රීවරයෙක්. උදේ මම එද්දීත් එතුමා අහක බලාගෙන මොකක්ද සාකච්ඡාවක්. දැනුත් එහෙමයි. කරුණාකරලා ඒ සාකච්ඡා නවත්වන්න. ඒක සුනිල් විජේරත්නට කරන ගෞරවයක් නොවෙයි. පළාත් සභාවේ සභාපතිවරයාට කරන ගෞරවයක් ඒක. සාකච්ඡා කරනවා. උසුළු විසුළු කරනවා.

මේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු. අලුත් මන්ත්‍රීවරු නොවෙයි. ඉස්සරහා පේළියේ ඉන්නේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුනේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නවක මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර මේ සභාවේ ඒ හැසිරීම් කරන්න එපා. මම දැනුත් එනකොට දැක්කා. අනවශ්‍ය සාකච්ඡා කරනවා. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, වෙලාවට නවත්වන්න.

[අ.භා. 02.02]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා. අපේ ගරු අධ්‍යාපන ඇමැතිතුමාගේ වැය ශීර්ෂයේදී වචනයක් කථා කරන්න ලැබීම ගැන සතුටු වෙනවා. දාර්ශනික යූවී කොසුප් සඳහන් කරනවා, ජාතියේ ඉරණම දරුවන්ට දෙන අධ්‍යාපනයෙන් තීරණය වෙනවා කියලා. එ නිසා ජාතියේ ඉරණම තීරණය කරන, අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන වැය ශීර්ෂයේදී, ඒ අමාත්‍යාංශයේ කළ කී දෑ පිළිබඳව සහ කරන්න තිබෙන කටයුතු පිළිබඳව ඔබතුමාගේ අමාත්‍යාංශයේ ගුණ වරුණ කරන්න හෝ නරක කථා කරන්න මේක තමයි හොඳම අවස්ථාව. ඒ නිසා මම විශ්වාස කරනවා, අද උදෑසන සිටම කථා කරපු ගරු මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් ඔබතුමාගේ අමාත්‍යාංශයේ පසුගිය අවුරුද්ද තුළ සහ ඔබතුමා වැඩ භාරගත්තු දවසේ සිට තිබුණු හොඳ සහ නරක අඩු වැඩි වශයෙන් කියන්න ඇතියි කියලා. ඔබතුමාට ඒ නිසා මේ වන කොට යම් අවබෝධයක්, කල්පනාවක් ඇති වෙලා ඇති මෙතැනින් එහාට මම අමාත්‍යාංශය ගෙනි යන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව. ඒක ඔබතුමාට වාගේම එක්සත් ජාතික පක්ෂය විධියට අපටත් විශාල වගකීමක් සහ අයිතියක් තිබෙනවා, මේ අධ්‍යාපනය පිළිබඳව. ඒකට හේතුව 1944 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට පළමුවැනි වතාවට ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා තමයි මේ නිදහස් අධ්‍යාපනය පිළිබඳව යෝජනාව ගෙනෙන්නේ. ඒක සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා විසින් නිදහස් අධ්‍යාපනය ඇති කරනවා. ඊට අමතරව ඩී.ඇස්. සේනානායක මැතිතුමාගේ කැබිනට් ඇමැතිවරයෙක් වුණු ඊ.එන්. නුගවෙල ඇමැතිතුමාගේ පළමුවැනි කැබනට් එකේදී තමයි මධ්‍ය මහ විද්‍යාල සංකල්පය ඇති කරලා, 1977 න් පසුව එක්සත් ජාතික පක්ෂ පාලන කාල සීමාවක් තුළ නොමිලේ දරුවන්ට පාසල් නිල ඇඳුම් දීලා, පොතපත දීලා, අධ්‍යාපනය දීලා, ආහාර දීලා, විද්‍යා පීඨ හදලා මේ රටේ අධ්‍යාපනය විධිමත් කළේ. ඒ අද වර්තමාන අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා අධ්‍යාපන ඇමැතිවරයා වශයෙන් සිටින කාලයේ. ඒ නිසා මේ අපට එක්සත් ජාතික පාක්ෂිකයන් විධියට තමුන්නාන්සේගේ අමාත්‍යාංශය පිළිබඳව විශාල වගකීමක් සහ ඕනෑකමක් තිබෙනවා, ඒකේ කටයුතු සහ කාරණා වෙන විධිය ගැන කල්පනා කරලා බලන්න. ඒ නිසා මම ඔබතුමාට දොසක් කියන්න කල්පනා කරන්නේ නැහැ. හැමෝම උදේ සිට යම් යම් දේවල් කියලා ඔබතුමාගේ ටිකිරි මනසට මමත් දෙයක් කියන එක ඒතරම් උචිත වන්නේ නැහැ. මොකද හේතුව, ඔබතුමා අපේ ආසනයේ, අපේ දිස්ත්‍රික්කයේ කෙනා නිසා. හැබැයි මම දකිනවා, ඔබතුමා හරියට ගල උඩ පැළ වුණු කැප්පෙට්ටිය ගහ වාගේ. පැළ වෙන්නෙත් නැහැ. මැරෙන්නෙත් නැහැ. ගල උඩ පැළ වුණු කැප්පෙට්ටි ගහ. ඔබතුමාටත් අර ගෝනගලට රළ ගහන්නා වාගේ අපිත් හැමදාම දේවල් කියනවා. මේ අයවැය විවාදයේදී විතරක් නොවෙයි. පළාත් සභාව පුරාම තිබෙන සෑම සභා සැසිවාරයකම ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්නයක් නැත්නම්, දෙකක් වැඩි වශයෙන් ඔබතුමාට යොමු වෙනවා. ඔබතුමාත් නිලධාරීන් ඇවිල්ලා කියන ඕනෑ එකක් මෙතැන ගිරවා වාගේ කියවන්න පුරුදු වෙලා තිබෙන නිසා නිලධාරිනුත් ඕනෑ දෙයක් ඔබතුමාට කියනවා මිසක් ඒකට නිවැරදි උත්තරය නොවෙයි දීලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමාට මම ගෞරවයෙන් කියන්නේ. මේ ඉදිරි වර්ෂයේදී ඔබතුමාව අන්දන්න ලැහැස්ති වෙලා ඉන්න නිලධාරීන්ගෙන් හෝ එහෙම නැත්නම් මේ ලබා දෙන හැම උත්තරයක්ම හරියි කියලා විශ්වාස කරලා මෙතැනට ඇවිල්ලා කියන්න එපා. ඒක අධ්‍යාපනයට කරන හානියක්.

දැන් ඔබතුමාට වගකීමක් තිබෙනවා. අකිල විරාජ් ගරු අධ්‍යාපන ඇමැතිතුමා ලබන වර්ෂයේ සිට 13 වැනි ශ්‍රේණිය දක්වා අනිවාර්ය අධ්‍යාපනය පටන් ගන්නවා. අලුතෙන් විෂයයන් 24 ක්, තිබෙන විෂයයන් ටිකත් කරගන්න තිබෙන බාධක මැද්දේ තවත් විෂයයන් 24 ක්

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

හඳුන්වලා දෙනවා. එතකොට බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන ඇමැතිවරයාට මීට වැඩිය වගකීමක් තිබේවි. Smart Class room එනවා. ඒ Smart Class room එනකොට ඔබතුමා ඒකට හැඩ ගැහෙන්න ඕනෑ. ඒ වාගේම පරිගණක 50 ගණනේ පාසල්වලට ලබා දීලා IT තාක්ෂණය දරුවන්ට ලබා දෙන වැඩ පිළිවෙළ තුළ රේඩියෝ අමාත්‍යාංශයත් එක්ක තමුන්නාන්සේලා බද්ධ වෙලා කරන්න ඕනෑ. ඒ නිසා මේවා කරන්න ගරු ඇමැතිතුමනි, යම් වැඩ පිළිවෙළක්, සංවිධානයක් සහ යම් දැක්මක් ඔබතුමාට තිබෙන්න ඕනෑ. ඔබතුමා උගතෙක්, නැණවතෙක්, බුද්ධිමතෙක්. හැබැයි අපේ අර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම උගත්කමයි, බුද්ධිමත්කමයි දෙක පටලවා ගන්නේ නැතිව බුද්ධිමත් භාවයෙන් යුතුව මේ කටයුත්ත කරන්න ඕනෑ. එහෙම කළොත් තමයි ඔබතුමාට මේ කාරණාව කරන්න පුළුවන්කම ලැබෙන්නේ. මම විශ්වාස කරනවා. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය මඟින් පාසල් දරුවන්ට IT තාක්ෂණය දෙන්න උත්සාහ කළාට, අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රියාපටිපාටියට කාර්යාලය ඇතුළට මේ තොරතුරු තාක්ෂණයේ ප්‍රතිඵල අරගෙන නැහැයි කියලා. ඒ නිසා දැන් කාලය එළැඹිලා තිබෙනවා, ඔබතුමාගේ අමාත්‍යාංශය ප්‍රමුඛ ලංකාවේ සියලු අමාත්‍යාංශවලට, සියලු දෙපාර්තමේන්තුවලට මේ නවීන තාක්ෂණයත් එක්ක කටයුතු කරන්න.

එතකොට තමුන්නාන්සේට පුළුවන්කම ලැබෙන්න ඕනෑ, ලබන අවුරුද්ද ඇතුළත අපේ පළාත තුළ කොපමණ ගුරුවරු ඉන්නවාද? ඒ ඉන්න ගුරුවරු වර්ගීකරණය හැටියට මොන මොන විෂයයන්ද? ඒ ගුරුවරු විශ්‍රාම යන්න අවුරුදු තුනක්වත් තිබියදී අවම වශයෙන් ලබන අවුරුදු තුන ඇතුළත - ඊළඟ අවුරුද්දේ කවුද? ඊළඟ අවුරුද්දේ කවුද? කියලා විශ්‍රාම යන්නේ කවුද කියන දත්තයන් එකතු කරලා, ඒ පුහුණු ගුරුවරුන් පිළිබඳව එකතු කරලා ඒ ගුරුවරුන්ට පුහුණුව ලබා දෙන එක පිළිබඳව පරිගණක තාක්ෂණය උපයෝගී කරගෙන, වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියලා තමුන්නානසේගෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම අම්මලා හැමදාම කියනවා, අවුරුද්දේ මැද ගුරුවරයා Transfer වෙලා ගියා. බබා හම්බ වෙන්න ගියා. විශ්‍රාම ගියා කියලා. නිවැරදි තොරතුරු පද්ධතියක් අධ්‍යාපන අමාත්‍යාංශයට එකතු කරනවා නම් මේවාට විසඳුමක් ඒවි.

ගරු ඇමැතිතුමනි, එහෙම නොවුණොත් ඔබතුමාට අවසාන වශයෙන් මම කියන්නම්. දක්ෂ නිලධාරීන්ගේ වැඩ ගන්න එක තමුන්නාන්සේට පුළුවන් වෙන්න ඕනෑ. හැබැයි, වැඩ ගන්න බැරි වෙලා අවසානයේදී ඒකට හේතු සාධක කියන එක නොවෙයි, වැඩේ. එංගලන්ත හමුදාව කියලා කියන්නේ දක්ෂ හමුදාවක්. ඉංග්‍රීසි හමුදාව. ඒ ඉංග්‍රීසි හමුදාව පළමුවැනි ලෝක යුද්ධයේදී පරාජයට පත් වෙනවා. ඒ දක්ෂ හමුදාව පළමුවැනි ලෝක යුද්ධයේදී පරාජයට පත් වෙනවා. හැබැයි ඒ පරාජයට පත් වෙන්න හේතුව තමයි, ජෙනරාල්වරුන්ගේ තිබෙන නායකත්වයේ දුර්වලතාවය. මේක හඳුනාගත්තු ඉංග්‍රීසි ලේඛකයෙකු වන ඇලන් ක්ලාක් විසින් පොතක් ලියනවා. ඒ පොතට නම දෙනවා, ජෙනරාල්වරුන්ගේ දුර්වලතාවය කියලා. ඒ ජෙනරාල්වරුන්ගේ දුර්වලතාවය නිසා සොල්දාදුවන්ගේ දක්ෂ හමුදාව පරාජයට පත් වෙනවා. ඒකට නමක් දෙනවා,Lion lead by donkeysකියලා. අවසානයේ ඔබතුමාගේ අමාත්‍යාංශය දිහා බලලා ඊළඟ වැය ශීර්ෂයේදීත්, Lion lead by donkeys කියලා අධ්‍යාපන අමාත්‍යාංශයට නොකියන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉතාමත්ම ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. කාලය හරියටම කළමනාකරණය කරන්න. මූලාසනය හැටියට මට මේ විදියට යන්න අමාරුයි. පස්වරු තුනට අවසන් කරන්න ඕනෑ. ඒ නිසා නියමිත වේලාවට මූලාසනයෙන් නිවේදනය කළාට පස්සේ, කථාවට යන්න එපා. කථාව නවත්වන්න.

අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 02.08]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, අධ්‍යාපාන අමාත්‍යාංශය සම්බන්ධයෙන් මට කථා කරන්න ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. අර කිව්වා වාගේ සිංහලෙන් කවියක් කියලා පටන් ගන්නේ. අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ප්‍රසන්න මහත්මයාගේ කාලයේ

අධ්‍යාපනයට දොස් කිව්වා. එහෙමනම් අහගන්න. රඹුක්කන සිද්ධාර්ථ හාමුදුරුවෝ සහරාවකට කියලා තිබෙනවා. ගරු සභාපතිතුමනි මට අද වාගේ කවිය මතකයි.

අල්ලට සිහා කුස ගින්දර නිවාගෙන
කල් ගිය රෙදි වැරැලි ඇඟ විලි වසාගෙන
ඇල්මෙන් අකුරු කළ දරුවන් නසාලන
ලෝකයේ උතුම් රට මේකද හිභාකන

කියලා. එදා කියලා තිබුණා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වැරැදියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවිය වැරැදියිලු. අර ගරු මන්ත්‍රීතුමා කියන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ වැරැදි ඉස්සර කවිය. මේ නවීන කවිය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආ....අලුත් කවිය.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අලුත් කවිය. ලෝකය උතුම් රට හිභාකන. ඒ කවිය සිද්ධාර්ථ හාමුදුරුවෝ කියලා තිබුණේ ඒ කාලයේ ත්‍රීමා විතාරණට ඔළුවට ඇණ ගහලා අර බටලන්දේ තරුණයන් මරපුවා තමයි. දැන් ශිෂ්‍යන් සහ අධ්‍යාපනය ගැන කථා කරනවා. ගරු සභාපතිතුමනි, මම එතැනින් පටන් ගන්නවා. මම හිතන්නේ රොඩ්නි ප්‍රේසර් ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ ටියුෂන්කාරයොයි - එතුමයි කිව්වේ. මම නොවෙයි. ටියුෂන් කාරයෝ නැත්නම් අධ්‍යාපනය නැහැයි කියලා. ඔව්. මේ කාලකණ්නි අධ්‍යාපන ක්‍රමය නැහැ තමයි ටියුෂන්කාරයෝ නැත්නම්. ගරු සභාපතිතුමනි, මොකද මේ අධ්‍යාපන ක්‍රමය තිබෙන්නේ ලියන්නයි කියන්නයි විතරයි. ගෙදර ගිරවාටත් කියා දුන්නොත්, ඌත් කියනවා. එතැනින් එහා මොකුත් නැහැ.

ඉතින් ගරු සභාපතිතුමනි, මේ ලියන කියන අධ්‍යාපනයෙන් එපිට ගිහිල්ලා - අපේ අර අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ පාසල කියන්නේ සෙමී කාර්මික විද්‍යාලයක් වෙන්න ඕනෑ. අවුරුදු 10 ක් ඉස්කෝලේ ගිහිල්ලා, අවුරුදු 10 න් පසුව අපි එළියට ගියාම මොකුත් දන්නේ නැහැ. දැන් මෙදාපාර තමයි ඉතිහාසයේ වැඩි ප්‍රමාණයක් වන ලක්ෂ හයාමාරක් සාමාන්‍ය පෙළ ලියනවා. එයින් ලක්ෂ දෙකකට උසස් පෙළ කරන්න ගන්නේ. හාර ලක්ෂ පනස් දාහක් විසි වෙනවා. වෙන්නේ මොකක්ද කියලා කිසිම රජයක් දන්නේ නැහැ. තම තමන්ගේ අත තම තමන් බලා ගන්නවා. ඊළඟට ලක්ෂ දෙකක් උසස් පෙළ ලියලා විසි පන්දාහක්, තිස් දාහක්, අර මෙතුමා කිව්වා වාගේ, තව පන්දාහක් වැඩි වුණාම තිස් දාහක් තමයි විශ්ව විද්‍යාලයට යන්නේ. ඒ විශ්ව විද්‍යාලයට යන තිස් දාහත් මහ පාරේ. එතකොට මේ ලක්ෂ දෙකෙන් එක් ලක්ෂ හැත්තෑ පන්දහසක් අයින් වෙනවා. එතකොට ගරු සභාපතිතුමනි, මේ අධ්‍යාපන ක්‍රමය සුද්දා ගෙනැල්ලා අද සුද්දාගේ රටේ මේ අධ්‍යාපන ක්‍රමය නැහැ. නමුත් තවම අපි ළඟ තිබෙනවා. එහෙමනම් මම හිතන්නේ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මෙය වෙනස් කරන්න පටන් ගත්තා. දැන් අලුත් අධ්‍යාපන ඇමැතිතුමා වෙනස් කරමින් පවතිනවා කියනවා.

මම විශ්වාස කරනවා ගරු අධ්‍යාපන ඇමැතිතුමනි, පාසල් එක් දහස් දෙසිය ගණනක් තිබෙන මේ අපේ බස්නාහිර පළාත් සභාවේ, දහ දාහෙන් එක් දහස් දෙසිය ගණනක්ම තිබෙන්නේ අපට. ඔබතුමා සක්‍රියව මැදිහත් වෙලා ඔබතුමාගේ දක්ෂ නිලධාරී මණ්ඩලයත් සමඟ මේ වෘත්තීය අධ්‍යාපනයට ප්‍රමුඛත්වයක් දීලා මේ අධ්‍යාපනය හරි තැනට ගෙනි යන්න. උදේ පටන් ගත්තාම රෑට නින්දට යනතුරු මට කියන්න බලන්න, අපි පරිහරණය කරන ලියන කියන දේවල් සහ පරිහරණය කරන භාණ්ඩවලට වාහනයේ සිට, ගරාජ් එකේ සිට, ස්විස් එකේ සිට, ඒසී එකේ සිට, වයිරින් කරන තැන සිට අපි ඉස්කෝලේ ගිහිල්ලා අධ්‍යාපනය ලබපු කිසිම දෙයක් භාවිතා වෙනවාද? නැහැ. ගරාජ් එකට ගියාම කියනවා, එක්ටා ගහන්න ඉක්මණට. ඇයි? ඉන්දියාවෙන් සේවකයන් ගෙන්න ගන්න. ස්ර්විස් එකට ගියාම එක්ටා ගහන්නේ කොයි කාලයේදී. ඉන්දියාවේ සේවකයන් ගෙන්න ගන්න. මේ ඉන්දියාවේ සේවකයන් ගෙන්නා ගන්න තරමටම අපේ අධ්‍යාපනය පිරිහිලා. අධ්‍යාපනයෙන් මේ වෘත්තිකයන් බිහි කරන්නේ නැත්නම් කොහෙන්ද බිහි කරන්නේ? අවුරුදු 18 ක්, 19 ක් ගිහිල්ලාත් පාසලෙන් කියා

[ගරු අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා]

දෙන්නේ නැත්නම් - 19, 20 ගියාට පස්සේ කොල්ලෝ යන්නේ කෙල්ලෝ පස්සේ. අධ්‍යාපනය පස්සේ යන්නේ නැහැ. කොහේ තිබෙන වෘත්තීය අධ්‍යාපනයක්ද? පාසලෙන් තමයි මෙයට යොමු කරන්න ඕනෑ. මම හිතන්නේ මේ කාලකණ්ණි අධ්‍යාපනඥයන්ට මේක තවම පෙනිලා නැහැ. මොකද කකුල් දෙක බේසමේ දාගෙන පාඩම් කරනවා. A 4 ක් ගන්නවා. විශ්ව විද්‍යාලයට යනවා. කෙල්ලෙක් එක්ක යාළු වෙන්නේ නැහැ. වොලි බෝලයක් ගහන්නේ නැහැ. වෙන දෙයක් කරන්නේ නැහැ. සමාජය ගැන දන්නේ නැහැ. ඌ ස්පෙෂල් එකක් ගහලා පාස් වෙනවා. එයා තමයි අධ්‍යාපනඥයා. හොඳම පුද්ගලයා. හැබැයි ගෙදර ගෑණි යන්නෙත් ඩ්‍රයිවර් එක්කලා. ඕක තමයි සාමාන්‍ය තත්ත්වය. ඒ වාගේ මිනිස්සු තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක බොරුවක්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගොඩක් අයගේ. ඇයි මහත්තයා නැහැ නේ? මේ වාගේ අය තමයි මේ සමාජයේ ප්‍රායෝගික දැනුමක් නැතිව ඉන්නේ. ගරු සභාපතිතුමනි, අපේ ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මේ අධ්‍යාපන රටාව වෙනස් කරන්න උත්සාහ කරන්න. වර්තමාන අධ්‍යාපන තත්ත්වය වෙනස් කරන්න පටන් ගන්න. මෙය කරන්නය කියලා එතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම අද කොල්ලෝ නැහැ. කොලු හාගේ ඉන්නේ. කොල්ලෙකුට තනි අණ්ඩෙන් පැය කාලක් හිටගෙන ඉන්න බැහැ. අද කෙල්ලෙකුට තනි අණ්ඩෙන් පැය භාගයක් හිටගෙන ඉන්න බැහැ. අද රැස්වීමේ පැය භාගයක් අව්වේ ඉන්න බැහැ. ඇයි? සිහිය නැතිව වැටෙනවා. ඇයි? ක්‍රීඩාවක් නැහැ. වෘත්තියක් නැහැ. මේ කාලකණ්ණි අධ්‍යාපනයේ පහේ පන්තියෙන් පටන් ගත්තාම දොළහ පන්තිය වනතුරු තරග. දරුවන්ට කිසිම දෙයක් කරන්න බැහැ. අම්මලා පිස්සු වැටිලා වාගේ. ඇයි මොකද? ඉස්කෝල සොයනවා. දුවනවා. අම්මලාටත් දොස් කියන්න බැහැ. මොකද, සෑම දෙමව්පියෙක්ම බලන්නේ තමන්ට අහිමි වුණු දේ, දරුවන්ට අධ්‍යාපනයක් ලබා දීලා හොඳ තැනක් ලබා දෙන්න. අම්මලාට දොස් කියන්න බැහැ. නමුත් මේ අවුරුදු 12 ක් ගියාට පස්සේ තමයි අම්මලාට තේරෙන්නේ අනේ අපට ගිය කල තමයි දරුවන්ටත් යන්නේ. හොඳ ඉස්කෝලයකුත් නැහැ. හොඳ අධ්‍යාපනයකුත් නැහැ. හොඳ රැකියාවකුත් නැහැ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ වාගේම -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඔතැන ඉඳලා හරි යන්නේ නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මම කිව්වේ මේ අධ්‍යාපන ක්ෂේත්‍රයටම. ඔක්කෝටම. ගරු සභාපතිතුමනි, ඔය කෑගහන JVP කට්ටිය මම දැක්කා යහපාලන ආණ්ඩුවට බණිනවා. යහපාලනයට කඩේ ගිහිල්ලා, මේ ආණ්ඩුව ඇති කරලා, අර ඉන්න රතු අලි පැලියා - දැන් මෙතැනට ඇවිල්ලා මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා කෑගහනවා මේ යහපාලන ආණ්ඩුවේ අගමැතිතුමාටයි, ජනාධිපතිතුමාටයි. කඩේ ගියේ ඒ අය. මේ ආණ්ඩුව ගෙනාවේ ඒ අය. දැන් බොරුවට කෑගහනවා. ඊළඟට ටැබ් දෙනවා. A/L කරන අයට ටැබ් දෙන්නේ ටීචර් එක්ක බ්ලූ බලන්න. වෙන මොනවාටද? ටැබ්ද දෙන්න ඕනෑ. ටැබ් දීලා හරි යන්නේ නැහැ. මේ අධ්‍යාපනය දියුණු කරන්න, වෘත්තීය අධ්‍යාපනය ගේන්න කියන්න. ටැබ් දෙන්නේ ටීචර් එක්කලා බ්ලූ බලන්න. වෙන මොකටද? ලොකු ළමයින්ට ටැබ්. ඒවාටයි ටැබ් දෙන්නේ. ගරු සභාපතිතුමනි, එතුමා කිව්වා වැඩබලන විදුහල්පතිවරු එක පාරට අයින් කරන්න කියලා. කාත් කවුරුත් නැති කාලේ, පාසල් භාර ගන්නේ නැති කාලේ, විදුහල්පති ශ්‍රේණි විභාග තියන්න දෙන්නේ නැති කාලේ ඒ වැඩ බලන විදුහල්පතිවරු ඉස්කෝලේ දියුණු කරලා එක පාරටම බල්ලෝ බලල්ලු වාගේ, JVP කාලේ වාගේ විදුහල්පතිවරු අත්හැරලා දාන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කාගේ කාලයේද එහෙම තිබුණේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඇයි? මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා කිව්වේ. ගරු සභාපතිතුමනි, මම අපේ අධ්‍යාපන ඇමැතිතුමාට කියනවා ඒ වැඩ බලන විදුහල්පතිවරු ගැනත් සාධාරණයක් බලන්න කියලා. ඒ වාගේම එතුමා බොහොම නිහතමානී, අවංක ඇමැතිවරයෙක්. මම හිතන්නේ රට ගිහිල්ලා නැහැ. වෙන අයගේ වාගේ පුත්තු, දූරු, බෑණලා මේවාට රිංගගෙන නැහැ. ඒ වාගේ නිහතමානී අවංක ඇමැතිවරයෙක්. (බාධා කිරීමක්) එතුමාට කිව්වේ. ඒක නිසා එතුමාගේ Staff එක හොඳයි. එතුමාගේ කකුලෙන් අදින්නේ නැතුව, හැම කෙනාම උදව් කරගෙන, හැබැයි ගරු සභාපතිතුමනි, හොඳ හොඳම නැහැයි කියලා කථාවක් තිබෙනවා. ඒ නිසා අර අපේ අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඔබතුමා ටිකක් සැර වෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේ ගමන යන්න බැහැ. ස්තුතියි.

[අ.භා. 02.15]

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ පළාත් සභා අතුරින් වැඩිම මන්ත්‍රීවරු සංඛ්‍යාවක් නියෝජනය කරන, වැඩිම බලයක් තිබෙන පළාත් සභාව තුළදී, රටේ වැදගත්ම විෂයයක් වන අධ්‍යාපන විෂයය සම්බන්ධව කථා කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකනවා. අද උදේ ඉඳලා අපේ ගරු මන්ත්‍රීතුමන්ලා විවිධ කරුණු කාරණා රාශියක් මෙතැන එල්ල කළා. මට පෙර කථා කළ අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කාලකණ්ණි අධ්‍යාපන ක්‍රමයක් ගැන කිව්වා. හැබැයි අපි යහපාලන අණ්ඩුව බලයට ඇවිල්ලා තවම ඉතාම කෙටි කාලයයි. එතකොට මේ කාලකණ්ණි අධ්‍යාපන ක්‍රමය ඇති කළේ කවුද? අවුරුදු 20 ක් රට පාලනය කරපු තමුන්නාන්සේලා. ඒකේ වගකීම දැනගන්න ඕනෑ. ඒක තේරුම් අරගෙන අපි ආවේ ඒක නිදහස් කරන්න. අපට එක පාරට මේක කරන්න බැහැ. මේ අධ්‍යාපනය ගැන කථා (බාධා කිරීම්) කරුණාකරලා විනය ගරුක වෙන්න. ඔබතුමා අධ්‍යාපනයට බොහොම ගරු කරන මන්ත්‍රීවරයෙක්. මේ තුළ අපි සියලු දෙනාට ගරුත්වය දීලා කථා කරන්න ඕනෑ. ඒක නිසා මම හිතන්නේ මේ ක්‍රමයෙන් එහාට ගිහිල්ලා කටයුතු කළේ නැත්නම් අපට කිසි දෙයක් කරන්න බැහැ. ඔබතුමන්ලා අතින් ඒ දේ සිද්ධ වුණේ නැති නිසා තමයි අද මේ දේ කරන්න වෙලා තිබෙන්නේ. ඒ වාගේම මම මතක් කරනවා අපේ අග්‍රාමාත්‍යතුමා, අපේ පක්ෂයේ නායකතුමා මේ රට නිදහස් අධ්‍යාපනයෙන් ඵල ලබාගෙන නීතිඥවරයෙක් හැටියට පත් වුණු කෙනෙක්. අපේ අගමැතිතුමා සමහරු වාගේ ඉස්කෝල හතර පහකින් ගහලා පන්නපු කෙනෙක් නොවෙයි. එහෙම අය හිටියා. නාලන්දෙට ඇවිල්ලා පැන්නුවා. ඊට පස්සේ තර්ස්ටන් එකට ගිහිල්ලා පැන්නුවා. මේ වාගේ අය රට පාලනය කරන කොට, මෙවැනි දේවල් වෙනවා තමයි.

ගරු සභාපතිතුමනි, මේ අධ්‍යාපන ක්‍රමය නවීකරණය කිරීම සම්බන්ධයෙන් කථා කළා. එතකොට අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාත් කියපු විධියට මේ අලුත් ක්‍රමය ඇති කරන්න හදන්නේ O/L වලින් පස්සේ. දරුවන්ට දරුවෝ කැමැති විෂයයක් හදාරන්න. අන්න ඒ නිසා තමයි විෂයන් 24 ක් හඳුන්වලා දෙන්නේ. A/L කරන්න කලා අංශයෙන් ඕනෑ නම් කලා අංශයෙන්. දරුවෝ ඉපදෙන කොට විවිධ දක්ෂතා තිබෙන දරුවෝ ඉන්නවා. හැම කෙනෙක්ම අධ්‍යාපනයට කැමැති නැහැ. පොත පතේ ඇලෙන්නේ නැහැ. හැබැයි, ඒ අය ක්‍රීඩාවලට දක්ෂයි. එයාලා වෙනත් අංශවලට දක්ෂයි. ඒ අයට ඒ ක්‍රමවේද තුළින් යෑමේ හැකියාව, අවශ්‍යතාවය දිය යුතුයි. අන්න ඒ නිසා තමයි සාමාන්‍ය පෙළින් පස්සේ, උසස් පෙළ දක්වා - කැමැති අයට Scienceද, Maths ද, Art ද, Commerce ද කරන්න පුළුවන්. ඒකෙන් එහා කට්ටියට තමන් කැමැති විෂයය නිර්දේශවලට ගිහිල්ලා ඒ කටයුතු කිරීමේ හැකියාව ඒ අයට තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමා, අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ ගරු ඇමැතිතුමාගේ හොඳකමත් සමහර වෙලාවට නරකට ගිහිල්ලා තිබෙනවා. හැබැයි කාල වේලාව ගෙවෙමින් තිබෙන මොහොතේ මම මෙන්න මේක කියන්න ඕනෑ. ඇත්තටම මේ පැත්තේ ඉන්න මන්ත්‍රීවරු යහපාලනය බිහි කරන්න දැවැන්ත කැප කිරීමක් කළා. අපට කිසිම දේශපාලන පක්ෂයක් කැඩීමේ අවශ්‍යතාවයක් නැහැ, ගරු සභාපතිතුමනි. හැබැයි සාධාරණය කියලා දෙයක් තිබෙන්න ඕනෑ. අද වනකොට ගම්පහ දිස්ත්‍රික්කයේ සමහරු, ඔබතුමන්ලාටත් විරුද්ධ එක්තරා කණ්ඩායමක් හිටපු ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ කාලයේ සිද්ධ වුණු

[ගරු ඉන්දික මහීෂ බණ්ඩාර]

අකටයුතුකම් ගැන කියන්න ඕනෑ නැහැ. සියලු දෙනාටම සාධාරණය කියන එක තියෙන්න ඕනෑ. දරුවෙක් දාගන්න ගියත්, වෙනත් යමක් කරන්න ගියත් අදත් ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමාට ඉහළින් බල හස්ත මේකේ ක්‍රියාත්මක වෙන්න බැහැ. හැබැයි විශේෂයෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ මෙවැනි කණ්ඩායම් තියෙනවා. ඔබතුමාව බලෙන් නම්ම ගන්න හදනවා නම්, ඔබතුමාට තර්ජනය කරන්න හදනවා නම් මම හිතන්නේ ඒක නොවෙයි ක්‍රමවේදය. මේක අපි ගම් මට්ටමෙන් පටන් අරගෙන ගුරුවරයාට පවා, විශේෂයෙන්ම psychology ගුරුවරුන්ට -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

අධ්‍යාපන ඇමැති ආවා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

අපේ ගම්පහ දිස්ත්‍රික්කයේත් අධ්‍යාපන ඇමැතිවරයෙක් බිහි වෙලා තිබෙනවා. හිටපු ඇමැතිතුමාට පස්සේ. මම කිසිම පෞද්ගලික තරහක් නැහැ. මම කෙලින් කියන මනුස්සයෙක්. මම තැනින් තැන ගිහිල්ලා කියන්නේ නැහැ. කියන දේ මුහුණට කිව්වා. වෙනත් තැන්වල කියන මිනිහෙක් නොවෙයි. ඉතින් ඒක නිසා ගරු සභාපතිතුමනි, මේ කවුන්සිලින් කියලා දෙයක් තිබෙනවා. උපදේශන සේවාව. සමහර ගුරුවරු ඉන්නවා මේ ගැන දන්නේ නැහැ. දරුවෝ ප්‍රශ්නයක් ඇහුවාම ඒ ගැන හරියට අවබෝධයක් නැහැ. ඒ නිසා ඉදිරි වර්ෂයේදී මේ කවුන්සිලින් කියන දේ කරුණාකරලා ඇතුළත් කරන්න. මොකද, ඒ දරුවන්ගේ මානසික තත්ත්වය රැක ගන්න පුළුවන් අන්න එතැනදී.

ඒක නිසා මේ අපි සියලු දෙනාම අලුත් අවුරුද්දේ එකතු වෙලා වැඩ කරමු. අපේ පාට පක්ෂ පැත්තකින් තියලා, මේ රටේ ඉදිරියට යා යුතු වැදගත්ම පළාත් සභාව, බස්නාහිර පළාත් සභාව හැටියට අපි වැඩ කරමු. තව එක කාරණයක් කියන්න තිබෙනවා. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා අර එක්සයිස් පොත් සම්බන්ධයෙන් කථා කළා. අකිල විරාජ් ගරු ඇමැතිතුමාව මට සම්බන්ධ කර ගන්න අවස්ථාව ලැබුණා. ගරු සභාපතිතුමනි, ඒකට කැබිනට් ජේපර් එක දාලා තිබෙන්නේ, උදාහරණයකට එක පොතක් ගහන්න. මොකද ගස් කපලා මේවා කළාම ඒක කරගෙන යන්න බැහැ. විශේෂයෙන් ලෝකයේ තව රටවල් තිබෙනවා. එතුමා කියලා තිබ්බා එහෙම නැහැයි කියලා. එහෙම පාවිච්චි කරන රටවල් තිබෙනවා. මගේ වෙලාවට අනුව විනාඩි 05 ක කාලය ගෙවිලා තිබෙනවා. ඒක නිසා මෙතැනින් එහාට කථා කරන්න යන්නේ නැහැ. පෞද්ගලික ප්‍රශ්න පැත්තකින් තියලා අපේ ගමන අපි එකතු වෙලා යමු කියලා සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා. ඡන්දයේදී ඕනෑ පක්ෂයකින් ඉල්ලමු. වැඩ කරද්දී එකතු වෙලා කරමු කියමින් ගරු ඇමැතිතුමාට ජය පතමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 02.20]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් අවසරයි. ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට විනාඩි 05 ක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඉතාමත් සතුටට පත් වෙනවා. ඒකට ප්‍රධානම හේතුව දිගු කාලීන ආයෝජනයක් වන අධ්‍යාපනය ගැන යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්න ලැබීම ගැන ඉතාම සතුටට පත් වෙනවා. අධ්‍යාපනය කියන්නේ, මනුස්සයා පූර්ණ මනුස්සයෙක් බවට පත් කිරීමයි. නමුත් අද අපට තිබෙන ගැටළුවක් තමයි මේ තිබෙන අධ්‍යාපන ක්‍රමය තුළ දරුවෝ පූර්ණ මනුස්සයෙක් බවට පත් වෙනවාද එහෙම නැත්නම් සතෙක් බවට පත් වෙනවාද කියන එකයි. අද අපි ඒ ගැන කථා කරන්න ඕනෑ යුගයක්. එක එක යුගයන්වල එන ආණ්ඩුවල ඇමැතිවරුන්ගේ පුද්ගලික න්‍යාය පත්‍රවලට රටේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කරනවා. අපි කරන පළමුවැනි යෝජනාව තමයි, අධ්‍යාපනය කියන විෂයය ගැන කිසිම කෙනෙක් තනි තීරණ ලබා ගන්නේ නැතුව බුද්ධි මණ්ඩලයක් විසින් කථා කරලා, සංවාද කරලා විවිධ යෝජනා ඉදිරිපත් කරනවා මිසක්, එක එක පුද්ගල යෝජනා ඉදිරිපත් කරන්න එපා. උදාහරණයක් විධියට මේ රටේ 72 කැරැල්ල ඇති වුණේ සාහිත්‍ය නිසා කියලා එදා සාහිත්‍ය විෂයය වෙනස් කළා. ඊට පස්සේ අපට බිහි වුණේ මොන වාගේ දරු පිරිසක්ද? නිර්මාණශීලී නැති, හිතන්න බැරි දරුවෝ පිරිසක් බිහි වුණා. අධ්‍යාපනය කියන්නේ රටක ආයෝජනය. රටක් පවතින්නේ අධ්‍යාපනය තුළ. ඒකේදී තීන්දු ගත යුතුයි. ඒවා තනි තීන්දු නොවිය යුතුයි.

මම මුලින්ම මොන්ටිසෝරි අධ්‍යාපනය ගැන කථා කරන්න කැමැතියි. මුල් ළමාවිය ගැන. මුල් ළමාවිය අධ්‍යාපනය ගැන අද අපට කිසිම ප්‍රතිපත්තියක් තිබෙනවාද? දරුවන්ට ළමා කාලයක් තිබෙනවාද? එක එක මොන්ටිසෝරිවල, එක එක පාඨමාලා තිබෙනවා. පුංචි කාලය කියන්නේ, හැම කෙනෙක්ම පිළි අරගෙන තිබෙනවා දරුවෝ මොන්ටිසෝරි යවන්නේ අකුරු උගන්වන්න නොවෙයි කියන එක. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා අධ්‍යාපන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. බස්නාහිර පළාතට නොවෙයි. මේ මොන්ටිසෝරි ක්‍රමය විධිමත් කිරීම මේ මුළු රටටම අතවශ්‍යයි. මොකද, මේ දරුවෝ මුලින්ම හැදෙන්නේ එතැන සිට. නිර්මාණශීලී දරුවෙක්ව අපට දකින්න නම්ඒක නිසා දරුවන්ගේ ළමා කාලය දරුවන්ට දිය යුතුයි. ඒ වාගේම මම ඔබතුමාට තව යෝජනාවක් කරනවා. අඩුම තරමේ එකේ සිට අට දක්වා පන්තිවලටත් ඉරිදා දවස දරුවන්ට පන්ති පවත්වන්න ඉඩ තියන්න එපා. 10, 11, 12 පන්තිවල ළමයින්ට සමහර විට උවමනා වෙයි. නමුත් අඩුම තරමේ අට වසර දක්වාවත් ඉරිදා දවසේ පන්ති පවත්වන එක නවත්වන්න කියන ඉල්ලීම අධ්‍යාපන ඇමැතිතුමාගෙන් ඉල්ලන්න කැමැතියි. මොකද, මේ අධ්‍යාපනය තුළ දැනුම කේන්ද්‍ර කර ගත්තු අධ්‍යාපනයක් අපේ රට තුළ තිබෙන්නේ. විශේෂයෙන්ම පෞද්ගලික පන්ති. අද අධ්‍යාපනය කියන්නේ දැනුම විතරක් නොවෙයි, මනුස්සයෙක් පූර්ණ මනුස්සයෙක් බවට පත් වෙන්නේ අධ්‍යාපනයෙන්. එකේදී දැනුම, ආකල්ප, කුසලතා කියන තුනම එකට එකතු කරගත් අධ්‍යාපනයක් අපට අත්‍යවශ්‍ය යුගයක්. අද අපි බිල්ඩින් හදනවා. බිල්ඩින් ගැන කථා කරනවා. හැම දෙයක් ගැනම කථා කරනවා. නමුත් අපේ අධ්‍යාපන ක්‍රමය අපි වෙනස් කළ යුතුයි. නැත්නම් මොන දේවල් අපට ලැබුණත්, ඇති වැඩක් වෙන්නේ නැහැ.

ඒ වාගේම ඔබතුමා යටතේ තිබෙන සංස්කෘතික විෂයය. අද කලාව කියන එක අපට නැති වෙලා. රසවින්දනය කියන එක, ඉතාමත් අඩු යුගයක් බවට පත් වෙලා. ඒවාට මුදල් වෙන් කරන්නේත් ඉතාමත් අඩුවෙන්. අද අපි මැෂින් බවට පත් වෙලා තිබෙනවා. ඉතින් මේ රසවින්දනය, කලාව, සංස්කෘතිය කියන එකට මීට වැඩිය මුදල් වෙන් කරලා මේක ඉස්සරහාට ගෙන එන්න කියන එක, අපේ ඉල්ලීමක් විධියට ඔබතුමාගෙන් ඉල්ලන්න කැමැතියි. ඒ වාගේම අපි යෝජනා කරන්න කැමැතියි, පන්ති කාමරයේ දරුවන්ට උගන්වන ගුරුවරයාගේ, ගුරුවරියගේ ගුණාත්මකභාවය වැඩි කිරීමට. මොකද, අද ගුරුවරුන්ට වැඩිය ගුරු මුදලාලිලා වැඩියෙන් ඉන්නේ. පන්තියේ කරන්නේ නැති දේවල් පුද්ගලික පන්තිවල කරන්නේ. දරුවාව හදාගෙන, දරුවාව හඳුනගෙන, දරුවාට මූලික අධ්‍යාපනයක් ලබා දෙන්න ගුරුවරුන්ව දැනුවත් කිරීම. ඒ වාගේම අපි කනගාටුවට පත් වෙනවා. මේ වසර තුළ අපට මුදල් වෙන් කරන්න බැරුව ගිය අධ්‍යාත්මික, ඒ වාගේම නායකත්ව පුහුණු වැඩ සටහන්වලට මුදල් වෙන් කිරීම නතර කරලා තිබුණා. අපි අධ්‍යාපන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. භෞතික දේවල්වලට වාගේම මිනිස්සුන්ගේ ආකල්ප, කුසලතා වැඩි දියුණු කරන වැඩ සටහන්වලට මුදල් වෙන් කිරීම අනුමත කර ලබා දෙන්න කියලා. ඒ වාගේම ඇමැතිතුමා ගැන කිව්වොත් එතුමා අලුතෙන් ඇවිල්ලා පැවතගෙන එන අධ්‍යාපනය වෙනස් ක්‍රමයකට ගෙන යන්න ඉතාමත් වෙහෙස මහන්සියක් දරලා, ශක්තියක් දරලා යම් ගුණාත්මකභාවයකට ගෙන එන්න උත්සාහ කරන ඇමැතිවරයෙක්. එතුමාට අපි සම්පූර්ණ සහයෝගය දෙනවා. භෞතික දේවල් වාගේම අනෙක් පැත්ත ගැනත් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කියන ඉල්ලීම අපි ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ අධ්‍යාපනය භෞතික මෙන්ම ගුණාත්මකව කරන්න කියන ඉල්ලීමත් අපි ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම අධ්‍යාපනය ගැන කථා කරන්න පටන් ගත්තොත්, ඉවර කරන්නේ කොතැනින්ද කියලා හිතා ගන්න අපහසුයි. ඉතා කෙටි කාලයක් හම්බ වුණේ. ඒ අවස්ථාව හරි ලබා දීම ගැන අපි ඉතාමත් ස්තූතිවන්ත වෙනවා.

[අ.භා. 02.26]

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ අතිශය වැදගත් මෙන්ම, සංවේදී, සංකීර්ණ අමාත්‍යාංශයක් වන අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ වැය ශීර්ෂයට කථා කරන්න විනාඩි 05 ක් වැනි කෙටි කාලයක් ලැබීම පිළිබඳව මම සතුටුවෙනවා. මේ කාලය ලබා ගත්තෙත් විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට බොහොම කරදර කරලා. මොකද, මේ කාලය පැන්සලක් උල් කරන්න යන කාලයටත් වඩා අඩුයි. කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේ මම හිතන්නේ සියලුම ගරු මන්ත්‍රීවරු කථා කරද්දී, මට ඇහුණු දෙයක් තමයි, අමාත්‍යාංශයට වරද

[ගරු රොයිස් විජිත ප්‍රනාන්දු]

පටවලා අමාත්‍යතුමා හොඳයි කියනවා. අමාත්‍යාංශය කියන්නේ, ගොඩනැගිල්ලක්. ඇමැතිතුමා හොඳ ඇමැතිවරයෙක්. ඒක මාත් පිළිගන්නවා. නමුත් ඉතින් වගකීම එතුමාට තමයි පැවරිය යුත්තේ. ඇමැතිවරයා හොඳ වෙන්නත්, අමාත්‍යාංශය වැරැදි වෙන්නත් බැහැ. ඒ නිසා මේකේ පූර්ණ වගකීම නිලධාරීන්ගේ සහ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා සතු විය යුතුයි. මොකද, මේක දරුවන් සමග, දෙමව්පියන්ගේ ජීවිත සමග ගැටෙන අමාත්‍යාංශයක්. දරුවෙක් පාසලට ඇතුළත් කරන මොහොතේ ඉඳලා දරුවා පාසලේ අවසන් අධ්‍යාපනය ලබලා ගේට්ටුවෙන් එළියට යනතුරු,බොහෝම සංවේදී ගමන් මගක ගමන් කරන අමාත්‍යාංශයක් තමයි මෙතුමාට භාර වෙලා තිබෙන්නේ. ඒ නිසාම තමයි එතුමාට ගල්මුල්, තාඩන පීඩන, විවේචන ලැබෙන්නේ. ඒ නිසා මේක ඔබතුමා සතු දැවැන්ත කාර්ය භාරයක්. මේ අමාත්‍යාංශය බස්නාහිර පළාතේ කොඳු නාරටිය හා සමානයි. මොකද, මේ නිලධාරීන් සෙල්ලම් කරන්නේ, මේ රටේ ප්‍රාණ වායුව, රුධිරය, හෙට දවසේ මේ රට භාර ගන්න ඉන්න දරු පැටවුන් පිළිබඳව. මේ දරුවන් පිළිබඳව අපි කථා කරද්දී, පාසලට ඇතුළත් කිරීමේදී ඉඳලා මේ නිලධාරීන්ට දැවැන්ත වගකීමක් තිබෙනවා. මම ඔක්කෝම කියන්නේ නැහැ. රාජකාරී මට්ටමින් සමහර නිලධාරීන්ගේ හැසිරීම දිහා බලද්දී සමහර විට මේ අය සීයලා වෙන්න පුළුවන්. දරු මුනුබුරන් ඉන්න අය වෙන්න පුළුවන්. මම කථාව අවසන් කරන්න කලින් මේවා සාක්ෂි එක්ක ඔප්පු කරන්නම්.

ගරු සභාපතිතුමනි, 2016 වසරේ ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා පළමුවැනි වසරට ඇතුල් කරන්න ක්‍රියාත්මක ලැයිස්තුවලින් ඉතුරු වුණු අතිරික්තයට මම දරුවන් තුන් දෙනෙක් නම් කරලා, ඔබතුමාට එවනවා. ඒ එව්වාම, මේ දරුවන් තුන් දෙනා මීගමුව ශාන්ත පීතර විද්‍යාලයට ඇතුළත් කිරීමට ඔබතුමාගේ ලේකම්වරයා විදුහල්පතිවරයාට අනුමැතිය දෙනවා. මේ දරුවෝ උදේ පාන්දර පාසලට අයත් නිල ඇඳුම ඇඳලා ගෙදර දෙමව්පියන්ට වැඳලා පාසලට යනවා. නමුත් පාසල් ගේට්ටුවෙන් ඇතුල් කරන්නේ නැහැ. ඒ ලේකම්වරුන්ගේ නම් මම කියන්නේ නැහැ. ලැජ්ජයි. ඒ නිලධාරීන්ට මට කියන්න තිබුණා, මේ දරුවන් ඇතුල් කරන්න විධියක් නැහැ. පාසලේ අතිරික්තයක් නැහැ. පුටුවක්, බංකුවක් නැහැ. ඇතුල් කරන්න බැහැ කියලා. නමුත් මේ දරුවෝ තුන් දෙනා ඇවිල්ලා මට වැඳලා, දෙමව්පියන්ට වැඳලා පාසලට යනවා. ඉතින් මේ ලේකම්වරු දරු මුනුබුරන් ඉන්න සීයලා. ලැජ්ජ වෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඒ ලේකම්වරු දීපු කොළ තුනත්, අමාත්‍යවරයාට ලියපු ලිපියත් මම අද මේ වැය ශීර්ෂයේදී සභාගත[1] කරනවා. ගරු සභාපතිතුමනි, මේක ඇතුළත් කරන්න.

ඒ වාගේම විනාඩි 05 ක් වැනි කෙටි කාලයක් තුළ ගරු සභාපතිතුමා හරහා මම ඔබතුමාට කියනවා. මධ්‍යම රජය විසින් ඔබතුමාට ළඟම පාසල හොඳම පාසල කියන සංකල්පය, ඒ Conceptඑක අද ඉදිරිපත් කරලා තිබෙනවා. ළඟම පාසල හොඳම පාසල කියන්නේ මම අර කථා කරපු කථාවේ මුලින් පටන් ගත්තු හොඳම පාසල කිරීමෙන් ඒ භෞතික සම්පත් සහ නගරයේ පාසල්වල තිබෙන ඒ සියලු දෑ දීලා ළඟම ඉන්න දරුවාට ළඟම පාසලට ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදය සකස් කර ගන්න තමයි මේක සකස් කරලා තිබෙන්නේ. නිදහසින් පස්සේ දේශපාලන නායකයෝ එක එක්කෙනා, එක එක්කෙනාට ඇඟිල්ල දික් කරගත්තාට අපේ පක්ෂයත්, ඔය පක්ෂයත් කරපු වැරැදි නිසා තමයි මේ ක්ෂේත්‍රය අද මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපතිවරයෙක්, එක්සත් ජාතික පක්ෂයේ අගමැතිවරයෙක්, ද්‍රවිඩ සන්ධානයේ විපක්ෂ නායකවරයෙක්, ජනතා විමුක්ති පෙරමුණේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයෙක් සමන්විත වුණු සංකල්පයකින් අද පාර්ලිමේන්තුවේ සංයුතිය ගොඩ නගලා තිබෙනවා. ඒ දේශපාලඥයෝ ඇති කරපු ප්‍රශ්න, ඒ අයගේ හෘදය සාක්ෂිය පිළි අරගෙන, අපි විසින් ඇති කරපු ප්‍රශ්න අපි විසින් ඒකාබද්ධ වෙලා යහපාලනයක් තුළින් අවසන් කළ යුතුයි කියන තැනට තමයි අපි මේ ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා ඔය මල් පොකුරු, මල් පොහොට්ටු නොවෙයි. අපි සියලු දෙනාම එක කුඩාරමක් ලෙස එකතු වෙලා, අපි විසින් ඇති කරපු ප්‍රශ්නය අප විසින්ම විසඳමු කියලා මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

මගේ විනාඩි 05 න් විනාඩියක් දෙකක් ඉතුරු වෙලා තිබෙනවා නම් ගරු සභාපතිතුමනි, ඒක ඊළඟ කථිකයාට දෙන්න. මොකද මට මේ කථාව ඉස්සරහාට ගෙනියන්න බැහැ. පුළුල් මාතෘකාවක් ඔස්සේ කථා කරන දෙයක්. මට අවශ්‍ය වුණේ, මෙතුමාගේ අවධානයට යොමු කරන්න මෙතුමාගේ ලේකම්වරු මේ කරන දේ නිසා තමයි මෙතුමාත් එක්කලා ද්වේෂයෙන්, වෛරයෙන් එක මන්ත්‍රීවරයෙක් හරි ඉන්නවා නම්, ඉන්නේ කියලා.

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.

එතුමාගේ නිල පැන නිසා නොවෙයි. එතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ නිල පැන් එතුමාට විරුද්ධව හසුරුවලා මන්ත්‍රීවරුන්ව අවතක්සේරු කරලා, මන්ත්‍රීවරුන්ව හැල්ලු කරන නිසා මන්ත්‍රීවරු සිත් තැවුලට පත් වෙලා තමයි එතුමා කෙරෙහි යම්කිසි වෛරයක් හරි තරහක් හරි ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා ළඟින් ඉන්න අය පිළිබඳව ඔබතුමා කල්පනාවෙන් වැඩ කරන්න කියන එක මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.31]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, මම මුලින්ම කියන්න ඕනෑ අපේ ගරු ඇමැතිතුමා හරි අවාසනාවන්ත පුද්ගලයෙක්. මොකද, එතුමා යම් අසහනකාරී තත්ත්වයක තමයි හිටියේ. එතුමා සෞඛ්‍ය ඇමැතිවරයා වශයෙන් ඉඳලා ඒක සුද්ධ කරගෙන, හදාගෙන එන්න ආපු ගමනක්. ඇමැතිකම නැතුව ගියා. අද ඒකේ ඵල වෙන අය භුක්ති විඳනවා වෙන්න පුළුවන්. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් එතුමා වැඩ පිළිවෙළක් හදාගෙන එන්න උත්සාහ කරනවා. ඉතින් අපි මන්ත්‍රීතුමන්ලා වශයෙන් ඒකට අත දෙන්න ඕනෑ. ඕනෑම කෙනෙකුට කාලයක් අවශ්‍යයි. තමන්ට සංකල්ප තියෙනවා. තමන්ට කාලයක ඕනෑ. විෂයය අවබෝධ කර ගන්න ඕනෑ. ඒ විෂයට අනුව අනුගත වෙන්න ඕනෑ. චක්‍රලේඛ, අණපනත් අනුව සියල්ල බලලා ඒ කාර්යය කරන්න කාලයක් අවශ්‍ය වෙනවා. ඒ කාලය අපි එතුමාට දීලා බලන්න ඕනෑ,එතුමා ඒ කාර්යය හරියට කරනවාද කියන එක පිළිබඳව. නොකරනවා නම් තමයි අපට අවස්ථා ගණනක් තිබෙනවා. එතුමාව නිලයෙන් පහ කරන්න පුළුවන්. අයවැයෙන් පරාජය කරන්න පුළුවන්. ප්‍රතික්ෂේප කරන්න පුළුවන්. ඉතින් අපි ඉදිරි කාලයේදී එතුමාගේ ක්‍රියා කලාපයට අතහිත දෙමු කියලා ආරාධනා කරනවා.

මට විනාඩි 04 ක කාලයක් තිබෙන නිසා මේ කරුණු කාරණා කියන්නත් අමාරුයි. දැනුම ආකල්ප වශයෙන් අපි මේ අධ්‍යාපනය ගොඩ නඟන්න උත්සාහ කළත්, අපි මේ ජන සමාජයට හැම කෙනාම අකුරු උගන්වන්න, පන්ති කාමරය හදන්න, ෆෑන් එක දාන්න, ටයිල් එක අල්ලන්න අපි කථා කරනවා ඇරෙන්න, මේ ජන සමාජයේ දරුවෙක් ජීවත් කරවන්න අපි කවුරුවත් කථා කරන්නේ නැහැ. අපි මහ පොලොවේ හිටගන්න පුළුවන් දරුවෙක් හදලා නැහැ. ඒ නිසා මේ මහ පොළොවේ හිටගෙන, මේ ජන සමාජයේ ගොඩ නැගෙන දරුවෙක් හදන්නට ඕනෑ. මම එදත් මේ සභාවේ කිව්වා. අම්මා බැන්නා කියලා අවුරුදු 13 ක දරුවා බෙල්ලේ වැල දාගන්නවා. එහෙම නම්, ඒ දරුවාට මෙහෙම ආකල්පයක් ඇති වුණේ ඇයි? පන්ති කාමරය තුළ ආකල්ප සංවර්ධනය වෙලා නැහැ. පන්ති කාමරය තුළ දැනුම විතරයි සංවර්ධනය වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි බලන්න ඕනෑ මේ අධ්‍යාපන ක්‍රමය තුළ ගුරු මාතාවන් නැවත පන්ති කාමරයට ගෙන එන්නේ කොහොමද? ගුරු පියවරු පන්ති කාමරයට ගෙන එන්නේ කොහොමද? උපාධිධාරී ගුරුවරයාට පත්වීමක් දීලා, උඹ ගිහිල්ලා උගන්නපන් කියනවාට වඩා, ගුරුවරයා පුහුණු කරන්නේ කොහොමද? ප්‍රාථමික අධ්‍යාපනයට එහෙම නැත්නම් වෙනත් අධ්‍යාපන ක්‍රමයකට පුහුණු කරලා, මේ පුහුණු ගුරුවරයෙක් පන්ති කාමරයට දෙන්න අධ්‍යාපන අමාත්‍යාංශය ගන්න උත්සාහය අපි අගය කරන්නට ඕනෑ. අපි ඒකට සහාය දෙන්නට ඕනෑ. ඒ වාගේම තමයි මම ගිය සැරේ අයවැයේ කථා කරලා කිව්වා මේ අධ්‍යාපන ක්‍රමයේ තිබෙන ගැටළුව තමයි - දරුවන් ඉන්න පියවරු වශයෙන් අපට තේරෙන්නේ - දරුවා අපට කරුණු ගණනාවක් කියනවා. වෙස් පන්තියට යන්න ඕනෑ. කරාතේ පන්තියට යන්න ඕනෑ. වොලිබෝල් ගහන්න ඕනෑ. ක්‍රිකට් ගහන්න ඕනෑ. පීනන්න යන්න ඕනෑ. නටන්න ඕනෑ. සංගීතවලට යන්න ඕනෑ. දරුවා ඇවිල්ලා කියන කොට හැම දේටම දෙමව්පියන්ට සල්ලි දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. එතකොට මේ අධ්‍යාපන ක්‍රමය තුළ මේ හැම කාර්යයක් සඳහාම ගුරුවරයා පුහුණු කරන්න පුළුවන්. ප්‍රාථමික අධ්‍යාපනය ලබන පුංචි දරුවා දවසින් දවස වැඩෙන කොට මේ දරුවා කුසලතාවලින් පරිපූර්ණ දරුවෙක් කරන්න ඕනෑ. දරුවාට සංගීත, නැටුම් ඉගෙන ගන්න පන්ති කාමරය තුළ ඒ අවස්ථාව උදා වෙලා නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි හැම කෙනාම මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ කියලා මම කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා, ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා දෙදෙනාම සභාවෙන් පිට වෙන්න. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා එළියට යන්න. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු. කරුණාකරලා දෙන්නාම එළියට ගිහිල්ලා ආපහු එන්න.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, දැක්කේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇහෙන්නේ නැද්ද? ඔබතුමා කථා කරන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, දරුවාට තිබෙනවා, මුල් ළමාවිය සංවර්ධන ආයතනය කියලා පූර්ව මනස සංවර්ධනය කරන ආයතන. අවසානයේ දරුවා පළමුවැනි පන්තියේ විධිමත් අධ්‍යාපනයට එනකොට මේ පෙර පාසල් ප්‍රඥප්තියක් ගොඩ නගලා කියනවා, මේ දරුවාට අකුරු උගන්වන්න එපා. දරුවාට හැඩ තල ටික උගන්වලා එවන්න කියන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ. මට මේ පුස්තකාල සම්බන්ධයෙන් කියන්න ගොඩක් දේවල් තිබුණා. ගරු සභාපතිතුමනි, 1996 ලෝක කුසලානය දිනන්න කළමනාකරණය කිරීම තුළින් තමයි ඒ ලෝක කුසලානය ගෙන ආවේ. ඔබතුමා හිතන්න ඔබතුමාට ගමනක් යන්න පුළුවන් කියලා.

[අ.භා. 02.36]

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධව මුලින්ම ස්තුතිවන්ත වෙනවා. මම හිතනවා අධ්‍යාපන විෂයය සම්බන්ධව කථා කිරීමේදී, ගියවර අධ්‍යාපන විෂයයට අදාළව අපි කරපු ඉල්ලීම අනුව ගරු අධ්‍යාපන ඇමැතිතුමා මීගමුවේ මම නියෝජනය කරන ප්‍රදේශයේ, විශේෂයෙන්ම අධ්‍යාපන ගුරුවරුන්ගේ ගැටළුව සමතයට පත් කරන්න මැදිහත්වීම සම්බන්ධයෙන් එතුමාටත්, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මගේ අවංක ආදර ස්තුතිය මුලින්ම පුද කරනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම පළාතේ තිබෙන දෙමළ පාසල්වල ගුරු පුරප්පාඩුවමතක් කරන්න ඕනෑ. දැනටමත් එතුමා විසින් අපට යම්කිසි මට්ටමක ගුරු පුරප්පාඩු සඳහා අවශ්‍ය කටයුතු සලසා දීලා තිබෙනවා. ඒ සම්බන්ධවත් මතක් කරනවා. ඒ වාගේම දැනට පළාතේම ගුරු පුරප්පාඩු 698 ප්‍රමාණයක් තියෙන කොට ගම්පහ දිස්ත්‍රික්කයේ ගුරුවරු 216 ක් සහ කොළඹ දිස්ත්‍රික්කයේ 202 ක්, ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ 280 ක අවශ්‍යතාවයක් තිබෙනවා. ඒ වුණත් ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම මතක් කරනවා දෙමළ පාසල්වල ගුරුවරුන්ගේ පුරප්පාඩු එක පැත්තකින් තියෙන කොට, විශේෂයෙන්ම ගණිතය සහ විද්‍යාව කියන විෂයයන්ට අදාළව තමයි දෙමව්පියන් වාගේම ගුරුවරුන් විසිනුත් අවධානය යොමු කරන්නේ. ඒ වාගේම දෙමළ මාධ්‍යයෙන් ගණිතය සඳහා ගුරුවරුන්ගේ අවශ්‍යතාවය 56 ක් වෙලා තිබෙන කොට, මම හිතනවා කොළඹ දිස්ත්‍රික්කයේ ගුරුවරුන්ගේ අවශ්‍යතාවය 05 කට සීමා වෙලා තියෙනවා. ඒ වාගේම, ගරු සභාපතිතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයේ ගුරුවරුන් 26 කගේ අවශ්‍යතාවයක් සහ කළුතර දිස්ත්‍රික්කයේ ගුරුවරු 25 කගේ අවශ්‍යතාවයක් පවතිනවා. ගරු සභාපතිතුමනි, ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ ගණිත ගුරුවරු 05 ක් අවශ්‍ය වනකොට ගම්පහ දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය ගණිත ගුරුවරුන්ගේ 26 ක් සහ කළුතර දිස්ත්‍රික්කයේ ගුරුවරුන් 25 ක අවශ්‍යතාවය - මම හිතන විධියට ගුරුවරු ස්ථානගත කිරීමේදී, යම් දෝෂයක් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමා හරහා අධ්‍යාපන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. කොළඹ දිස්ත්‍රික්කයේ දරුවන්ට අධ්‍යාපනය හැදෑරීමේ අයිතිය තිබෙනවා වාගේම ගම්පහ දිස්ත්‍රිකයේ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ ඒ අහිංසක දරුවන්ටත් ගණිතය හැදෑරීමේ අයිතීන් පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා.

ඒ වාගේම මම විශේෂයෙන් මතක් කරනවා පාසල් ක්‍රීඩා සම්බන්ධව. මොකද, අපි පාසල් යන කාලයේ ඉඳලා 11 න් පහළ, 13 න් පහළ ඒ වාගේම 15 න් පහළ, 17 න් පහළ, 19 න් පහළ කියලා තමයි ක්‍රීඩා තරගවලට අපි ඉදිරිපත් වුණේ. දැනටමත් මට ආරංචි වුණා, අධ්‍යාපන අමාත්‍යාංශය හරහා 2017 වර්ෂයේ ඉඳලා 12 න් පහළ, 14 න් පහළ, 16 න්

පහළ, 18 න් පහළ සහ 20 න් පහළ වශයෙන් වෙනස් විධියකට මේ තරග තියන්න ක්‍රමවේදයක් හදලා තිබෙනවා කියලා.ඒ නිසා මම විශේෂයෙන්ම ක්‍රීඩා කටයුතු භාරව අධ්‍යාපන ඇමැතිතුමා ඉන්න නිසා එතුමාගේ අවධානය යොමු කරනවා. මොකද, ඉස්සර පාසලේ නිවාසාන්තර ක්‍රීඩා තරග තිබුණා. ඊට පස්සේ කොට්ඨාශ තරග තිබුණා. ඊට පස්සේ කලාප තරග තිබුණා. ඊට පස්සේ පළාත්, ඒ වාගේම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය අවසන්. කරුණාකර වාඩි වෙන්න.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

අද මේ අලුත් චක්‍රලේඛය තුළින් කොට්ඨාශ තරග අවලංගු කරලා දරුවා නිවාසාන්තර ක්‍රීඩාවලට පස්සේ කලාප තරග සඳහා යොමු කිරීම තමයි මම හිතන විධියට මේ චක්‍රලේඛය තුළින් සිදු වෙලා තිබෙන්නේ. ඒ නිසා දුප්පත් දරුවන්, ඒ දුප්පත් පාසල්, ඒ වගේම කුඩා පාසල් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. කුඩා පාසල් සඳහා කොට්ඨාශ තරගවලට යන්න පුළුවන් අවස්ථාව අහිමි කරලා කලාපයට යනකොට කුඩා කුඩා පාසල් සඳහා යන්න පුළුවන් අවස්ථාව මුළුමනින්ම නැති වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා. ඔබතුමා කථා කරන්න. කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

විශේෂයෙන්ම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මූලාසනයට ගරු කරන්න. ඔබතුමාට සිංහල තේරෙන්නේ නැද්ද?

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 02.42]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මූලාසනයෙන් නිවේදනය කළාට පස්සේ කථාව අවසන් කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, රංජිත් සෝමවංශ අපේ අධ්‍යාපන ඇමැතිතුමාට විටෙක අදහසක් කියැවුණා, අවාසනාවන්ත ඇමැතිවරයෙක් කියලා. මට හිතෙන්නේ එතුමා වාසනාවන්ත ඇමැතිවරයෙක් කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් සමාවෙන්න. සංවිධායකතුමා විනාඩි 04 ට, 05 ට මේ වාගේ කථා දාන්න එපා. ඔබතුමන්ලා මේ කරන්නේ, විහිළුවක් නේ? විනාඩි 03, 04 ට කථා දෙන්න ඕනෑ නැහැ. දෙනවා නම් විනාඩි 10 ක් දෙන්න. ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේදෙපැත්තටම මම කියන්නේ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ඇමැතිතුමා තමයි ඒ වෙලාවල් දීලා තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමැතිතුමා දුන්නාට මූලාසනයේ ඉන්නේ මම නේ? මෙතුමාට දැන් විනාඩි 05 ක්වත් නැහැ.

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

ඇමැතිතුමා විසින් තමයි අදහස් ප්‍රකාශ කිරීමට වෙලාව ලබලා දීලා තිබෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ රංජිත් සෝමවංශ අධ්‍යාපන ඇමැතිතුමා එහෙම අවාසනාවන්ත ඇමැතිවරයෙක් නොවෙයි. එතුමා දරපු අමාත්‍යාංශයට වඩා රටට වැඩ කරන්න පුළුවන් අමාත්‍යාංශයක් තමයි අද ලැබිලා තිබෙන්නේ. ඒ වාගේම රටක අනාගතය දරුවෝ. ඒ රටේ අනාගතය නිර්මාණය කරනවා නම් ඒ නිර්මාණය කරන්න මූලික වෙන්නේ රටේ දරුවෝ. ඒ වාගේම රටේ දරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන්, රටේ දරුවන් නිර්මාණය කිරීමේ වගකීම තමයි එතුමාට මූලික වශයෙන් පැවරිලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. මෙතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි රටේ සහජීවනය, රටේ සදාචාරය, රටේ ශීලාචාර සම්පන්නභාවය, ඒ වාගේම ගුණ යහපත්කම ඇති කරන සංස්කෘතිය, කලා කටයුතු, මනුස්සකම් ඇති මිනිස්සු ඇති කිරීම සහ නිරෝගී මිනිසුන් බිහි කරන ක්‍රීඩාව ඇතුළු ආයතන ගණනාවක් එතුමාට තමයි ලැබිලා තිබෙනවා. ඒ නිසා මේ ශ්‍රී ලංකා ධරණීතලය තුළ බස්නාහිර පළාත කියන ප්‍රධාන පළාත් සභාවේ ඉතාම වැදගත් අමාත්‍යාංශයක් සම්බන්ධව තමයි එතුමා කටයුතු කරන්නේ. ඒත් එක්කම පසුගිය දිනවල එතුමාට බරපතළ ප්‍රශ්න තිබුණා. අද එතුමා සතුටෙන් ඉන්නවා. අද එතුමාට එහෙම ප්‍රශ්න නැති බවක් පේනවා. අද එහෙම අවාසනාවන්ත බවක් පේන්නේ නැහැ. නමුත් මේ හැමෝම ඉල්ලීමක් කරන්නේ ඔබතුමාගෙන්. අපි හැමෝගෙම ආදරයක්, ගෞරවයක් ඔබතුමාට තිබෙනවා. එක පැත්තකින් ජ්‍යෙෂ්ඨයෙක් විධියට. ඒ වාගේම ඔබතුමා මනුස්සකම් දන්න කෙනෙක් විධියට යම් විධියකට ඇහුම්කන් දෙනවා. නම්‍යශීලී වෙනවා. විටෙක ඔබතුමා කථා කරනවා, ඇහුම්කන් දෙනවා වැඩිද කියලාත් හිතෙනවා. නමුත් සමහර විට ගරු සභාපතිතුමනි, ඒ ඒ අංශවල වැඩ කටයුතු ප්‍රමාදයන් නිසා තමයි අපේ මන්ත්‍රීවරුන්ගේ සහ අනෙක් අයගේ ප්‍රසාදය බිඳෙන අවස්ථාවල් තිබෙන්නේ. නමුත් ඔබතුමා පිළිබඳව ද්වේශයකින් කටයුතු නොකරන නිසා තමයි මේ හැමෝම එකතු වෙලා ඔබතුමාට සහයෝගය දෙන්නේ.

ඔබතුමාගේ කටයුතුවලට සුභ පතන ගමන් මම මෙතැනදී විශේෂයෙන් ඉල්ලන්නේ, පසුගිය කාලයේ අපි නිරන්තරයෙන් 2014 වර්ෂය ගත්තොත් මේ රටේ දරුවෝ තමයි අනාගතය කියලා හිතලා විශේෂයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ දරුවන්ට හොඳම දේ දෙන්න පාසල් විශාල ප්‍රමාණයක සංවර්ධනය සඳහා අපි සියලු දෙනාගේ දායකත්වයෙන් ගොඩ නැඟුනා. මොකද, දරුවෝ හදන්න අධ්‍යාපනය ගොඩ නඟනවා නම්, ඒ සඳහා මූලික වශයෙන් කාරණා දෙකක් ඉෂ්ට වෙන්න ඕනෑ. භෞතික සම්පත් ටික දෙන්න ඕනෑ. පුස්තකාල ගොඩනැගිලි, ඒ වාගේම පාසල් ගොඩනැගිලි, ඩෙස් බංකු ටික දෙන්න ඕනෑ. ඒ වාගේම මානව සම්පත විධියට ගුරුවරු ටික ලබා දෙන්න ඕනෑ. ඒ දෙකම ඉතා හොඳින් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේදී දුන්නා. ඒ නිසා දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වැඩ කොටසක් කළා. ඒ වාගේම දරුවන්ගේ මූලික අඩිතාලම, ගෙදර අත්තිවාරම හා සමානයි දරුවන්ගේ පෙර පාසල් අධ්‍යාපනය. පෙර පාසල් ගුරුවරයාට අවශ්‍ය පහසුකම් දෙන්න කටයුතු කළා විතරක් නොවෙයි. පෙර පාසල්වල ගුරුවරුන්ගේ ප්‍රශ්න විසඳීම සඳහා මූලික වශයෙන් රුපියල් 2500/- ක් ලබා දෙන්නත් එතුමා 2015 අයවැයට යෝජනා කළා. ඉතින් ජාතියේ අවාසනාවකට ඊට වඩා වැඩි දෙයක් දෙන්න තමයි යහපාලන රජය ආවේ. හැබැයි මහින්ද රාජපක්ෂ මැතිතුමා දෙන්න යෝජනා කරපු රුපියල් 2500/- මුදල රුපියල් 250/- වුණා. කනගාටුවෙන් කියන්න ඕනෑ. දැන් වනකොට රුපියල් 250/- ලැබෙන්නෙත් නැහැ. ඒ නිසා මේ දරුවාගේ මූලික අඩිතාලම වුණු පෙර පාසල පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. ඒ ගුරුවරු නොවිඳිනා දුක් විඳලා දරුවන් වෙනුවෙන් වැඩ කරන්නේ. ඒ ගැන බලන්න ඕනෑ. ඒ වාගේම ප්‍රමිතියක් තියෙන්න ඕනෑ. නිවැරැදි වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ. ඔබතුමාට ඒ සඳහා මැදිහත් වෙලා කටයුතු කරන්න හැකියාව තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ රටේ මිනිස්සු විශේෂයෙන්ම මනුස්සකම් තිබෙන ඒ වාගේම මේ රට ධර්මද්වීපය කියලා අපි හැඳින් වූයේ. මේ ධර්මද්වීපය තුළ

වයසට ගියාම සැදෑ සමයේ දරුවන්ගේ සැලකිල්ල ලබලා ගෙදර ඉන්න ඕනෑ අම්මා තාත්තා අද බලු කූඩුවලට යනවා. කුකුල් කූඩුවලට යනවා. හැබැයි බල්ලෝ, කුකුල්ලු ගෙවල් ඇතුළේ මෙට්ට උඩ හැදෙමින් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

බොහොමත්ම ස්තූතිවන්ත වෙනවා මේ පිළිබඳව මෙහෙමවත් අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව. මම ගරු ඇමැතිතුමාටත්, ඔබතුමාටත් ස්තූතිවන්ත වෙමින් මේ කියපු කාරණා කෙරෙහි අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ස්තූතියි.

[අ.භා. 02.47]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා. ඇත්තටම බස්නාහිර පළාත් සභාවේ අයවැය ගත්තාම ලංකාවම බලාගෙන හිටියේ මේ අධ්‍යාපන වැය ශීර්ෂය සම්බන්ධවයි. මේක තමයි යථාර්ථය. පුවත්පත්වලින්, ජනමාධ්‍යයෙන් ලොකු විවේචන තිබුණා. ලොකු ප්‍රසිද්ධියක් ලබා දුන්නා. අද දවසේ මොනවාද වෙන්නේ? අද දවසේ මොනවාද වෙන්නේ කියන එක තව විනාඩි 05 කින් බලා ගන්න පුළුවන්. කෙසේ වෙතත් අද දවසේ වුණත් ගණපූරණය නොමැතිව දෙපාරක් නවත්වලා, ඒ වාගේම යම් යම් සිද්ධි ඇති වෙලා මේ අයවැය පිළිබඳ විවාදය අද කරගෙන යෑම සම්බන්ධව මම සතුටු වෙනවා.

ඒ වාගේම මෙතුමාගේ ග්‍රන්ථයේ තිබෙනවා, නූතන ශිෂ්‍යයා තවදුරටත් පන්ති කාමරයේ ශිෂ්‍යයෙක් නොවෙයි. එහෙම නම් එහි තේරුම, අධ්‍යාපනය නවීන තාක්ෂණයට ගෙන යෑම. එම නිසා මම ඉල්ලීමක් කරනවා, ඒ ගැන සතුටු වෙනවා වාගේම මම කෙටි යෝජනාවල් ටිකක් කරලා මගේ කථාව අවසන් කිරීමට බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, විදුහල්පති ශ්‍රේණි සම්බන්ධව කථා කළා. ශ්‍රේණි සමත් උදවියට යම් යම් පාසල් නොලැබීම සම්බන්ධව කථා කළා. අපට අග්‍රාමාත්‍යතුමා සඳහන් කළ පරිදි, හෙට අනිද්දා කැබිනට් තීන්දුවක් ලබා දෙන බවට ප්‍රකාශ කළා. මම ඉල්ලීමක් කරනවා, සාධාරණය ඉෂ්ට කරන්න කියලා. මම උදාහරණයක් කියන්නම්. කැලණිය අධ්‍යාපන කොට්ඨාශයේ, කැලණිය ජනාධිපති විද්‍යාලයේ ශ්‍රේණි සමත් තුන් දෙනෙක් එක පාසලට එව්වා. තුන්වැනි ශ්‍රේණිය සමත් තුන් දෙනෙක් එකම පාසලට එව්වා. හැබැයි, ඒ විද්‍යාලයේ විදුහල්පතිතුමිය, ඉතාම කීර්තිමත් පරිපාලන සේවයේ පළමුවැනි ශ්‍රේණිය තිබෙන විදුහල්පතිතුමියක්. තව තුන් දෙනෙක් එවනවා. මොන තරම් දෙයක්ද? එකම තුන් දෙනෙක් එවනවා, එක පාසලකට. ඒ ඉන්න විදුහල්පතිතුමිය පරිපාලන සේවයේ. මේක එක උදාහරණයක්. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා දන්නවා මහර අධ්‍යාපන කොට්ඨාශයේ කිරිකිත්ත මහ විද්‍යාලයේ විදුහල්පතිතුමාව මාරු කිරීම සම්බන්ධව. දැන් දෙමව්පියන්ගේ නොකඩවා අඛණ්ඩ වැඩ වර්ජනයක් තිබෙනවා. ඇයි හේතුව? ගරු සභාපතිතුමනි, ඒ විදුහල්පතිතුමා පත් කළේ මෑතකදී. මාස දෙකයි තුනයි. තුන්වැනි ශ්‍රේණිය පාස් වුණු එක්කෙනෙක්. පොඩි පාසලක්. ඒ දෙමව්පියන් වැළඳගෙන ඉවරයි. එහෙම නම් ඔබතුමා මගින් මම ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේක කඩිනමින් නවත්වන්න. නැතිනම් මමත් ඒ ස්ථානයට ගිහිල්ලා ඉන්නවා. වචන දෙකක් නැහැ. මමත් ඉන්නවා. සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාත් මෙතැන ඉන්නවා. මහර අධ්‍යාපන කොට්ඨාශයේ අපි දෙන්නත් ඒ අඛණ්ඩ වර්ජනයට එකතු වෙලා මේ පාසල රැක ගන්න කටයුතු කරන බව ප්‍රකාශ කරනවා. මේ දාපු විදුහල්පතිව මාරු කිරීම නවත්වන්න කියන එක පිළිබඳව අවංක ඉල්ලීමක් කරනවා. ඒ වාගේම පිලපිටිය ජනාධිපති විද්‍යාලය කියන්නේ, මගේ දෙමව්පියන් ඉගෙන ගත්තු විද්‍යාලය. මගේ ආසන්නයේ තිබෙන විද්‍යාලය. දැන් පැරණි ගොඩනැගිලි දෙකක් කඩා ඉවත් කරමින් යන වෙලාවේ 2017 වර්ෂයේදී නව සිව්මහල් ගොඩනැගිල්ලක් ලබා දෙන්න ඔබතුමා පොරොන්දු වෙලා තිබෙනවා. අපේ ව්‍යුහ කමිටුවේ අනුමත වෙලා තිබෙනවා. එය ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මෙතුමාට අයිතියක් නැහැ කැලණිය ගැන කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

බයිලා ගහන්නේ නැතුව ඉන්න. ඔබතුමාගේ ඇමැතිකම ගියා. නෝනාගේ නගරාධිපතිකම ගියා. මහ ඇමැතිතුමා -

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, ඒ වාගේම එතුමාගේ වැය ශීර්ෂයට අයත් වෙනවා සංස්කෘතික විෂයය. කැලණි රජමහ විහාරස්ථානය කියන්නේ, බස්නාහිර පළාත් සභාවේ තිබෙන වැදගත් ස්ථානයක්. ගරු ප්‍රධාන ඇමැතිතුමා වැසිකිළි පද්ධතියක් පවා ඉදි කරන්න කටයුතු කිරීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. මේ දවස්වල පෙරහැර තිබෙනවා. ඒක ඓතිහාසික පෙරහැරක්. සංචාරකයින් ආකර්ෂණයට පත් කරන පෙරහැරක්. අපි වසරක් පාසා මේ පළාත් සභාවෙන් උදව් උපකාර කරනවා. ඒ සම්බන්ධව මැදිහත් වෙලා ගරු ඇමැතිතුමාම කැලණිය රජමහ විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ හමු වෙලා, ඒ අවශ්‍යතාවය ඉෂ්ට කරන්න කියන ඉල්ලීමත් කරනවා. ඒ වාගේම කැලණියේ ඉන්න එකම පළාත් සභා මන්ත්‍රීවරයා මම. හැම පක්ෂයක්ම ගත්තොත් මම විතරයි ඉන්නේ. ඒක තේරුම් ගන්න. හැබැයි ඔබතුමන්ලා වෙන වෙන මන්ත්‍රීවරු ඒ ආසනයට ගෙනිහිල්ලා ව්‍යාපෘති කිරීම සම්බන්ධව මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. පක්ෂ භේදයෙන් තොරව අපි එකට වැඩ කරනවා වාගේම ඔබතුමාව කෙලින් කරන්න අද කටයුතු කරනවා වාගේම ඉදිරියේදිත් (බාධා කිරීම්) සාධාරණ ලෙස සලකන්න කියලා ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, රීති අංක 3 (2) සහ 3 (3) කෙරෙහි. ගරු සභාපතිතුමනි, මේ සභාවේ අසුන් පනවන්නේ ජ්‍යෙෂ්ඨත්වය අනුව. දැන් ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා වාඩි වෙලා ඉන්නෙත්, කථා කළෙත් වැරදි ආසනයේ ඉඳගෙන. ඔබතුමාට මතක් කරනවා. එතුමා දිගින් දිගටම කිව්වා, එතුමා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙක් කියලා. එතුමා ඒ වාගේම කථා කරලා කිව්වෙත් එක්සත් ජාතික පක්ෂයේ මගේ නායකයා. මගේ පක්ෂය කියලා කිව්වේ. එතුමා දැන් පක්ෂ නායකයෙක් නොවෙයි. ඒ නිසා කරුණාකරලා මේ ආසනයෙන් මෙතුමා අයින් කරන්න ඕනෑ. මෙතුමාට ඉදිරි පෙළ ආසනයක් හිමි වෙන්න විධියක් නැහැ.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු සභාපතිතුමනි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට මේක අදාළ වෙන්නේ නැද්ද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා රීති -

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

එතුමාත් සන්ධානයෙන් ඉල්ලලා -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා රීති අනුව -

[සභාවේ ඝෝෂා]

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

එතුමා පක්ෂ නායකයෙක් විධියට නොවෙයි, ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ඔබතුමා තීරණය කරනවා නම්, මට වෙනත් ආසනයක් දෙන්න. මම යන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම තීරණයක් දෙන්නම්.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ආසනය මාරු කළා කියලා කට වහගන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මෙතුමා වැරදි ප්‍රකාශයක් කළේ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා පක්ෂ නායකයෙක් නොවෙයි. හිටපු අමාත්‍යවරයෙක් හැටියට එතුමා ඉන්නේ. එතුමා පක්ෂ නායකයෙක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ ගැන හොයලා බලලා තීරණයක් ගන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේදී ඔබතුමන්ලාගේ ප්‍රශ්නයක් ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ඇතුළු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ හැන්සාඩ් එකේ තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

යම් යම් අවස්ථාවලදී මම ඇහුවා ඔබතුමාගෙන් ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායමට ලැබෙන ස්ථානය මොකක්ද කියලා. මොකද මෙතුමා ප්‍රකාශයක් කළා, ජෙනරාල්ගේ පක්ෂයෙන් එක්සත් ජාතික පක්ෂයට එකතු වුණා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට එක්සත් ජාතික පක්ෂයට එකතු වුණා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා ඔබතුමාට අවස්ථාව. විනාඩි 04 ක් තිබෙනවා.

[අ.භා. 02.55]

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, 2017 අයවැය සම්බන්ධව පළාත් සභාවේ මගේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රධාන අමාත්‍ය මණ්ඩලය, ඒ වාගේම අපේ ගරු විපක්ෂ නායකතුමා ප්‍රධාන ගරු මන්ත්‍රීතුමන්ලා සියලුම මන්ත්‍රීතුමන්ලා මගේ සහෝදරයෝ. ඒක මම හැමදාම දන්නවා. ඇමැතිකමක් තිබුණත් නොතිබුණත් මම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. මට මේ අධ්‍යාපනය සම්බන්ධව ලොකු බරක් දැනෙන කෙනෙක්. මම බොහොම අවංකව කියන්න ඕනෑ. මට වැඩ කරන්න ලොකු ආශාවක් තිබෙන කෙනෙක්. ඒ නිසා මට මේ ලැබුණු අවවාද, අනුශාසනා බොහොම සතුටින් භාර ගන්න කෙනෙක්. මට බොහෝ තැන්වල නිහතමානීකම ඇහුනා. නිහතමානීකම තිබෙන්නේ, මම හැම වෙලාවේම විශ්වාස කරනවා. මේ සභාවේ සියලුම දෙනා මට වැඩිය බොහෝ දේවල් දන්නවා ඇති කියලා. ඒ නිසා එතුමන්ලා දෙන දේ මම ලබාගෙන, උකහාගෙන, ඒ කරුණු කාරණා මගේ අමාත්‍යාංශය හරහා නිවැරැදි තැනකට ගොඩ නඟන්න තමයි මම බලාපොරොත්තු වෙන්නේ. මට චෝදනා කළත්, මට දොස් කිව්වත්, මට බැණ්නත් මම කිසිම කෙනෙක් එක්ක කවදාවත් අමනාප නැහැ. මම ඒ කාලය පහු කරලා තියෙන්නේ. මට සාමාන්‍යයෙන් ස්ථාවරව, ඍජුව සියලුම අභියෝග තුළ රැඳී ඉන්න පුළුවන් කෙනෙක්. ඒ මගේ හැටි. මට අද දවසේ ගෙවෙන තත්පරය පවා මට මේ වාගේ ලස්සන පැටව් ඉන්නවා. ලංකාවේම ඉන්න දරුවෝ අපේ. නමුත් බස්නාහිර පළාත් සභාවේ අපේ දරුවෝ ගැනමට ඍජු වගකීමක් තියෙනවා. ඒ නිසාවෙන් මේ දරුවන්ගේ විභාග

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

පිළිබඳව, මේ දරුවන්ට අවශ්‍ය අධ්‍යාපන පහසුකම් පිළිබඳව, මේ දරුවන්ට අවශ්‍ය ගුරුවරු පිළිබඳව, නිවැරැදි විදුහල්පති පරිපාලන කටයුතු පිළිබඳව, විවිධ විෂයන්වල ඌණතාවයන් පිළිබඳව, ප්‍රතිඵල බිඳ වැටීම් පිළිබඳව මට විශාල වගකීමක් තිබෙනවා. මම දැක්කා, මන්ත්‍රීතුමන්ලා මට ස්තුති කරනවා. විශේෂයෙන්ම මම එනකොට කල්පනා කළා, ද්‍රවිඩ මාධ්‍ය පිළිබඳව ලොකු වගකීමක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ නිසාවෙන් අද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කරන්න දෙයක් නැහැ. මම ඔබතුමාට ඊයේ ඉඳලා කිව්වා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හොඳයි, හොඳයි. මම මීට වැඩිය කථා කරන්නේ නැහැ. මා වෙනුවෙන් අදහස් උදහස් දක්වපු සියලු දෙනාට හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමා ඔබතුමාගේ වගකීම අප වෙනුවෙන් ඉතාම ගෞරවාන්විතව ඉටු කළා. මේ දෙපාර්ශවයම ඔබතුමන්ලාගේ අදහස් උදහස් ගෞරවාන්විතව ඉටු කළා. මේ අයවැයෙන් පස්සේ මගේ අමාත්‍යාංශයට කැඳවලා, මීටත් වඩා හොඳින් සාකච්ඡා කරලා, ලබන අවුරුද්දේ මගේ අඩුපාඩු හදාගෙන මම කටයුතු කරන්න බලාපොරොත්තු වන බව බොහොම අවංකව කියන්න ඕනෑ.

***අ.භා. 02.59 ට, අංක 108, හා 129 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***
*Discussion on the Expenditure Head Nos 108 and 129 concluded at 02.59 p.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි.

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ මයික් එක වැඩ කරන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, අපටත් විනාඩි 05 ක් හරි කථා කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් බැහැ. කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. සභාව නිශ්ශබ්ද වන්න. අද දවසේ විවාදයට ලක් වූ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් 108 සහ 126 විවාදය මේ මොහොතේ අවසන් වුණා. ඒ විවාදය වෙනුවෙන් විපක්ෂයේත් ආණ්ඩු පක්ෂයේත් මන්ත්‍රීතුමන්ලා රාශියක් ඉතාමත් වැදගත් කරුණු කාරණා ප්‍රකාශ කළා. මම ඒ සියලුම දෙනාට ස්තුතිවන්ත වෙනවා. ශීර්ෂ අංක 108 සහ 126 අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂ සම්බන්ධව සභාවේ බෙදීමක් තිබෙනවාද?

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් නැහැ.

***ශීර්ෂ අංක 108 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 108 was proposed and adopted.*

***ශීර්ෂ අංක 129 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 129 was proposed and adopted.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී යසපාල කෝරලගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම මේ අවස්ථාවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට විශේෂ නිවේදනයක් ප්‍රකාශ කරනවා.

*"2016.12.15 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් බටහිර වෛද්‍ය සහ දේශීය වෛද්‍ය සායනයක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. එම සායනයේදී රුධියේ සීනි ප්‍රමාණය, රුධිරයේ කොලෙස්ටරෝල් ප්‍රමාණය, උස, බර මැනීම, දන්ත, අක්ෂි පිළිබඳව පරීක්ෂාවන් සිදු කරන බව දැනුම් දී ඇති බව ඔබතුමන්ලා වෙත දැනුම් දෙනවා. සායනයට පැමිණීම හා සම්බන්ධ උපදෙස් පත්‍රිකාවක් 2016.12.14 වන දින ඔබතුමන්ලා වෙත ලබා දීමට කටයුතු කරන බවත් කාරුණිකව දැනුම් දෙනවා."*

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 107** | **-** | **මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 121** | **-** | **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 122** | **-** | **සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 123** | **-** | **ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 124** | **-** | **නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 125** | **-** | **කර්මාන්ත දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 103** | **-** | **සමූපකාර සේවක කොමිෂන් සභාව** |
| Head No 107 | | Ministry of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction,Estate Infrastructure facilities, Industries and Rural Development |
| Head No 121 | | Department of Motor Transport |
| Head No 122 | | Department of Co-operative Development |
| Head No 123 | | Department of Registration of Business Names |
| Head No 124 | | Department of Housing Commissioner |
| Head No 125 | | Department of Industries |
| Head No 103 | | Co-operative Employee's Commission |

*[සංකේත කපා හැරීම ]*
*[Symbolic write-off]*

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳව අමාත්‍යාංශ වැය ශීර්ෂ අංක 107, 121, 122, 123, 124, 125 හා 103 සඳහා රුපියල් 10/- ක සංකේත මුදලක් අඩු කළ යුතු යැයි"* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විවාදය ආරම්භ කිරීම සඳහා ගරු ජගත් පින්නගොඩ විතාන ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 03.05]

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ගරු ඇමැතිතුමාගේ වැය ශීර්ෂයේදී මම පළමුවෙන්ම ප්‍රවාහනය පිළිබඳව කථා කරනවා. ඔබතුමාගේ අමාත්‍යාංශයේ විශාල බස් රථ සංඛ්‍යාවක් ධාවනය කරන පුද්ගලයෙක් වශයෙන් මම කියනවා, පසුගිය වර්ෂයේ තමුන්නානසේගේ මූල්‍ය ප්‍රගතිය 29% යි. ඉතින් ඔබතුමාගෙන් මම අහනවා.ඔබතුමාට කියන්න උත්තරයක් තිබෙනවා. ඔබතුමා මේ ළඟදී අමාත්‍යාංශය භාර ගත්තා කියලා. නමුත් මුළු අවුරුද්ද පුරා අමාත්‍යවරු කී දෙනෙක් හිටියත් 29% ක ප්‍රගතියක් පෙන්වන කොට මම අහනවා. අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් අහනවා. ඒක තමුන්නාන්සේලාගේ අකාර්යක්ෂමතාව පෙන්නුම් කිරීමක් නොවෙයිද කියලා. මොකද, මේ ක්ෂේත්‍රයේ ගැටළු රාශියක් තිබෙනවා. විශේෂයෙන්ම ප්‍රායෝගිකව ප්‍රවාහන ක්ෂේත්‍රයට සම්බන්ධ වෙලා ඉන්න පුද්ගලයෙක් වශයෙන් මම දන්නවා ගරු ඇමැතිතුමා, මේ රටේ නීති දෙකක් ක්‍රියාත්මක වෙනවා. ගමනාගමන මණ්ඩලයට එක නීතියක්. පෞද්ගලික අමාත්‍යාංශයට එක නීතියක්. ඇයි මෙහෙම

[ගරු ජගත් පින්නගොඩ විතාන]

දෙයක් වෙන්නේ? ඔබතුමාගේම කලාපයේ දුවන ටිකට් පරීක්ෂකවරුන්ට දුර ගමන් සේවා බස් රථ පරීක්ෂා කරන්න තහනම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒවා නවත්වන්නත් තහනම්. සියලුම නීතිරීති කඩමින් දුර ගමන් සේවා, NTC බස් රථ කතරගම සිට, මාතර සිට, ගාල්ල සිට, කොළඹ දක්වා ධාවනය වෙනවා. එක් බස් රථයක් නවත්වන්න කාටවත් බැහැ. ඕක මම තමුන්නාන්සේගේ උපදේශක කාරක සභාවේදී කිව්වාම, තමුන්නාන්සේලා සියලු දෙනා මුනිවත රකිනවා. මම දන්නේ නැහැ මේ නිලධාරීන් කොහොම ගත්තාද කියලා. මේ නිලධාරීන්ට අපි කියනවා. නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා ඉන්න කොටත් උපදේශක කාරක සභාවේදී මම මේ දේ කිව්වා. අපේ පැත්තේ බස් රථයක් දුවනවා. වගකීමෙන් කියන්නේ. මතුගම සහ නුවර. අද වනකල් බස් රථයක් දුවනවා. කිසිම මාර්ග බලපත්‍රයක් නැහැ. බලහත්කාරකමෙන් දුවනවා. මගේ ඥාතියෙක් දුවන්නේ. නමුත් බස් රථ තිබෙන පුද්ගලයෙක් වශයෙන් සහ මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මම කියන්නේ ඇත්ත වශයෙන්ම අපට හිතට කනගාටුයි. මේ මාර්ග නීති උල්ලංඝණය කරමින් ඇයි මේ වාගේ දේවල්වලට ඉඩකඩ දෙන්නේ? ඇයි මෙහෙම පහසුකම් දෙන්නේ? කොහොමද මෙහෙම වෙන්නේ? මම වගකීමෙන් කියනවා. ටිකට් පරීක්ෂකවරු නැති කරලා දාන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස් එකට අත දැම්මා. ලොග් ෂීට් එක ඇතුළේ රුපියල් 100 ක්, 200 ක් තිබ්බා. වරද ඉවරයි. බස් රථය පුරුදු විධියට ගමනේ යෙදෙනවා. වගකීමෙන් කියන්නේ. මේවා නැති කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් බැහැ. බලන්න ඔබතුමාගේ අමාත්‍යාංශය. බස්නාහිර පළාතේ වැඩියෙන්ම දුවන්නේ මගේ බස් රථ. මම වගකීමෙන් කියනවා. වැඩිම කිව්වාම තමුන්නාන්සේ හිතේ තියා ගන්නකෝ? නමුත් මම කියනවා, මම අද වනකල් තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශයෙන්වත්, ඔබතුමාගෙන්වත් මම පෞද්ගලිකව කිසිම දෙයක් ඉල්ලලා නැහැ. මම නීත්‍යානුකූල අන්දමින් මේ සියලු දේවල් කරන කොට අවනීතිය කොපමණ රජ කරනවාද? බැස්ටින් මාවතේ ගණන්කාරයෝ පිරිලා. හැම බස් ස්ටෑන්ඩ් එකකම. පඩි ගෙවනවාට අමතරව කප්පම් ගන්නවා. කෝ මේවා නවත්වන්න වැඩ පිළිවෙළක්? පොලීසිය ඉන්නවා. හමුදාව ඉන්නවා. විශේෂ සේවා ඉන්නවා. මොනවාද? කවුරුවත් නැහැ. ඔබතුමාත් නිහඬව ඉන්නවා. නිලධාරීන් නිහඬව ඉන්නවා. මම කියන්නේ, මේ පරණ නිලධාරීන් ඔක්කෝම ටික මාරු කරලා වැපල් කරලා දාන්න ඕනෑ කොහේට කොහේට හරි. එහෙම නැතුව කවදාවත් මේක කරන්න බැහැ. මේක තනිකරම සල්ලි උල්පතක්. තමන්ගේ ගෙදරට එන සල්ලි උල්පතක් මේ. මේ එකම කණ්ඩායමක් ඉඳගෙන කප්පම් ගන්නවා. මේ බස්රථ වර්ජනය කවුද ක්‍රියාත්මක කළේ? බස් රථ හිමියෝ නොවෙයි වර්ජනය කරන්නේ. TV එක යටින් දානවා අහවල් දවසේ රාත්‍රී 12.00 ඉඳලා බස් වර්ජනය කරනවා. හැම නාලිකාවකම දානවා. පත්තරේත් දානවා. එතකොට බස් හිමියෝ කවදාවත් මේකට කැමැති නැහැ. සේවකයෝ ටික එකතු වෙලා බස් ටික නවත්වලා දානවා. ඔබතුමාගේ යහපාලන ආණ්ඩුව යටතේ රුපියල් 25,000/- අඩුද, වැඩිද කියන එක වෙනම ප්‍රශ්නයක්. ඒ ගැන තීරණය කරන්න පළමුවැනිදා වෙනකල් ඉන්න කියලා ජනාධිපතිතුමා කියලා තිබෙනවා. පළමුවැනිදායින් පස්සේ නේ මේක ක්‍රියාත්මක වෙන්නේ. ඊට කලින් මේ බස් රථ වර්ජනය කරන කොට ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් කිසිම දැනුවත් කිරීමක් කළේ නැහැ. බස් හිමියෝ ගෙන්නලා සාකච්ඡාවක් තිබ්බා නම් මෙන්න මේ විධියටයි මේක වෙන්නේ කියලා. අපට මීට වඩා හොඳ විසඳුමක් දෙන්න තිබුණා. ඒ දේ ක්‍රියාත්මක වුණේ නැහැ.

ඒ නිසා මම තමුන්නාන්සේට කියනවා. අපි වාගේ ප්‍රායෝගික දැනුම තිබෙන මන්ත්‍රීවරු තමුන්නාන්සේලා ගන්න. වාහන එපා. පඩි එපා. දීමනා එපා. මාසයකට දවසක් දෙකක් ගෙන්නලා ඔය නිලධාරී මණ්ඩලයයි, කප්පම්කාරයෝයි එක්ක අපට මුහුණට මුහුණ කථා කරන්න දෙන්න. අපි ඒ ටික නවත්වලා දෙන්නම්. ඔබතුමාට හයිය දෙන්න මේ කථා කරන්නේ. ඔය තියෙන අහිංසක ක්‍රමයට මේ කතන්දරය කරන්න බැහැ. එක බස් රථයකින් බලන්න කෝ - එහෙම නම් ගමනා ගමන මණ්ඩලයට, රාජ්‍ය භාණ්ඩාගාරයෙන් කොපමණ ආධාර මුදලක් දෙනවාද? අපේ මිනිස්සුන්ට ශත පහක ආධාරයක් දෙන්නේ නැහැ. පෞද්ගලික බස් රථ හිමියෝ ආණ්ඩුවට කිසිම බරක් නැහැ. භාණ්ඩාගාරයට බරක් නැහැ. තමන්ගේ අතින් තමයි දුවන්නේ. කීදෙනෙක් පාඩු විඳිනවාද? කීදෙනෙක් ෆිනෑන්ස්, ලීසිං ගෙවා ගන්න බැරුව ඉන්නවාද? ඒ මිනිස්සු ගැන මීට වඩා මානුෂිකව හිතන්න ඕනෑ. මම දැක්කා. අද පත්තරේ තිබෙනවා, බස් රථ 1250 ක් අලුතෙන් ගේන්න යනවාලු. CTB එකට බස් රථ අලුතෙන් ගේනවා

කියන්නේ, අනිවාර්යෙන්ම එක්දහස් ගණනක් ගන්නවා කියන්නේ, කෝටි ගණනක කොමිස් මුදල් ගෙන්වන ඇමැතිතුමන්ලාට නැත්නම් නිලධාරීන්ට යනවා. ඒක අපි දන්න සත්‍යය. ඒ දවස්වල අපි ලක්ෂ 40 ට බස් රථයක් ගන්න කොට ලංගමට බස් රථයක් ගත්තේ ලක්ෂ 50 කට.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

10 ට එකක් නිකම් හම්බ වෙනවා.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

10 ට එකක් නිකම් හම්බ වෙන එකට අමතරව, එක බස් එකකට ලක්ෂ 10 ක් වැඩිපුර ගෙවපු රජයක් මේ ඉන්නේ. ඒ නිසා තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේදී මම කියනවා - දැන් අපට රූට් පර්මිට් දෙන්නේ නැහැ කියනවා. රූට් පර්මිට් දෙන්නේ නැති වුණාට CTB එකට රූට් පර්මිට් තියෙනවාද? එහෙම නැත්නම් මාර්ගයේ යනකොට තනි දොරේ බස් යන්න බැහැ, දොර දෙකේ බස් යන්න කියලා නීතියක් තිබෙනවා. එන්නකො පෙන්වන්න. මතුගම - කළුතර දුවන බස් ටිකේ යන්නේ තනි දොරේ බස්. සෙනග ඉන්න තැනට දානවා. හැබැයි ඒකෙන් ලාභ ගන්නේ නැහැ. සෙනග ඉන්න තැනට දාලා, ඒ මිනිස්සු ටික ගේන්න බස් එක හිස්ව යන්නේ. අරගෙන එන එක විතරයි කරන්නේ. ඒකයි මේ ලංගමය පාඩු වෙන්නේ. ලංගමයේ ඉහළ නිලධාරීන් පත් කරන්නේ කොහොමද? සුදුසුකම් බලනවාද? මොන සුදුසුකමක්වත් බලන්නේ නැහැ. පළවෙනියාටම දේශපාලනය කරලා තියෙන්න ඕනෑ. බස් ඩිපෝවල ඉන්න සියලුම දෙනා දේශපාලනය කරපු කට්ටිය. අපේ කට්ටිය ආවොත් එහෙම අපට කරලා තියෙන්න ඕනෑ. ශ්‍රී ලංකා එක ආවොත් ඒකට කරලා තියෙන්න ඕනෑ. ඕක තමයි නීතිය.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

කොන්දොස්තර DS.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

කොන්දොස්තර පැයක් යනකොට DS වෙනවා. මේ අකාර්යක්ෂමකම නැති කරන්න කියලා මම තමුන්නාන්සේට යෝජනා කරනවා. තමුන්නාන්සේට පුළුවන් නම් ලබන අවුරුද්දේ රියදුරු, කොන්දොස්තර මහත්වරු ටික අරගෙන EPF, ETF ගෙවන්න මේ අයව දාලා.මේ අයට පඩියක් නියම කරලා, මේ අයගේ වැඩිපුර ඉන්න රියදුරු කොන්දොස්තරවරු සංචිතයක් විදියට ලියාපදිංචි කරන්න. එතකොට අපේ බස් එකට ඩ්‍රයිවර් කෙනෙක් නැති වුණොත්, කොන්දොස්තර කෙනෙක් නැති වුණොත් නිලධාරියෙක් දාන්න. අපි තමයි එයාගෙන් ඉල්ලන්නේ අභවල් දවසට කොන්දොස්තර කෙනෙක් දෙන්න. නැත්නම් අපට ඩ්‍රයිවර් කෙනෙක් දෙන්න කියලා. එතකොට මේක පාලනය කරන්න පුළුවන්.

අද මොකද වෙන්නේ? ඔබතුමා දන්නවාද බස් රථවල පඩි ගෙවන තාලේ? මේ රටේ කම්කරු නීතිරීති තිබෙනවා. බස්වල තිබෙන කිසිම කම්කරු නීති රීතියක් බස් රියදුරු මහත්වරුන්ට, කොන්දොස්තර මහත්වරුන්ට බලපාන්නේ නැහැ. ඇයි? කොහොමද? ඩීසල් ගණන වැඩි වුණත් ඒ අයට ලාභයි. බස් රථයේ වියදම රුපියල් 20,000 නම් 10% යි. එතකොට රුපියල් 2000 යි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔන්න වැටුප් ගෙවන තාලේ. ඔබතුමා දන්නවාද නැද්ද මම දන්නේ නැහැ. කෑමට රුපියල් 500 යි. එක්කෙනෙකුට. ඊට පස්සේ කොන්දොස්තරටත් එහෙමයි තෙල් ගහලා ඉවර වෙලා ඉතුරු ටික බස් හිමියාට. ඊට පස්සේ අරුන්ගේ අතේ ආපහු ශත පහක්වත් නැහැ. ස්ට්‍රයික් කළත් මුන් අපේ බස්වල සල්ලි ටික හොකරම් කරනවා. ඒ නිසා ඔබතුමා මේ කියපු දේ කරන්න. මේ කියපු දේ කරන්න අමාරු නැහැ. මේ රටේ නීතියක් තිබෙනවා නම්, කම්කරු නීතිය තිබෙනවා නම් ඇයි කම්කරු දෙපාර්තමේන්තුවට බැරි මේ මිනිස්සුන්ට EPF, ETF ගෙවලා ස්ථිර සේවකයෝ බවට පත් කරගන්න. මගේ බස් රථයේ ස්ථිර දෙන්නා නැති දවසට මම ඔබතුමන්ලාට කිව්වාම, ඔබතුමන්ලා අපට දෙනවා. මෙන්න මෙයා තමයි කියලා. එතකොට ඒ අය දන්නෙත් නැහැ කොයි බස් එකට යනවාද කියලා. එතකොට මේ ඒකාධිකාරිය කඩන්න පුළුවන්. නැත්නම් දිගින් දිගටම මේ ඒකාධිකාරිය ගියොත් එහෙම මොකද වෙන්නේ? මේ කර්මාන්තය කඩා වැටෙනවා. මේ කර්මාන්තයට අලුතෙන් මිනිස්සු එකතු වෙන්නේ නැහැ. මට නම් ප්‍රශ්නයක් නැහැ. මම අවංකව කියනවා මට ව්‍යාපාර ජාලයක් තිබෙන නිසා මට මේක දුවන්න පුළුවන්. බස්වලින් යැපෙන්නේ නැහැ. නමුත් බස්වලින් ජීවත් වන මිනිහාට ජීවත් වෙන්න බැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ දේ අපට කරලා දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩි 02 ක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

මට මදි. නමුත් කරන්න දෙයක් නැහැ. මතුගම බලමු. මතුගම රුපියල් මිලියන 56 ක් වියදම් කරලා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් බස් ස්ටැන්ඩ් එකක් හැදුවා. අපේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාත් එක්ක උපාලි කොඩිකාර හිටපු ඇමැතිතුමා තමයි විවෘත කරන්න ආවේ. විවෘත කරපු දවසේ පහුවදා ඉඳලා බස් ස්ටැන්ඩ් එකේ බස් දෙකයි තවම ගාල් කරන්න දෙන්නේ. මුළු ඔක්කෝම ආධිපත්‍ය අරගෙන තිබෙන්නේ ගමනා ගමන මණ්ඩලයේ බස්. ඇයි ඔබතුමන්ලා බෝඩ් එකක් ගහලා තියලා, බෝඩ් එක ගලවාගෙන යන්නේ? මහ ලොකු බෝඩ් එකක් ගහලා තිබෙනවා. මෙපමණ මිලයන ගණනක් වියදම් කළා. මේක මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් නැවතුම් පළක් කියලා. බස් දෙකයි ගහන්න දෙන්නේ. ඒ බස් දෙක ගහන්න දෙන්නෙත් හවස 05.00 න් පස්සේ. වලල්ලාවිට ඉඳලා කොළඹ යන්න. මේ වාගේ හැල්ලුවට ලක් කරන්න එපා. අපි පළාත් සභාවේ ඉන්නවා නම් අපේ පළාත් සභාවේ තිබෙන අයිතිවාසිකම් ටික ආරක්ෂා කර ගන්න ඕනෑ. අපි පාර්ලිමේන්තුවට ගියොත් ඒක වෙනම කථාවක්. නමුත් මම කියන්නේ අපි කෝටි ගණනක් වියදම් කරනවා ඔබතුමන්ලා ඒවා ගැන බලන්නේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා අපෙන් ගන්න තිබෙන සේවය ගන්න. අපි බලමු.

ඒ වාගේම උපදේශක කාරක සභාව තියෙන දවසට කවුරු හරි නෝනා කෙනෙක් කථා කරලා කියනවා, ඔන්න අහවල් දවසේ උපදේශක කාරක සභාව තියෙනවා කියලා. ඊට දවස් දෙකකට පස්සේ උපදේශක කාරක සභාව පැවැත්වෙන දවසේ කෝල් එකක් එනවා අද නැහැ මන්ත්‍රීතුමා අද එන්න එපා කියලා. හරි. ඉවරයි. අපේ Programme ඔක්කෝම Cancel කරලා අපි මෙතැනට ඇවිල්ලා ප්‍රශ්න කියන්න ඉන්නවා. නමුත් ඒක කරන්න එපා ඇමැතිතුමා. මේ නිලධාරීන්ට ඕනෑ විධියට මේක පාලනය කරන්න දෙන්න එපා. කරුණාකරලා අපි ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වෙනවා. කිසිම වැටුපක් එපා. අපට ඕනෑ ගරු ඇමැතිතුමාත් එක්ක එකතු වෙලා මේක යම්කිසි ප්‍රමාණයකට හදන්න. ඔබතුමා ඉතා හොඳයි. ඇහුම්කන් දෙනවා. නමුත් අපට සෘජු තීරණ ඕනෑ. දැන් බලන්න කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ කිසිම වාහනයක් නැහැ. බස් රථ කොපමණ සංඛ්‍යාවක් දුවනවාද? ඔබතුමාට කොපමණ ආදායම අරගෙන දෙනවාද? රත්මහ පාය හැදුවේ අපේ සල්ලිවලින්. ආණ්ඩුවේ ශත පහක් නැහැ. මේ ඇමැතිතුමා හිටියා නම් කියයි. අද තට්ටු ගණන් ගහලා හදලා තියෙන්නේ අපේ සල්ලිවලින්. එක වාහනයක් නැහැ. ත්‍රීවීල් එකේ යන්නේ. බස් එකේ යන්නේ. ඉතින් මේ වාගේ දේවල් ඔබතුමන්ලා බලන්න. කොළඹ ඉන්න නිලධාරී ටික රජ සැප විඳිනවා. අර රත්මහ පායට ගියාම නිලධාරියෙක් ඉන්නවා. ඔබතුමා අනිවාර්යෙන් ඒ නිලධාරියාව මාරු කරන්න. අසංග මහතා. ගියාට පස්සේ පත්තරයක් බල බලා ඉන්නවා. බස්වල අයට කථා කරන්නේ කොහොමද? මොකද අවේ? යනවා ඕයි එළියට. මොකක්ද මන්දා ලොකු තනතුරක් ඒක ඇතුළේ තියෙන්නේ. මේ අය දන්නවා ඇති. දැන් මෙතැන ඉන්නවාද දන්නෙත් නැහැ. ඒ වාගේ නිලධාරීන් පන්නන්න ඕනෑ. යහපාලනය ඇවිල්ලා තියෙන්නේ. අපට ඕනෑ බස්රථ රියදුරු, කොන්දොස්තරලාත් එක්ක බොහොම සුහදශීලී සම්බන්ධයක් තිබෙන නිලධාරීන්. හරියට නිකම් මාළු මාර්කට් එකේ ඉන්නවා වාගේ. මෙතැන ඉන්නවා නම් මම නම කියලා කියන්නේ, බය නැති නිසා. ඒ නිසා මම කියනවා. කරුණාකරලා නිලධාරීන්ට චර්යා ධර්ම උගන්වන්න. බස් එකේ කොන්දොස්තර මහත්වරු වාගේ තමයි මේ නිලධාරීන් එතැන ඉන්නේ. ඒ මිනිස්සුන්ටත් බොහොම සුහදව කථා කරන්න එපැයි. ළඟට ගිහිල්ලා වැඩේ කරලා දෙන්න එපැයි.

මම මේක කියලා කථාව අවසන් කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. දැන් අපි රූට් පර්මිට් එකක් අලුත් කරන්න ගියාම, මේ බස් එකේ ලියාපදිංචිය හරිද කියලා RMV එකේ චෙක් කරන්න, මේ අයට අවුරුද්දක් යනවා. Online ගන්න පුළුවන් ක්‍රම තියෙද්දී. ඊට පස්සේ ඒ බස් හිමියා ආවාම මාසයකට දෙනවා. දෙකකට දෙනවා. තුනකට දෙනවා. මොනවාද මේ නීති? දැනට අවුරුදු 50 කට 60 කට කලින් තිබුණු ක්‍රමයක් නේ මේ ගෙනියන්නේ. ගහපු ගමන් RMV එකෙන් Online බලාගන්න පුළුවන්. මෙන්න මේ අය මේවා කරන්නේ. කරුණාකරලා මේවා හදලා දෙන්න. එහෙම නැත්නම් බස් රථ දුවන්නේ නැහැ. එහෙම නැත්නම් බස්රථ දුවන්නේ නැහැ. බස් රථ මිනිස්සු ඉස්සරහාට ගන්නේ නැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඒ ටික ඕනෑ ගේම් එකට.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ඔව් ගේම් එකටයි, ගෙන්න ගන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා තවත් කාලය දෙන්න බැහැ.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

මගේ කාලය අවසන් නිසා කථාව අවසන් කරනවා. ඔබතුමාට මම කියනවා, මේ ටික තරහාට කියපුවා නොවෙයි. මේක හදන්න කියපුවා. මේක පිළිගන්න. බොහොම ස්තූතියි.

[අ.භා. 03.16]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warnakumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දිනයේ පළාත් මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම හිතන්නේ, මේ හයවැනි පළාත් සභාව තුළ තුන්වැනි අයවැය තමයි මේ මොහොතේ ඉදිරිපත් වෙන්නේ. තුන්වැනි අයවැය තුළ පළාත් මාර්ග අමාත්‍යාංශය හැටියට ගත්තොත් මම හිතන්නේ, මේ පළාත් සභාව තුළ වැඩිම සේවාවක් කරන්න, වැඩිම සේවාවක් ලබා දෙන්න පුළුවන් අමාත්‍යාංශයක් හැටියට අපි මේ අමාත්‍යාංශය දකිනවා. මේ අමාත්‍යාංශයේ බස්නාහිර පළාත් සභාව තුළ තිබෙන මාර්ග පද්ධතිය ගත්තාම පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයිති අතිවිශාල මාර්ග පද්ධතියක් තිබෙනවා. ඒ තුළදී අපි දැක්කා මීට පෙර හිටපු ඇමැතිතුමා වාගේම කඩිනමින් ඒ පාරවල් විශාල ප්‍රමාණයක් සංවර්ධනය කරමින්, ඒ සේවාව ලබා දුන්නා වාගේම වර්තමානයේ ඒ තරම් ප්‍රමාණයක් සංවර්ධනය කරන්න නොලැබුණත්, ගරු ඇමැතිතුමා යෝජනා කරමින්, සකස් කරමින් යන යම් වැඩ පිළිවෙළක් අපි දකිනවා. ඇත්තටම බස්නාහිර පළාත් සභාව තුළ සුවිශේෂීම අමාත්‍යාංශය හැටියට මම මේ අමාත්‍යාංශය දකිනවා. මොකද, හැමදාම මේ පළාත් සභාව තුළදී වුණත්, දෝෂාරෝපණවලට ලක් වන, කථා බහට ලක් වන, විවේචනවලට ලක් වන අමාත්‍යාංශ විෂයයන් කිහිපයක් මේ තුළ තිබෙනවා. ඒ නිසා ඒ වැඩ පිළිවෙළ ඉතාමත්ම සාර්ථකව ගෙන යන්න ඉතාමත් හොඳ සුභ නිමිති පහළ වෙලා තිබෙනවා. ඇත්තටම කලින් දිනවල වාගේම අද දිනයේත් අපි දැක්කා, මේ පළාත් සභාවේ සහයෝගය, ශක්තිය දෙන සියලුම මන්ත්‍රීතුමන්ලා කිසි භේදයක් නැතුව, කිසිම බාධා කිරීමක් නැතුව මේ අයවැය සම්මත කරලා දෙනවා. එහෙම නම් අපට හොඳ පෙර නිමිත්තක් ඉස්සරහාට පේනවා. මොකද, රටේ ජනතාවට, ප්‍රදේශයේ ජනතාවට සේවය කරන්න හැමදාමත් මෙහෙම හිතනවා නම්, මෙහෙම වැඩ කටයුතු කරනවා නම්, මේ විෂයයන් තුළින් ලබා දෙන්න පුළුවන් සේවාව තවත් එහාට ලබා දීලා, බස්නාහිර පළාතේ ඉන්න ජනතාවට ලොකු සේවාවක් ලබා දෙන්න පුළුවන් කියලා විශ්වාස කරනවා. නමුත් ඒ විධියට කොපමණ කල් යයිද කියන එකයි තියෙන්නේ.

සමූපකාරයක් ගත්තාම සමහර වෙලාවට ඒ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයාගේ, ඒ ප්‍රදේශය නියෝජනය කරන මහජන නියෝජිතයාගේ අවශ්‍යතාවය අනුව ඒවා එහෙම නැත්නම් කුමක් හෝ නොගැළපෙන වැඩ පිළිවෙළක් තුළ ඒවාට ගන්නා වූ තීන්දු තීරණ අපි දැක්කා. ඒ ප්‍රදේශයට ප්‍රායෝගිකද? ඒ ප්‍රදේශයට ඒක උචිතද? කියන වෙනත් වැඩ පිළිවෙළවල් තුළදීත් ඒක බලන්න ඕනෑ. මොකද, සමහර වෙලාවට තමන්ගේ පෞද්ගලික තීන්දු තීරණ තුළ ගෙනාපු වැඩ පිළිවෙළවල් වෙනස්ව ගිය ක්‍රමවේද තිබුණා. ඒ වාගේම තමයි තමන් හරි දේ කරනවාට ඒ සමූපකාර ගත්තොත් ඒ සේවාව තුළ ඉන්න අය ඔවුන්ගේ පෞද්ගලික වැඩ පිළිවෙළවල් තුළ ඒ ක්‍රමවේදය සම්පූර්ණයෙන් වෙනස් වුණු වැඩ පිළිවෙළවල් තිබුණා. ඉතින් මේ වැඩ පිළිවෙළවල් හරියට ගෙනියන්න අපේ කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමාට ප්‍රවාහන ක්ෂේත්‍රය ගැන අත්දැකීම් තිබෙනවා. මේ වාගේ අයව එකතු කරලා අඩුපාඩු තිබෙන තැන් බලලා තමන්ට විතරක් නොවෙයි, සමස්ත ජනතාවටම යම්කිසි සේවාවක් ලබලා දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියන එක මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් අපේ ඇමැතිතුමාට මේ අවස්ථාවේ

[ගරු ලලිත් වර්ණකුමාර]

මතක් කරනවා. මොකද, මේ මොහොත වනකොට අපි දකිනවා. අර රත්මලානේ තිබුණා අලුත්වැඩියා කරන අංගනයක්. ගැරේජ් එකක්. මේ මොහොතේ අපි හිතන්නේ, එහි හිටපු ඉංජිනේරුතුමෙක් වෙන්න ඇති.එහි ප්‍රධානියා විශ්‍රාම ගියා කියලා. ඒක වහලා දාන තත්ත්වයට පත් වෙන්න යනවා කියලා අපට ආරංචියක් තියෙනවා. එහෙම විය යුතු නැහැ. හරි වැඩ පිළිවෙළක් හදලා, ඒ වැඩ පිළිවෙළ තුළ මම හිතන්නේ, පළාත් සභාවේ නොවෙයි. මුළු පළාත් සභාවේ විෂයයන් තුළ නොවෙයි. අඩුම ගාණේ ප්‍රවාහන අමාත්‍යාංශයේ තිබෙන වාහන ටිකවත් හරියට සර්විස් එකට සහ නඩත්තුවලට දාලා වැඩ කටයුතු කළොත් මම හිතන්නේ ඒ තුළින් ලොකු ලාභයක් පළාත් සභාවට ලබන්න පුළුවන්. ඒ වාගේම ලාභය වාගේම හරි විනිවිධභාවයකින් කටයුතු කරලා හොඳ සේවාවක් ලබලා දෙන්න පුළුවන් කියලා අපි දකිනවා.

ඒ වාගේම කර්මාන්ත අධිකාරිය.කර්මාන්ත දෙපාර්තමේන්තුව තුළ "බිඳුණු පුටුවට දැතේ සවියක්" කියලා, අපේ මීට පෙර හිටපු ඇමැතිතුමන්ලා පටන් ගත්තා වාගේ වැඩ පිළිවළෙවල් තුළ හොඳ වැඩ පිළිවෙළවල් පාසල් තුළට ගෙනියන්න පුළුවන් වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් අපි ඔබතුමාටත් මතක් කරන්නේ. ඒ වැඩ පිළිවෙළවල් ටික ක්‍රියාත්මක කරන්න. මහජන නියෝජිතයෙක් වන අපට යම්කිසි මුදල් ප්‍රතිපාදනයක් අපේ විමධ්‍යගත අරමුදලෙන් හරි දාලා පාසල් පද්ධතියේ එවැනි වැඩ පිළිවෙළවල් ඉස්සරහාට ගෙනියන්න කටයුතු කළොත් මම හිතන්නේ, ඒක අපි අගය කරන්න ඕනෑ. ඒක ඔබතුමා කරන ලොකු සේවාවක්. මොකද, අපි දැක්කා,සමහර පාසල්වලට ඇවිල්ලා ඒ ආපු දිනයට කැඩුණු පුටු, ඩෙස් 100 ක් වාගේ හදනවා. නමුත් ඇත්තටම ප්‍රායෝගිකව, සමහර වෙලාවට 100, 150 හදලා ගිය තැන් තිබෙනවා. ඒවා නැත්නම් පිළිකන්නට දානවා. තෙමෙනවා. දිරනවා. නැවත ප්‍රයෝජනයට ගන්න බැහැ. නමුත් පොඩි දෙයක් තියෙන්නේ. ලෑල්ලක්, ඇණ ටිකක් දාලා හදන්න පුළුවන්. හැබැයි මේ වැඩ පිළිවෙළවල්වලට ඉතුරු අමාත්‍යාංශ එකින් එක බද්ධ වෙන්න ඕනෑ. අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක බද්ධ වෙලා, ඒවා වෙනත් ව්‍යාපෘති බවට පත් වෙලා, මුදල් උපයන වෙනත් කොන්ත්‍රාත්කරුවන්ගේ දේවල් බවට පත් නොවී, අපට කර ගන්න පුළුවන් කාරණාව තුළ අපි හරියට කටයුතු කරනවා නම්, මම හිතන්නේ ලොකු ලාභයක්, ලොකු ප්‍රයෝජනයක් දෙපාර්තමේන්තු, අධිකාරි තුළින් මේ පළාතට සිද්ධ වෙනවා කියන එක මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම අපි දන්නවා, නිවාස වැඩ පිළිවෙළ ගත්තත් ඉතා ප්‍රායෝගික වැඩ පිළිවෙළක්. අපේ ගම්බිම්වලට, දුෂ්කර ගම් පළාත්වලට හොඳ වැඩ පිළිවෙළක් බවට පත් වෙමින් යනවා. ඒ තුළ ඇත්තටම අද අපේ ලංකාවේ ගත්තොත් අපි එදා දැකපු පොල් අතු ගෙවල්, එදා දැකපු මැටි ගෙවල් අද දකින්න නැහැ. අද සමහර තැන්වල ලොකු හෝටල් වාගේ ඒවා හදනවා. නිකම් ආකෘති හැටියට තමයි හදන්න වෙලා තිබෙන්නේ. අපේ බස්නාහිර පළාත් සභාව තුළ යම්කිසි තැනකට ඒ සේවාව ලබලා දීලා, ඒ දුප්පත් ජනතාවට හොඳ නිවසක් ලබලා දෙන්න කටයුතු කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඇත්තටම අපි සන්තෝෂ වෙනවා. ඒ වාගේම මම මුලින් කියපු විධියට ගරු ඇමැතිතුමනි, ඔබතුමාට තිබෙන්නේ බොහොම අමාරුවෙන් කරන වැඩ පිළිවෙළක්. හැබැයි මේ බස්නාහිර පළාත් සභාව තුළ තිබෙන හොඳම අමාත්‍යාංශ ටික තමයි තියෙන්නේ. ධීවර නැති වුණත් ඉතුරු ටික. මේ සියලු දේ තුළින් ජනතාවට යම්කිසි සේවාවක් ලබලා දෙන්න පුළුවන් අමාත්‍යාංශ ගොඩක් තමයි ඔබතුමාට තිබෙන්නේ. එම නිසා ඒ තුළින් ඉදිරියටත් දෙන්න පුළුවන් ශක්තිය, සේවාව ලබලා දෙන්න කටයුතු කරන්න කියන එක මේ අවස්ථාවේදී මතක් කරනවා. අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 03.25]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මමත් නියෝජනය කරන උපදේශක කාරක සභාවේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන, වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය ගැන වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. අද විශේෂයෙන්ම ග්‍රාමීය ජනතාවට බෙහෙවින් බලපාන මාර්ග වැඩ සටහන් පවත්වාගෙන යන්නේ, මේ අමාත්‍යාංශය යටතේ. මේ මාර්ග සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ඇමැතිතුමා ලොකු උනන්දුවක්, උත්සාහයක් ගන්නවා. මම හිතන්නේ එතුමා දිස්ත්‍රික්කවලට ගිහිල්ලා, ප්‍රාදේශිකව තිබෙන පළාත්

මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යාලවලට ගිහිල්ලා, අපවත් කැඳවලා, ඒ අයත් එක්ක සාකච්ඡා කරලා ප්‍රදේශයේ සංවර්ධනය ගැන කටයුතු කරලා, අප අතර සහ නිලධාරී මණ්ඩලය අතර තිබෙන සහෝදරත්වය ඇති කරලා, වඩාත් ඵලදායී වැඩ පිළිවෙළක් කරන්න උත්සාහයක් ගන්නවා. ඒ වාගේ කැපවීමෙන් කටයුතු කිරීම ගැන අපි සතුටු වෙනවා. අපේ බස්නාහිර පළාත දිහා බැලුවාම මාර්ග සංවර්ධන අධිකාරියට අයිති වෙන්නේ A, B පාරවල්. මහ ආණ්ඩුවට අයිති වෙන්නේ C, D පාරවල්. අපට C, D පාරවල් කිලෝ මීටර් 1952ක් අයත් වෙනවා. මෙයින් 548 ක් කාපට් කරලා තිබෙනවා. ඉදිරියේදී තවත් 548 ක් කාපට් කරන්න තිබෙනවා.ලබන වර්ෂයේ කාපට් කිරීම සඳහා ඇමැතිතුමා ඇස්තමේන්තු කරලා තිබෙනවා, කිලෝ මීටර් 103 ක්. එය මම අගය කරනවා වාගේම ඊටත් වැඩිය කරන්න පුළුවන් නම් වැදගත් කියන එක මතක් කරන්න කැමැතියි. මොකද, හේතුව ඔබතුමා අපේ ග්‍රාමීය පාරවල් හුඟක් - දැනට හුඟක් ඉතුරු වෙලා තිබෙන්නේ ගම්බද පාරවල්. පසුගිය කාලයේ හදලා තිබෙනවා. නගරයට කිට්ටු කිට්ටු පාරවල් තමයි වැඩියෙන් හැදිලා තියෙන්නේ. පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයිති වුණත් ගම්වල ඇතුළට තිබෙන පාරවල් තමයි දැනට හුඟක් ඉතුරු වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒවා තවත් වැඩියෙන් ලබා දෙන්න පුළුවන් නම් ඒ ගැන මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ඒ වාගේම මාර්ග සංවර්ධන අධිකාරියේ මුදල් සම්බන්ධව වැඩමුළුවක් තිබ්බා. ඒකේදී අපට ලැබුණු ලිපියක් තිබෙනවා. අපේ මාර්ග සංවර්ධන අධිකාරියට මුදල් අඩුවීමට එක හේතුවක් හැටියට, සාමාන්‍යාධිකාරීතුමා ලේකම්තුමාට ලියුමක් ලියලා තිබෙනවා. මේකේ තිබෙනවා ව්‍යාපෘති සීමාව මත, අධිකාරියට ලැබෙන බාහිර ව්‍යාපෘති සීමාව නිසා ආදායම අඩු වුණාය කියලා. බාහිර ව්‍යාපෘති අඩු වීම නිසා ආදායම අඩුවීම පිළිගන්නවා. නමුත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ලැබෙන කොන්ත්‍රාත් ටිකවත් අද අපේ පළාත් මාර්ග අධිකාරියෙන් කරන්නේ නැහැ. ඒවාත් පිට කොන්ත්‍රාත්කරුවන්ට දෙන්නේ. ඒ ටිකවත් කරනවා නම් මම හිතනවා, මීට වැඩිය ආදායමක් ලබා ගන්න පුළුවන්. නිදර්ශනයක් වශයෙන් බැලුවොත් අපේ හදපාන්ගොඩ පාරේ අපේ මූලාසනයේ ඉන්න නියෝජ්‍ය සභාපතිතුමාත්, මමත් නිතර යනවා. කොන්ත්‍රාත්කාරයෙකුට දීලා තිබෙනවා ගරු ඇමැතිතුමනි. කවදාවත් පස් දෙනෙක් වැඩ කරනවා දැකලා නැහැ. දැන් මාස දෙකක් විතර වෙනවා. ඒක අත ගගා කරමින් ඉන්නවා. මොකද, පාරෙත් අවහිරතාවක් තිබෙනවා. මිනිස්සුන්ටත් කරදරයි. මේවා හිමින් හිමින් අත ගගා ඉන්නවා. අද නම් මම දැක්කා, ටිපර් හතරක් පහක් ගිහිල්ලා තිබෙනවා. පැත්තේ බැම්මක් බැන්දා. දෙන්නෙක් තුන්දෙනෙක් තමයි වැඩ කරන්නේ. ඒවා කොන්ත්‍රාත් දීලා තියෙන්නේ. අපේ කම්කරුවෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. මේවා අපේ මාර්ග සංවර්ධන අධිකාරිය තුළින් අරගෙන කරනවා නම් අපට ලාභයක් ගන්නත් පුළුවන්. අපේ සේවකයින්ගෙන් වැඩ ගන්නත් පුළුවන්. සේවකයින්ට නිකම් පඩි ගෙවනවා. සේවකයින්ට වැඩ නැහැ කියලා කියනවා. ඒ අයව ස්ථිර කරන්න ඉල්ලනවා. මම හිතනවා, මේ වැඩ පිළිවෙළ අපිම කර ගන්නවා නම්, අපි එකක් නොවෙයි. කිහිපයක් යන යන තැන්වල බැලුවොත්, සෑම එකක්ම කරන්නේ කොන්ත්‍රාත් පදනම මත. නමුත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් මේවා කරනවා නම්, අපේ ආදායම වැඩි කරන්න තිබුණා. ප්‍රමිතිය හොඳට හදන්න පුළුවන්. මේ සෑම දෙයක්ම බලපානවා. ඒ නිසා මම ඒ ගැන අවධානය යොමු කරනවා. මේ වැඩ පිළිවෙළ තුළින් අපේ ආදායම් වැඩි කර ගන්න පුළුවන් වෙනවා. ඒ වාගේම හොඳ ප්‍රමිතියක් ඇතුව වැඩ කරන්න පුළුවන්කම ලැබෙනවා.

ඒ වාගේම ප්‍රවාහන අංශය ගැන අපේ ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා හොඳ අවබෝධයක් ඇතිව දීර්ඝව කථා කළා. එය බෙහෙවින් ජනතාවට බලපානවා. ප්‍රවාහනය ගැන මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. කෙටියෙන් මම වචන කිහිපයක් කථා කරන්න කැමැතියි. ලංකා ගමනා ගමන මණ්ඩලයයි, අපේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියයි දෙක එකට සම්බන්ධ වෙලා, වැඩ කරන අවස්ථා තිබෙනවා. සම්බන්ධ නොවී වැඩ කරන අවස්ථා තිබෙනවා. ඝට්ටන ඇති වන අවස්ථා තිබෙනවා. කොහොම වුණත් ජනතාවට විශාල වශයෙන් වැඩ කළා වාගේම - සවස් කාලයේ වැඩ කරන්නේ නැහැ. හයෙන් පස්සේ ඇත්තේම නැහැ. එතකොට ලංගම බස් විතරයි දුවන්නේ. ඒ නිසා අපේ බසුත් ධාවනය කරන්න යම්කිසි ක්‍රමවේදයක් යොදන්න, ඔබතුමා උත්සාහ ගන්නවා නම් හොඳයි. ඒ වාගේම තමයි තරඟකාරී ධාවනය. ඉතාමත්ම තරඟකාරී ධාවනයක් තිබෙනවා. ඒක අනතුරු සහිතයි. මම දැක්කා, ඔබතුමාගේ පොතේ සඳහන් වෙලා තිබෙනවා. ඔබතුමා ඒ ගැන පියවරක් ගන්න බලාපොරොත්තු වෙනවා. මම දැක්කා හොඳ වැඩ පිළිවෙළක් යෝජනා කරලා තිබෙනවා. මම ඒ ගැන අගය කරනවා.

[ගරු පී.ඩී. අබේරත්න]

පළාත තුළ ධාවනය වන බස් රථ ක්‍රමානුකූලව නිසි ලෙස කාල සටහනකට අනුව ධාවනය කිරීම පහසු කරලීම සඳහාත්, බස් නැවතුම් ස්ථානවල විද්‍යුත් වේලා සටහන් යන්ත්‍ර ලබා දීම තුළත් මම හිතනවා, නියමිත වෙලාවට බස් එකක් යනවා නම් සට්ටනයක් ඇති වෙන්නේ නැහැ. කාල සටහනක් තිබ්බොත් නියම වෙලාවට නියම ස්ථානයට යනවා. අපි දන්නවා. ජනතාවට ඉක්මණින් යන්න ඕනෑකම තිබෙනවා. නමුත් ආරක්ෂාව ගැන අපි වැඩියෙන් බලන්න ඕනෑ. මේවා තුළ රිය අනතුරු වැඩි වෙනවා. රිය අනතුරු ගැන බැලුවාම අපි දැක්කා, සියලුම රිය අනතුරු බැලුවාම, පුද්ගලික බස් අංශයේ රිය අනතුරු ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. අනෙක් ඒවාට වැඩිය. ඒකෙත් යම්කිසි ප්‍රගතියක් තිබෙනවා. 2012 – 2015 අතර ත්‍රිරෝද අනතුරු පස් ගුණයකින් විතර වැඩි වෙලා තිබෙනවා. කොහොම වුණත්, ඒ ගැන අපේ පොඩි අඩුවක් දකින්න ලැබෙනවා. ඒ වාගේම සේවකයින් ගැන අපේ මන්ත්‍රීතුමා කථා කළා. අද ඇත්ත වශයෙන්ම ස්ථාවරයක් නැහැ. පුද්ගලික අංශයේ බස්වල වැඩ කරන සේවකයින්ට ස්ථාවරයක් නැහැ. සමහර අය අද ගියාම, බස් එකක් හම්බ වුණාම වැඩ කරනවා. ගෙදර යනවා. නැත්නම් ඒ මනුස්සයාට එදා දවසේ හම්බ කරගන්න පුළුවන්කමක් නැහැ. බස් හිමියෙක් හැටියට අපේ ජගත් විතාන ගරු මන්ත්‍රීතුමාගේ කථාව බැලුවාම බස් හිමියෝ කැමැතියි මේ අය ස්ථිර කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරනවා නම්. මම හිතනවා මගී ප්‍රවාහන අධිකාරිය තුළින් බස් සේවකයෝ ස්ථිර කරලා, පඩියක් දෙන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම්, ලක්ෂ ගණනක් සේවකයින්ට ස්ථාවරයක් හම්බ වෙනවා. ඒ වාගේම මීට වැඩිය හොඳට පවත්වාගෙන යන්න පුළුවන්කම හම්බ වෙනවා. ඒ වාගේම බස්වල තිබෙන කරදර ගැන එතුමා කිව්වා. මේ පගාව ගැනීම සෑම තැනම තියෙන දෙයක්. මේ වාගේ දේවල් නවත්වලා ඒ අයට සහනයක් ලබා දීම ඉතා වැදගත් හැටියට මම සලකනවා.

ඒ වාගේම සමුපකාර අංශය ගැනත් වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. සමුපකාරය තුළින් තමයි මමත් දේශපාලනයට ආවේ. රයිගම් උඩුගහපත්තුව විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති කෙනෙක් වශයෙන් පත් වෙලා තමයි සමාජ සේවයට බැස්සේ. අද සමුපකාර ක්ෂේත්‍රයේ ප්‍රගතියක් තිබෙනවා වාගේම සමහර සමුපකාරවල විශාල බිඳ වැටීමක් තිබෙනවා. විශේෂයෙන්ම ඉංගිරිය විවිධ සේවා සමුපකාර සමිතිය ගැන වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. ඔබතුමාත් දන්නවා ඇති, පසුගිය කාලයේ විශාල විනාශකාරී තත්ත්වයකට පත් වෙලා, කෝටි ගණනක් මුදල් අවභාවිතා කරලා,46 පරීක්ෂණයෙන් සභාපතිවරයාත්, අධ්‍යක්ෂ මණ්ඩලයත් ඉවත් කළා. නමුත් අපි කනගාටු වෙනවා. උසාවියට ගියාට පස්සේ 46 පරීක්ෂණයේ වාර්තාව උසාවියට නොදුන්න නිසා, ඒ අය නිදොස් කොට නිදහස් කළා. ඒක මම හිතන්නේ සමුපකාර ව්‍යාපාරයේ වුණු ලොකු අත්වැරැද්දක්. මම දකින විධියට ඒකට දෙපාර්තමේන්තුව වග කියන්න ඕනෑ. මම නඩු තීන්දුව කියවලා බැලුවා. 46 වාර්තාව උසාවියට ඉදිරිපත් කරලා නැහැ. ඒ අනුව නිදොස් කොට නිදහස් කළා. නිදහස් කරලා ඇවිල්ලා, ඊට පස්සේ ඡන්දයක් තිබ්බාම, ඒ අය නැවත වරක් අද බලයට පත් වෙලා. අද බලයට පත් වෙලා ඉන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒකට හේතුව මේකයි. සභාපති කෙනෙක් පත් වුණාට පස්සේ ණය දෙන්නම් කියලා, ඒ අයට හිතවත් අයව බඳවා ගන්නවා. සමුපකාර බැංකුවෙන් ණය දෙන්නම් කියලා සාමාජිකයෝ හැටියට බඳවා ගෙන කීයක් හරි ණය අරන් දීලා, ඒ අයගේ හිතවත් අය පුරවා ගන්නවා. ඉතින් ඡන්දයක් තිබ්බාම ඒ අය තමයි ඉන්නේ. මොකද, මේකට අලුතෙන් බැදෙන්න වැඩි උනන්දුවක් නැහැ. ඉන්න අධ්‍යක්ෂ මණ්ඩලය එකතු වෙලා, මේ වැඩ පිළිවෙළ ගෙන යනවා. ඉතින් සෑමදාම ඒ අය පත් වෙන්නේ. මේ මනුස්සයා පත්වෙලා ඉන්නවා. එතුමා සමුපකාර බැංකු සංගමයේ කළුතර දිස්ත්‍රික් සභකාර ඉඳලා ලුණු සංස්ථාවෙන් ගත්තු කොටස් විකුණලා, එතැන විශාල වංචාවකට අහු වෙලා. තිබෙන පුද්ගලයෙක් තමයි සභාපති තනතුර දරන්නේ. මම හිතනවා හිටපු ඇමැතිතුමාත් මේකට වග කියන්න ඕනෑ. මෙතැන ඉන්නවා නම් මම මූණටම කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමා දන්නවා. අපි ඒ වෙලාවේ ප්‍රසිද්ධියේ කිව්වා. මේ නඩුව හරියට ගෙනිහිල්ලා නිසි දඬුවම් ලබා දෙන්න කියලා. එතුමා ඒක හරියට ක්‍රියාත්මක කළේ නැහැ. ඒ නිසා අද ඒ අය නැවත වරක් ඇවිල්ලා, දැන් මේ පුටුවේ වාඩි වෙලා ඉන්නවා. විශාල වංචා කිහිපයකට සම්බන්ධ පුද්ගලයෙක්. අනාගතය ගැන කිසි ස්ථාවරයක් නැහැ. සමුපකාර සමිතියේ මුදල් ගැන. ඒ නිසා මම ඔබතුමාගේ දැඩි අවධානයට යොමු කරනවා. මේ වාගේ විනාශකාරී වැඩවලට සම්බන්ධ වුණු, වංචාකාරී අයට සභාපති තනතුරු ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා නම්, මේ සම්බන්ධයෙන් දැඩි නීති පනවලා හරි, මේ අය ඉවත් කරලා අපේ සමුපකාරයේ මුදල්

ආරක්ෂා කරලා දෙන්න. රටේ දීර්ඝ කාලයක් පවත්වාගෙන ආපු සමිති සංගම්. මේවායේ තියෙන්නේ දුප්පත් මිනිස්සුන්ගේ මුදල්. ඒ ගැන අපි මීට වඩා වගකීමෙන් කටයුතු කළ යුතුයි කියලා මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මට තව විනාඩි 02 ක් දෙන්න. මට කරුණු කිහිපයක් ගැන කථා කරන්න තිබෙනවා. මාර්ග වැඩ පිළිවෙළ ගැන මම තවත් යෝජනාවක් කරන්න හිටියේ. මට දැනුයි මතක් වුණේ,මාර්ග සති වැඩ පිළිවෙළ. දැන් ආණ්ඩුවෙන් මාර්ග සති වැඩ පිළිවෙළක් ගෙන යනවා. දැන් අපේ පළාත් සභාවේ නැහැ. මම ඔබතුමාට යෝජනා කරනවා. අඩුම ගාණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මාර්ග සති වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරමු. දැන් ප්‍රාදේශීය සභාවල ගොඩක් යන්ත්‍රෝපකරණ තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කය ගන්නවා නම් කළුතර දිස්ත්‍රික්කයේම තිබෙන ප්‍රාදේශීය සභාවල තිබෙන ඔක්කෝම උපකරණ අරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සතියක මාර්ග සති වැඩ පිළිවෙළක් ගෙන ගියොත්, ශ්‍රමදාන මට්ටමින් විශාල සංවර්ධනයක් කරන්න පුළුවන්. ගමේ ජනතාව කැමැතියි, ගමේ පාරවල්වලට බැහැලා වැඩ කරන්න. ඒ වාගේ සතියක් අපි වෙන් කරගෙන හොඳ සැලසුමක් ඇතිව, හොඳ පසුවිපරමක් ඇතිව කළොත් ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් විශාල වැඩ කොටසක් කරන්න පුළුවන් තත්ත්වයට පත් වෙනවා. මම ඔබතුමාට යෝජනා කරනවා. මේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරමු. කළුතර දිස්ත්‍රක්කයෙන් පටන් ගමු. මට දෙන්න අගලවත්ත දුෂ්කරම ප්‍රදේශයක්. අපි භාර අරගෙන පළමුවැනි මාර්ග සතිය කරන්නම්. විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්. දුප්පත් ප්‍රදේශවලට ලොකු ශක්තිමත් වැඩ පිළිවෙළක් වෙනවා.

ඒ වාගේම දේශීය රෙදිපිළි නිෂ්පාදනය ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන්නේ. අද රෙදිවලට හොඳ ඉල්ලුමක් තිබෙනවා. අපි ඉස්සර දැකලා තිබෙනවා, ගමේ ගෙවල්වල රෙදි මැෂින් එකක් ටක් ටොක් ගානවා. අද එහෙම තත්ත්වයක් නැහැ. අද ගමේ රස්සාවල් නැති අයට රැකියා ලබා දීමට, ඔබතුමා මේ වීවින් කර්මාන්තය කරන ප්‍රදේශවල ගෙවල්වලට මේ මැෂින් ලබා දීලා කරන්න පුළුවන් නම් මම හිතනවා, රැකියා ප්‍රශ්නය විසඳෙනවා වාගේම අද වෙළඳ පොළට අවශ්‍ය නිෂ්පාදනය ලබා දීම තුළින් ඔබතුමාගේ අමාත්‍යාංශයටත් ලාභයක් ගන්න පුළුවන් වෙනවා කියලා. රෙදි ලබා දෙන්න පුළුවන්කම ලැබෙනවා. මම ඒ ගැනත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

මට තවත් කථා කරන්න තිබුණත් වෙලාව මදී නිසා මම කථා කරන්නේ නැහැ. අද අපේ ගමේ ජනතාවට බෙහෙවින් සම්බන්ධ වන වැඩ පිළිවෙළක් ඔබතුමා ක්‍රියාත්මක කරනවා. බිඳුණු පුටුව ගැනත් වචනයක් කියන්න ඕනැ. කලින් කථා කරපු ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා කිව්වා. ඔබතුමාගේ වැඩ පිළිවෙළ යටතේ අපටත් ඉස්කෝලයක් ලබා දුන්නා. ඉතාම හොඳ වැඩ පිළිවෙළක්. මේ අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධ වෙලා - පුටුවකට විශාල මුදලක් වියදම් කරනවා. බිඳුණු පුටුවෙන් හදලා දීපු පටුවත් එකයි. කෝකත් එකයි. හොඳට ප්‍රේම් කරලා දෙනවා නම් අලුත් පුටුවක් වාගේ. අධ්‍යාපන අමාත්‍යාංශය වියදම් කරන මුදල් අරගෙන, බිඳුණු පුටුව වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළාම මම හිතන්නේ අවුරුදු ගණනකට අලුත් පුටු හදන්න ඕනැ නැහැ. ඒ තරම් කැඩුණු පුටු තිබෙනවා. මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා. අධ්‍යාපන ඇමැතිතුමාත් එක්ක කථා කරලා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා. මම මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඔබතුමාට සුභ පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

[අ.භා. 03.36]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ප්‍රවාහන,සමූපකාර අමාත්‍යාංශය වෙනුවෙන් වචන කිහිපයක් කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම ගරු ඇමැතිතුමාට මුලින්ම ප්‍රකාශ කරන්න කැමැතියි. මම මේ අයවැය ලේඛනය සාකච්ඡාවේදී නිරන්තයෙන් දැක්කේ, ඇතැම් වැය ශීර්ෂ තිබෙනවා, ඒකට අපි කථා කරනවා. එක්කෝ ඇමැතිතුමා බැණුම් අහනවා. ඒක්කෝ නිලධාරීන් බැණුම් අහනවා විතරයි. අපට කරන්න පුළුවන් දෙයක් ඉතුරු වෙලා නැහැ. ඒ නිසා යම් යම් වැය ශීර්ෂයන්

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

තිබෙනවා. අපට ඒ පිළිබඳව යම් අවබෝධයක් තිබෙන්නට ඕනෑ. අපේ ලලිත් වනිගරත්න ඇමැතිතුමා බොහොම හොඳ ඇමැතිවරයෙක්. එතුමාට හොඳ කාර්ය මණ්ඩලයක්, ලේකම්තුමියක් ඉන්නවා. එහෙම තිබුණත්, මේ පළාත් සභාවේ නිරන්තර පිටු ගණන් පිරෙන්නේ සමූපකාරය පිළිබඳවයි. සමූපකාරය සමග තමයි ප්‍රශ්නය තිබෙන්නේ. අර සමූපකාරය හොරකම් කළාය. මේක හොකරම් කළාය. විසුරුවා හරින්නය. වැරැදියි. එතකොට අවසානයේ මේවාට හරියට උත්තර ලැබිලාත් නැහැ. ඒ සමූපකාර එහෙම්ම තිබෙනවා. මේ ගැන අපට යම් අධීක්ෂණයක් තිබෙන්න පුළුවන්. සමූපකාර සාමාජිකයන්ගෙන් සැදුම්ලත් මේ ආයතනයේ අපට පූර්ණ බලතලයක් නැත්නම් මේ විෂයය අපට වැඩකුත් නැහැ. ඇමැතිතුමා නිකම් මන්ත්‍රීවරු 104 දෙනෙක් ඉස්සරහා බැණුම් අහනවා ඇරෙන්න ඒකට ගන්න පුළුවන් ක්‍රියා මාර්ගයකුත් නැහැ. මට නම් හිතෙන්නේ නැහැ, ඒක මෙතැනට ගැළපෙනවාද කියලා. මම නිරන්තරයෙන් අපේ පළාත් සභාවේ දැකපු දේ. නැත්නම් අපි මේකට බලය ආරෝපණය කරගන්න ඕනෑ. අපට මේ සමූපකාරය මෙන්න මේ තැනට ගේන්න පුළුවන්. අපි මේ විධියට සමූපකාරයට අත පොවනවා. අපි මේක පාලනය කරනවා. මේ ගැන අධීක්ෂණය කරනවා. මේක නියාමනය කරන්නේ, මේ විධියට. නිකම් නමට සමූපකාර ඇමැතිතුමා කිව්වාට එතුමාට යමක් කරන්න බැරි නම් වැඩක් නැහැ. එතුමා නිකම්, අපරාදේ වැඩක් කරන්න පුළුවන් ඇමැතිවරයෙක් වශයෙන්, බැණුම් අහන එක විතරයි වෙන්නේ.

ඒ නිසා ඕනෑම ආයතනයක ඇමැතිවරයා ඉහළ ඉන්නවා. ලේකම්වරයා එතැන නෛතික රාමුව හදනවා. ඇමැතිතුමාට සංකල්ප තිබෙනවා. උපදේශක කාරක සභාව තිබෙනවා. නිලධාරීන් ඉන්නවා. මේ යම් යම් නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය ඉතාමත් - දැන් අපේ ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ යම් නිලධාරීන් අකාර්යක්ෂමයි. සෘණාත්මක අදහස් තිබෙන්නේ. මේ නවීන ලෝකය ගැන කල්පනා කරන්නේ නැහැ. ඇමැතිතුමා දේශපාලන චරිතයක්. ඇමැතිතුමා ඉලක්කය සපුරන්නට ඕනෑ. තමන්ගේ නායකයාට යම්කිසි උවමනාවක් තිබුණා නම්, ඒකට නෛතික රාමුව හදලා, ඒක සපුරන්නට ඕනෑ. එහෙම නැති වුණොත් ඔහු යම් අසරණතාවයකට පත් වෙනවා. එහෙම හිතන්නේ නැහැ. තමන්ට වැටුප් ලැබෙනවා. තමන් පැය 08 ට රාජකාරී කළා. එහෙම නිලධාරීන් මේ ආයතනවලට වැදගත් වෙන්නේ නැහැ. මම නිරන්තරයෙන් කියනවා. පළාත් සභාව කියන්නේ, වැඩක් කරන්න පුළුවන් තැනක්. ඒ වැඩක් කරන්න පුළුවන් තැන අපි හදාගන්නට ඕනෑ. ඉතින් මම මෙහෙම කියන්න හේතුව තමයි, අපේ ඇමැතිතුමාගේ ප්‍රවාහන අමාත්‍යාංශය ගත්තත්, යම් යම් නිලධාරීන් ඉන්නවා නිදිමතේ ඉන්නේ. මොන දේ කිව්වත් කරුණු තිබෙනවා. අපේ සමාජයේ කථාවක් තිබෙනවා. අමාරුම වැඩක් කරන්න හොයා ගන්න ඕනෑ කම්මැලි මිනිස්සු. මේ ලෝකේ කරන්න බැරි අමාරුම වැඩේ දෙන්න ඕනෑ කම්මැලි මිනිහෙකුට. ඒ මිනිහා ඒක ඉතා ඉක්මණින් කරන්න ක්‍රමවේදයක් හදාගන්නවා.

ඒ වාගේම අපි මේ වැඩක් කරන්න බැරි මිනිස්සු අයින් කරලා, වැඩක් කරන්න පුළුවන් මිනිස්සු ගන්න වෙනවා. ඒ අය හරි මේවාට දාලා කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් අපි කිනම් අපේ තෙල් පුච්චගෙන ඇවිල්ලා ඇමැතිතුමාට කියනවා. අරයාට කියනවා. වැඩේ වෙන්නේ නැහැ. ආපහු ගෙදර යනවා. අවුරුදු ගණන් ගියපු වැඩ තිබෙනවා. මම ඇතුළු මන්ත්‍රීතුමන්ලාට වුණේ නැති ඒවා. මම ඒක කනගාටුවෙන් ප්‍රකාශ කළේ. ඇමැතිතුමා හොඳ වැඩක් කරන්න උත්සාහ කරන කෙනෙක්. මම එතුමාට මගේ ගෞරවය හදපතුලෙන්ම පුද කරනවා. මම මේ සභාවට ඇවිල්ලා කිව්වා, මම පත් වෙලා තිබෙන අසරණතාවය. මගේ ගමේ තිබෙන ප්‍රශ්නය. පාලමක් කඩාගෙන වැඩිලා. අද එතුමා ඒකට ධනාත්මකව හිතලා, ඒකට නිල් එළිය පත්තු කරලා දැන් ඒක ආරම්භ කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒකේ ගෞරවය දෙන්නට ඕනෑ. එහෙම අනුකම්පා සහගත ඇමැතිවරයෙක් ඕනෑ. පල්ලෙහා ඉන්න මන්ත්‍රීවරු යමක් කිව්වාම තේරෙන්න ඕනෑ. අවබෝධ වෙන්න ඕනෑ. ඒක ඉටු කර දෙන්න ඕනෑ. අපි මහා සතුටට පත් වෙනවා. අපට දැවෙන ප්‍රශ්නයක් විසඳලා දුන්නාම. එතකොට මේවා නොකරන නිලධාරියෙක් ඉන්නවා නම්,ඔහුව ඉවත් කරන්නත් අපි කටයුතු කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් අපට මේ ගමන යන්න පුළුවන්කමක් නැහැ. එම නිසා මේ ඇමැතිතුමාගේ අමාත්‍යාංශය ගන්න කොට කරුණු ගණනාවක් තිබෙනවා.

අපේ මාර්ග කියලා ගත්තොත්, ඉතා ඉහළ මාර්ග හොඳ තත්ත්වයෙන් නිර්මාණය කරනවා. ඉතින් මම ඇමැතිතුමාට

යෝජනාවක් වශයෙන් ගෙන එනවා. මේවායේ යම් යම් ඉදි කිරීම් සීමාවන් තිබෙනවා. මේවා ලකුණු කරලා නැහැ. මේවා ලකුණු කරන්න. එහෙම නැත්නම් ජනතාව ගෙවල් හදන්නේ පාර අයිනේ. එතකොට අපට ඉවත් කරන්න ගියාම ගැටළු ඇති වෙනවා.

ඒ වාගේම මම එතුමාගේ අමාත්‍යාංශයට වඩාත් ගරු කරන්නේ, ග්‍රාම සංවර්ධන විෂයයට. එතුමාගේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය හරහා ගමට ගිහිල්ලා කරන්න බැරි දෙයක් නැහැ. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙක් ඉඳලා මෙතැනට ආපු මම දන්නවා, පළාත් පාලන ආයතනය තුළ සභාතිවරයාට කරන්න පුළුවන් දේ. ඒ හා සමානම දෙයක් මේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයෙන් කරන්න පුළුවන්. මිනිස්සුන්ගේ ජන ජීවිතය ආර්ථික වශයෙන් සුරක්ෂිත කරන්න පුළුවන්. ඔවුන්ව සවිබල ගන්වන්න පුළුවන්. තමන්ගේ ගමේ තිබෙන ප්‍රජා සංවිධාන ගොඩ නඟන්න පුළුවන්. ඒ වාගේම ඒවායේ අසමතුලිතතා නැති කරන්න පුළුවන්. නිවාස හදලා දෙන්න පුළුවන්. පාරවල් හදලා දෙන්න පුළුවන්. ඒ වාගේම ගොඩනැගිලි හදලා දෙන්න පුළුවන්. දරුවාගේ පෙර පාසල හදලා දෙන්න පුළුවන්. විවිධ වූ කරුණු කාරණා ගණනාවක් කරන්න පුළුවන්කම තිබෙනවා. අපේ පළාත් සභාවේ ඇමැතිතුමාගේ අමාත්‍යාංශය වැඩි ආදායම් උත්පාදනය කරන ආයතනයක්. ඒ කියන්නේ, මෝටර් රථ දෙපාර්තමේන්තුව. ඒ වාගේම ව්‍යාපාර ලියාපදිංචිය. ආදී කරුණු ගණනාවකින් විශාල ආදායමක් මේ අමාත්‍යාංශයට ලැබුණත්, අවසානයේ එතුමාටත් ලැබෙන්නේ අර හා සමාන පුංචි මුදලක්. ඒ නිසා ඇමැතිතුමාට වැඩි ප්‍රමාණයක් ලැබුණා නම්, ලොකු වැඩක් කරන්න පුළුවන්කම තිබුණා. කනගාටුවට කාරණය තමයි අපේ ප්‍රදේශයේ මාර්ගය හැදෙනවා. මධ්‍යම රජයේ ඇමැතිතුමා පාරවල් හදන්න මුදල් පවරාගෙන තිබෙනවා. අපේ පාරවල්, පළාත් සභාව සතු පාරවල්. එතුමාට තිබුණා, සාධාරණයක් ඉටු කරන්න. අපේ පාරේ නම් සල්ලි ටික අධ්‍යාපන ඇමැතිතුමාට දුන්නා වාගේ අපේ පළාතේ ඇමැතිතුමාට දුන්නා නම්, එතුමාට තිබුණා තමන්ගේ මහ මාර්ග අධිකාරිය හරහා ඒ කාර්ය ඉටු කරන්න.

ඒ වාගේම අපේ නිවාස කොමසාරිස්තුමිය ගැන කිව්වොත්, අරමුදල ගැන කිව්වොත්, ඉන් අපි විශාල කාර්ය භාරයක් කරනවා. ඒ නිසා මම ඉස්සෙල්ලාත් කිව්වා වාගේ මේ දේශපාලනය, මේ ජන සමාජයේ ඇහැ නොගැටෙන මිනිස්සුන්ට මහ සේවයක් කරලා, මිනිස්සුන්ගේ හදවතට දැනෙන දේ කරලා, සතුටක් විඳින්න පුළුවන් තැනක් තමයි මේ අමාත්‍යාංශය කියලා මම හිතනවා. අමාත්‍යාංශ වැය ශීර්ෂ හරියට ගළපා ගත්තොත්, මිනිස්සුන්ගේ විවිධ වූ අවශ්‍යතාවයන් ඉටු කරන්න අපට පුළුවන්. කර්මාන්ත අමාත්‍යාංශය ගත්තත්. වෙනත් පාසල් අධ්‍යාපනය ගැන ගත්තත්. අපේ ප්‍රදේශවල ඉන්න කම්මල්කරුවා වෙන්න පුළුවන්. රන්කරුවා වෙන්න පුළුවන්.මැටිකරුවා වෙන්න පුළුවන්. එහෙම නැත්නම් උළු සාදන මනුස්සයා වෙන්න පුළුවන්. බට කර්මාන්තය වෙන්න පුළුවන්. මේ කර්මාන්ත ගොඩ නඟලා මේ මිනිස්සු මේ ජන සමාජයේ ගෞරවනීය තත්ත්වයට ගෙන එන්න පුළුවන් අමාත්‍යාංශයක්. ඒ නිසා ඇමැතිතුමාට යමක් කරන්න පුළුවන්. හොඳ බලතලත් තිබෙනවා. නමුත් ඔබතුමාට මුදල් අඩු වෙන්න පුළුවන්. හොඳ ලේකම්වරයෙක් සහ ඒ උපදෙස් දෙන කණ්ඩායමක් ගොනු කරලා වඩා හොඳ ඵලදායී සේවයක් මේ බස්නාහිර පළාතේ ඉටු කරලා නමක් තියපු ඇමැතිවරයෙක් වශයෙන් කටයුතු කරන්න කියලා ගෞරවයෙන් සිහිපත් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.44]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ ගුරුතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ බස් ගැනයි, බස්වල දොස් ගැනයි කියන්න අවස්ථාව ලැබීම ගැන ස්තුතිවන්ත වෙනවා. මම මගේ කථාව පටන් ගන්න කැමැතියි මේ විධියටම ගරු ඇමැතිතුමනි. ඔබතුමාගේ වැය ශීර්ෂයට 2015 දෙසැම්බර් මාසේ 21 වැනිදා -ඒ දෙසැම්බර් මාසේ 21 වැනිදා කථා කරපු විස්තරේ තියෙනවා අයවැය විවාද පොතේ. ඔබතුමාගේ වැය ශීර්ෂයට අදාළව 23 වැනි පිටුවේ තිබෙනවා මම කරපු ඒ කථාව. ඒ නිසා අද අලුතෙන් කථාවක් කරන්න තරම් හේතුවක් පැන නැඟිලා නැහැයි කියන එකයි මගේ විශ්වාසය. මොකද, එදා කථාවම තමයි අදත් කරන්න තිබෙන්නේ. පසුගිය අවුරුද්දේ ඔබතුමාගෙන් ඒ දේ අමුතුවෙන් වෙලා තිබෙනවාද කියන කාරණය විතරක් ඔබතුමා සිහිපත් කරලා බැලුවාම, හොඳටම ප්‍රමාණවත් වෙනවා. ඔබතුමාට මම එදා කථාවේ, තිබෙන දේවල් මේ කියන්නේ. මම එදා මේක කියලා, කියලා අන්තිමට කිව්වා මේක කරන්න එපා. අන්ධයාට කිරිවල සුදු කියනවා වාගේ වැඩක් කරන්න එපාය කියලා. ඒක මේ කථාවේ තියෙනවා. ඒ නිසා ඒක ඒ විධියටම වෙලා වාගේ තමයි අද

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

පේන්නේ. මේ පොතේ ඊළඟට පිටු 21 කට පස්සේ ඔබතුමාගේ කථාව තිබෙනවා. ඔබතුමා කියනවා මම මෙන්න මේ දෙවල් කරන්න බලාපොරොත්තු වෙනවා කියලා. 2015 දී කියනවා,2016 දී කරන්න බලාපොරොත්තු වන දේවල්. "බස්නාහිර පළාතේ ප්‍රධාන බස් නැවතුම් පොළවල් හතක් දැනටමත් තෝරාගෙන තිබෙනවා. ඒ හත නවීකරණය කරලා, මගීන්ට වඩාත් පහසුකම් සහිත බස් නැවතුම් පොළවල් හතක් බස්නාහිර පළාතේ හදනවා" කියලා. දැන් ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඔබතුමා කියයි,2015 වනකොට තෝරාගෙන තිබුණු, 2016 අවුරුද්දේ සංවර්ධනය කරපු මගීන්ට පහසුකම් වැඩිපුර දීපු, ඒ ප්‍රධාන බස් නැවතුම් පොළවල් හත මොනවාද කියන එක. දැන් ගිය සැරේ ඔබතුමාගේ කථාවේ කියනවා,"ඩිජිටල් තාක්ෂණයෙන් නව හැඳුනුම්පතක් රියදුරු, කොන්දොස්තර මහත්වරුන්ට ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා" කියලා. ඒ කාරණය සඵල වෙලා තිබෙනවාද කියලා මම ජගත් විතාන ගරු මන්ත්‍රීතුමාගෙන් ඇහුවාම එතුමා කිව්වා, තවම නම් එහෙම එකක් නැහැ. තවම Photo ගත්තෙත් නැහැයි කියලා. ඒ නිසා ඔබතුමාට ඒක කරගන්න බැරි වුණේ ඇයි කියලා ඔබතුමාගේ කථාවේදී ඔබතුමා කියයි.

ඔබතුමා ගිය සැරේ අයවැය කථාවේදී කියනවා, "GPS තාක්ෂණය යොදා ගනිමින් බස්රථ ධාවනය වන විධිය පිළිබඳව වඩාත් ඵලදායීව, ක්‍රමවත්ව පළාත තුළ බස් රථ ධාවනය වන විධිය අධීක්ෂණය කරන්න, නිරීක්ෂණය කරන්න GPS තාක්ෂණය යොදා ගන්න කටයුතු කරමින් තිබෙනවා" කියලා. ඒ නිසා දැන් මේ වනකොට කොයි කොයි මාර්ගවල, කොයි කොයි ප්‍රවාහන බස්වලට අදාළවද මේ GPS තාක්ෂණය ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. ගත වුණු අවුරුද්දක්, දවස් 365 ක් ඇතුළේ මේක වෙලා තිබෙන්නේ කොහේද කියලා ඔබතුමා දැන් ඔබතුමාගේ කථාවේදී කියයි.

නව මගී ආවරණ. ඔබතුමාගේ කථාවේ ගිය සැරේ කියනවා, "නව මගී ආවරණ තියෙන එවා අන්තිම සවුත්තුයි. ඒවා පිළිවෙළක් නැහැ. ලස්සනක් නැහැ. මගියෙකුට ඉඳගන්න බැහැ. ඒ නිසා පිළිවෙළක් ඇතුව නව මගී ආවරණ දෙනවා" කියලා. ඒකෙම ඔබතුමා කියනවා, හැම මන්ත්‍රීවරයෙකුටම මගී ආවරණයක් දෙනවා කියලා. හැබැයි අපිත් ඔබතුමාට නම දුන්නා. ස්ථානය දුන්නා. තැන දුන්නා. අවුරුද්දකට ඉස්සෙල්ලා මගී ආවරණයක් හදන්න කියලා. දින 365 කට තවම මගේ මගී ආවරණය පිළිබඳව තැන බලන්නවත් ආවේ නැහැ. ඒ නිසා ඔබතුමාගේ කථාවේදී කියාවි දවස් 365 ඇතුළේ මන්ත්‍රීවරුන්ට අදාළව මේ මගී ආවරණ ටික හදන්න බැරි වුණු හේතුව. එහෙම කියන කොට මම බලාපොරොත්තු වෙනවා - මේ කියන කථාව ඔබතුමාටයි, රංජිත් සෝමවංශ ඇමැතිතුමාටයි දෙන්නටම වලංගු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නයා වුණත් නිකන් හිටියොත් එහෙම දර මිටියට තියලා බඳිනවා. නයා වුණත් ටිකක් පෙනේ පුප්පන්න ඕනෑ. එතකොට තමයි නයා බව දැනගන්නේ. ඔබතුමාටයි, රංජිත් සෝමවංශ ඇමැතිතුමාටයි දෙන්නටම නිකම් උපාසක බලල්ලු සිල්ගත්තා වාගේ ඉඳලා අමාත්‍යාංශ කරන්න බැහැ. වුට්ටක් නිලධාරීන් එක්ක තකට තක ඉඳලා, ටිකක් හොයලා බලලා, ඒවා පසුපස ගමන් කරලා, කියන දේම අහලා හා හොඳයි කියලා කරන්න ගත්තොත් එහෙම ඉතුරු අවුරුද්ද ඇතුළත මේ ටික කරගන්න බැරි වුණා විතරක් නොවෙයි. ඔබතුමාව දර මිටියට තියලා බඳින එක බඳිනවා. ඒ නිසා නයා වුණත් වැඩක් නැහැ ටිකක් පුම්බන්න ඕනෑ. මම ගිය අවුරුද්දේ මේ කථාව කිව්වේ වෙනස් විධියකට. ඔබතුමාට ගිය අවුරුද්දේ මම කියපු උපහරණය කොටියා වුණත් වැඩක් නැහැ නියපොතු නැත්නම් කියලා. ඒ නිසා කොටියා වුණත් වැඩක් වෙන්නේ නියපොතු තියෙනවා නම් විතරයි. ඒ නිසා ඔබතුමාගේ නියපොතු එන්න තරම් වයසක් නොවෙයි දැන්. ඔබතුමාට තවම පුප්පන්න පුළුවන්කම තිබෙන නිසා මම බලාපොරොත්තු වෙනවා මේ දින 365 දී ඊළඟ අවුරුද්ද එනකොටවත් පුප්පලා, මේ වැඩ ටික කරයි කියලා. එහෙම නැත්නම් වැඩක් වෙන්නේ නැහැ.

ඔබතුමා ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසේ 21 වැනිදා සමූපකාර සේවකයන් ගැන කිව්වා. 2016 ජනවාරි ඉඳලා සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට අවශ්‍ය කටයුතු මේ වනකොටත් සකස් කරලා තිබෙන්නේ කියලා. ගිය අවුරුද්දේ වැටුප් වැඩි කළාද, නැද්ද කියන කාරණය ඔබතුමා දන්නවා. ඒ නිසා ඒ සේවක පන්තියේ තිබෙන අඩුපාඩු කළාද නැද්ද කියලා ඔබතුමා දන්නවා. ඊළඟට ඔබතුමාට ඒ වනකොට ධීවර අමාත්‍යාංශය තිබුණා. පස්සේ ඔබතුමාට ධීවර නැති වුණා. ඔබතුමා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ගැන දීර්ඝ වශයෙන් කියලා තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ගරු ඇමැතිතුමාගෙන්

බලාපොරොත්තු වෙනවා. පසුගිය අවුරුද්දේ මේ දින 365 ඇතුළේ ඒ අයවැය විවාදයේ මම ඇතුළු කථික මන්ත්‍රීවරු කථා කරපු, යෝජනා කරපු, ඉල්ලපු, පෙන්වා දීපු දේවල් මොන තරම් දුරට වෙලා තිබෙනවාද නැද්ද කියන කාරණය ඔබතුමා ස්වෙච්ඡාවෙන් සොයන්න. අධ්‍යයනය කරන්න. කල්පනා කරන්න. ඔබතුමාට දොසක් කියන්න කල්පනා කරන්නේ නැහැ. ඔබතුමාත් හොඳ ඇමැතිවරයෙක්. ඔබතුමා අපේ හඬට ඇහුම්කන් දෙනවා. අපේ ඉල්ලීම් දිහා බලනවා. හැබැයි ඒවා ප්‍රායෝගිකව වන විධිය පිළිබඳව, ඒවා අධීක්ෂණය කරන විධිය පිළිබඳව ඔබතුමාට වාගේම අපටත් ගැටළු තිබෙනවා. ඔබතුමාට හොඳ නිලධාරී කණ්ඩායමක් ඉන්නවා. ඔබතුමාට හොඳ පෞද්ගලික ලේකම්වරයෙක් ඉන්නවා. ඔබතුමාට හොඳ පෞද්ගලික කාර්ය මණ්ඩලයක් ඉන්නවා. ඒ නිසා ඔබතුමා උත්සාහ කරන්න, ඒ සම්පත් උපයෝගී කරගෙන, ඔබ අමාත්‍යාංශය ගැන කවුරුත් ප්‍රසාදාත්මකව කථා කරන අමාත්‍යාංශයක් බවට පත් කර ගන්න. ඔබතුමාට මේක කියන්නේ, ඉතාමත්ම ගෞරවයෙන් සහ හිතවත්ව. මොකද, ඔබතුමා මේ පළාත් සභාව ඇතුළේ අපට වඩා බොහෝ ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයෙක්. ඒක නිසා ඔබතුමාගේ ගෞරවය රකින්නයි මම මේ කාරණාව කියන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගිය අවුරුද්දේ සමූපකාරය ගැන කියද්දී මම ගරු ඇමැතිතුමාට කිව්වා, මේ සමූපකාර ප්‍රඥප්තිය අවුරුදු ගණනක් පස්සට ගිහිල්ලා තිබෙනවා. ඒ සමූපකාර ප්‍රඥප්තිය වෙනස් වෙන්න ඕනෑ. ඒ සමූපකාර ප්‍රඥප්තියත් එක්ක මේ තිබෙන සමූපකාර ක්‍රමය පවතින තරගකාරී වෙළඳ පොළ ඇතුළේ දියුණු කරන්න පුළුවන්කමක් නැහැ. ෆුඩ් සිටි එක්ක, වෙනත් ආයතන එක්ක දියුණු කරන්න නම්, ප්‍රඥප්තියේ ඉඳලා සියලු අංග වෙනස් වෙන්න ඕනෑ. ඔබතුමා සමූපකාරයේ දියුණුව පිළිබඳව කිව්වා. ඒවා සාකච්ඡා කරලා තීන්දු තීරණ ගන්න පුළුවන් කමිටුවක් නම් කරන්න කියලා. ඔබතුමා කමිටුවක් නම් කරන්න පොරොන්දු වුණා. දින 365 ක් ගිහිල්ලා තිබෙනවා. ඔබතුමාට තවම කමිටුව නම් කරගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ වාගේම ඔබතුමාට මම කිව්වා, සමූපකාරය තමයි ගොඩ නගන්න පුළුවන් ලෙහෙසිම ආයතනය. මොකද, හේතුව සමූපකාරයේ සෑම සේවකයෙක්ම ලංකාවේ 1982 අංක 12 දරන පොදු දේපළ පනතින් පවා බැඳිලා තිබෙනවා. ඒකට වරදක් කරන උදවිය මහාධිකරණයෙන් ඇප ගන්න ඕනෑ. එහෙම බලසම්පන්න ආයතනයක නීතියක් රීතියක් යටතේ තිබෙන ආයතනයක් කඩා වැටෙන්න යනවා නම්, ඒ කඩා වැටීමට ප්‍රධාන හේතුව පරිපාලනයේ වැරැද්දක් මිසක්, සේවකයන්ගේ වැරැද්දක් වෙන්න බැහැ. ඒ නිසා ගොඩ ගන්න පුළුවන් ආයතනයක් විධියට සමූපකාරය මම තමුන්නාන්සේට හඳුන්වා දෙන්න කැමැතියි. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගිය අයවැයේදී මම කිව්වා, ඊළඟ අවුරුද්දේ අපි අයවැය ශීර්ෂය යටතේ කථා කරන කොට මේක කාටවත් කියන්න තියන්න එපා කියලා. ඔබතුමාට එදා බොහොම ආදරයෙන්, ගෞරවයෙන්, භක්තියෙන් කිව්වා, මේ අයවැයේදී අපි ඔබතුමාට ඇඟිල්ල දික් කරලා කථා කරනකොට උපාලි කොඩිකාර කියන තමුන්නාන්සේගේ අමාත්‍යාංශයත්, පළාත් සභාවත් දෙකම විනාශ කරපු, අද පළාත් සභාවට ඇවිල්ලා -

[සභාවේ ඝෝෂා]

කෑගහන්න එපා. පනින්න එපා. අද පළාත් සභාවට ඇවිල්ලා මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය විනාශ කරන ආකාරයට පළාත් සභාවේ හැසිරුණේ. අද පළාත් සභාවේ හැසිරුණේ බේබද්දෝ හැසිරෙන විධියට. ඒ නිසා එහෙම ඇමැති කෙනෙක් යටතේ තිබුණු අමාත්‍යාංශය තමුන්නාන්සේට අපි කිව්වා කැහි ගැනි දීලා හොටු ගැනි ගන්න එපා කියලා.

[සභාවේ ඝෝෂා]

මේකේ පාරවල් නැති ඉඩම් ගත්තා. මේ සමූපකාරයත්, අමාත්‍යාංශයත් විකුණපු, කාපු උදවිය අද මේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය නැති කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බූරු ගහන්න හොඳයිද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද පාරේ යන හැම බස් එකකම, හැම වාහනයකම දුම පරීක්ෂා කරන්න ලංකාවේ නීතියක් තිබෙනවා. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

යටතේ, පළාත තුළ දුවන වායු සමීකරණ බස් එකකට තමුන්නාන්සේ නැගලා බලන්න. එක කිලෝ මීටර් හයක් ගිහිල්ලා බලන්න. කිලෝ මීටර් හතරක් ගිහිල්ලා බලන්න. ඒ බස්වල A/C තියෙනවාද? කියලා. එක බස්වල A/C නැහැ. මම පෙරේදා කොළඹ ඉඳලා පානදුරේට A/C බස් එකක ආවා. බස් එකෙන් බහින්න බැරිකමට ආවා. අවුරුදු ගණන් පරණ බස්. ඒවා ඇතුළේ A/C නැහැ. මගීන් අන්ත දුකක් විඳිනවා. අර වායු විමෝචනය කරනවා වාගේ තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ මේ අධි සුඛෝපභෝගී ප්‍රවාහන බලපත්‍රය යටතේ ගමන් කරන බස් රථවල වායු සමීකරණ වැඩ කරනවාද? ඒවා මගීන්ට යන්න සුදුසුද? කොළඹ ඉඳලා පානදුරේට රුපියල් 80 ක් ගන්නවා. ඒ රුපියල් 80 ට සාධාරණයක් වෙනවාද කියන එක සහ එය ප්‍රතිමියට තිබේද කියන එක තමුන්නාන්සේ හොයලා බලන්න. ඒ වාගේම පසුගිය දවසක අපි මාධ්‍යවල දැක්කා, සමහර බස් ඇතුළේ සිංදු සහ නිල් වීඩියෝ පට පෙන්වනවා. ඒ නිසා මෙන්න මේ දේවල් පරිපාලනමය වශයෙන් පාලනය කරන්න පුළුවන් වැඩ පිළිවෙළක්, ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා කිව්වා. බලපත්‍ර ලබා ගැනීමේදී සිදු වුණු අපහසුතාවය පිළිබඳව. ඒවා ප්‍රාදේශීය වශයෙන් ඉෂ්ට කරන්න බලන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් ගරු ඇමැතිතුමාට අවසාන වශයෙන් කථාවක් කියන්න කැමැතියි. එක මීයෙක්ව මැද්දෙන් මීයාගේ එක පැත්තකින් පාන් තිබ්බා. මීයාගේ අනේක පැත්තෙන් චීස් තිබ්බා. මීයා බලාගෙන ඉන්නවා. පාන්ද, චීස්ද, පාන්ද චීස්ද කියලා.

[සභාවේ ඝෝෂා]

මැද්දේ මීයා. පාන්ද චීස්ද කියලා බල බලා ඉන්නවා.

[සභාවේ ඝෝෂා]

දෙපැත්ත බල බලා, පාන්ද, චීස්ද කියලා බල බලා හිටපු මීයාගේ බෙල්ල කැපුනා වාගේ ඔබතුමාගේත් බෙල්ල කැපෙන කල් ඉන්න එපා. මේ පළාත් සභාවේ (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාගේ දහයක් දොළහක් මට දවසකට හම්බ වෙනවා. හැබැයි මේ කට්ටියට දෙන්න මම තණකොළ වවලා නැහැ. බොහොම ස්තුතිය.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම අපි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ආසනයට ගිහිල්ලා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථාවක් තිබෙනවා. මේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ඒ කථාව වෙලාවට ඉන්න ඕනෑ. මොකද, මෙතුමාගේ සූට් එක ගලවලා මම සාමාන්‍ය මිනිහෙක් ගණනට - ඇයි මෙයා තමයි උසාවියේ ජරාව කන එකම නීතිඥයා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා වාඩි වෙන්න. හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ජරාව කනවා. මෙතුමා නඩුවක් කිව්වාම 12.25 සුනිල් සරත් නඩුවට ඉදිරිපත් වුණාම ආ... Sir. Thank you Sir. ... Sir. ...මගේ විවාදය -

[සභාවේ ඝෝෂා]

මන්ත්‍රීතුමා ඔයා පැනලා දෙන්නේ නැතුව වාඩි වෙන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

රීති ප්‍රශ්නයක්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපි සභාව ඇතුළට එනකොට අපේ හැම එකක්ම අත ගාලා, පරීක්ෂා කරලා එවන්නේ. අඩුම ගණනේ මේ ටැබ් එක ගේනකොටත් කිව්වා මේක ගෙනියන්න දෙන්න බැහැයි කියලා. මම යෝජනාවක් වාගේම වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට මතු කරනවා. ඇතුළට එනකොට බැලූන් එකක් පුම්බලා ගන්න කියලා. මම යෝජනා කරනවා, බැලූන් පුම්බලා හැම මන්ත්‍රීවරයෙක්ම ගන්න කියලා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රතු -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාර්ග, ප්‍රවාහන,සමූපකාර සංවර්ධන සහ වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විනාඩියක් ඉන්න. රීති අංකය මොකක්ද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

36 (1) යටතේවරප්‍රසාද. මෙතුමා මගේ සහ වෘත්තිමය වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නිර්මාණය කරලා තිබෙන නීතිඥ වෘත්තිය පිළිබඳව අගෞරව, අපහාස වන විධියට කථා කළා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. බල්ලෝ උඩු බිරුවාට නීතිඥවරු සැලෙන්නේ නැහැ. බල්ලෝ හඳට බුරන්නේ. ඒ නිසා එහෙම සැලෙන්නේ නැහැ. නමුත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ වාගේම මේ සභාවේ යම් මන්ත්‍රීවරයෙක් බීමතින්, අශෝභන විධියට හැසිරෙනවා නම්, අවුරුදු 28 ක් පුරා මේ සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය නැති වෙන්නේ. ඒ නැති වෙන්නේ, මහ ඇමැතිතුමාගේ ගරුත්වය. ඔය ආසනයේ ඉන්න තමුන්නාන්සේගේ ගරුත්වය. බීලා, අශික්කිත, අශිලාචාර විධියට හැසිරෙනවා නම් මේ සභාව -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ සම්බන්ධව දැඩිව ක්‍රියා කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගැන මහ ඇමැතිතුමා දැනුවත් කරලා - එතුමා පියවරක් ගත්තේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෙතුමාව එළියට දාන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එය මගේ අවධානයට යොමු වුණා. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රවාහන ඇමැතිතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් සාකච්ඡා වන මොහොතේදී -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

යහපාලනයේ උන්ට පොඩි පිස්සුවක් තියෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම දැන් උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාව නම් කරනවා. මීළඟට ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 03.57]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයේදී වචන කිහිපයක් කථා කරන්න ලැබීම ගැන සන්තෝෂ වෙනවා. ඇත්ත වශයෙන් විපක්ෂයේ අපේ සහෝදර ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා මීට ප්‍රථම කථා කරපු වෙලාවේ මට මතක් වෙනවා, දීර්ඝ කාලයක් තිස්සේ මෙතුමා මේ ප්‍රශ්නය යොමු කරනවා. මොකද, මමත් දන්නවා නගරයක ජීවත් වන පුද්ගලයෙක් හැටියට මේ බස්වල තිබෙන ප්‍රශ්න පිළිබඳව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ඇමැතිතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු කරන්න කියලා, පළමුවෙන්ම කියනවා. ඔබතුමාගේ අමාත්‍යාංශවල සියලුම අංශවලට අවශ්‍ය කරන ශක්තිය අපි ලබා දීලා තිබෙනවා. අපි ඉල්ලීමක් කරනවා. ඔබතුමා ඒ කාල වකවානුවල වැඩ කරගෙන යද්දී, අපි දැකලා තිබෙනවා. විවිධ කටයුතු නිර්මාණය කරන්න, අලුත් වැඩක් කරන්න, අලුත් දෙයක් හඳුනා ගන්න උත්සාහ කරනවා. අපි නිලධාරීන්ගෙන් ඉල්ලීමක් කරනවා. 2017 වසරේදී ඒ අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරලා දෙන්න.තමුන්නාන්සේලාගේ තිබෙන අලුත් අලුත් යෝජනා ගෙනැල්ලා මේ ප්‍රවාහන ක්ෂේත්‍රයට අවශ්‍ය කරන ශක්තිය ලබා දීලා, අලුතින් මුදල් උපයා ගැනීමේ ක්‍රමවේදය හඳුන්වලා දීලා, මේ පළාත් සභාවට අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ග්‍රාම සංවර්ධනය පිළිබඳව කථා කරන කොට ගමේ ජනතාව දැනුවත් කරලා ග්‍රාම සංවර්ධන සමිති දිරිමත් කරලා, අවශ්‍ය කරන ශක්තිය තව තවත් වැඩිපුර නිර්මාණය කරන්න කියලා අපි ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමා ප්‍රධාන නිලධාරීන්ගෙන් ඉල්ලීමක් කරනවා. ඒවායේ අඩුපාඩු තිබෙනවා. සමහර තැන්වල ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්න නිරාකරණය කරලා අලුත් වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න තමයි අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් සමුපකාරය පිළිබඳව කථා කළා. මට මතකයි පුංචි කාලේ අපි පන් මල්ල අරගෙන සමුපකාරයට ගිහිල්ලා, අර පුංචි බිල් කැල්ල දීලා, ජාති 20 ක් විතර ඒකෙන් අරගෙන එනවා. අද සමහර සමුපකාර තිබෙනවා. ඇරගෙන ඉන්නවා. ඒක දිහා බලන්නත් ලැජ්ජයි. මොකද, හේතුව ඒවා කිසිම අලංකාර විධියකට නොවෙයි තිබෙන්නේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

රුපියල් 5000 ක බඩු නැහැ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

5000 ක නොවෙයි. රුපියල් 100, 200 කවත් බඩු නැති තැන් තිබෙනවා. අලුත්ගම නගරයේ තිබෙන සමුපකාරයත් ඒ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මම හිතනවා. අදාළ ඒවා පරීක්ෂා කරලා, අවශ්‍ය කරන ශක්තිය දෙන්නය කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දන්නවා ඇති අලුත්ගම නරගයේත්, මග්ගොන නගරයේත් පළාත් සභාවට අයිති ෂෙඩ් දෙකක් තිබෙනවා. සමුපකාර ෂෙඩ් දෙකක්. ඊයේ පෙරේදා වනකොට එක සමුපකාරයක ෂෙඩ් එකකට මුල්ගල තිබ්බා. හැබැයි ගරු ඇමැතිතුමා දන්නෙත් නැතුව ඇති. එහෙම නේද ගරු ඇමැතිතුමනි. ඔබතුමාගේ විෂයය. අපට කමක් නැහැ. කවුරු හරි මේක අලංකාර විධියට හදන්නයි ඕනෑ. ඒ වාගේම කැබිනට් අමාත්‍ය රාජිත

සේනාරත්න මැතිතුමා තමයි මුදල් ගෙනැල්ලා, ඒ වැඩ කටයුතු ආරම්භ කරන්න කටයුතු කළේ. අපි ඒකට ස්තුතිවන්ත වෙනවා. හැබැයි විෂයය භාර ඇමැතිවරයාවත් දැනුවත් කිරීම හෝ මේ නිලධාරීන් දැනුවත්වීම යුතුකමක් විය යුතුයි. එහෙම නැත්නම් මම නිලධාරීන්ගෙන් අහනවා, ඔබතුමන්ලා මේ ප්‍රශ්නය පිළිබඳව දැනුවත් වුණාද? එහෙම නම් පළාත් සභා විෂයයක් පිළිබඳව අදාළ පළාත් සභා මන්ත්‍රීවරු දැනුවත් කළාද? ඇමැතිතුමා දැනුවත් කළාද කියන එක අපි අහන්න කැමැතියි.

ඒ වාගේම අපට අයත් ස්කාගාර කිහිපයක් තිබෙනවා. ඒ ස්කාගාරයට අවශ්‍ය ශක්තිය නිර්මාණය කරන්න මම හිතනවා ලොකු දේවල් කරන්න අවශ්‍ය වෙනවා. ඒ නිසා සමහර තැන්වල මහ පරිමාණයේ වංචා දූෂණ සිදු වෙලා තිබෙනවා. මම හිතන්නේ, ඒවා නැවත හරියාකාරව ගෙනැල්ලා කටයුතු කරන්න, ඔබතුමාගේ කාල වකවානුව තුළ ක්‍රියාත්මක කරන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම වතු යටිතල පහසුකම් පිළිබඳව තමුන්නාන්සේ දන්නවා. අහිංසක දුප්පත් මිනිස්සු ජීවත් වන ප්‍රදේශ හැටියට කළුතර දිස්ත්‍රික්කයේ සමහර තැන්වල පාරවල්වල යන්න බැහැ. විශේෂයෙන් වතු පාරවල්වල. දෙමළ ජාතීන් ජීවත් වන ප්‍රදේශවල. ඒ වතු පාරවල් ටික හදන්න ලබන වසරේදී ඔබතුමාගේ ප්‍රතිපාදන වෙන් කරලා, අපට ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි ගරු නියොජ්‍ය සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ආසනය කියන ප්‍රදේශය තුළට මේ අවුරුද්දේ මම හිතන්නේ කාපට් ව්‍යාපෘති කිසිම දෙයක් ලැබුණේ නැහැ. ඒ අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරන්න විශේෂයෙන්ම ඉෆ්තිකාර් ජෙමිල් ගරු මන්ත්‍රීතුමා මෙතැන හිටියා නම් මම සතුටු වෙනවා. මොකද, හේතුව එතුමා ජීවත් වන මුස්ලිම් ජනතාව ඉන්න ප්‍රදේශවලට හිටපු පළාත් සභා මන්ත්‍රී අම්ජාඩ් මැතිතුමා හැම පාරකටම කාපට් දාලා ඉවර කළා. හැබැයි, අපේ ජනතාව ජීවත් වන ප්‍රදේශවලට කාපට් පාරවල් ඉතාම අල්පයයි ලැබුණේ. ඒ නිසා මේවා හදලා නැහැ. මේවායේ යන්න බැහැ. සමහර තැන්වල ඒ අයට විතරයි කාණු දාගත්තේ. අන්න ඒ නිසා ඔබතුමා, ඔබතුමාගේ නිලධාරීන් යොදලා අවශ්‍ය කරන ශක්තිය මට විතරක් නොවෙයි. මේ සියලුම මන්ත්‍රීවරුන් ගෙනැල්ලා කථා කරලා, අවශ්‍ය කරන තැන් සොයා බලලා, අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම තමයි -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අම්ජාඩ් සභාපති වුණා නම්, කොහොම තියෙයිද?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

සභාපති වෙන්න දුන්නේ නැත්තේ ඒක නේ? ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා හරහා ඉල්ලා සිටිනවා. අපේ නිවාස හා ඉදි කිරීම් අමාත්‍යාංශය තුළින් අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස හදන්න ප්‍රතිපාදන ලබා දීම පිළිබඳව අපි අමාත්‍යාංශයට ගියාම අපේ අධ්‍යක්ෂතුමිය මම හිතන්නේ, ඉතාමත් කරුණාවෙන් හැම නිලධාරියෙක්ම එකතු වෙලා අපට ලොකු ශක්තියක් ලබා දෙනවා. අපේ ප්‍රදේශයේ ජනතාවට ඉක්මණින් නිවාස ආධාර ටික ලබා දීලා අවශ්‍ය කරන කටයුතු නිර්මාණය කරන්න. අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රධාන අනෙකුත් සියලු නිලධාරීන්ට අපි හදවතින්ම ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වාගේම 2017 අවුරුද්ද තුළ අයවැයත් එක්ක ගරු ඇමැතිතුමාගේ සිතුම් පැතුම් සියල්ල ඉටු කර ගන්න ඒ වාගේම වෙලාවට උපදේශක කාරක සභාව පවත්වලා අවශ්‍ය කරන යෝජනා සියල්ල අරගෙන කාර්යක්ෂම සේවාවක් ලබා දෙන්න කටයුතු කරන්න ඔබතුමාට ශක්තිය, ධෛර්ය, වාසනාව සහ සියලුම නිලධාරීන්ගේ සහයෝගය උපරිම ලැබෙනවා කියන එක මතක් කරමින් මට අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 04.05]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමු කොටම මම සඳහන් කරන්න ඕනෑ. මාර්ග, ප්‍රවාහන සම්බන්ධයෙන් කථා කරන කොට,අපි සැලකිය යුතු මට්ටමක මාර්ග සංවර්ධනය කරලා තිබෙන එක පිළිගන්න ඕනෑ. මේ වනකොට රටේ සාමාන්‍යයෙන් ප්‍රමාණවත් මාර්ග සංවර්ධනයක් සිදු වෙලා තිබෙනවා. ප්‍රවාහනය සම්බන්ධයෙන් කථා කරන කොට මේ ඇමැතිතුමා පත් වෙලා ඇත්ත වශයෙන්ම පසුගිය රාජපක්ෂ පවුල් පාලනය අවසන් කරලා, අපි නව

අමාත්‍යවරු පත් කරලා, රට ඉස්සරයාට ගෙනියන්න සූදානම් වනකොට අපේ ඇමැතිතුමා නම් පවුලේ කාටවත් පත්වීම් [ගරු රෝස් ප්‍රනාන්දු]

දීලා නැහැ. සභාපති කරලා නැහැයි කියලයි මට දැනගන්න ලැබෙන්නේ. ඒ ගැනත් අපි සන්තෝෂයට පත් වෙනවා.

ඒ වාගේම කියන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විවිධ ප්‍රශ්න අරඹයා මෑතකදීත් පෞද්ගලික බස් රථ උද්ඝෝෂණයක් තිබුණා. බස් රථ ධාවනයේදී මෑතකදී බස් රථ 20 ක් ධාවනයට එක් කරලා තිබෙනවා. එක දිනකට වැඩි නිසා බස් රථ 15 ක් නවත්වනවා. ඒක කරන්නේ ක්‍රමානුකූලව. ඒ නවත්වන්නේ වැඩි නිසා. ඒ අයට ඉඩකඩ මදී නිසා නවත්වලා තමයි ධාවනයට දෙන්නේ. මම හිතන්නේ ප්‍රවාහනය ගැන කථා කරපු අපේ අනෙක් මන්ත්‍රීතුමාත් දන්නවා. එහෙම තියෙද්දී, තව 20 ක් දුන්නාම තරගය තවත් වැඩි වෙනවා. එතකොට මගදී ගහගන්නවා. අපට හොඳට අත්දැකීම් තිබෙනවා. අපට ඒ ප්‍රශ්න අරගෙන එන නිසා. මේ යන මාර්ගයේදී ඒ අයට ටිකක් දුරට ගිහිල්ලා, මගීන් ගන්න නම් දීලා තිබෙන්නේ. මගීන් ගත්තු ගමන් වෙන බස්වල කට්ටිය ගහගන්නවා. ඉතින් එවැනි ව්‍යාකූලතා වැඩි කරන්න තමයි මේ වනකොට ක්‍රියා කරමින් පවතින්නේ. ඉතින් මේ පිළිබඳව ඇමැතිතුමාට අපි කියනවා. අපි දෝෂාරෝපණය කරනවා නොවෙයි. විධිමත් ඒ වාගේම සංවර්ධනාත්මක ගමනක් යනකොට ඒ වාගේ දේවල් හොයලා බලලා කරන්න ඕනෑ. පර්මිට් දෙනකොට කීයක් හරි අතට ලැබෙනවාත් ඇති. විශේෂයෙන් ඒ ගැන කියන්න ඕනෑ.

ඊත් එක්කම රියදුරු පුහුණුව දෙන්න මගේ අරමුදල් මම අපේ කටාන කොට්ඨාශයට වෙන් කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම වෙන් කළාම, විභාගය පාස් කරලා අපට දිනයක් දෙනවා ගිහිල්ලා රිය පුහුණුව පෙන්වන්න. ඒ කියන්නේ, අපේ දක්ෂතාවය පෙන්වලා, සමර්ථභාවය ගන්න. ඉතින් මේකට මේ බස්නාහිර පළාත් සභාවේ වාහනයක් ඇවිල්ලා, ඒ අය පුහුණු කරන්න ඕනෑ. දැන් මම මුදල් වෙන් කළාට පස්සේ අපේ ගරු ඇමැතිතුමා, වාහනය කැඩිලා කියලා මාස හතරක් පහක් යනවා. විභාගය පාස් කරපු අයට වෙනම ගිහිල්ලා ඉගෙන ගෙන තමුන්ගේ හැකියාව පෙන්වල ලයිසන් එක ගන්න වෙනවා. ඉතින් ඔබතුමාගේ අවධානයට මම ඒක යොමු කරනවා. සභාපතිතුමා ඔබතුමාගේ කවුරුවත් නොවෙනවා වෙන්න ඇති. ඡන්ද හදන්නේ නැතුව, අර වැඩ පිළිවෙළ ඉතාම ලස්සනට ක්‍රියාත්මක කරනවා නම් හොඳයි. එතැන ඉන්නේ, ඔබතුමාගේ නෑදැයෙක් නොවෙයි. ඒ නිසා කරුණාකරලා අපි දෙන ඒ අරමුදල් යොදවලා අපට ඒ පහසුකම හරියට ලබලා දෙන්න. දැන් මාස 06 ක් විතර වෙනවා. මම පුහුණුවට දාලා බලාගෙන ඉන්නවා. දැන් මගේ අතින් වෙනම වාහනක් දාලා පුහුණු කරනවා. මොකද, මිනිස්සු මාව කන්න යනවා. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා වැදගත් කරුණු. කියද්දිත් හිනා යනවා. හවුල් ආණ්ඩුවක් කියලා කියනවා. අපට බණින්නත් බැහැ. අපට දැඩිව එරෙහි වෙන්නත් බැහැ. ඡන්දය නොදී ඉන්නත් බැහැ. මේක හරියට අර අපිව ගිනි ගොඩක් මැද්දට දාලා තිබෙනවා වාගේ අමාරු අවස්ථාවක්.

ඊට අමතරව මේ ග්‍රාම සංවර්ධනය ගැන කථා කරද්දී අපි දකිනවා, ස්වෙච්ඡා සංවිධාන රාශියක් ග්‍රාම සංවර්ධනයට බිහි වෙලා තිබෙනවා. ඒවායේ නිසි අධීක්ෂණයක් වෙන්නේ නැහැ. මිනිස්සුන්ට ඕනෑ විධියට මුදල් එකතු කරනවා. ඕනෑ විධියට ව්‍යාපෘති කරනවා. සමහර විට ඒ මුදල් සභාපති ලේකම් අත්සන් කරලා අරගෙන කොමිෂන් එක සාක්කුවේ දාගන්නවා. මේ ග්‍රාම සංවර්ධනයේදී අවධානය යොමු කරන්න ඕනෑ විශේෂ පැත්තක් තිබෙනවා. මේක අපෙන් ගිලිහිලා ගිහිල්ලා. මේකෙන් සමහර මිනිස්සු අයුතු විධියට ප්‍රයෝජන ගන්නවා. ඒකෙන් පීඩාවට පත් වෙන්නේ මහජනතාව. මේ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. අපි මේවා ද්වේශයෙන් කියන්නේ නැහැ. පුතා හිටියා කියලා හිත අමාරු කර ගන්න එපා.

[සභාවේ ඝෝෂා]

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් යහපාලන ආණ්ඩුව ආවට පස්සේ අපි කිව්වා, අපටත් ඔය රස්සාවල් දෙකක් දෙන්න. අපි අවුරුදු 20 ක් මහන්සි වෙලා, ආණ්ඩුව අරගෙන දීලා අපටත් රස්සාවල් දෙකක් දෙන්න කියලා. අපේ අතරත් රස්සාවල් නැති කට්ටිය ඉන්නවා. මට එක්කෙනෙක්ව රස්සාවකට එවන්න කිව්වා. යැව්වාම, හැම අවුරුද්දේම Leakage වෙලා නඩු දාන ජොබ් එකක් මට එවලා තිබුණා. ඒකට ගියා නම් කොල්ලා හිරේ යනවා. ඒ ආකාරයට දක්වපු සහයෝගයටත් ස්තූති කරන්න ඕනෑ. මම හිතන්නේ තුන් හතර සැරක් අමාත්‍යාංශයට එන්න කියනවා. ඇත්ත වශයෙන්ම කථා කරන්න කාල වේලාව

මදී. නමුත් මම උපහාසාත්මකව කිව්වත් ඇමැතිතුමාට මම කියනවා, අපි බොහොම බුද්ධිමත්ව මේ දිහා බලාගෙන ඉන්නවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ මීන් ඉදිරියට යථාවත් කරලා හරියට වැඩ කරන්න කියලා ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 04.11]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

கௌரவ எம்.எஸ்.எம். ரஹீம் பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம், பிரதி தவிசாளர் அவர்களே, இன்று வீதி, 95 போக்குவரத்து, கூட்டுறவு அபிவிருத்தி மற்றும் வியாபாரம், வீடமைப்பு நிர்மாணம், தோட்ட உட்கட்டமைப்பு வசதிகள், கைத்தொழில் மற்றும் கிராம அபிவிருத்தி தொடர்பான அமைச்சின் கீழ் எனக்கு கதைக்க கிடைத்தமைக்கு முதலில் நான் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அத்துடன்,

මගේ පටන් ගැනීම දෙමළ භාෂාවෙන් වුණත් මම සිංහල භාෂාවෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. අපේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමා කටාන ආසනයේ- මම පදිංචි මීගමුව ආසනයේ. කටාන ආසනයේ අවුරුදු 23 ක පළපුරුද්ද තිබුණ ගරු ඇමැතිවරයෙක්. අද දෙවැනි අයවැයට එතුමාගේ අමාත්‍යාංශයට කථා කිරීමට අවස්ථාව ලැබුණු අවස්ථාවේ ඒ ගැන තොරතුරු කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ප්‍රවාහනය සම්බන්ධව කථා කරන කොට මම ගිය අවුරුද්දේත් කථා කළා. බස් රථයේ කාන්තාවන්ට ආසන වෙන් කිරීම සඳහා මම ඉල්ලීමක් කළා. නමුත් අද වනතුරු ඒක ඉටු වෙලා නැහැ. ඒ කියන්නේ, කාන්තාවන්ට හරි කරදරයක්. පෞද්ගලික බස්වල හෝ යනකොට හරි ප්‍රශ්න. ඒ වාගේම ගැබිණි මව්වරුන්, වයසක අම්මලා ඒ බස්වලට බොහොම අමාරුවෙන් නගින අවස්ථා තිබෙනවා. ඒ වාගේම ආබාධිත රණවිරුවන් ඒ බස් එකේ නගින කොට මම හිතන්නේ අඩි 1 ½ ක් 2 ක් උඩට කකුළ තියලා තමයි නගින්න ඕනෑ. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරලා බස් එකට නගින අම්මලාට, ගැබිණි මව්වරුන්ට, ආබාධිත රණවිරුවන්ට නගින්න පහසු විධියක් - අපි විදේශ රටවල දකිනවා ඒ වාගේ ආබාධිත අය නගින කොට ඒකට අවශ්‍ය විධිවිධාන හදලා තිබෙනවා. නමුත් අපේ රටේ තව වනතුරු ඒවා හදලා නැහැ. ඒකෙන් දුකට පත් වන, ඒ වාගේම ඉන්දියාවේ බස් එකක යනකොට මගීන් ප්‍රමාණය අතිවිශාලයි. අපේ බස් එන්න එන්න පොඩි වෙලා. සීට් එකේ වාඩි වුණොත් දෙන්නෙකුට වාඩි වෙන්න බැහැ. එක්කෙනෙක්ගේ භාගයක් සීට් එකෙන් එළියේ තියෙන්නේ. ඒ ගැනත් අවධානය යොමු කරලා අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ඔබතුමාගේ විෂයයක් තමයි නිවාස ඉදි කිරීම. නිවාස ඉදි කිරීමේදී, ඔබතුමා හරි දක්ෂ විධියට කටයුතු කරනවා. ඇත්ත වශයෙන්ම මම ඔබතුමාට ස්තුති කරන්න ඕනෑ. අපට මේ අවුරුද්දට කරන්න පුළුවන් උදව් කිහිපයක් කළා. අපට නිවාස ඉදි කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දුන්නා. ආධාරලාභීන්ට සෑහෙන පරිදි අපට ඒ ප්‍රතිපාදන ලබා දෙන්න පුළුවන් වුණාද? ඒ වාගේම තමයි කර්මාන්තය. කර්මාන්ත අංශයත් ඔබතුමාගේ අමාත්‍යාංශ යටතේ තමයි තිබෙන්නේ. ඒකේදී ඉස්කෝලයේ තිබෙන ලී බඩු උපකරණ අලුත්වැඩියා කිරීමට - ඒක සාමාන්‍යයෙන් අපි කවුරුත් බලන්නේ නැති දෙයක්. ඒ කියන්නේ, කඩලා ඉවත් කරලා මුල්ලට දාලා තිබෙන දේ අපි ඇමැතිතුමා හරහා ඉල්ලීම අනුව මගේ ප්‍රදේශවල පලගතුර, අල්ෆලාල්, ඒ වාගේම මලිහාල් වාගේ පාසල් කිහිපයක ඩෙස් පුටු ආදිය අලුත් වැඩියා කළා. ඒක ඒ අයට ලොකු වාසියක්. ලබන අවුරුද්දට ලී බඩු උපකරණවල අඩුපාඩු හුඟක් තිබුණත් මේ නිසා අපට පුළුවන් වුණා ඇමැතිතුමා හරහා ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළවල් සකස් කරලා, ඒ ප්‍රදේශයේ පාසල්වල ඉන්න ළමයින්ට වාඩි වෙන්න පුටුවක් හරි අපට ලබා දෙන්න පුළුවන් වුණා. ඒ වාගේම කර්මාන්ත නිෂ්පාදනකරුවෝ. ඒ අයට පුළුවන් නම් ඒ අයගේ නාස්තිය, නිෂ්පාදකයෙක්, සාමාන්‍යයෙන් වැඩ පොළක ඉඳගෙන තමන්ම ඉගෙන ගෙන තමයි මේ වැඩ කරන්නේ. තාක්ෂණ අංශය ගැන ඒ අයට හරියට අවබෝධයක් නැහැ. නමුත් ඒ අයට Training Programme දීලා, ඒ අයව හරි මාර්ගයට ගෙයන්න පුළුවන් නම් කැන්ටන් ෆෙයාර්වලට, China රටට ගෙනිහිල්ලා ඒ අයට අවශ්‍ය නිෂ්පාදන, ඒ කියන්නේ මැෂිනරීස් පෙන්නලා, ඔබතුමාට පුළුවන්කම තිබෙනවා ණය පහසුකම් දීලා ඒ අයව දියුණු කිරීමට අවශ්‍ය කටයුතු කරන්න.

ඒ වාගේම තමයි ටැක්සි බයික්. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ටැක්සි බයික් එක පටන් ගන්න කියලා. බස්නාහිර පළාතේ ටැක්සි බයික් එකක් පටන් ගත්තොත් ඔබතුමාටත් බස් නැහැයි කියන ප්‍රශ්නය හුඟක් දුරට අඩු වෙනවා. ටැක්සි බයික් එක ගත්තොත් අපට පුළුවන්. අපි

භාගයක් දාලා ඒ අයට භාගයක් ගෙවන්න කියලා ඉලෙක්ට්‍රික් බයික් එකක් හරි දෙන්න. Loan System [ගරු එම්. ෂාෆි රහීම්]

එකකින් ටැක්සි බයික් එක දුන්නොත් ප්‍රවාහනයට හුඟක් පහසු වෙනවා. ලාභදායී වෙනවා. ප්‍රවාහනයට බස් නැහැයි කියලා ඇමැතිතුමාටත් අඩුපාඩු කියන්න දෙයක් නැහැ. ලබන වසරේ මේක ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා.

ඒ වාගේම රියදුරු පුහුණු කිරීම. ඒක ප්‍රාදේශීය ලේකම් මට්ටමින් ගෙන ආවොත් වඩාත් හොඳයි කියලා හිතනවා. ඒ කියන්නේ ජනතාවට සමහර තැන්වල ගම්පහ කිව්වොත්, රාගමට යන්න ඕනැ. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. දුර ගමන් යන්න බැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් ගෙන ආවොත් අපට ප්‍රතිපාදන ලබා දුන්නොත්, ඒ වාහන පුහුණු කරන කට්ටියට දීලා, ඒ අයව ඒ ප්‍රදේශවල පුහුණු කරලා ගන්න පුළුවන්. එතකොට වියදම හුඟක් අඩු කරගන්නත් පුළුවන්කම තිබෙනවා.

අනෙක් එක තමයි මාර්ග. අපේ පළාත් මාර්ගවල ගෙවීමේ ක්‍රමයට හරි, අපට සමහර විට වාහන තදබදයක් ඇති වුණොත්, සාමාන්‍යයෙන් පෙට්ට්‍රල්, ඩීසල් පිච්චෙනවා. ඒක හරි නාස්තියක් වෙනවා. ඒක ගෙවීමේ ක්‍රමයට හරි කමක් නැහැ. ගුවන් පාලමක් හෝ හදලා දීලා ඒ අයට යන එන පහසුකම් සලසා දෙන්න කියලා ඉල්ලනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න. ඒ කියන්නේ පෞද්ගලීකරණය කිරීම නොවෙයි. නමුත් නාස්තිය. අපි බලන්නේ, ගෙවීම කරන්න එපා කියන මන්ත්‍රීවරු හුඟක් හිටියත්, මේකේ නාස්තිය අනෙක් පැත්තෙන් බලන්න ඕනැ. ඒ අයගේ කාල වේලාව. ඒ වාගේම මේ අවස්ථාව ලබා දීම ගැන ස්තූතිය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 04.17]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ 2017 වර්ෂයේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන සහ වෙළඳ, නිවාස, ඉදි කිරීම්, කාර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඉතාමත්ම සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව කියන්නේ, මේ රටේ තිබෙන ප්‍රධානම පළාත් සභාව. අපි දැක්කා. මේ පළාත් සභාවේ අමාත්‍ය ධූර බෙදා හරින කොට පසුගිය වකවානුව තුළ පළාත් සභා ඉතිහාසය ගැන කල්පනා කරන කොට, ගම්පහ දිස්ත්‍රික්කයෙන් තමයි මහ ඇමැතිවරු වැඩියෙන් බිහි වුණේ. ඊට පස්සේ කළුතරට ගියා. කොළඹට ගියා. නමුත් ඒ අමාත්‍ය ධූර බෙදා හැරීමේදී ගම්පහ දිස්ත්‍රික්කයට මෙවර විශාල අසාධාරණයක් වෙලා තිබෙනවා. අපි දැක්කා. අපට අමාත්‍යවරයෙක් වශයෙන් ඉන්නේ, ඔබතුමා පමණයි. පසුගිය පළාත් සභා මැතිවරණය කාලයේදී ප්‍රසන්න රණතුංග මැතිතුමා මහ ඇමැතිවරයා වශයෙන් දිවුරුම් දෙන කොට, අපේ නිමල් ලාන්සා ඇමැතිතුමා තමයි මහ මාර්ග ඇමැතිවරයා වශයෙන් හිටියේ. මේ රටේ විශාලම ඡන්දදායකයෝ ඉන්නේ කොළඹ සහ ගම්පහ. දැන් තරගයක් තිබෙනවා. නමුත් ගම්පහ දිස්ත්‍රික්කයේ තමයි අද වනකොට විශාල තරගයක් තිබෙන්නේ. ඔබතුමා සමස්ත ගම්පහ දිස්ත්‍රික්කයේම පළාත් සභාවම දියුණු කරන්න ඕනැ. ඔබතුමා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ මම හිතන්නේ අපට ලැබිලා තිබෙන්නේ ආණ්ඩු පක්ෂයට සහ විපක්ෂයට එක ඇමැති ධූරයයි. ඒ ඇමැති ධූරය හරහා ඔබතුමාට විශාල කාර්ය භාරයක් කරන්නට අවස්ථාව උදා වෙලා තිබෙනවා.

ඔබතුමා මේ පළාත් සභාවේ ඉන්න ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයෙක්. ඔබතුමා පසුගිය කාල සීමාවේ කරපු සේවය තවදුරටත් ශක්තිමත් කරමින් - ඔබතුමා බිහි වෙන්න ප්‍රධාන හේතුව තමයි යහපාලන ආණ්ඩුව. පසුගිය 2015 ජනවාරි මාසේ 08 වැනිදා මේ රටේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජයග්‍රහණය කරන කොට, මේ පළාත් සභාවේ අමාත්‍ය ධූර වෙනස් වනකොට, ඔබතුමාට මේ අමාත්‍ය ධූරය ලබා දුන්නා. ඉතින් ඔබතුමාගේ අමාත්‍ය ධූරය හරහා අපි දැක්කා, පසුගිය කාල සීමාව තුළදී ඔබතුමා විශාලා වැඩ කොටසක් කරන්න යම්කිසි උත්සාහයක් දැරුවා. නමුත් සමහර වැඩ කොටස් කරන්න හැකියාවක් ලැබුණේ නැහැ. අපි දැක්කා අපේ සමහර මන්ත්‍රීවරු ප්‍රකාශ කරන කොට, 2015 පොත නිර්මාණය කරන කොට - මේ 2016 අයවැය ලේඛනය. ඔබතුමාට ඒ පොතේ තිබුණු සම්පූර්ණ දේවල් කරන්න හැකියාව ලැබුණේ නැහැ. දැන් 2016 පොත නිර්මාණය කරලා තිබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ යහපාලන ආණ්ඩුව තුළින්. මේ 2016 පොත නිර්මාණය කරන කොට මම හිතනවා, මේකේ පිටු 68 කින් සමන්විත

සියලුම දේවල් අනුව ඔබතුමාගේ අමාත්‍යාංශයේ විෂයයන් හතක් තිබෙනවා. ඒ විෂයයන් 07 ම මේ පිටු 68 කට ගොනු කරලා තිබෙනවා. ඉතින් අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ සංවර්ධන ක්‍රියා මාර්ග කරන කොට අපට විශාල ප්‍රශ්න රාශියක් තිබෙනවා. ප්‍රවාහන ප්‍රශ්නය. මම හිත්නනේ බස්නාහිර පළාතේ මාර්ගවල රාත්‍රී ගමන් යාමේදී ජනතාවට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හවස 6.30 න් 7.00 න් පස්සේ මිනිස්සුන්ට යන්න වාහන නැහැ. අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා විශේෂයෙන්ම බියගම මැතිවරණ කොට්ඨාශයේ 234 කියලා මාර්ගයක් තිබෙනවා. කොළඹ සිට දෙල්ගොඩ දක්වා. ඒ මාර්ගයේ සවස 6.00 න් 6.30 න් පස්සේ ප්‍රවාහන පහසුකම් නැහැ. දෙල්ගොඩ දක්වා මාර්ගයේ හවස 6.30 න් පස්සේ ප්‍රවාහන පහසුකම් නැහැ. ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය සහ රේඛීය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර අඩුම වශයෙන් රාත්‍රී 9.30 වන තෙක්වත් - මොකද, මේක ප්‍රධාන මාර්ගයක්. ජයනාත් මන්ත්‍රීතුමා දන්නවා. රාත්‍රියේ ප්‍රවාහන පහසුකම් සලසන්නය කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. මේ වන කොට නව බස් නැවතුම්පල අපේ ගුණසිරි ජයනාත් මන්ත්‍රීතුමාගේ මැදිහත් වීමෙන් සිද්ධ වුණේ. මේ බස් නැවතුම්පලේ ගොඩනැගිල්ල ඇතුළේවිශාල අඩුපාඩු රාශියක් තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඒ එක්කම සණස ව්‍යාපාරය. සණස ව්‍යාපාරය අධීක්ෂණය කිරීමේ බලතල ඔබතුමාට තිබෙනවා. වර්තමානයේදී සණස ව්‍යාපාරයේ විශාල හොරු රැළකින් පිරිලා තිබෙනවා. අපි දැක්කා. සමහර ගම්වල සණස ව්‍යාපාරයේ සභාපතිවරු ලේකම්වරු ඒ සල්ලි පොළියට දීලා තවත් සල්ලි හම්බ කරනවා. මේ සණස ව්‍යාපාරය පිළිබඳව ඔබතුමා පූර්ණ අධීක්ෂණයක් කරන්න. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දැක්කා, ත්‍රීරෝද රථ ප්‍රශ්නයක් තිබුණා. පසුගිය කාලයේ ඔබේ අමාත්‍යාංශයෙන් අපේ ගෙවල්වලට ත්‍රීරෝද රථ ලියාපදිංචි කරන්න කියලා ෆෝම් වගයක් එවලා තිබුණා. අපි මහ ලොකුවට ඒක ගිහිල්ලා ත්‍රීවීල් පාර්ක්වලට ගිහිල්ලා බෙදුවා. ඊට පස්සේ සුමානයක් ගියේ නැහැ. අපට ඇවිල්ලා අනික් පැත්තෙන් බණිනවා. ඒ නිසා ඔබතුමා ප්‍රවාහන අමාත්‍යවරයා වශයෙන් බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට යම්කිසි දෙයක් දෙන කොට, ඒ සඳහා නිශ්චිත නීතියක් සම්පාදනය කරලා, ඒ හරහා ඔබතුමා ඉදිරි කාලය තුළදී ඒවා ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම මාර්ග සංවර්ධනයේදී නිමල් ලාන්සා ගරු ඇමතිතුමා ඉන්න කොට බස්නාහිර පළාතට මාර්ග සංවර්ධනය අතින් කෙසේ වෙතත් විශාල කාර්යභාරයක් කළා. ගම්පහ දිස්ත්‍රික්කයට ඔබතුමා විතරයි අමාත්‍යවරයකු වශයෙන් ඉන්නේ. ඔබතුමා ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට තමන්ගේ ආසනවල තිබෙන මාර්ග සංවර්ධනය කිරීමට අවශ්‍යකරන කටයුතු සම්පාදනය කරන්නය කියලා ඉල්ලීමක් කරමින්, 2017 වර්ෂයේදී මේබස්නාහිර පළාත් සභාවේ අයවැය ලේඛනයට විශාල කාර්යභාරයක් කරන්න සැලසුම් කරලා තිබෙනවා. ඒ සැලසුම්වලට අපට ඔබතුමාට දෙන්න පුළුවන් උපරිම සහයෝගය ශක්තිය දීලා, 2016 වර්ෂයේ අඩුපාඩු ටික 2017 වර්ෂයේදී හදා ගන්න ඔබතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 04.24]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාට හිමි වී තිබෙන අමාත්‍යාංශය පිළිබඳව යම් අදහසක් පළ කිරීමට අවස්ථාවක් මම උදා කර ගන්නවා. එතුමා සමූපකාර අමාත්‍යවරයා හැටියට කටයුතු කළා වාගේම මමත් එක වකවානුවක සමූපකාරය පිළිබඳ අමාත්‍යවරයා හැටියට කටයුතු කළා. මම මා ගැන කියනවා නොවෙයි. නමුත් එදා සමූපකාරය පිළිබඳව අපේ තිබුණේ පූජනීයභාවයක්. සමූපකාරය නැංවුවොත් තමයි සැබවින්ම සමූපකාරයේ අර්ථය ජනතාව හිමි වෙන්නේ කියලා විශ්වාසයක් තිබුණා. සමූපකාරය බිහි වුණේ, එවකට අපේ සුභසිංහ මැතිතුමා වාගේ, ටී.බී. ඉලංගරත්න මැතිතුමා වාගේ අයගේ මැදිහත්වීම තුළයි. එවැනි අයගේ උදාර සංකල්පයක් තුළ තමයි සමූපකාරය බිහි වුණේ. අපේ පැරණි අය ගමේ සමූපකාර සමිතිය පිහිටුවාගෙන ඒකට සීමා සහිත සමූපකාර සමිතිය හැටියට අරගෙන, ඒවා පිහිටෙව්වාට පස්සේ රජයේ අලුත් වැඩ පිළිවෙළ තුළ, එවකට මට මතකයි. ටී.බී. ඉලංගරත්න මැතිතුමා ඒ සමූපකාර සංකල්පය තවත් විධිමත් කළා. සමූපකාරයක සේවය කරන සේවකයෝ ඉතාමත්ම භක්තියෙන් තමයි ඒ යුගයේ සේවය කළේ. නමුත් කනගාටුයි කියන්න. පහුවෙන්න, පහුවෙන්න සේවකයෝ විතරක් නොවෙයි. නිලධාරීන්, සමූපකාර

කොමසාරිස්වරු, සහකාර කොමසාරිස්වරු, ඇමතිවරු මේ ඔක්කොම එකතු වෙලා මේක කෑවා. බස්නාහිර පළාත

[ගරු හෙක්ටර් බෙත්මගේ]

තුළ පසුගිය අමාත්‍ය ධූරය දරන කාලයේදී සමූපකාරය විනාශභංග කළාය කියන කාරණාව මම කියන්න ඕනෑ. ඒකට හිටපු ඇමතිවරයා, ඇමතිවරයාගේ සගයෝ සියලු දෙනාම වග කියන්න ඕනෑ. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ වගකීම තමයි, හොඳ ලේකම්වරයෙක් හෝ ලේකම්වරියක් යටතේ මේවා හොඳ අධීක්ෂණයක් කරලා, මේ සමූපකාරය යළිත් ගොඩ නගලා දෙන එක. මම මේ වීදුරු කුටිය දිහා බලාගෙන හිටියා. මට පොඩි හයියක් ආවා. මොකද, බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්තුමා ඉන්නවා. දයා සෙනරත් මැතිතුමා. මම හිතන්නේ, එතුමා හැම අමාත්‍යාංශයක්ම නියෝජනය කරමින් මෙහි රැඳී සිටින බව මට තේරුණා. මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මඟින් ප්‍රධාන ලේකම්තුමාට මේ පණිවුඩය දෙනවා. ඔබතුමා බස්නාහිර පළාතේ ප්‍රධාන වගකිවයුතු රජයේ නිලධාරියා හැටියට සියලුම අමාත්‍යාංශවල ලේකම්වරුත් සමඟ ඊට යට ඉන්න සියලුම නිලධාරීන්ව සුපරීක්ෂණයක් කරන්න ඕනෑ. අද සමූපකාරයට වෙලා තිබෙන්නේත් - මම දන්නේ නැහැ. අලුත් සමූපකාර කොමසාරිස්තුමාට මට දවසක් දෙකක් කථා කරන්න පුළුවන් වුණා. නමුත් එතුමාගේත් මම හිතන්නේ, උදාසීනභාවයක් තිබෙනවා. සමූපකාර අයාලේ යමින් තිබෙන්නේ. කඩුවෙල විවිධ සේවා සමූපකාර සමිතිය කියන්නේ, ජනාධිපති සම්මාන ලබපු සමූපකාර සමිතියක්. අද බිමට සමතලා වෙලා. සමතලා වෙනකල් බලාගෙන ඉන්නේ කවුද? දේශපාලඥයෝ දේශපාලනය කරමින් ඒ කාරණාවලදී මැදිහත් වෙනවා. හැබැයි, සමූපකාර දෙපාර්තමේන්තුව නිහඬව බලාගෙන ඉන්නවා. හොරකම් කරන්න දීලා, හොරකම් කළාට පස්සේ පියවර ගන්න හදනවා. හැම සමූපකාරයක්ම එහෙමයි. බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය අද වහන තත්ත්වයට ගෙනැල්ලා. සියලුම සමූපකාර ශාඛා බඳු දීලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය ගිහිල්ලා බලන්න. එළවළු සුපර් මාර්කට් එකක් තිබෙනවා. දැක්කාම ආසා හිතෙනවා. උඩින් ගහලා තිබෙනවා, Co-operative vegetable stores ද මොකක්ද කියලා. මිනිස්සු යන්නේ, මේ සමූපකාරයේ එළවළු ගන්නවාය කියලා. බලන කොට පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට දීලා තිබෙනවා. මම හය නැතිව කියනවා. නිලධාරීන්තමයි ඒකේ සභාපති හැටියට පත් කරලා තිබෙන්නේ. ඒ නිලධාරීන්ගේ පටන් හැමෝටම යන කොට ඒ එළවළු මල්ල දීලා තිබෙනවා. මේක නොවෙයි අපේ සමූපකාර චින්තනය. මේක නොවෙයි සමූපකාර ව්‍යාපාරය. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මැදිහත් වෙන්න ඕනෑ. ඔබතුමාට මැදිහත් වෙන්න හයියක් නැත්නම් විෂය පිළිබඳව පුළුල් අවබෝධයක් තිබෙන ලේකම්වරු ඉන්නවා. අලුතෙන් ඉන්නේ ලේකම්වරියක්. දයා සෙනරත් මැතිතුමාව මැදිහත් කර ගෙන මේවාට යම්කිසි වැඩ පිළිවෙළක් ගන්න. නැත්නම් ඔහේ අයාලේ යමින් ඔබතුමාගේ කාලය ඉවර වුණාට පස්සේ තවත් ඇමතිවරයෙකුට මේක භාර දීලා අපේ අම්මලා, තාත්තලා, මුතුන් මිත්තෝ ස්ථාපනය කරපු මේ සමූපකාරය වට්ටලා, ඒ පාපය තමුන්නාන්සේ ආදේශ කර ගන්න එපාය කියන කාරණාව කියන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා. මම එතැනින් එහාට සමූපකාරය ගැන කථා කරන්නේ නැහැ.සමූපකාරයේ ඉන්න හැම ඇත්තෙක්ම විශේෂයෙන් නිලධාරි මහත්වරු මීට වඩා අවධානයෙන් කටයුතු කරලා සමූපකාරයේ ගුණාත්මකභාවය නංවන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඊළඟ කාරණාව, අපේ ජගත් විතාන ගරු මන්ත්‍රීතුමාත් කියපු මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිළිබඳව. එතුමා ව්‍යාපාරිකයෙකුට වඩා, මහජන සේවකයෙකු හැටියටකථා කළේ. ඒ සියලුම කාරණා ඇත්ත. තමුන්නාන්සේට මම එක සරළ උදාහරණයක් කියන්න ඕනෑ. මම ඊට ඉස්සෙල්ලාත් කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දන්නා හඳුනන අහිංසක කොල්ලෙක් ඉතාම සුළුවෙන් බස් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියා. මේ පුද්ගලයා විසින් අවුරුදු දෙකක් තිස්සේ අත ඇරලා දාලා තිබුණු බස් මාර්ගයක් හදා ගත්තා. මම ඒක විස්තර කරනවා නම්, ඒ පැත්තේ වාහනයක් යන්නේ නැහැ. මිනිස්සුන්ගේ ඇවිටිල්ල නිසා පෞද්ගලික බස් සේවයක් ඒකේ යොදවා ගත්තා. මේක පුරුදු කර ගන්න ටිකක් දවස් ගියා. අවුරුද්දක් ගියා. අවුරුදු දෙකක් විතර ගියාට පස්සේ මිනිස්සු මේකට කාන්දු වුණා. අර උල්පතකට ජලය කාන්දු වෙනවා වාගේ. මේ බස් රූට් එක එයා හදාගෙන ගියාට පස්සේ මොකක්ද වුණේ? මේක ටෙන්ඩර් කරන්න ඕනෑ කිව්වා. ටෙන්ඩර් කරන්නේ මොකටද? බිස්නස්කාරයාට දෙන්න. මම හිටපු සමූපකාර ඇමතිවරයෙක්. මේ බස්නාහිර පළාත් සභාවේ වහළ යට අවුරුදු දහයක් ඇමතිකම් කළා. මම ඇමතිතුමාට කියලා

දුන්නා. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියක් තිබෙනවා. සභාපතිවරයෙක් ඉන්නවා. ඒකේ මණ්ඩලයක් තිබෙනවා. ඒකට යෝජනාවක් ආවාම ඇමතිවරයාගේ අත්සනින්, මණ්ඩලයට පුළුවන් සාකච්ඡා කරන්න. තීන්දුවක් ගන්න පුළුවන්. තීන්දුවක් අරගෙන ඒක නිර්දේශ කරලා උඩට දෙන්න පුළුවන්. සාධාරණ හේතු පාඨ කියලා. දුන්නේ නැහැ. අතන කොමිස් එක හරියට එනවා. ටෙන්ඩරයකට ගියා. අහිංසකයාට ඒ ටෙන්ඩර් එකට යන්න බැහැ. ඇවිටිලි කරලා, කරලා මම මෙතුමා ළඟට ගිහින් කිහිප විටක් කිව්වා. හැබැයි, එතුමා මට සැලකුවා. මට ඇහුම්කන් දුන්නා. ඊට පස්සේ මොකක් කර ගත්තාද දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න මේක තමයි තත්ත්වය. මේ අවාසනාවන්ත තත්ත්වය නැති කර ගන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රූට් එක හදපු කෙනාට ලැබෙන්නේ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එයාට ලැබෙන්නේ නැහැ. ඇයි අතන ඉන්නවානේ ටයි කෝට් ගහගෙන. ගරු අමාත්‍යතුමනි, ඒ නිසා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපතිතුමාට - සාමාන්‍යාධිකාරීතුමා ඉන්නවා මට පේන්න නැහැ. මේ හැමෝටම කියන්නේ. තමුන්නාන්සේලාගේ පව්, ඊට පස්සේ ඊළඟ අයවැයේදී තමුන්නාන්සේගේ අමාත්‍යවරයාට ගෙවන්න වෙනවා. ගරු අමාත්‍යතුමනි, මම මේ කියන්නේ පෙර සූදානමක් වෙන්න. අවසාන වශයෙන් තවත් එක දෙයක් කියන්න ඕනෑ. එතුමා හොඳයි. එතුමාගේ අමාත්‍ය කාර්ය මණ්ඩලය හොඳයි. විශේෂයෙන් හොඳ පෞද්ගලික ලේකම්වරයෙක් ඉන්නවා. ගියාම ඇහුම්කන් දෙනවා. අර රංජිත් සෝමවංශ ඇමතිතුමාගේ වාගේ නොවෙයි. එතුමා මගේ මිත්‍රයා වුණත් අපි ඔක්කෝටම ඒ ප්‍රශ්නය තේ ආවේ. මෙතුමාගේ හොඳ පෞද්ගලික ලේකම්වරයෙක් ඉන්නවා. සම්බන්ධීකරණ ලේකම්වරයෙක් ඉන්නවා. හැබැයි, ඒ අය අපි මොනවා හරි කිව්වාම, මුහුණ ඇඹුල් කර ගන්නවා. ඒ අයත් දන්නවා මේක ගියාට, එතැනින් එහාට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට ගියත් වැඩක් වෙන්නේ නැහැ. සමූපකාර දෙපාර්තමේන්තුවට ගියත් වැඩක් වෙන්නේ නැහැයි කියලා. අවසාන වශයෙන් ඔබතුමාට සුභ පතනවා. ඔබතුමාගේ වැය ශීර්ෂය ජයග්‍රහණය කරන්න මගේ ඡන්දය දෙන බව ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.31]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මෙම අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරද්දී මම මුලින්ම කථා කරන්න කැමැතියි. ඇත්ත වශයෙන්ම මේ අමාත්‍යාංශය දුවන්නේ, මේ අමාත්‍යාංශයේ වැඩේ යන්නේ මෙන්න මේ කුඩුවේ ඉන්න අර ඉස්සරහාම ඉන්න දෙන්නා හින්දා. වැඩියෙන්ම. මගේ පුද්ගලික දැනීම අනුව. පෞද්ගලික ලේකම් හා සම්බන්ධීකරණ ලේකම් නිසා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක ඇත්ත.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

පැහැදිලිවම. ඇත්ත වශයෙන්ම ඊට අමතරව මේ අමාත්‍යාංශයේ ලේකම්වරිය සම්බන්ධයෙන් අපි අමාත්‍යාංශයට ගියාම විවිධ විවේචන ආවා. නමුත් අපි විශ්වාස කරනවා. එතුමිය ළඟදී ආවේ. යම්කිසි ප්‍රමාදයක් තිබෙනවා නම්, එතුමිය ඒක හදා ගනියි කියන විශ්වාසය අප සතුව තිබෙනවා. කෙසේ වෙතත් නිලධාරීන්ගේ මට්ටමින් ගත්තොත් විශේෂයෙන්ම රෙහෙන්සිරි වරාගොඩ මහත්මයා ගැන මතක් කරන්න ඕනෑ. හිටපු මන්ත්‍රීරවරයෙක්. මට එක සිද්ධියක් මතකයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට එතුමා ගැන ඒ තරම් හැඟීමක් ආපු වෙලාවක් තිබුණා. මම පොඩි වැඩකට අධ්‍යාපන අමාත්‍යාංශයට ගියා. අධ්‍යාපන අමාත්‍යාංශයට වැඩකට ගියාම, ඒ අධ්‍යාපන අමාත්‍යාංශයේ මහජන දිනයේ මිනිස්සු පිරිලා, ඇමතිතුමාට කොළ දික් කර ගෙන ඉන්නවා. ඇමතිතුමාට කොළ දික් කර ගෙන ඉන්න කොට ඒ සෙනඟ අතරේ වරාගොඩ මහත්තයාත් කොළයක් තියාගෙන ඉන්නවා. මම ඇහුවා, මොකද කියලා. මට මේ බිඳුනු පුටුවට සල්ලි ටිකක් ගන්න අවුරුද්දක් තිස්සේ මම පස්සෙන් යනවා. කොහොම හරි කර ගන්න මේ බලන්නේ කිව්වා. බිඳුනු පුටුව කියලා ව්‍යාපෘතියක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම බිඳුනු පුටුව ව්‍යාපෘතිය සැලකිය යුතු ප්‍රගතියක් ලබපු ව්‍යාපෘතියක්. හොඳම ව්‍යාපෘතියක්, ඒ ව්‍යාපෘතිය. ඇත්ත වශයෙන්ම මට දැන ගන්න ලැබුණා, ඇමතිතුමාගේ

පැත්තෙන් ප්‍රතිචාර තිබුණත්, නිලධාරී තන්ත්‍රයෙන් පොඩි පොඩි ප්‍රශ්න ටිකක් තිබෙනවා. කෙනෙහිලිකම් ටිකක් [ගරු සුනිල් වටගල]

තිබෙනවා. ඒක සම්පූර්ණ කරලා, ඒ බිඳුනු පුටුව ව්‍යාපෘතිය ඉස්සරහාට ගෙනියන්න අවස්ථාව ලබා දෙන්නය කියලා තියෙනවා.

විශේෂයෙන් මෙන්න මේ කාරණය අවධානයට ලක් කරනවා. මේ අමාත්‍ය මණ්ඩලය අතර සාමූහික වගකීමක් තිබෙන්න ඕනෑ. මේක එක එක්කෙනාට යම් යම් විෂය පථයන් පවරලා තිබෙන එක ඇත්ත. හැබැයි, මේකේ සමහර කරුණු අධ්‍යාපන අමාත්‍යාංශයත් සමඟ සම්බන්ධ වෙනවා. සමහර කරුණු ප්‍රධාන අමාත්‍යාංශයේ අදාළ අංශ සමඟ සම්බන්ධයක් ඇති වෙනවා. විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණයට අදාළව. ඒ තොරතුරු තාක්ෂණ විෂය ක්‍රියාත්මක කරන්න වෙන්නේ පාසල් හරහා. එතකොට තොරුතුරු තාක්ෂණයට අදාළව කිසියම් යෝජනාවක් ආවාම කැබිනට් මණ්ඩලයේ සාමූහික තත්ත්වයක් තිබෙන්න ඕනෑ. බිඳුනු පුටුව ක්‍රියාත්මක කරන්න වෙන්නේ ඉස්කෝලවලට. හැබැයි, බිඳුනු පුටුව ව්‍යාපෘතිය ඉස්කෝලවල ක්‍රියාත්මක කරන්න යන කොට අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන් ඒකට අදාළ සහයෝගය දෙන්නේ නැත්නම්, අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන් ඊට අදාළ අත් උදව්ව දෙන්නේ නැත්නම්, අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන් ඊට අදාළ මුදල් ටික දෙන්නේ නැත්නම්, බිඳුනු පුටුව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. පළාත් සභා ක්‍රමය විසින් ජාතක කරපු ආයතනයක් තමයි කර්මාන්ත අධිකාරිය. අද කර්මාන්ත අධිකාරිය අනාථ වෙලා තිබෙන්නේ. කර්මාන්ත අධිකාරිය අනාථ වෙලා තිබෙන්නේ තමුන්නාන්සේලා සලකන්නේ නැති නිසයි. එතකොට කර්මාන්ත අධිකාරිය දුවා ගන්න පුළුවන්. ඒ හිටපු ගරු මන්ත්‍රීතුමා සැලකිය යුතු ප්‍රයත්නයක් දරනවා මේ වැඩේ කර ගන්න. හැබැයි, ඒකට දෙන අත් උදව්ව මදි.

ඒ වාගේම තව කාරණයක් විශේෂයෙන් මතක් කරනවා. අපි විශ්වාස කරනවා. ජනතා විමුක්ති පෙරමුණට පළාත් සභා ක්‍රමය පිළිබඳ විවේචනයක් තිබෙනවා. මේ පළාත් සභා ක්‍රමය ඕනෑ නැහැයි කියලයි අපි කියන්නේ. මේ අවුරුදු 28 ක් තිස්සේ තමුන්නාන්සේලාට පුළුවන් වුණාද? අවුරුදු 28 ක් තිස්සේ මාර්ග හදලා, ප්‍රවාහනය හදලා, සමූපකාරය හදලා, නිවාස හදලා මිනිස්සු සැහෙනවාද? මේක කරන්න බැහැ. මේක තමුන්නාන්සේගේ පෞද්ගලික නොහැකියාවක් නොවෙයි. මේ සිස්ටම් එකේ ප්‍රශ්නය. එතකොට මේ සිස්ටම් එකේ තිබෙන ප්‍රශ්න ටික එන්න එන්නම උඩු දුවනවා. විශේෂයෙන්ම අර හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මතක් කළා වාගේ මේ සමූපකාර ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්නය. මේවා ලිහන්න බැහැ. ඇයි මේක කරන්න බැරි. මම පෞද්ගලිකව ගියා කොමසාරිස්තුමාව හමු වෙන්න. කොමසාරිස්තුමා සමඟ පෞද්ගලිකව ගිහිල්ලා කථා කළා, වත්තෙගෙදර සමූපකාර සමිතියේ කෝටි 75 ක වංචාව පිළිබඳව. මේක ඇස් පනාපිට වුණු සිද්ධියක්. වංචාවක්. මහ දවල් මංකොල්ලයක්. එතකොට ඒ අධ්‍යක්ෂ මණ්ඩලයේ උදවිය කථා කරලා කර ගත්ත වැඩක්. එතකොට මේකට අදාළ නෛතික ප්‍රතිපාදන, මේකට අදාළ ක්‍රියාමාර්ග මේ බස්නාහිර පළාත් අමාත්‍යාංශය යටතේ, සමූපකාර ප්‍රඥප්තිය යටතේ දුවන ආයතනයක්. එතකොට මේකට මොකක්ද කරන්නේ කියලා බලන කොට තමුන්නාන්සේ විශ්වාස කරන්න. තමුන්නාන්සේ යටතේ, බස්නාහිර පළාත්සභාව යටතේ සමූපකාර 1309 ක් තිබෙනවා. අහන්න කොමසාරිස්වරයාගෙන්. මම ගිහිල්ලා ඇහුවා, නීති නිලධාරියාට අපිත් එකක් කථා කරන්න කියලා. කාලය ඉවරද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කාලයෙන් විනාඩි 05 ක කාලයක් සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට ලබා දෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නීති නිලධාරීට කථා කළා. එතුමාගේ පැත්තෙන් ඇත්තටම කොමසාරිස්තුමාට කරන්න දෙයක් නැහැ. කොමසාරිස්තුමා කිව්වේ, ස්ථිරවම නීති නිලධාරියෙක් නැහැ. වෙනත් තැනක දෙපාර්තමේන්තුවේ වැඩ කරන නීති නිලධාරියා තමයි ඇවිල්ලා වැඩ බලන්නේ කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බලන්න සමූපකාර සමිති 1309 ක් දුවන ආයතනයක්. staff එකක්

ඉන්න ඕනෑ. මේ වත්තෙගෙදර සමූපකාර සමිතිය විතරක් නොවෙයි, බියගම විවිධ සේවා සමූපකාර සමිතිය, හෙක්ටරේ බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා කියපු කඩුවෙල විවිධ සේවා සමූපකාර සමිතිය, ඒ වාගේම කොටිකාවත්ත සමූපකාර සමිතිය. මේවායේ විශාල ප්‍රශ්න රාශියක් තිබෙනවා. කෝ staff එක? අහන්නකෝ කොමසාරිස්තුමාගෙන්. මම කිව්වා, තමුන්නාන්සේගේ නිලධාරීන් අරගෙන එන්න මෙතැනට කථා කරන්න. කවුද ඉන්නේ? එහෙම Staff එකක් නැහැ. තමුන්නාන්සේ මේ ප්‍රශ්නය ගන්න. මහජනතාවගේ ලොකු ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය විසඳන්න. කෝටි 75 වංචාව මහ දවල් මංකොල්ලයක්. එතකොට ගරු ඇමතිතුමනි, ඒ ප්‍රශ්නයට වත්තෙගෙදර සමූපකාර සමිතියේ ඒ ප්‍රශ්නය සිද්ධ වුණාට පස්සේ, මේ මාස තුනකට කලින් තවත් වංචාවක් සිදු වෙලා තිබෙනවා. ඒ වංචාව සම්බන්ධයෙනුත් අපි කොමසාරිස්වරයාට පැමිණිලි කළා. කොහොමද මේ තරම් ලොකු ප්‍රශ්නයක් දුවද්දී, ඒ ප්‍රශ්නය යටින් ගිහිල්ලා, සල්ලි ගෙවන්නේ නැතිව දේපළ නිදහස් කර ගත්තේ කොහොමද? කියලා සොයන්න ඕනෑ. සල්ලි ගෙවන්නේ නැතිව රුපියල් කෝටි පහමාරක දේපළ බේරා ගත්තේ කොහොමද? ඔප්පුවේ සීල් එක වැදිලා තිබෙනවා. හැබැයි, සල්ලි ඇවිල්ලා නැහැ බැංකුවට. කොහොමද ඒක වුණේ? මේ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කරන්නය කියලා අපි කොමසාරිස්වරයාට ලිඛිතව දැනුම් දුන්නා. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔප්පුව සමූපකාර සමිතියෙන් බේරා ගෙන ගිහිල්ලා කොමර්ෂල් බැංකුවේ උකස් තියලා. එතකොට මේක සිද්ධ වුණේ කොහොමද? මේක තනිකරම යම් යම් උඩු දුවන නිලධාරී තන්ත්‍රයක් එක්ක මාෆියාවක් එක්ක සිද්ධ වන වැඩක්. පැහැදිලිව මේකට තමුන්නාන්සේ විසඳුමක් දෙන්න ඕනෑ.

මම කිව්වා, මේ ප්‍රශ්නය අරන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ යන්න ඕනෑ තැන. පැමිණිල්ල හදන විධිය. කරන්න ඕනෑ වැඩේ. එකම එක වැඩක් කරලා තමුන්නාන්සේ පෙන්වන්න. අභියෝගයක් හැටියට ජනවාරි මාසයේ මේ කෝටි 75 ක වංචාවේ එක විත්තිකරුවෙකුව අල්ලලා සමූපකාර පනත යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් දාන්නකෝ? අපි දන්නවා. සමූපකාර පනත යටතේ සල්ලි ගෙව්වේ නැත්නම් කෙළින්ම කුඩු කළා. කෙළින්ම කුඩු කරනවා. හැබැයි, ඒ එකක්වත් දාන්නේ නැත්තේ ඇයි? මේ ඉන්න කොමසාරිස්තුමා උත්තර දෙයි. එතකොට මේ කොමසාරිතුමාගේ වගකීම. දැන් මේ කොමසාරිස්තුමා ආදර්ශයක්වත් වෙන්න එක්කෙනෙකුවවත් අල්ලලා මහේස්ත්‍රාත් උසාවියට දාන්න ඕනෑ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

අපෙත් ඉන්නවා නීතිඥයින් ටිකක්. අරගෙන මේ ප්‍රශ්නයට උදව් ඉල්ලා ගන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

පැහැදිලිවම. මේ පිළිබඳව තමුන්නාන්සේ විශේෂ කමිටුවක් පත් කරන්න. කමිටුවේ නිර්දේශ මත කටයුතු කරන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

විශේෂ කමිටුවක් අදම පත් කරන්න. මෙතැන ජනාධිපති නීතිඥතුමාත් ඉන්නවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. දැන් මෙතැන සමූපකාර ක්ෂේත්‍රයේ විශාල ප්‍රශ්න ජාලාවක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. දැන් නිවාස දෙපාර්තමේන්තුව ගත්තොත් ගරු ඇමතිතුමනි, නිවාස දෙපාර්තමේන්තුවේ කරන්න පුළුවන් වැඩ ඒගොල්ලෝ කරනවා. දැන් තමුන්නාන්සේ දන්නවා. අපේ උපදේශක කාරක සභාවේ කථා කරද්දී, නිවාස කොමසාරිස්වරියක් ඉන්නවා. ලස්සන නෝනා කෙනෙක්. එතුමියට කරන්න තිබෙන කාර්යභාරය අඩුයි. නිවාස කොමසාරිස්වරිය කියලා මොකක්ද කරන්නේ? එතුමිය හොඳට නඩු අහනවා. ඇත්ත. එතුමියට කුලී ආඥා පනත යටතේ, 18(1) වගන්තිය යටතේ නඩු අහන්න පුළුවන්. ඊට අමතරව, මම විශ්වාස කරන්නේ අපි දෙන නිවාස ෆෝම් එකට එතුමිය බලලා, කාර්ය මණ්ඩලයත් එක්ක සාකච්ඡා කරලා සාධාරණයක් කරනවා. දැන් ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේගේ පොතේ තිබෙනවා, මෙන්න මෙහෙම වාක්‍යයක්.

*"ගෙවල් කුලී පනතේ 18 වැනි වගන්තිය ප්‍රකාර ප්‍රති සංවිධානය කිරීම සඳහා පැරණි ගොඩනැගිලි කඩා දීමට අවසර ලබා දීම යටතේ අදාළ දේපළෙන් ඉවත්ව යන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමටත්, ඔවුන්ට අයිතිකරු වෙතින්*

*වන්දි මුදල් ලබා ගැනීමටත්, ගෙවල් කුළී පනතේ පවතින විධිවිධාන යටතේ අවශ්‍ය කටයුතු සලසා දීම."*
[ගරු සුනිල් වටගල]

දැන් මම තමුන්නාන්සේට යෝජනාවක් කරනවා. මේ ගෙවල් කුළී පනතේ 18 වන වගන්තිය අතිශය අසාධාරණ වගන්තියක්. මේ වගන්තිය යටතේ උපරිම වන්දිය ගෙවන්න පුළුවන් රු. 150,000 යි. අවුරුදු 60 ක් ජීවත් වෙලා හිටියත් කුළී නිවැසියා ඒ නිවසේ - කොමසාරිස්වරිය නියෝගයක් දුන්න ගමන් එයා එළියට යන්න ඕනෑ. පුංචි වන්දියක් ගෙවන්නේ. කොමසාරිස්වරියට කරන්න දෙයක් නැහැ. එතුමිය වාද්දුවේ නඩුවක් අහලා ඉතාම සාධාරණ තීන්දුවක් දීලා තිබුණා. අපේ නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. අවුරුදු 60 ක් වාද්දුවේ කඩ කාමරයේ හිටපු ඒ තැනැත්තාට දීලා තිබෙන්නේ රු. 234,000 යි. හැබැයි, පනත යටතේ කොමසාරිස්වරියට ඊට වඩා යන්න බැහැ. හැබැයි, මේ වගන්තිය අතිශය අමානුෂික වගන්තියක්. මේ වගන්තිය වෙනස් කරන්න බස්නාහිර පළාත් සභාවෙන් යෝජනාවන් මධ්‍යම ආණ්ඩුවට කරන්න. පැහැදිලිවම අපේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රඥප්තියක් තිබෙනවා. ඒ යටතේ තමයි මේක ක්‍රියාත්මක වෙන්නේ. ඒ වගන්තිය අතිශය අමානුෂික වගන්තියක්. මේ වගන්තිය යටතේ විපුලසේන මාවතේ සම්පූර්ණ ගෙවල් ටික කඩලා එළෙව්වා. ඊට පස්සේ වාද්දුව. පානදුර. මෙතැන මහරගම. කොට්ටාවට. කොමසාරිස්තුමිය දන්නවා ඇති. මේ වගන්තිය පාවිච්චි කරලා, මේ වගන්තියෙන් රිංගලා අර අසරණ මිනිස්සු ටික එළියට දානවා. මේ වගන්තිය අතිශය අසාධාරණයි. මේ ගොඩට තව වාක්‍යයක් එකතු වෙන්න ඕනෑ. මේ වගන්තිය සංශෝධනය කළ යුතුයි කියලා මහා හඬක් නගලා, තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශය විධියට මධ්‍යම ආණ්ඩුවටත් මේක යෝජනාවක් විධියට යවන්න. පැහැදිලිවම.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලාගේ කර්මාන්ත අධිකාරියේ දැන් දෙනවා, ස්වයං රැකියා උපකරණ. එතකොට කර්මාන්ත අධිකාරියේ තවත් සිද්ධ වෙනවා. මම හිතන්නේ, වරාගොඩ මහත්තයා යටතේමයි ඒකත් තිබෙන්නේ. ස්වයං රැකියාවක් කරනවා නම්, මොකක් හරි කර්මාන්තයක් කරනවා නම්, 50% ක් ඒ මිනිහා ළඟ තිබෙන්න ඕනෑ. මේක කෙරෙන වැඩක් නොවෙයි. 50% ක් දීලා කවුද කර්මාන්ත කරන්න එන්නේ. එතකොට 50% ක් දීලා කර්මාන්ත කරන්න එන්නේ නැහැ. වරාගොඩ මහත්තයා මගෙත් එක්ක පෞද්ගලිකවත් කථා කළා, මේ ගැන. මේකට අමාත්‍යාංශ මට්ටමෙන් විසඳුමක් දෙන්න. කවුරුවත් කර්මාන්ත කරන්න එන්නේ නැහැ තමුන්නාන්සේ එක්ක 50% ක් දීලා. දැන් එතකොට ඒ 50% ක් ගත්ත ඇප්ලිකේෂන් ටික තියාගෙන, දැන් මේ අවුරුද්දේ මම දන්න විධියට ක්‍රියාත්මක කරන්නේ නැහැ. මේ අවුරුද්දේ ඇප්ලිකේෂන් ටික තියා ගෙන ඉන්නවා. නිශාන්ති කියලා කෙනෙකුට මම කථා කරනවා. දැන් එතුමිය දුරකථනයට එන්නෙත් නැහැ. මගේ ෆෝම් එකට මොකක්ද වුණේ කියලා අහන්න. එතුමියගේ පෞද්ගලික වරදක් නොවෙයි.

තවත් එකක්. 2011 අංක 05 දරන ව්‍යාපාර නාම ආඥා පනත ක්‍රියාත්මක කරන්න වෙන්නේත් තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ. අපි උපදේශක කාරක සභාවේදී කථා කළා. ව්‍යාපාර නාම ආඥා පනතට තනියෙන් ගමනක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉඳලා හිටලා මැස්සට ඇහිරෙන්නා වාගේ මිනිහෙක් එනවා. ඒක ටක්ගාලා ලියාපදිංචි කරනවා. එහෙම නොවෙයි. කර්මාන්ත අධිකාරියෙන් වැඩ සටහනක් කරන්න. අපි කිව්වා, කර්මාන්ත අධිකාරියෙන් කර්මාන්තකරුවන් ගෙන්වලා, කුඩා පරිමාණ කර්මාන්තකරුවන් ගෙන්වලා ඒ අයට වැඩක් හදන්න. ඒ අයගේ කර්මාන්තය ලියාපදිංචි කරන්න යවන්න ව්‍යාපාර නාම ආඥා පනතට. එතකොට ඒ විධියට තමයි අපි උපදේශක කාරක සභාවේදී කථා කළේ. අපි විශ්වාස කරනවා, මෙන්න මේ හඬට කන් දීලා, කර්මාන්ත අධිකාරිය ශක්තිමත් කරලා, ඒ හරහා ව්‍යාපාර නාම ආඥා පනතට - තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ බෝඩ් ලෑලි කිහිපයක් තිබෙනවා. කිසිම වැඩක් වෙන්නේ නැහැ. කිසිම වැඩක් කරන්න බැහැ. කිසිම වැඩක් කරන්න සල්ලි නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් කැබිනට් මණ්ඩලයේ තිබෙන මේ සාමූහික වගකීම සම්බන්ධයෙන් මම වචනයක් කියනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීමක් නැත්නම් මේ පළාත් සභාවට ගමනක් නැහැ. කඹ අදින්නේ ඇයි? ඇයි අනික් ඇමතිවරයාගේ ඇමතිධුරය ගන්න හදන්නේ? මේ තිබෙන එක මදිද? අධ්‍යාපන ඇමති මමයි කියලා ඇයි imitate කරන්නේ? එහෙම කරන්න ඕනෑ නැහැ. මේ සාමූහික වගකීමෙන් මේ ගමන යන්න. ඔබතුමන්ලා

දෙදෙනාට එකතු වෙලා ගමනක් යන්න තිබෙනවා. පැහැදිලිවම අපි යෝජනා දාලා තිබෙනවා. තොරතුරු තාක්ෂණයත් එක්ක, කර්මාන්ත අධිකාරියත් එක්ක, බිඳුනු පුටුවත් එක්ක යන්න. බිඳුනු පුටුවට තනිවම යන්න බැහැ. තනිවම යන්න ගියොත් කඩා වැටෙනවා. ඒ නිසා දෙන්නාම එකතු වෙලා යන්න. ඒ නිසා නැවත වතාවක් මේ නිලධාරී තන්ත්‍රයට ස්තුති කරනවා. අපි අමාත්‍යාංශයට ගියාට පස්සේ සැහෙන සලකනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාගේ අදහසට මම බොහොමත්ම එකඟ වෙනවා. අධිකාරිය ශක්තිමත් කරන්න කියන මාතෘකාව තමයි දිගින් දිගටම කථා කළේ. ඒ සම්බන්ධව බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. මීළඟට රෝහණ අබේගුණවර්ධන මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 04.48]

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා විනාඩි කිහිපයක් ලබා දීම සම්බන්ධයෙන්. හයවැනි පළාත් සභාවේ තුන් වන අයවැයේ හතර වන දිනය. හය වැනිදා සිට බස්නාහිර පළාත් සභාවට පැමිණිලා ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයේ සිට අද දක්වා විනාඩි කිහිපයක් කථා කරන්න උත්සාහ දැරුවත් විනාඩි කිහිපයක් ලැබුණේ නැහැ. අද ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාගේ මේ වැය ශීර්ෂයෙන් විනාඩි කිහිපයක් ලබා දීම සම්බන්ධයෙන් මම විශේෂයෙන්ම ගරු ඇමතිතුමාට උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, මම මේ නවක මන්ත්‍රීවරයෙක් හැටියට තුන්වන අයවැයට සම්බන්ධ වුණේ. මම මේ පුටුවේ වාඩි වෙලා, අඩුවෙන් කථා කරලා අපි බලාගෙන හිටියේ, මධ්‍යම රජයේ කැබිනට් ඇමතිවරයෙක් දරන ඇමතිකමකට වැඩිය අපහසු ඇමතිකමක් තමයි, බස්නාහිර පළාත් සභාවේ ඇමති ධුරයක් ලබන ඇමතිවරයෙක් දරන්නේ. ඒකට හේතුවක් තමයි, 104 දෙනෙක් බස්නාහිර පළාත් සභාව නියෝජනය කරනවා. මේ අයවැයේදී මොන මොන මති මතාන්තර තිබුණත්, මොනවා කථා කළත්, අඩුපාඩු සෙව්වත් 2017 ජනවාරි 01 වැනිදා සිටම මේ 104 දෙනාම ඇමතිවරයාගේ පස්සෙන් යනවා, යම්කිසි වැඩක් කර ගන්න. ඒ මාස 12 ම යනවා. ගිහිල්ලා, ඇමතිවරයාට ලැබෙන pressure එකට ඇමතිවරයා වැඩ කරන්නේ කෙසේදෝ කියලා මට එක වෙලාවකට හිතෙනවා. මොකද, මම මධ්‍යම රජයේ කැබිනට් ඇමතිවරුත් එක්ක වැඩ කරලා, පළපුරුදු නිසා තමයි මම මේ කථාව කිව්වේ. ඒ වාගේම අපේ ලලිත් වනිගරත්න ඇමතිතුමාගේ වැය ශීර්ෂයේ විෂයයන් කිහිපයක් තිබෙනවා. මම ප්‍රථමයෙන්ම කථා කරන්න කැමැතියි, පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය ගැන. මම කළුතර ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ගැන ප්‍රථමයෙන්ම කියන්න ඕනැ, මේ වසරේ මුදල් කප්පාදුවත් එක්ක මේ ලැබිලා තිබෙන මුදල් ප්‍රමාණය, බස්නාහිර පළාතේ නොවෙයි, කළුතර ආසනයේ තිබෙන පාරවල් දෙකක් හරියට කළත්, ඒ මුදල් ප්‍රමාණයඅවසන් වෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. 2017 වර්ෂයේ පාරවල් හදනවාට වඩා හොඳයි, ඒ ලැබුණු මුදලින් මෙපමණ කාලයක් පළාත්බද මාර්ග සංවර්ධන අධිරියෙන් අපි හදා ගත්ත පාරවල් ටික නඩත්තු කරන එක. ඒ සඳහා ඒ මුදල් ටික තියා ගන්න කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මොකද ගරු අමාත්‍යතුමනි, අපි දකිනවා. අද වන කොට මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග හැරුණාම දෙවැනි මාර්ග පද්ධතිය තමයි පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය. ඒ මාර්ග සංවර්ධන අධිකාරියට අයිති මාර්ගවල අර හා සමානව, වාහන හා ජනතාව ගමන් කරන මාර්ග තමයි අද බස්නාහිර පළාතේ තිබෙන්නේ. මම කළුතර ගැන කථා කළොත් ගරු ඇමතිතුමනි, 2012, 2013, 2014 වර්ෂයේ මම වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයෙක් හැටියට කළුතර ආසනයේ තිබෙන මාර්ග පද්ධතියේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ පාරවල් කිහිපයක් කාපට් කළා. දැන් වන කොට අපට තිබෙන ප්‍රධාන ගැටළුව ඒ මාර්ග පද්ධතියේ තිබෙන පාලම්වල අවදානම් තත්ත්වය. මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. පසුගිය මාස කිහිපය තුළදී කඩාගෙන වැටෙන්න ඔන්න මෙන්න තිබුණු පාලමක් ඉදි කරන්න මිලියන 18 ක් වෙන් කිරීම සම්බන්ධයෙන්. මොකද, මම ජීවත් වන ප්‍රදේශය බේදවාචකයකට මුහුණ දෙන්න තිබුණා. අපට ඇඟිල්ල දික් කරලා අහයි, මන්ත්‍රීවරයා ගෙදර නිදි ද කියලා. නමුත් ඒක සිදු වෙන්නට පෙර ඇමැතිතුමා රුපියල් මිලයන 18 ක් වියදම් කරලා ඒ පාලම සෑදීම සම්බන්ධයෙන් මම

ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමායි, මමයි තමයි ඒකට මැදිහත් වෙලා අද වන
[ගරු පී.ආර්.පී. අබේගුණවර්ධන]

කොට ඒ වැඩ කටයුතු ටික ඉතා සාර්ථකව කෙරී ගෙන යනවා. ගරු ඇමතිතුමනි, ඒ වාගේ පාලම් කිහිපයක් අද අපට කළුතර ආසනය ඇතුළේ අපට ඇහැට පෙනෙන ප්‍රමාණයේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයිති මාර්ගවල තිබෙනවා. ඉතාම අවදානම්. මම ප්‍රධාන ඉංජිනේරුතුමියට කිව්වා. මේවා අමාත්‍යාංශයට යොමු කරන්න. අවශ්‍යතාවයන් අනුව හඳුනාගෙන 1, 2,3 කියලා නම් කරන්නය කියලා. අවාසනාවකට 2017 වර්ෂයේ බස්නාහිර පළාත් සභාවට ලැබෙන මුදල් කප්පාදු කරලා 2017 වර්ෂයේ වැඩ කරන්නේ කෙසේදෝ කියලා අපට පොඩි ගැටළුවක් තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මම ඉල්ලීමක් කරනවා මේ හදා ගත් මාර්ග ටික, දැන් වන කොට අපි සියලු දෙනා යන කොට දකිනවා, කාපට් මාර්ග කැඩී ගෙන යනවා. මම කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට ඔබතුමාට දෙන්න පුළුවන් මුදලක්, කළුතර දිස්ත්‍රික්කයේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයිති මාර්ගවල ඒ කැඩෙන පාරවල් ටික නඩත්තු කරන්න මුදලක් ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ. 2014 වර්ෂය වන තෙක්, අපි පසුගිය රජය කාලයේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග හැදුවා. 2015, 2016 වර්ෂවල කළුතර දිස්ත්‍රික්කයේ එකම පාරකටවත් මධ්‍යම රජයෙන් මුදල් වෙන් කළේ නැහැ. එදා ඒ මුදල් වෙන් කිරීම නොකරපු නිසා තමයි අද අපි දැඩි ප්‍රශ්නයකට මුහුණ දීලා සිටින්නේ. මම ගරු ඇමතිතුමාත් එක්ක කථා කළාම ඇමතිතුමා කිව්වා, 2017 වර්ෂයේ මෙගා පොලිස් කියන අමාත්‍යාංශය හරහා යම් පාරවල්වලට මුදල් වෙන් කර ගැනීමට උත්සාහ දරනවාය කියලා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ජනවාරි මාසයේ මුලම ඒ හඳුනාගත් පාරවල්වලට මධ්‍යම රජයෙන් ඒ මුදල් ටික ඉල්ලලා වෙන් කර ගන්නය කියලා.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම අපි කථා කළොත් මාර්ගස්ථ මගී වාහන අධිකාරිය. මාර්ගස්ථ මගී වාහන අධිකාරියට චෝදනා රැසයි. අපි දන්නවා. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මේ බස්නාහිර පළාතේ - මේ මුළු ලංකාවේම පටන් ගත්ත දවසේ ඉඳලා හැමදාම ප්‍රශ්නවලින් වෙළුනු අමාත්‍යාංශයක්. මේක සෑහීමකට පත් කරන්නත් බැහැ. සෑහීමකට පත් වෙන්නෙත් නැහැ. හැමදාම අර්බුදවලින් නිර්මාණය වුණු අමාත්‍යාංශයක්. ඒ අර්බුදවලින් නිර්මාණය වුණු අමාත්‍යාංශය තමයි පසුගිය කාලයේ නව සභාපතිවරයෙක් පත් වන කොට, මම එතුමාටත්කිව්වා, බෙල්ලේ වැල දා ගත්තා වාගේ කියලා. සමූපකාරයි මාර්ගස්ථ මගී ප්‍රවාහන යයි එකයි කියලා. ඒ ප්‍රශ්නවලට මුහුණ දෙමින් අද ඔබතුමා වැඩ කටයුතු කරගෙන යනවා. අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම මේ පළාත් සභාවේදී බලාගෙන හිටියා. අපේ මන්ත්‍රීවරු ඇමතිවරයෙකුගේ යම් වැරැද්දක් සොයා ගෙන ඇවිල්ලා මෙතැන කථා කරන කොට අපි දැක්කා ඒ වැරැද්ද නිවැරදි කර ගන්න පැහැදිලි කරනවාට වඩා එහා ගිය දෙයක්. ඒ එහා ගිය දේ තමයි, අනවශ්‍ය වචන මේකට ඇඳමින් නයාව පොළගා කරමින්, ඒ වාගේම සිංහයා, කොටියා කියලා ඒ අනවශ්‍ය වචන මේකට ඇතුළත් කරමින් ඇමතිවරුන්ට කථා කිරීම මේ උත්තරීතර සභාවක යුතුකමක් නොවෙයි කියලා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. අපි එක පැත්තකට නොවෙයි කථා කරන්නේ. 104 දෙනා ඇතුළේම යම් පිරිසක් ඇමතිවරුන්ට කථා කිරීම. යම් වරදක් වුණොත් ඒ වරද නිවැරදි කරලා දීම අපේ යුතුකම හා වගකීම. වරදක් වුණොත් ඒ වරද පෙන්වන එක අපේ යුතුකම හා වගකීම. නමුත් ඒ වැරැද්ද දැකලා, වැරැද්දට අනවශ්‍ය ලෙස කථා කිරීම එපමණ සුදුසු නැහැයි කියලා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. අපි මේ අවුරුදු තුනක කාලයක් තමයි - අපි අයවැය තුනකට තමයි ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඉදිරිපත් වෙලා තිබෙන කාල පරිච්ඡේදයේදී අපි මේ වාගේ දේවල් දැක්කා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම විශේෂයෙන් කියන්න කැමැතියි. බේරුවල ආසනයේ සමූපාකාර ස්කාගාරයක් තිබෙනවා. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාත්, මමත් ජීවත් වන ප්‍රදේශයේ. ඒ සමූපකාර ස්කාගාරයේ අපේ ප්‍රදේශයේ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් සමූපාකාර ස්කාගාරයක්. ඒ ස්කාගාරයේ අතීතය සම්පූර්ණ විස්තරාත්මකව පටන් ගත්ත දවසේ සිට මේ 2016 වන තෙක් විස්තර මගේ ළඟ තිබෙනවා. මම ගරු ඇමතිතුමාට ඉදිරියේදී ඒ විස්තර සියල්ල ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. මේවායේ යම්කිසි අක්‍රමිකතා වේගෙන ඇවිල්ලා අවසානයේදී මේ ස්කාගාරය, සාමාජිකයන්ගෙන් සැදුම් ලත් ස්කාගාරය දැන් වන කොට කොමසාරිස් පාලනයට අරගෙන, ඒක කරගෙන යාමත් දැන් වන කොට නැවතිලා තිබෙන්නේ. මගේ එකම පරමාර්ථය මේක සාමාජිකයන්ගේ අතට පත් කර ගැනීම. ගරු ඇමතිතුමනි, මේ ගැන අවධානය යොමු කරලා මේක සාමාජිකයාගේ අතට ලබා දෙන්නය

කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.
[අ.භා. 04.58]

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අයවැය විවාදයේ මගේ පළමුවැනි කථාව. ඇත්ත වශයෙන්ම ලලිත් වනිගරත්න ඇමතිතුමාගේ ඉතාමත්ම වටිනා අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් ගැන මට කථා කරන්න ලැබීම ගැන සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අත්තනගල්ල ආසනය නියෝජනය කරන්නේ. එතුමා මාර්ග සම්බන්ධව වැඩ කරන අපේ ඇමතිතුමා. ගරු ඇමතිතුමනි, අත්තනලග්ල ආසනය කියන්නේ ජනාධිපතිවරු, අගමැතිවරු. කැබිනට් ඇමතිවරු හිටපු ආසනයක්. එහි මැතිවරණ කොට්ඨාශ 13 න් හුදෙකලා ගම්මාන, දුෂ්කර ගම්මාන ලෙසට නම් වෙලා තිබෙන්නේ අත්තනගල්ල ආසනය. ඔබතුමා සීඝ්‍ර සංවර්ධනයක් කර ගෙන යනවා. මාර්ග සංවර්ධනයක්. බස්නාහිර පළාත තුළ. ගම්පහ දිස්ත්‍රික්කය තුළ. අත්තනගල්ල ආසනය තුළ. ඒ නිසා ලබන වසරේ වැඩි අවධානයක් අපේ ආසනයට ලබා දෙන්නය කියලා මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම සමූපකාරය ගැන පොඩි අවධානයක් මම යොදනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අත්තනගල්ල ආසනය තුළ මෙගා කෝප් සිටි එකක් තිබෙනවා. කෝප් සිටි හතරක් තිබෙනවා. මිනි කෝප් සිටි 22 ක් තිබෙනවා. ප්‍රාදේශීය කඩ 16 ක් තිබෙනවා. රෝහලක් තිබෙනවා. පෙට්‍රල් ෂෙඩ් හතරක් තිබෙනවා. නමුත් ඉතාමත්ම කාර්යක්ෂමතාවයෙන් අඩු තත්ත්වයක් තමයි සමූපකාරවල තිබෙන්නේ. මේකට මොකක්ද හේතුව? ඔබතුමා දන්නවා. වෙස්කෝ කියලා ආයතනයක් මගින් තමයි සමූපකාරයට බඩු ගත්තේ. පිටරටින් බඩු ගෙනැල්ලා සමූපකාරයට නිකුත් කළා. නමුත් මම දන්නා විධියට අද කෝටි ගණනක පාඩුවක් තිබෙනවා. ටයර් වගයක් ගෙන්වලා, ලක්ෂ 70 ක් 80 ක් වාගේ. ඒ කාලේ. ඔබතුමා එන්න පෙර. ඒ නිසා අද හැමෝම කඩේකට යන්නේ කඩය හැම බඩුවකින්ම සම්පූර්ණ වෙලා ලස්සනට තිබුණොත් තමයි මහජනතාව ඒ කඩයට යන්නේ. ඒ අතින් සමූපකාර කඩවලට මිනිස්සු යන්නේ නැහැ. අනික් එක සීමිත බඩු සංඛ්‍යාවක් තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. සමූපකාර පද්ධතිය නගා සිටුවන්න. ඒ පාරිභෝගිකයන්ට බඩු ගන්න සමූපකාර නිසි ලෙස පවත්වාගෙන යන්න. සියලුම භාණ්ඩවලින් සපිරි සමූපකාරයක් කරන්නය කියලා මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. ඒ තුළින් තමයි අපට යම්කිසි තත්ත්වයක් සමූපකාරවලට ලබා දෙන්න පුළුවන් වෙන්නේ.

ඒ වාගේම ග්‍රාමීය බැංකු සහ සමෘද්ධි බැංකු රජයට පවරා ගන්න මම හිතන්නේ, මේ 2017 අයවැයෙන් යෝජනා කරලා තිබෙනවා. ඒ තුළ විශාල පාඩුවක් මම හිතන්නේ - ග්‍රාමීය බැංකු විශාල ප්‍රමාණයක් අපේ ප්‍රදේශ තුළත් තිබෙනවා. බස්නාහිර පළාත තුළත් තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධව යම්කිසි අවධානයකට ලක් කරන හැටියට මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඊළඟට කථා කරන්න යන්නේ, ග්‍රාම සංවර්ධන කර්තව්‍යය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න.

## රීති අංක 30 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 30

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"දැන් මෙම සභාවේ කාලය විනාඩි 05 කින් දීර්ඝ කළ යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

ගරු ඇමතිතුමනි, ඉතාමත්ම සන්තෝෂයෙන් ග්‍රාම සංවර්ධන සමිති සම්බන්ධව මම කථා කරනවා. මාර්තු මාසයේ අත්තනගල්ල ආසනය තුළ ග්‍රාම සංවර්ධන සමිති පිහිටෙව්වා. මෙතැන ඉන්නවා, ග්‍රාම සංවර්ධන සමිතියේ ගරු අධ්‍යක්ෂතුමා. ඉතාමත්ම කාර්යශූර, ඉතාමත්ම එඩිතර, ක්‍රියාශීලී අධ්‍යක්ෂවරයෙක්. පළමුවැනි දවසේම ග්‍රාම සංවර්ධන සමිති 115 ක් පිහිටෙව්වා. මෙතැනදී ආපු ප්‍රශ්නයක් ග්‍රාම සංවර්ධන සමිතිවල නිලධාරීන්ට පොත්පත් නැහැයි කියලා. පසුව මම ඒ වෙලාවේ පොරොන්දු වුණා, සියලුම ග්‍රාම සංවර්ධන සමිතිවලට පොත්පත් ලබා දෙන්න. ඒ නිසා එක ග්‍රාම සංවර්ධන සමිතියකට රු. 1000 බැගින්

ග්‍රාම සංවර්ධන සමිති 115 කට මගේ පෞද්ගලික මුදලින් මම පොත් ලබා දුන්නා. අද මට කියන්න සන්තෝෂයි.

[ගරු අශෝක දයාරත්න]

ඊයේ මට දුරකථන ඇමතුමක් ආවා, ග්‍රාම සංවර්ධන නිලධාරී විජේකෝන් කියන මහත්මයාගෙන් අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාම සංවර්ධන සමිතිවලින් පළමුවැනි ස්ථානයට මේ වන කොට ඇවිල්ලා තිබෙන්නේ අත්තනගල්ල ග්‍රාම සංවර්ධන සමිතිය. ඒ වාගේම බස්නාහිර පළාත තුළම ග්‍රාම සංවර්ධන සමිතිවලින් තුන්වන ස්ථානයට පැමිණිලා තිබෙන්නේ, අපේ ගමේ සමිතියක්. (බාධා කිරීමක්)

ඇත්ත වශයෙන්ම එතුමා මට කිව්වා. මේකේ ගෞරවය ඔබතුමාට හිමි වෙනවා. නමුත් මට නොවෙයි. අපි මන්ත්‍රීවරු හැටියට අපි ඒගොල්ලන්ව ප්‍රාණවත් කරන්න ඕනෑ. ඒ නිසා ග්‍රාම සංවර්ධන සමිති තුළ ගරු ඇමතිතුමනි, විශාල ප්‍රශ්න තිබෙනවා. ග්‍රාම සංවර්ධන සමිතිවලට කොන්ත්‍රාත් දෙනවා. නමුත් සමහර සමිතිවලට කොන්ත්‍රාත් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් තිබුණත්, මුදල් නැහැ. ඒගොල්ලන්ට පවත්වාගෙන යන්න ක්‍රමයක් නැහැ. ග්‍රාම සංවර්ධන සමිති නිලධාරීන් අත්තනගල්ල ආසනයට මාසයකට දවසක් එනවා. නමුත් ඒගොල්ලන්ට තේ එකක්වත් දෙන්න ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. මම මේ පිළිබඳව ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාටත් යෝජනා කළා. අඩුම වශයෙන් මාසයකට වරක් එකතු වන ඒ නිලධාරීන්ට තේ එකක් බොන්න යම්කිසි මුදලක් මේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය තුළින් වෙන් කළ යුතුයි කියලා. ඒ තුළින් තමයි අපි ඒගොල්ලන්ව නගා සිටුවන්න පුළුවන් වන්නේ. ඒ නිසා මම විශේෂයෙන්ම ග්‍රාම සංවර්ධන සමිති ගැන දන්නවා. අත්තනගල්ලේ ග්‍රාම සංවර්ධන සමිති ඉතාමත්ම සාර්ථකව යනවා. එය නගා සිටුවන්න තමුන්නාන්සේලාගේ ආශිර්වාදය දෙන්න.

ගරු අමාත්‍යතුමනි, රන්මගපායට මම යන කොට මම ඉතාමත්ම සන්තෝෂයෙන් යන එක් මහළක් තමයි ඔය තුන්වැනි මහළ. ඔබතුමා සිටියත්, ඔබතුමා නොසිටියත් එතැන සිටින නිලධාරීන් අපට ඉතාමත්ම හොඳින් සලකනවා. ඔබතුමා නොසිටියත් ඒ රාජකාරි ඇත්ත වශයෙන්ම පෞද්ගලික ලේකම්, සම්බන්ධීකරණ ලේකම්, ඒ වාගේම සැලසුම් අංශය ඉතාමත් හොඳින් අපට සලකලා අපේ කර්තව්‍ය කරනවා. ඒ වාගේම මම අනික් ඒවා පහත් කරනවා නොවෙයි. අපි හැම තිස්සේම පස්වන මහළටත් යනවා. ඒ නිසා ඉතාමත්ම හොඳ කාර්ය මණ්ඩලයක් ඔබතුමාට ඉන්නවාය කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***

*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**

Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් වෙනවා.

***ඊට අනුකූලව අ.භා. 05.04 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***

*Accordingly at 05.04 p.m. the Provincial Council resolved itself into a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ]**

[Progress of the whole council]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**

Mr. Deputy Chairman

අද දින පූ.භා. 9.00 ට පළාත් සභාව ආරම්භ වූ අතර, අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා, යෞවන කටයුතු හා තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 108 හා 126 පිළිබඳ විවාදය ආරම්භ වී ප.ව. 3.00 ට විවාදය අවසන් වුණා. එකී වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය අවසානයේ බෙදීමකින් තොරව අංක 108 හා 126 ට අදාළ අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම වැය ශීර්ෂ ඒක ඡන්දයෙන් සභා සම්මත වූ අතර, එකී විවාදයෙන් පසු ආරම්භ වුයේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයට අදාළ ශීර්ෂ අංක 107, 121, 122, 123, 124, 125 හා 103 වැය ශීර්ෂයන් පිළිබඳ විවාදයයි. එකී විවාදය අද දින ප.ව. 5.00 ට අවසන් වූ අතර, නැවත 2016 දෙසැම්බර් මස 14 වන දින පෙ.ව. 9.00 ට ආරම්භ වන බව පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය වශයෙන් සඳහන් කරනවා.

# කල් තැබීම

# ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**

Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 05.05 ට, 2016 දෙසැම්බර් මස 14 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 05.05 p.m till 09.00 a.m, on 09.12.2016*